01. දකුණු පළාත් සභාවේ 1989 අංක 02 දරන (දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ස්වයං රැකියා උත්පාදනය හා වෙනත් සංවර්ධන අරමුණු තුළින් දුගී දුප්පත්කම තුරන් කරලීම සඳහා විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01.මෙම ප්‍රඥප්තිය 1989 අංක 02 දරණ දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. කෙටි නාමය

02. (I) දකුණු පළාතේ ස්වයං රැකියා උත්පාදනය හා වෙනත් සංවර්ධන අරමුණු තුළින් විරැකියාව හා දුගී දුප්පත්කම දුරලීම සඳහා (මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ. අරමුදල පිහිටුවීමේ පරමාර්ථ

(II) රුපියල් ලක්ෂ සියයක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදල ආරම්භ කිරීම සඳහා එකී අරමුදලට ගෙවිය යුතුය.

03. පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් හෝ වෙනත් මාර්ග වලින් හෝ කලින්-කලට තීරණය කෙරෙන එවැනි මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

04. මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ සපුරා ගැනීම සඳහා දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයක් මත ප්‍රධාන ලේකම්වරයා විසින් පළාත් සභා ලේකම්වරුන් වෙත අවශ්‍ය මුදල් ලබා දෙනු ඇත.

05. (I) අරමුදලේ භාරකාරත්වය ප්‍රධාන ලේකම්වරයා දරනු ඇත. අරමුදලේ භාරකාරත්වය ප්‍රධාන ලේකම්වරයා දැරිය යුතුය

(II) අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම හා සම්බන්ධ හෝ ඊට අනුයාත සියළු කරුණු විධිමත් කිරීම සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් රීති මගින් විධිමත් කළ යුතුය. ගිණුම් රීති සැකසීම

06. ප්‍රතිලාභීන් තෝරා ගැනීම දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන මණ්ඩල විසින් කළ යුතුය. ප්‍රතිලාභීන් තෝරා ගැනීම

අරමුදලින් මුදල් ප්‍රමාණයක් ගෙවීම

07. තෝරා ගනු ලබන ප්‍රතිලාභීන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් විසින් ඒ ඒ රැකියාවන් සඳහා තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයන් නීතිමය අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසුව ලබා දිය හැක.

08. (I) (අ) 10%කට නොවැඩි පොළියක් සමග ආපසු මුදල් ගෙවීමේ පදනමක් මත; හෝ,

(ආ) එක්වර දෙනු ලබන ප්‍රදානයන් වශයෙන්; හෝ එකී මුදල් අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත ඒ ඒ ලේකම්වරයා විසින් නිකුත් කළ යුතුය.

(II) පොළිය අඩු කිරීම, වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සහ දෙනු ලබන මුදල් ප්‍රමාණය නියම කිරීම දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව විය යුත්තේය

(III) අමාතය මණ්ඩලය තීරණය කරන පරිදි;

(අ) සුදුසු අවස්ථාවන්හි දී; හෝ

(ආ) ව්‍යාපෘති ඵල දරන තෙක්; හෝ

වාරික අය කර ගැනීමේ කාලය විලම්භනය කළ හැකිය.

09. මෙම අරමුදල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.

10. ප්‍රධාන ලේකම්වරයා විසින් අරමුදලේ වාර්ෂික ගිණුම ඊළඟ වර්ෂයේ ජූනි මස 30 දිනට පෙර ඊට සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාවේ පිටපතකුත් සමග ආණ්ඩුකාරවරයා වෙත යැවිය යුතු අතර, ඔහු විසින් එය පළාත් සභාව ඉදිරියේ තැබීමට සලස්වන්නේය.

1989 සැප්තැම්බර් මස 28 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව අනුමත වූ බව, මම මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති,
දකුණු පළාත් සභාව. 1989.10.04 දින

(2) දකුණු පළාත් සභාවේ 1989 අංක 3 දරන (පළාත් සභා සභාපති, නියෝජ්‍ය සභාපති) වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාතෙහි පළාත් සභාවේ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට වැටුප් හා දීමනා නියම කරනු ලැබීමට අදාළ ප්‍රඥප්තියකි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය 1989 අංක 3 දරන (පළාත් සභා සභාපති හා නියෝජ්‍ය සභාපති) වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

දකුණු පළාත් සභාවේ සභාපතිට හා නියෝජ්‍ය සභාපතිට ගෙවනු ලබන වැටුප් හා දීමනා

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින සහ ඉන් පසුව,
(අ) පළාත් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප දීමනා තත් කාලයෙහි පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනෙකුත් දීමනා වලට සමානවද,

(ආ) පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාගේ මාසික වැටුප හා දීමනා තත් කාලයෙහි රාජ්‍ය අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනෙකුත් දීමනා වලින් සියයක පනහකට සමානවද ගෙවිය යුත්තේය.

වැටුප් හා දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය

3. මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවනු ලබන සභාපතිවරයාගේ හා නියෝජ්‍ය සභාපතිවරයාගේ වැටුප් හා දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය.

(3) දකුණු පළාත් සභාවේ 1989 අංක 04 දරන හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිසද ඊට සම්බන්ධ සහ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1989 අංක 04 දරන හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. කෙටි නාමය

2. (1) දකුණු පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ. පළාතේ හදිසි අවස්ථා අරමුදල

(2) රුපියල් දශ ලක්ෂයක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළ යුතු අතර, එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.

(3) පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කෙරෙන එවැනි මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(2) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතුය. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20(2) වගන්තිය අනුව විය යුතුය

4. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර, ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු විසින් කළ යුතුය. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය

1989 නොවැම්බර් මස 15 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

(4) 1989 අංක 06 දරන දකුණු පළාත් සභාවේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ට වැටුප් හා දීමනා නියම කරනු ලැබීමට අදාළ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. ප්‍රඥප්තිය 1989 අංක 06 දරන (පළාත් සභා වැටුප් සහ දීමනා) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සහ ඉන් පසුව ,
(අ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් හාරදහසක් (රු.4,000/=) ද,

(ආ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් තුන්දහසක් (රු. 3,000/=) ද, ගෙවිය යුත්තේය.

(ඉහත සඳහන් (අ) සහ (ආ) ඡේද යටතේ සියළු වැටුප් සහ දීමනා ගෙවීම පත්කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුත්තේය.

දකුණු පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා

3. මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා දකුණු පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය.

වැටුප් සහ දීමනා ගෙවීම දකුණු පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය

(5) දකුණු පළාත් සභාවේ 1990 අංක 01 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය.

පළාත් ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු, ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු පිහිටුවීම සඳහා ද, ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහා ද, ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීම හා පරිපාලනය, ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සහ ක්‍රීඩාංගන සම්පාදනය සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව මෙසේ පනවනු ලැබේ:-

01. මේ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාවේ 1990 අංක 01 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනක ක්‍රියාත්මක විය යුතුය. ලුහුඬු නාමය

02. මේ ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්යයන් සඳහා මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව :- ක්‍රීඩා සභාවන් ආදිය පිහිටුවීම

(අ) පළාත් ක්‍රීඩා සභාවක්,

(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු තුනක්,

(ඇ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු සංඛ්‍යාවක්,

(ඈ) පළාත් ක්‍රීඩා අරමුදල යනුවෙන් අරමුදලක්,

(ඉ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක්,

(ඊ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ක්‍රීඩාංගන සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකිය.

03. 1. ක්‍රීඩා අධ්‍යක්ෂකවරයෙකු පත් කරනු ලැබිය යුතුය. ක්‍රීඩා අධ්‍යක්ෂකවරයා විසින් ඔහු වෙත මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ රාජකාරි යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය. ක්‍රීඩා අධ්‍යක්ෂ සහ වෙනත් නිලධරයන් පත් කිරීම

2. එක් සහකාර අධ්‍යක්ෂකවරයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ මෙම පනත යටතේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් පත් කරනු ලැබිය හැකිය.

3. මේ වගන්තියේ (1) වන හා (2) වන උප වගන්ති යටතේ පත් කරනු ලබන සියළු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

4. මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

5. මේ වගන්තිය යටතේ පත්කරන ලද සියළු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේදී තම කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමේදී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

1 වන කොටස

දකුණු පළාතේ ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු හා ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු පිහිටුවීම

04.(1) දකුණු පළාතේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන හා විනෝද ක්‍රීඩා දියුණු කිරීම, සංවිධානය කිරීම හා ධෛර්යමත් කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන "දකුණු පළාත් ක්‍රීඩා සභාව" යනුවෙන් සඳහන් වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) ඒ සභාව,

(අ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඇ) පළාත් තරුණ සේවා අධ්‍යක්ෂ

(ඈ) පළාත් පාලන පළාත් අධ්‍යක්ෂ

(ඉ) පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සභාපති කෙනෙකු සහ වෙනත්

සාමාජිකයින් දහ දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ලේකම් වශයෙන් කටයුතු කළ යුතුය.

දකුණු පළාත් ක්‍රීඩා සභාව පිහිටුවීම

(4) සභාවේ ක්‍රියාකාරිත්වය සහ කාර්යයන් සහ රැස්වීම සඳහා ගණපූරනය අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(5) සභාවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකිය.

05. (අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති හෝ සාමාජිකයන් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන්, කලින් ධූරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාල සීමාවක් දැරිය යුතුය.

සභාවේ සාමාජිකයන්ගේ ධූරය හිස්වීම ඔවුන් ඉවත් කිරීම ආදිය

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ සභාවේ සභාපති හෝ යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම, අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා විසින් සලකතහොත් හේතු නොදන්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(ඇ) මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් සභාපතිගේ හෝ සාමාජිකයෙකුගේ ධූරය හිස් වූ විට එසේ හිස් වූ ධූරය දරන තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු හිස් වූ ධූරය දැරූ තැනැත්තාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

06. යම් තැනැත්තෙකු,

නුසුදුසුකම්

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙන් කොටස් එක් කර සෑදීමෙන්, විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාව දරතහොත් හෝ,

(ඇ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයේදී වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

නැවත පත් කරනු ලැබීමට සාමාජිකයෙකු සුදුසු බව

07. කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කිරීමට සුදුසු විය යුතුය

08. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් අන්කිසි තැනැත්තෙකු නියමිත කාලසීමාවකට පත් කරනු ලැබිය හැකිය.

වැඩ බලන සාමාජිකයන් පත් කිරීම

09. (1) ඒ ඒ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය සහ විනෝද ක්‍රීඩා දියුණු කිරීමට, සංවර්ධනය කිරීමට සහ ධෛර්යය දීමට දකුණු පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා "දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක්" අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටුවීම

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු :-

(අ) දිස්ත්‍රික්කයේ රජයේ ඒජන්ත

(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී

(ඇ) අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඈ) දිස්ත්‍රික් ශාරීරික අධ්‍යාපන නිලධාරී

(ඉ) දිස්ත්‍රික් භාර තරුණ සේවා නිලධාරී සහ

(ඊ) අමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) පරිපාලන දිස්ත්‍රික්කයෙහි රජයේ ඒජන්ත සභාපති විය යුතුය.

(4) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී ලේකම් විය යුතුය.

10. මේ ප්‍රඥප්තියෙහි විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරිත්වය, කාර්යයන් හා කමිටුවල රැස්වීම්වල ගණපූරණය නියෝගයන් මගින් නියම කරනු ලැබිය යුතුය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල රීති

11. සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් විසින් ඒ ඒ කමිටුවේ රැස්වීම්වල කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා නීති රීති සැදිය හැකිය.

12.(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් සාමාජිකයින් මිය යාමෙන් හෝ ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාල සීමාවක් දැරිය යුතුය.

සාමාජිකයන්ගේ ධූරය හිස් වීම

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා විසින් සළකතහොත් හේතු නොදන්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස් වන යම් සාමාජිකයෙකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු එසේ හිස් වූ ධූරය දැරූ සාමාජිකයින්ගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

සාමාජිකයා නැවත පත් කිරීම

13. කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

වැඩ බලන සාමාජිකයින්

14. අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ තම ධූරයේ යුතුකම් ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සාමාජිකයෙකු වශයෙන් වැඩ බැලීමට අන් කිසි තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල සාමාජිකයින් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්

15. යම් තැනැත්තෙකු :-

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කොටස් තැනීමෙන් කිසිවක් එක් කර සෑදීමෙන්, විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරතහොත් හෝ,

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී, වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවෙහි සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

16. (1) ඒ ඒ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ශාරීරික අධ්‍යාපන සහ විනෝද ක්‍රීඩා දියුණු කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ උදව් දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දකුණු පළාතේ එක් එක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා "ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු" සුදුසු ආකාරයේ නිවේදනයක් මගින් ඔහු විසින් පිහිටුවනු ලැබිය හැකිය.

(2) ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු :-

(අ) ප්‍රාදේශීය ලේකම්

(ආ) ක්‍රීඩා නිලධාරී

(ඇ) කලාපීය අධ්‍යාපන නිලධාරීන්

(ඈ) මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්

(ඉ) තරුණ සේවා නිලධාරීන්

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයින් 25 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) ප්‍රාදේශීය ලේකම් සභාපති වනු ඇත.

(4) ක්‍රීඩා නිලධාරී ලේකම් වනු ඇත.

ක්‍රීඩා කමිටු රීති

17. සභාවේ ක්‍රියාකාරිත්වය සහ කාර්යයන් සහ සභාවේ රැස්වීම සඳහා ගණපූරනය මෙම පනතතේ විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයාගේ නියෝග මගින් නියම කරනු ලැබිය යුතුය.

18. සභාවේ රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම් වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකිය.

සාමාජිකයින්ගේ ධූරය හිස්වීම

19. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති හෝ ලේකම් හෝ සාමාජිකයින් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාල සීමාවක් ධූරය දැරිය යුතුය.

20.(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා සළකතහොත් හේතු නොදන්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(2) මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධූරය හිස් වූ විට, එසේ හිස් වූ ධූරය දැරූ තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු හිස් වූ ධූරය දැරූ තැනැත්තාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

21. කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

22. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ධූරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් යම්කිසි තැනැත්තෙකු පත් කරනු ලැබිය හැක.

23. යම් තැනැත්තෙකු :-

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කොටස් තැනීමෙන් කිසිවක් එක්කර සෑදීමෙන්, විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරතහොත් හෝ,

(ඇ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

II කොටස

පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීම.

24. දකුණු පළාතේ ක්‍රීඩා වලට ධෛර්යය දීම, ඒවා සංවර්ධනය කිරීම සඳහා මෙහි මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ, පළාත් ක්‍රීඩා අරමුදල යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(අ) දීමනාවක් වශයෙන් කලින් කල රජයෙන් සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්.

(ආ) යම් විදේශීය රටකින් ආධාර වශයෙන් ලැබෙන සියළු මුදල්

(ඇ) යම් තැනැත්තෙකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල්

පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීම

(ඈ) අරමුදලේ කාර්යයන් සඳහා කලින්කල දකුණු පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල් සහ

(ඉ) වෙනත් යම් මාධ්‍යයකින් ලැබෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

25. එසේ වුවද, යම් නිශ්චය කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුතු මේ කොන්දේසි පිට මේ වගන්තියේ (ඇ), (ඈ) හෝ (ඉ) ඡේද යටතේ මුදලක් ලැබුණ අවස්ථාවක ඒ මුදල් අරමුදලේ බැරට බාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍යවරයාගේ අභිමතය අනුව විය යුතුය.

එසේම තවදුරටත් ප්‍රදාන හෝ පරිත්‍යාග කිරීම යොදා ගැනීමට හෝ යම්කිසි නිශ්චිත කාර්යයන් සඳහා භාරයක් වශයෙන් තබා ගැනීමට අමාත්‍යවරයාගේ අභිමතය අනුව මුදල් බාර ගනු ලැබිය හැකි අතර, ඒ මුදල් අරමුදලට බැර නොකර වෙනමම තබා ගත හැකිය.

අරමුදලට කළ යුතු ගෙවීම්

26. යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයක් මේ පනතේ කාර්යයන් සඳහා යෙදීම පිණිස දකුණු පළාත් සභාව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි යම් දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු වෙනුවෙන් විනිශ්චය කරනු ලබන පරිදි යොදවා ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය හැකිය.

චංචල හා නිශ්චල දේපොළ පරිත්‍යාග

27.(1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර, එය අමාත්‍යවරයාගේ විධාන වලට යටත්ව අමාත්‍යාංශයේ ලේකම් විසින් පරිශීලනය කළ යුතුය.

(2) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගණන් හිලව් තබාගෙන යාමට අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතුය.

අරමුදලේ පරිපාලනය

(3) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතුය.

(3) 1971 අංක: 38 දරන මුදල් පනතේ 2 කොටසේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මුදල් පාලනය හා ගණන් හිලව් සම්බන්ධයෙන් ඇතුළු විය යුතුය.

28. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක්ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමග දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

29. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් :-

(අ) දකුණු පළාතේ යම් ක්‍රීඩාවකට ධෛර්යය දීම, එය දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද,

(ආ) ක්‍රීඩා විෂයෙහි ලබා දී ඇති යම් යම් ස්ථානයකට සැළකිලි වශයෙන් ක්‍රීඩා වලට දැනට සහභාගිවන්නන්ට හෝ ඉහත දී සහභාගිවූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන් ද ,

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පත් ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකර වල ආයෝජනය කිරීම සඳහා සහ

(ඈ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යයන් සඳහා ඔහු විසින් අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

III කොටස

ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීම හා අනුපාලනය කිරීම.

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් නම් කිරීම

30. පළාත් ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් ගැසට් නිවේදනයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

පළාත් සංගම් ලියාපදිංචි කිරීම

31. 30 වැනි වගන්තිය යටතේ වූ නියමයන් මගින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් නම් කරනු ලැබූ කල්හි, ඒ නියම කරනු ලැබූ අවස්ථාවේ ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පංතිය පිළිබඳ පවත්නා වූ යම් පළාත් සංගමයක් නියම කරනු හෝ නියම කරනු ලැබූ දිනයෙන් පසු පිහිටුවනු ලබන ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පංතියක් පිළිබඳව පිහිටුවනු ලබන පළාත් ක්‍රීඩා සංගමයක් හෝ ක්‍රීඩාවක හෝ ක්‍රීඩා පංතියක මේ පනතෙහි මීන් මතුවන විධිවිධානවලට අනුකූලව පළාත් සංගම් ලියාපදිංචි කරන පිළිවෙලට ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

ලියාපදිංචි කිරීමේ තීරණවලට විරුද්ධ අභියාචනා

32. ලියාපදිංචි කිරීමට අදාළ යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය.

පළාත් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය හා ඒවායේ සංයුතිය යුතුකම්, බලතල හා කාර්යයන් ආදිය

33. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(අ) ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ ගාස්තු

(ආ) ක්‍රීඩා සංවිධානවල සංයුතිය සහ සංස්ථාපනය

(ඇ) ඒ සංගම්වල යුතුකම්, බලය සහ කාර්ය පරිපාටිය සහ,

(ඈ) ඒ ක්‍රීඩා සංවිධානවල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්ය පරිපාටිය.

34. (අ) සංගමයේ නිලධාරීන්ගේ දූෂණ, විෂමාචාර හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත්වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසළකා හැරීම නිසා හෝ,

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මණ්‍යව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා හෝ,

(ඇ) ක්‍රීඩා සංවිධානයේ යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා ක්‍රීඩා සංවිධානයේ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

35. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම නැතහොත් අවලංගු කරනු ලැබූ ක්‍රීඩා සංවිධානයක කාර්යයන් කරගෙන යාම සඳහා අන්තර්කාලීන විධිවිධාන ක්‍රම අමාත්‍යවරයා විසින් ඇති කළ හැකිය.

අන්තර්කාලීන විධි විධාන

36. (1) 31 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් නොකළහොත් හෝ, ලියාපදිංචි කිරීම 34 වැනි වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අවලංගු කරන ලද යම් ක්‍රීඩා සංවිධානයක් විසුරුවා හරින ලෙස බල කරනු ලබන නියමයක් අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, එකී නියමයේ සඳහන් කර තිබූ කාලය තුළදී ඒ සංගමය විසුරුවා හැරීමට එහි කටයුතු අවසන් කිරීමට එම ක්‍රීඩා සංවිධානයේ නිලධාරීන් විසින් එකී නියමය පරිදි ක්‍රියා කළ යුතුය.

පළාත් ක්‍රීඩා සංගම් විසුරුවා හැරීම

37. මේ ප්‍රඥප්තියෙහි විධිවිධාන වලට අනුකූලව ලියාපදිංචි නොකරන ලද යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් පිළිබඳව පවත්නා වූ සංවිධානයක් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලැබිය හැකි යම් පහසුකම්, වරප්‍රසාද හෝ ආධාර ලැබීමට හිමිකම් නොලබනවා ඇත.

38. යම් ක්‍රීඩා සංවිධානයක් සම්බන්ධයෙන් කරන ලද විසුරුවා හැරීමේ නියමයන් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා සළකතහොත්, එසේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම ද, යම් දූෂණ, විෂමාචාර හෝ අක්‍රමිකතා තිබේ නම් , ඒවාට අමාත්‍යාංශ ලේකම්වරයා සුදුසු යයි නිගමනය කරන ප්‍රතිකර්ම යොදන ලෙසද අමාත්‍යවරයා විසින් ඒ සංවිධානයේ සාමාජිකයන්ට නියම කළ හැකිය. ඉන් පසු තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් ඒ සංවිධානයේ ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට අවසර දිය හැකිය.

IV කොටස
ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක් පිහිටුවීම.

39. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක් හෝ ප්‍රදානයන් පිහිටුවනු ලැබිය හැකිය.

(අ) ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය හා විනෝද ක්‍රීඩා පිළිබඳ අවබෝධය හා උනන්දුව ඇති කිරීම.

(ආ) ක්‍රීඩා කුසලතාවය ඇති ළමයින්ගේ අවශ්‍යතා සම්පාදනය කිරීමෙන් දෙමව්පියන්ට ඇතිවන දුෂ්කරතා මග හැරවීම.

(ඇ) ක්‍රීඩා කුසලතා සොයා ගැනීම සහ එම කුසලතා වර්ධනය කිරීමට අවශ්‍යතා සැපයීම.

(ඈ) ක්‍රීඩා කුසලතා ඇති ළමයින් ඵලදායී රක්ෂාවලට යොමු කිරීම.

(ඉ) ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පුහුණුව ආරම්භ කිරීමට ඉතාම සුදුසු වයසේ දී විද්‍යාත්මක පුහුණුව ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීම. ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය

40. අමාත්‍යවරයා විසින් නියෝග මගින් :-

(අ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තෝරා ගැනීමේ පරිපාටි.

(ආ) ප්‍රදානය කරන ක්‍රීඩා ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම.

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි එම කාර්යය ඉටු කිරීමට සම්බන්ධීකරණ නිලධාරීන්, කථිකාචාර්යවරුන්, ගුරුවරුන්, උපදේශකයින් සහ වෙනත් නිලධරයන් පත් කිරීම, දීමනා ගෙවීම, සහ ශිෂ්‍යත්වලාභීන්, සඳහා විෂයමාලා පරීක්ෂණ තරග නියම කරනු ලැබිය හැකිය. නියෝග

41. අමාත්‍යවරයාට :-

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලද පාසල් සහ ශිල්පායතනයන්ට පුහුණුව, නේවාසික පහසුකම් හා වෙනත් කාර්යයන් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම සඳහා

(ආ) ඒ ශිල්පායතනවල ශිෂ්‍යත්වලාභින්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය සහ සුබ සාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා

(ඇ) ඒ ශිල්පායතනවලට ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා බලය තිබිය යුතුය.

පහසුකම් සැපයීම විනය පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලතල

ක්‍රීඩාංගන ගොඩනැගීම

42. පුහුණු ක්‍රීඩා තරග, ශාරීරික අධ්‍යාපනය සහ විනෝද ක්‍රීඩා, ධෛර්යමත් කිරීම, වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මෙහි මින්මතු "ක්‍රීඩාංගන" යනුවෙන් සඳහන් කරනු ලබන්නාවූ ක්‍රීඩාංගන සංකීර්ණ, ක්‍රීඩා මන්දිර, ක්‍රීඩා පිටි, ක්‍රීඩා කරන ස්ථාන ගොඩ නැංවීම හෝ ගොඩ නංවා ගැනීම අමාත්‍යවරයා විසින් කළ හැකිය.

ක්‍රීඩාංගන,ක්‍රීඩා සංකීර්ණ ගොඩ නැගීම

43. ඒ ගොඩ නැංවීම හෝ ඉදි කිරීම :-

(අ) රජයෙන් ලබා ගන්නා වූ,

(ආ) පළාත් සභා අරමුදලෙන් ලබා ගන්නා වූ,

(ඇ) විදේශීය රටවලින් ලැබෙන්නා වූ ආධාර වලින් ලබා ගන්නා වූ,

(ඈ) ලද්දාවූ පරිත්‍යාග වලින් ලබා ගන්නා වූ,

(ඉ) වෙනත් ආකාරයකින් ලබා ගන්නා වූ මුදල්වලින් කළ හැක.

44. එම ක්‍රීඩාංගන වලට නේවාසික සහ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම් හෝ ඉදි කරවා ගැනීම් නඩත්තු හෝ පවත්වා ගැනීම, උපකරණ සජ්ජිත හෝ සජ්ජිත කරවා ගැනීම අමාත්‍යවරයා විසින් කළ යුතුය.

ගොඩනැගිලි සජ්ජිත කිරීමට අමාත්‍යවරයා සතු බලතල

45. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(අ) එම ක්‍රීඩාංගනවල පරිපාලනය සහ වෙනත් කටයුතු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ පරිපාටිය

(ආ) එම ක්‍රීඩාංගනවල ඇති පහසුකම් පරිහරණය කිරීම හා ඒ ක්‍රීඩාංගනවල පරිහරණය සඳහා ඇති උපකරණවල ආරක්ෂිත තත්ත්වය

V වන කොටස.

46. (1) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල සහ වෙනත් මණ්ඩලවල බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ සභා කමිටු, සංවිධාන හෝ මණ්ඩල වෙත පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ සභා කමිටු සංවිධාන හෝ වෙනත් මණ්ඩල විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතුය.

අමාත්‍යවරයා සතු පොදු සහ විශේෂ බලතල

(2) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල හා වෙනත් මණ්ඩලවල දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වූ වාර්තා ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ සභාවලට, කමිටුවලට, සංවිධානවලට හෝ වෙනත් මණ්ඩලවලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ සභා කමිටු සංවිධාන හෝ වෙනත් මණ්ඩල ඒ සෑම විධානයන් අනුව ක්‍රියා කළ යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල සහ වෙනත් මණ්ඩලවල කටයුතු සියල්ලක්ම හෝ ඉන් යමක් තමන් විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර, එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියළු පහසුකම් සැලැස්වීම් සහ සියළු තොරතුරු සැපයීම් ඒ සභා කමිටු, සංවිධාන සහ වෙනත් මණ්ඩල විසින් කළ යුතුය

47. දකුණු පළාත නියෝජනය කරතියි සළකන තනි තනි ක්‍රීඩකයන් හෝ ක්‍රීඩක කණ්ඩායම් ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී හෝ ක්‍රීඩාවලට සහභාගි වීම නියෝග මගින් විධිමත් කිරීමද, පාලනය කිරීමද, අමාත්‍යවරයා විසින් කළ හැකිය

48. පළාත් පාලන ආයතන, පළාත් පාලන බලමණ්ඩල, සංස්ථාපිත මණ්ඩල හෝ සේවා යෝජිතයෙකු විසින් සැපයිය යුතු අවම ක්‍රීඩා සහ විනෝද ක්‍රීඩා පහසුකම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

49. (1) මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහාත් නියමිත සියළු කරුණු සඳහාත්, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම යෝග්‍ය ආකාරයෙන් පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තැබිය හැකි පසු දිනක සිට එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම යෝග්‍ය ආකාරයෙන් පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම දිනයේ සිට පරිච්න්න වූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්න්න වූ ලෙස සැලකෙන දිනය යෝග්‍ය ආකාරයෙන් නිවේදනය කරනු ලැබිය යුතුය.

50. මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් ක්‍රීඩා සභාවේ සාමාජිකයන්ට මුදල් පිළිබඳ විෂය බාර අමාත්‍යවරයාගේ එකඟත්වය අනුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයෙන් පරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

අර්ථ නිරූපනය

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි "අමාත්‍යවරයා" යනුවෙන් දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ක්‍රීඩා විෂය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වන අතර අමාත්‍යාංශය යන්න ඒ අනුව තේරුම් ගත යුතුය.

"ලේකම්" යනුවෙන් දකුණු පළාත් සභාව විසින් ක්‍රීඩා විෂය හෝ කාර්යය පවරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"ක්‍රීඩා" හෝ ක්‍රීඩාව යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ පනතේ කාර්යයන් සඳහා ක්‍රීඩාව වශයෙන් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, සෙල්ලම්, විනෝද ක්‍රීඩා, ශාරීරික ව්‍යායාම, කාය වර්ධන ව්‍යායාම හා වෙනත් ව්‍යායාම ඇතුළත් වේ.

1990 පෙබරවාරි මස 13 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

සභාපති,

දකුණු පළාත් සභාව

1990 පෙබරවාරි මස 14 වන දින,
ගාල්ලේ "හිල්ටොප්" මන්දිරයේ පිහිටි
දකුණු පළාත් සභා කාර්යාලයේදී.

(6). දකුණු පළාත් සභාවේ 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය.

1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ IV සහ V වන උපලේඛනවල විස්තර වන ප්‍රාදේශීය සභා සඳහා විශේෂ කොමසාරිස්වරු පත් කිරීම පිණිස හා එයට සම්බන්ධ වූ හෝ/හා අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01.(1) මෙම ප්‍රඥප්තිය 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

(2) මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

02. (I) වෙනත් ලිඛිත නීතියක මෙයට පටහැනිව කෙසේ සඳහන්ව තිබුණද අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ IV සහ V උපලේඛනවල දක්වා ඇති ප්‍රාදේශීය සභාවලින් මෙම පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු පත් කරනු ලැබිය හැකිය. — විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීම

(II) ඉහත (1) උප වගන්තියේ දක්වා ඇති විශේෂ කොමසාරිස්වරයාගේ පත්වීම එකී නියෝගයෙහි විශේෂයෙන් සඳහන් කර ඇත්නම් මිස 1990 ජනවාරි 01 වන දිනෙන් පටන්ගෙන කලින් කලට කරන ලද සංශෝධන ඇතුළත් (262වන අධිකාරිය වන) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධි විධාන ප්‍රකාර (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවට සභිකයන් තෝරා පත් කර ගනු ලබන තුරු බල පැවැත්විය යුතුය.

(III) මෙම වගන්තියේ (1) උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභාවක විශේෂ කොමසාරිස්වරයා මිය යෑම, ඉල්ලා අස්වීම, තනතුරෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ඉවත් වීමෙන් පුරප්පාඩු වූ විට එකී විශේෂ කොමසාරිස්වරයාගේ තව දුරටත් ඉතිරි වී ඇති ධූර කාලය වෙනුවෙන් වෙනත් විශේෂ කොමසාරිස්වරයෙකු අමාත්‍යවරයා විසින් එකී ප්‍රාදේශීය සභාවට පත් කරනු ලැබිය හැකිය.

03. මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන වෙනත් නීතියක් සමග අනනුකූල වන්නේ නම් හෝ ගැටෙන්නේ නම් හෝ මෙම ප්‍රඥප්තියේ සඳහන් විධි විධාන එම නීතිය අභිබවා බල පැවැත්විය යුතුය.

04. ප්‍රාදේශීය සභාව යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවක් අදහස් වෙයි.

1990 මාර්තු මස 13 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති,
දකුණු පළාත් සභාව

1990 අප්‍රේල් මස 06 වන දින
ගාල්ලේ "හිල්ටොප්" මන්දිරයේ පිහිටි
දකුණු පළාත් සභා කාර්යාලයේදීය.

දකුණු පළාත් සභාවේ 1990 අංක 02 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 එච් වගන්තිය ප්‍රකාර, අද දින මවිසින් මෙයින් අනුමත කරන ලද බව දන්වමි.
1990.04.17 දින,
ගාල්ලේදීය.

එම්. ඒ. බාකීර් මාකර්
ආණ්ඩුකාර
දකුණු පළාත

(7) 1990 අංක 03 දරන මුදල් ප්‍රඥප්තිය.

ඇතැම් බදු, බලපත්‍ර ගාස්තු, තීරු ගාස්තු සහ කලින් පැනවීම සහ එකතු කිරීම සඳහා, පළාත තුළ පිහිටි අධිකරණ විසින් පනවනු ලබන දඩ මුදල් පළාතේ ආදායමට උපචිත කිරීම සඳහා සහ ඒවාට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය පහත දැක්වෙන ගාස්තු වලට අනනුකූල වේ:-

(1) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත
(2) ඔට්ටු ඇල්ලීම සහ තුරඟ තරඟ පිළිබඳ ආඥා පනත
(3) ලොතරැයි ආඥා පනත
(4) තෑගි එකතු කිරීමේ පනත
(5) සුරාබදු ආඥා පනත
(6) මෝටර් රථ ප්‍රවාහන පනත
(7) මෝටර් වාහන ආඥා පනත
(8) වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත
(9) රජයේ ඉඩම් ආඥා පනත
(10) ඉඩම් සංවර්ධන ආඥා පනත
(11) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

01. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1990 අංක 03 දරන මුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය

1 වන පරිච්ඡේදය
තොග සහ සිල්ලර වෙළෙඳාම මත පිරිවැටුම් බදු පැනවීම

02. (1) 1991 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන සහ ඊට පසුව එළඹෙන එක් එක් කාර්තුව සඳහා, පළාත තුළ තොග හෝ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරය කරගෙන යන සෑම තැනැත්තෙකුම විසින් තම ව්‍යාපාරයෙන් ලබන පිරිවැටුම් සම්බන්ධයෙන් වූ බද්දක් (මෙහි මින් මතු "තොග සහ සිල්ලර වෙළෙඳ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණ වලට අනුව ඒ එක් එක් තැනැත්තාගෙන් අය කරනු ලැබේ. තොග සහ සිල්ලර වෙළෙඳ බදු

(2) තොග සහ සිල්ලර වෙළෙඳ බද්දේ අනුප්‍රමාණය ඒ ඒ තොග සහ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවයට අනුව තීරණය කරනු ලැබිය හැකි අතර, තොග සිල්ලර වෙළෙඳ ව්‍යාපාරවල ඒ ඒ පන්ති හෝ වර්ග සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ඒ ඒ වෙනස් අනුප්‍රමාණවලට අනුව එකී බද්ද අය කරනු ලැබේ.

(3) යම් ව්‍යාපාර පන්තියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් පනවා ඇති තොග සහ සිල්ලර වෙළෙඳ බද්දේ අනුප්‍රමාණය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර නියමයන් මගින් වෙනස් කරනු ලැබිය හැකිය.

(4) පළාතේ ආර්ථික ප්‍රගතිය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එහි නිශ්චිතව සඳහන් යම් පන්තියක හෝ වර්ගයක ව්‍යාපාරයක් එකී වෙළෙඳ බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

"පිරිවැටුම" යන්නෙහි අර්ථ කථනය

03. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා "පිරිවැටුම" යන්න යම් ව්‍යාපාරයකට අදාළව යෙදී ඇති විට, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුළත් වන ගනුදෙනු වලින් ලැබෙන හෝ ලැබිය යුතු වන මුළු මුදල් ප්‍රමාණය ඉන් අදහස් වේ.

(2) යම් කාර්තුවකදී ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා වූ තොග සහ සිල්ලර වෙළෙඳ බද්ද ගෙවා ඇති අවස්ථාවකදී එකී මුදල් ප්‍රමාණය ඇත්ත වශයෙන්ම ලැබුණු කාර්තුව සම්බන්ධයෙන් වූ බද්දක් ඒ මුදල සඳහා ගෙවීමට අවශ්‍ය නොවේ.

04. (1) යම් කාර්තුවක් සඳහා වූ තොග සහ සිල්ලර වෙළෙඳ බද්ද නිශ්චය කිරීම, ඒ කාර්තුව තුළදී ඒ ව්‍යාපාරයේ බොල් ණයක් බවට පත් වී ඇත්තා වූද යම් යම් කාර්තුවක් සඳහා වූ තොග සහ සිල්ලර වෙළෙඳාම පිළිබඳ පිරිවැටුම් බද්දට ඇතුළත් කොට තිබුණා වූ සහ ඒ සඳහා වෙළෙඳ බද්ද ගෙවා ඇත්තා වූ ද, යම් බොල් ණයකට සමාන මුදල් ප්‍රමාණයක් අඩු කරනු ලැබිය යුතුය. එසේ වුවද බොල් ණයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ කලින් අඩු කරන ලද මුදලක් ඒ ව්‍යාපාරයේ යම් කාර්තුවක් සඳහා ලැබුණු අවස්ථාවකදී ඒ මුදල ලැබුණේ යම් කාර්තුවකදී ද ඒ කාර්තුවේ ව්‍යාපාරයේ පිරිවැටුම් බද්දට එය එකතු කරනු ලැබිය යුතුය.

(2) තොග සහ සිල්ලර වෙළෙඳ බදු කාර්ය සඳහා යම් ව්‍යාපාරයක පිරිවැටුම තීරණය කිරීමේදී -

(අ) යම් තැනැත්තෙකු විසින් එකම ස්ථානයේ හෝ වෙනස් වෙනස් ස්ථානවලදී එකම ස්වභාවයේ ව්‍යාපාරයක් කරගෙන යන්නේ නම් ඒ ව්‍යාපාරය එක් ව්‍යාපාරයක් ලෙස ගණන් ගත යුතුය.
සහ
(ආ) එකම තැනැත්තා විසින් එකම ස්ථානයේදී විවිධ ව්‍යාපාර කර ගෙන යනු ලබන්නේ නම් එසේ එකම ව්‍යාපාරයක් ලෙස ගණන් ගනු ලැබිය යුතුය.

නිදහස් කැරෙන භාණ්ඩ

05. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් යම් භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නිදහස් කරනු ලැබූ භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) යම් පන්තියක හෝ වර්ගයක ව්‍යාපාර, සම්බන්ධයෙන් යම් භාණ්ඩයක් නිදහස් කරනු ලැබූ භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර ඇති විටක ඒ භාණ්ඩය විකිණීමෙන් උපලබ්ධ වන මුදල විෂයෙහි තොග හා සිල්ලර වෙළෙඳ බද්දක් අය නොකරනු ලැබිය යුතුය.

පිරිවැටුම රු. 25000/= ට වැඩිවන විට වාර්තා සැපයිය යුතු බව

06. (1) පළාත තුළ කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් යම් කාර්තුවකට ලැබෙන පිරිවැටුම රුපියල් විසිපන්දහසකට නොඅඩු වන්නා වූද ඒ ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තෙකු විසින් ඒ ව්‍යාපාරය යම් කාර්තුවකින් කොටසකදී පමණක් කරගෙන ගොස් ඇත්තා වූ අවස්ථාවක දී ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම සහ රුපියල් විසිපන්දහසක් අතර ඇති අනුපාතය ඒ කාර්තුවේ ඒ දින ගණන සහ දින අනූවක් අතර ඇති අනුපාතයට නොඅඩු වන්නේ නම් පළාත තුළ එවැනි ව්‍යාපාරයක් කරගෙන ගිය සෑම තැනැත්තෙකුම විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්තුව හෝ කාර්තුවේ ඒ කොටස හෝ ඉකුත් වී දින පහළොවක් ගත වීමට පෙර, ඒ ව්‍යාපාරයේ ඒ කාර්තුවේ නැතහොත් ඒ කාර්තුවේ කොටසේ පිරිවැටුම දැක්වෙන වාර්තාවක් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතුය. එවැනි සෑම වාර්තාවක්ම නියමිත ආකෘතියේ අනුසාරයෙන් සැපයිය යුතු අතර, ඒ ආකෘතියේ දැක්විය යුතු යයි නියමිත සියලු විස්තර ඒ ආකෘතියේ අඩංගු කළ යුතුය.

(2) යම් තැනැත්තකු තොග සහ සිල්ලර වෙළෙඳ බද්ද ගෙවිය යුතු තැනැත්තෙකු යයි තක්සේරුකරු විසින් නිගමනය කරනු ලැබූ විටක ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලබන ලිඛිත නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් කාලය තුළදී තක්සේරුකරු විසින් නියම කරනු ලබන තොරතුරු ඇතුළත් වාර්තාවක් සපයන ලෙස තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(3) යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්ය සඳහා තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත පහත දැක්වෙන නියමයන් ඉටු කළ යුතු බවට ඒ තැනැතැත්තා විසින් ලිඛිත නිවේදනයක් යවනු ලැබිය හැකිය:-

(අ) ඒ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද ඒ තැනැත්තාගේ සන්තකයේ ඇත්තා වූ ද, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන,වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණකවරුන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කොට ඇති කාලපරිච්ඡේදය තුළදී පරීක්ෂා කිරීම සඳහා තක්සේරුකරු වෙත ඉදිරිපත් කිරීමට හෝ යැවීමට,

(ආ) ඒ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ස්ථානයකදී දිනයකදී සහ වේලාවකදී තමාම පෞද්ගලිකව පැමිණිය යුතු බවට හෝ බලය දෙන නියෝජිතයෙකු මගින් පෙනී සිටිය යුතු බවට,

(4) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන දෑ නියම කරමින් යම් තැනැත්තෙකු වෙත ලිඛිත දැන්වීමක් නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් යවනු ලැබිය හැකිය:-

(අ) ඒ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූද ඒ තැනැත්තාගේ සන්තකයේ ඇත්තා වූ ද, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණකවරුන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කොට ඇති කාලපරිච්ඡේදය තුළදී පරීක්ෂා කිරීම සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමට හෝ යැවීමට,

(ආ) ඒ දැන්වීමෙහි සඳහන් යම් කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ දැන්වීමේ සඳහන් ස්ථානයකදී, දිනයකදී සහ වේලාවකදී තමාම පෞද්ගලිකව පැමිණ සිටිය යුතු බවට හෝ බලය දෙන ලද නියෝජිතයෙකු මගින් පෙනී සිටිය යුතු බවට,

(5) ඉහත (4) වන උප වගන්තිය යටතේ කරන ලද දැන්වීමකට අවනත වෙමින් පැමිණෙන යම් තැනැත්තෙකු විසින් යුක්ති සහගත ලෙස දරනු ලැබූ වියදම් කොමසාරිස්වරයා විසින් ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(6) ඉහත (3) වන උප වගන්තිය හෝ (4) වන උප වගන්තිය යටතේ තමන් වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ එවනු ලැබූ නැතහොත් වෙනත් යම් ආකාරයකින් තම සන්තකයට පත් වූ හෝ ලැබී තිබුණු පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණකවරුන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන කිසිවක් කොමසාරිස්වරයෙකුගේ අනුමැතිය යටතේ යම් තක්සේරුකරුවකු විසින් තමන් ඉදිරියේ රඳවා ගනු ලැබිය හැකිය.

(7) තක්සේරුකරු විසින් අවශ්‍ය යයි සිතනු ලැබූ විටක හෝ එසේ සිතනු ලබන ඕනෑම වාර ගණනකදී යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් නිකුත් කරමින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය තුළදී පහත දැක්වෙන දෑ ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය:-

(අ) වඩාත් සම්පූර්ණ හෝ වැඩිදුරටත් වූ වාර්තා සපයන ලෙස; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්ද තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි තක්සේරුකරු අදහස් කරන යම් කරුණකට අදාළ සම්පූර්ණ වූ හෝ වැඩිදුරටත් වූ තොරතුරු සපයන ලෙස;

(8) මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙනුවෙන් සපයන ලදැයි සලකනු ලබන යම් වාර්තාවක්, ප්‍රකාශයක්, ආකෘති පත්‍රයක් සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ ඔප්පු කිරීමක් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි එය ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ බලය යටතේ හෝ සපයනු ලැබුවක් ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. තවද එවැනි වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘති පත්‍රයක් අත්සන් කරන යම් තැනැත්තෙකු, එහි අඩංගු සියළු කරුණු සම්බන්ධයෙන් දැනීම ඇත්තකු ලෙස සලකනු ලැබිය යුතුය.

(9) තක්සේරුකරුවකු විසින් (2) වන උප වගන්තිය යටතේ දෙනු ලැබූ යම් දැන්වීමක අඩංගු නියමයන් අනුගමනය කිරීම යම් තැනැත්තෙකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) රුපියල් පනස්දහසකට නොවැඩි දඩයක් ඒ තැනැත්තාට පනවනු ලැබිය හැකිය; සහ

(ආ) I. එවැනි දඩයක් ගෙවීමට සහ
II. තක්සේරුකරු විසින් දෙනු ලැබූ දැන්වීමෙහි සඳහන් වාර්තා කොමසාරිස්වරයාගේ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය තුළදී, සපයන ලෙස, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(10) එකී වාර්තාව සැපයීම පැහැර හරින ලද්දේ තම පාලනයට පරිබාහිර වූ පරිවේෂණ හේතු කොට ගෙන බවත්, දඩය පැනවීමෙන් පසු තමන් විසින් ඒ වාර්තාව සපයන ලද බවත් යම් තැනැත්තකු විසින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් මේ වගන්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත පනවනු ලැබූ යම් දඩයක් අඩු කිරීම හෝ කපා හැරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකිය.

(11) යම් තැනැත්තකු වෙත (9) වන උප වගන්තිය යටතේ දඩයක් නියම කරනු ලැබූ විටක ඒ දැන්වීමට අදාළව මේ ප්‍රඥප්තියේ යම් වගන්තියක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට ඒ තැනැත්තා යටත් නොවන්නේය.

II වන පරිච්ඡේදය

ලොතරැයි සහ තෑගි තරග බදු

07. පළාත තුළ පවත්වා ගෙන යනු ලබන සෑම ලොතරැයියක් සහ තෑගි තරගයක් සම්න්ධයෙන් (මෙහි මන් මතු ලොතරැයි බද්ද සහ තෑගි තරග බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයක පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලබන අනු ප්‍රමාණවලට අය කරනු ලැබිය යුතුය. "තෑගි තරගය" යන්නෙන් ද්‍රව්‍යවලින්, මුදලින් හෝ සේවාවලින් තෑගි පිරිනමනු ලබන තරගයක් අදහස් වන අතර, ලොතරැයියත් ඊට ඇතුළත් නොවේ.

ලොතරැයි සහ තෑගි තරග මත පනවන බදු

(1) ලොතරැයියක් හෝ තෑගි තරගයක් පිහිටුවීමට හෝ පැවැත්වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකු විසින්ම, ඒ සඳහා වූ විධි විධානවලට අනුකූල, තත් කාර්ය සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය.

(2) ලොතරැයියක් හෝ තෑගි තරගයක් පිහිටුවීමට හෝ පැවැත්වීම සඳහා වූ බලපත්‍රයක්, තත් කාර්ය සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය.

(3) ඉහත (1) වන උප වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු වුවහොත් රුපියල් දහසක (රු.1000/=) දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට බරපතල වැඩ නොමැතිව බන්ධනාගාරගත කිරීමට ඒ තැනැත්තා යටත් වන්නේය.

08. පළාත තුළ පිහිටුවනු ලැබූ හෝ පවත්වනු ලබන බලපත්‍ර නොලත් ලොතරැයියකට හෝ තෑගි තරගයකට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යන හෝ පාවිච්චි කරන හෝ යම් පරිශ්‍රයක නැතහොත් ස්ථානයක එවැන්නක් පවත්වාගෙන යාම හෝ එවැන්නක් සඳහා යම් පරිශ්‍රයක් නැතහොත් ස්ථානයක් පාවිච්චි කිරීමට දැන දැනම ඉඩ දෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට ඒ තැනැත්තා යටත් වන්නේය.

බලපත්‍ර නොලත් ලොතරැයියක් හෝ තෑගි තරගයක් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීම වරදක් බව

09. (1) 2 වන වගන්තියේ (1), (3) සහ (4) වන උප වගන්ති යටතේ කරනු ලැබූ නියමයන් සහ (2) වන උප වගන්තිය යටතේ කරනු ලබන තීරණයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවහොත් සහ ඒ නියමය හෝ තීරණය අනුමත කරන ලෙස යෝජනාවක් මගින් කරනු ලබන ඉල්ලීමක් ඒ නියමය හෝ තීරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළතදී පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් සහ එසේ මාසයක් ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් නොපැවැත්වේ නම් තදනන්තරව පැවැත්වෙන ප්‍රථම රැස්වීමට ඉදිරිපත් කරනු ලැබ පළාත් සභාව විසින් එය අනුමත කරන ලද්දේ නම් මිස එවැනි නියමයක් හෝ තීරණයක් බලාත්මක නොවන්නේය.

නියමයන් යනාදිය සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු බව

(2) එවැනි නියමයක් හෝ තීරණයක පාඨය එවැනි සෑම යෝජනාවකම උපලේඛන ගත කොට තිබිය යුතුය.

10. යම් ජාතික ලොතරැයියක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරනු ලැබූ යම් ලොතරැයියක් සඳහා මේ පරිච්ඡේදයේ විධි විධාන හෝ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධි විධාන යටතේ සාදනු ලැබූ නියෝගයක් අදාළ නොවන්නේය.

ජාතික ලොතරැයි සහ ආණ්ඩුවේ ලොතරැයි පත් නිදහස් කැරෙන බව

III වන පරිච්ඡේදය
ඔට්ටු ඇල්ලීම මත පැනවෙන බදු

11. (1) පළාත තුළ වුවද ඉන් පිටත වුවද පවත්වනු ලබන තුරඟ තරග සඳහා ඔට්ටු අල්ලනු ලබන කවර වුවද වර්ගයක ඔට්ටු මත (මෙහි මින් මතු ඔට්ටු ඇල්ලීමේ බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පනවා අය කරනු ලැබිය යුතුය.

ඔට්ටු ඇල්ලීමට පැනවෙන බදු

(2) යම් තැනැත්තකු විසින් -

(අ) තුරඟ තරගයකදී හෝ ඒ කාර්යය සඳහා උපයෝගී කර ගනු ලබන වෙනත් උපක්‍රමයක් නැතහොත් වෙනත් උපකරණයක් සම්බන්ධයෙන් ඔට්ටුවක් ගනු ලැබුවහොත් හෝ තබනු ලැබුවහොත් හෝ

(ආ) තුරඟ තරගයකදී හෝ ඒ කාර්ය සඳහා වූ වෙනත් යම් උපක්‍රමයක් නැතහොත් උපකරණයක් මත යම් ඔට්ටුවක බාර ගනු ලැබුවහොත් හෝ ගනුදෙනු කරනු ලැබුවහොත් ඒ ක්‍රියාත්මකව කර ගෙන ගිය ස්ථානය මේ ප්‍රඥප්තියේ විධි විධාන යටතේ ලියා පදිංචි කළ යම් බලපත්‍ර ලත් ස්ථානයක් වන්නේ නම් මිස, ඒ තැනැත්තා නීති විරෝධීව ඔට්ටු අල්ලන්නෙකු ලෙස සලකනු ලැබිය යුතුය

(3) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහ බලපත්‍ර ලබා ගනු ලැබූ පරිශ්‍රයක් වන්නේ නම් මිස යම් පරිශ්‍රයක අයිතිකරු හෝ එහි පදිංචිකරු විසින් ඒ පරිශ්‍රය ඔට්ටු ඇල්ලීමේ ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. මේ වගන්තියේ (2) වන හෝ (3) වන උප වගන්තිවල විධි විධාන උල්ලංඝණය කරන හෝ ඒ විධි විධාන අනුගමනය කිරීම පැහැර හරින සෑම තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට රු. 1000/=කට නොවැඩි වූ දඩයකට හෝ මාස 6කට නොවැඩි කාලයකට බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

IV වන පරිච්ඡේදය

1 වන කොටස

අරක්කු ඇතුළුව මත්පැන් සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිළට ගැනීම සහ විකිණීම සඳහා බදු සහ බලපත්‍ර ගාස්තු සහ රා මැදීමේ බලපත්‍ර ගාස්තු

13. සුරා බදු අය කළ හැකි යම් භාණ්ඩයක් මුළු පළාත පුරාම හෝ යම් නිශ්චිත ප්‍රදේශයක් හෝ යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා හෝ යම් අවස්ථාවක් සඳහා හෝ යම් නිශ්චිත තැනැත්තන් පන්තියක් සම්බන්ධයෙන් හෝ මේ පරිච්ඡේදයේ විධි විධාන සියල්ලෙන්ම නැතහොත් කිසිවකින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීම අමාත්‍යවරයා විසින් නිවේදනයකින් කළ හැකි අතර එවැනි නිදහස් කිරීමකදී සුදුසුයයි අමාත්‍යවරයා අදහස් කරන කොන්දේසි එයට අදාළ කරනු ලැබිය හැකිය.

සුරාබදු අයකළ හැකි භාණ්ඩ මේ ප්‍රඥප්තියේ විධි විධානවලින් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු බලතල

14. සුරා බදු අය කරනු ලැබිය හැකි යම් භාණ්ඩයක් පිළිවෙලින් සිල්ලරට හෝ තොග වශයෙන් විකිණීමේදී මුළු පළාතම සම්බන්ධයෙන් හෝ යම් නිශ්චිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් සහ මිළට ගන්නන් සම්බන්ධයෙන් පොදුවේ හෝ නැතහොත් යම් නිශ්චිත පන්තියක මිලට ගන්නන් සම්බන්ධයෙන් සහ පොදුවේ නැතහොත් යම් නිශ්චිත අවස්ථාවක් සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ඒ සුරාබදු අය කළ හැකි භාණ්ඩයේ ප්‍රමාණය සීමා කිරීම අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

විකිණීමේ සීමා

15. යුද්ධ හමුදා හෝ නාවික හමුදා නියෝග යටතේ සහ යුද්ධ හමුදා හෝ නාවික නිලධරයන්ගේ අධීක්ෂණයට යටත්ව විවෘත කරනු ලැබ ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් ආපන ශාලාවකට හෝ සාප්පුවකට හෝ තැබෑරුමකට මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් අදාළ නොවන්නේය.

II වන කොටස

පිහිටුවීම සහ පාලනය කිරීම.

16. මේ ප්‍රඥප්තියේ වෙනත් ආකාරයට විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලදී හැර සුරාබද්දු ආදායම එකතු කිරීම පළාතේ ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරස්වරයා භාරයේ තිබිය යුතුය.

සුරාබද්දු ආදායම එකතු කිරීම ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බව

17. (අ) සුරාබද්දු කොමසාරිස්වරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව, ඔහු විසින් සුරාබද්දු දෙපාර්තමේන්තුවේ පාලනය සහ පරිපාලනය දැරීම ද සුරාබද්දු ආදායම් එකතු කිරීමද මේ ප්‍රඥප්තිය යටතේ ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සතු බලතල සහ කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් එවැනි නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සමග සමගාමීව හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකිය.

(ආ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සුරාබද්දු නිලධරයන් පත් කරනු ලැබිය හැකිය.

සුරාබද්දු කොමිෂන් සභාව සහ සුරා බද්දු දෙපාර්තමේන්තුවේ වෙනත් කාර්යාල පත් කිරීම

III වන කොටස

18. අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තිය බල පවත්වන මුළු පළාතම සඳහා හෝ යම් දිස්ත්‍රික්කයක් සඳහා හෝ යම් ප්‍රදේශයක් සඳහා -

(අ) මෙහි වගන්තිවල සඳහන් ක්‍රියා සහ කාර්ය ඉටු කිරීම සඳහා නිලධරයන් හෝ තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය.

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ සුරාබද්දු දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ තනතුරු නාම, බලතල සහ කාර්ය නියම කරනු ලැබිය හැකිය.

(ඇ) මේ වගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ යම් නිලධරයන් වෙත පවරනු ලැබූ බලතල කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් පළාත් ආදායම පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු යයි නියම කරනු ලැබිය හැකිය.

අමාත්‍යවරයාගේ බලතල

19. සුරා බද්දු අය කළ හැකි භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී පොදුවේ මුළු පළාත සඳහාම හෝ යම් ප්‍රදේශයක් සඳහා අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් නියම කරනු ලබන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක භාණ්ඩ, ඒ සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් යටතේ මිස, ප්‍රවාහනය නොකළ යුතුය:

සුරාබද්දු අයකළ හැකි භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර අවශ්‍ය බව

එසේ වුවද ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු නොවන්නා වූ තීරු බදු ගෙවන ලද විදේශ මත්පැන් සම්බන්ධයෙන් එවැනි අවසර පත්‍රයක් අවශ්‍ය නොවන්නේය.

20. (1) සුරා බදු අය කළ හැකි භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා වූ අවසර පත්‍ර සුරා බදු කොමසාරිස්වරයා විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, ඒ අවසර පත්‍ර නිශ්චිත කාල පරිච්ඡේදයක් සහ සුරා බදු අය කළ හැකි නිශ්චිත භාණ්ඩ වර්ග සඳහා පොදු අවසර පත්‍ර හෝ විශේෂ අවස්ථා සහ විශේෂ භාණ්ඩ තොග සඳහා පමණක් වූ විශේෂ අවසර පත්‍ර ලබා ගත හැකිය.

තීරු බදු අයකළ හැකි භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.

(2) මේ වගන්ති යටතේ ප්‍රදානය කරනු ලබන අවසර පත්‍ර අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක අනුසාරයෙන් විය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලබන තැනැත්තන් තම නියමිත තොරතුරු ඒවායේ අඩංගු කළ යුතුය.

<u>IV වන කොටස</u>

<u>සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිළට ගැනීම සහ විකිණීම.</u>

21. සුරාබදු කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලය යටතේ සහ එවැනි බලපත්‍රයක අඩංගු නියමයන් සහ කොන්දේසිවලට යටත්ව මිස -

(අ) රා නිපදවන යම් ගසක් මැදීම නොකළ යුතුය.

(ආ) කිසිවකින් රා ලබා නොගත යුතුය.

(ඇ) රා හැර වෙනත් සුරා බදු අය කළ හැකි භාණ්ඩයක් ගබඩා කිරීම සඳහා කිසිදු තැනැත්තකු විසින් යම් ස්ථානයක ගොඩනැගිල්ලක් හෝ ගබඩාවක් පවත්වා ගෙන යෑම නොකළ යුතු අතර රා හැර වෙනත් එවැනි භාණ්ඩයක් තම සන්තකයෙහි තබා නොගත යුතුය

(ඈ) විකිණීම සඳහා මත්පැන් බෝතල්වල ඇසිරීම නොකළ යුතුය.

රා හැර සුරා බදු අය කළ හැකි වෙනත් භාණ්ඩ බලපත්‍රයක් නොමැතිව ගබඩා නොකළ යුතු බව හෝ රා හැර වෙනත් භාණ්ඩ සඳහා අවසර පත්‍ර නොදිය යුතු බව සහ බලපත්‍ර නොමැතිව රා මැදීමට අවසර නොදිය යුතු බව

22. (1) සිල්ලරට විකිණිය යුතු සීමාව වශයෙන් 14 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන ප්‍රමාණයක් ඉක්මවූ සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩ ප්‍රමාණයක්, තත් කාර්ය සඳහා සුරාබදු කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස, සුරා බදු අය කළ හැකි භාණ්ඩ විකිණීම සඳහා බලපත්‍ර නොලත් කිසිදු තැනැත්තකු විසින් තම සන්තකයේ තබා නොගත යුතුය. සද්භාවයෙන් වූ පෞද්ගලික පරිභරණය හෝ පාවිච්චිය සඳහා එවැනි සුරාබදු අය කළ හැකි භාණ්ඩයක් සන්තකයේ තබා සුරාබදු අය කළ හැකි භාණ්ඩ නියමිත ප්‍රමාණයට වැඩියෙන් ළඟ තබා ගැනීම ගැනීම සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍ර වෙනුවෙන් ගාස්තුවක් අය නොකළ යුතුය.

සුරාබදු අය කළ හැකි භාණ්ඩ නියමිත ප්‍රමාණයට වැඩියෙන් ළඟ තබා ගැනීම

එසේ වුවද පොදු ප්‍රවාහකයෙකුගේ හෝ ගුදම්කරුවෙකුගේ සන්තකයේ තිබෙන නැතහොත් යම් තැනැත්තකු විසින් විකිණීම සඳහා නොව තමන්ගේ සද්භාවයෙන් වූ පෞද්ගලික පරිහරණය සඳහා මිලට ගනු ලබන ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු නොවන යම් විදේශ මත්පැන්වලට මේ වගන්තියේ අඩංගු කිසිවක් ව්‍යාප්ත නොවන්නේය.

තවද එසේ වුවද සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩයක් සම්පූර්ණ පළාත පුරාම හෝ යම් ප්‍රදේශයක යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් පන්තියක් විසින් සැපයීම හෝ තම සන්තකයේ තබා ගැනීම අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබිය හැකිය.

බල පත්‍රයක් නොමැතිව සුරා බදු අය කළ හැකි භාණ්ඩ විකිණීම තහනම් බව

23. සුරා බදු කොමසාරිස්වරයාගෙන් ලබා ගන්නා ලද බල පත්‍රයක් නොමැතිව සුරාබදු අය කළ හැකි කිසිදු භාණ්ඩයක් විකිණීම හෝ විකිණීම සඳහා තබා ගැනීම හෝ ප්‍රදර්ශනය කර තැබීම නොකළ යුතුය.

එසේ වුවද -

(අ) යම් කිසිවකින් රා ලබා ගැනීමේ බලය ඇති යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ රා විකිණීමට බලපත්‍ර ලත් යම් තැනැත්තකු හෝ වෙනත් යම් නීතියක් යටතේ රා වලින් අරක්කු හෝ විනාකිරි නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර ලත් යම් තැනැත්තකුට එකී රා බලපත්‍රයක් නොමැතිව විකුණනු ලැබිය හැකිය.

(ආ) යම් තැනැත්තකු විසින් තමන්ගේ පෞද්ගලික පාවිච්චිය සඳහා නීත්‍යානුකූලව මිලට ගන්නා ලද යම් විදේශ මත්පැන් කිසිවක් තමන් වැඩ කරන ස්ථානය හැර යාම හෝ තමන්ගේ රෝගය සුව වීම හෝ නිසා ඔහු විසින්ම නැතහොත් ඔහු වෙනුවෙන් නැතහොත් ඔහුගේ නියෝජිතයා වෙනුවෙන් ඔහු විසින් කරනු ලබන විකිණීමට හෝ වෙන්දේසියට මේ වගන්තියේ අඩංගු කිසිවක් අදාළ නොවන්නේය.

දේශිය මත්පැන් තොග වශයෙන් හෝ සිල්ලරට සැපයීමේ තනි වරප්‍රසාද

24. සුරාබදු කොමසාරිස්වරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව -

(අ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් කිසිවක් තොග වශයෙන් සැපයීම;

(ආ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම;

(ඇ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් තොග වශයෙන් සැපයීම සහ සිල්ලරට විකිණීම ; සහ

(ඇ) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලින් නියමිත නැතහොත් මේ වගන්ති යටතේ අමාත්‍යවරයාගේ විධාන යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක ප්‍රකාර යම් හෝටලයක, සමාජ ශාලාවක හෝ තැබෑරුමක යම් විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම.

සඳහා වූ තනි වරප්‍රසාදය සුරා බදු කොමසාරිස්වරයා විසින් සුදුසුයයි සලකනු ලබන කොන්දේසි යටතේ සහ එසේ සුදුසු යයි සලකනු ලබන කාලයකට යම් තැනැත්තකු වෙත ප්‍රදානය කරනු ලැබිය හැකිය.

25. රා ලබා ගැනීම සඳහා තනි වරප්‍රසාදය 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කොට ඇති අවස්ථාවකදී එකී බලපත්‍ර ලාභියා විසින් රා ලබා ගැනීම සඳහා දෙනු ලබන ලිඛිත අවසරයක්, 21 වන වගන්තිය යටතේ සුරාබදු කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලයම දරන බව අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකිය .

රා සඳහා වරප්‍රසාද ලත් තැනැත්තා විසින් බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි බව

26. යම් තනි වරප්‍රසාදයක් සඳහා වූ බලපත්‍රලාභියෙකු විසින් තම වරප්‍රසාදය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් මිලයට දීම හෝ පැවරීම, 24 වන වගන්තියේ පනවා ඇති යම් කොන්දේසියකට යටත්ව සහ සුරාබදු කොමසාරිස්වරයාගේ අනුමැතියට යටත්ව, කරනු ලැබිය හැකිය. එසේ නමුත් එවැනි වරප්‍රසාද බදු ලාභියාට හෝ පැවරුම්ලාභියාට බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා යටකී වරප්‍රසාදලාභියා විසින් සුරාබදු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කරනු ලබන තෙක් සහ ඉල්ලුම් කරනු ලැබුවහොත් සහ එහි බදුලාභියා හෝ පැවරුම්ලාභියාට එවැනි බලපත්‍රයක් ලැබුණහොත් හෝ ලැබෙනතුරු එවැනි බදු ලාභියෙකු හෝ පැවරුම්ලාභියෙකු විසින් යටකී වරප්‍රසාදය යටතේ යම් අයිතියක් ක්‍රියාත්මක නොකළ යුතුය.

බලපත්‍ර ලාභියා විසින් තම වරප්‍රසාද කුලියට දීම හෝ පැවරීම කළ හැකි බව

<u>V වන කොටස</u>

<u>සුරාබදු අය කළ හැකි භාණ්ඩ සඳහා බලපත්‍ර බදු</u>

27. (1) සුරා බදු පැනවිය හැකි යම් භාණ්ඩ විකිණීම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කොට ඇත්තේද එවැනි සුරා බදු අය කළ හැකි භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් පළාත් සභාව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයකට හෝ අනුප්‍රමාණවලට අනුකූල වූ (මෙහි මින් මතු බලපත්‍ර බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පළාත් සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් පනවනු ලැබිය හැකිය.

සුරා බදු අයකළ හැකි භාණ්ඩ මත පැනවෙන බලපත්‍ර බද්ද

(2) තදනන්තර යෝජනා සම්මුතියක් මගින් එකී බද්දෙන් නිදහසක් ප්‍රදානය කිරීමේ සහ එකී නිදහස ප්‍රදානය කරනුයේ කවර කොන්දේසි සහ පරිවේෂණ යටතේද යන්න නිශ්චය කිරීමේ බලය ඉහත (1) වන උප වගන්තියේ සඳහන් යෝජනා සම්මුතියටම ඇතුළත් වේ.

බලපත්‍ර

බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම

28. (1) මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරනු ලබන සෑම බලපත්‍රයක්ම හෝ අවසර පත්‍රයක්ම :-

(අ) යම් ගාස්තුවක් වේ නම් ඒ ගාස්තුව ගෙවීම මත ;

(ආ) යම් කාල පරිච්ඡේදයක් සඳහා;

(ඇ) යම් යම් කොන්දේසි වලට සහ සීමා කිරීම් වලට යටත්ව: සහ

(ඇ) නියමිත ආකෘතියට අනුකූලව;

විය යුතු අතර, තත් කාර්ය සඳහා පොදුවේ හෝ යම් විශේෂ අවස්ථාවකට අනුව හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන විස්තර එහි අඩංගු විය යුතුය.

(2) යම් බලපත්‍රයකට හෝ අවසර පත්‍රයකට අදාළ යම් කොන්දේසියක් කඩ කරනු ලැබුවහොත් ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කරන නිලධරයා විසින් ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකිද යන්න සෑම බලපත්‍රයක්ම හෝ අවසර පත්‍රයකම ඇතුළත් කොන්දේසියක් විය යුතුය.

බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ බලය

29. (1) මේ ප්‍රඥප්තිය යටතේ යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කළ නිලධරයා විසින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සීමා කිරීම්වලට යටත්ව යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් පහත සඳහන් අවස්ථාවලදී අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකිය. :-

(අ) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය දරන්නා විසින් ගෙවිය යුතු ගාස්තුව යථා පරිදි නොගෙවනු ලැබුවහොත්;

(ආ) එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් හෝ ඔහුගේ සේවකයෙක් විසින් හෝ ඔහුගේ ප්‍රකාශිතවම එසේ නැතහොත් ව්‍යංග අවසරය පිට ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ නියමයන් සහ කොන්දේසි අතුරින් කිසිවක් කඩ කරනු ලැබුවහොත්;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ තනි වරප්‍රසාදයක් දරන තැනැත්තකු විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ විට

,

(2) මේ වගන්තිය යටතේ යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් යම් වන්දි මුදලක් ලබා ගැනීමට හෝ එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය සම්බන්ධයෙන් ගෙවා ඇති හෝ ඇප වශයෙන් තබා ඇති යම් මුදල් ආපසු ඉල්ලා සිටීමට අයිතියක් බලපත්‍රයට හෝ අවසර පත්‍රය දරන්නා සතු නොවේ.

අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය යුතු බව

30. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි අතර, එකී රීති සාදනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් මූල වෙනස් කිරීම් සහිතව හෝ රහිතව පළාත් සභාවේ යෝජනා සම්මුතියක් මගින් අනුමත කොට ඒ අනුමත කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ තත් කාර්ය සඳහා නියම කරනු ලැබූ දිනයක සිට හෝ ඒ නීති වලංගුව බල පවත්වන්නේය.

(2) විශේෂයෙන්ම සහ, ඉහත සඳහන් විධිවිධානවල සාමාන්‍යත්වයට අගතියකින් තොරව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකිය :-

(අ) නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ සුරාබදු කොමසාරිස්වරයාගේ බලතල කිසිවක් පැවරීම විධිමත් කරමින්;

(ආ) සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලතල සහ කාර්ය නියම කරමින්:

(ඇ) නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ සුරාබදු කොමසාරිස්වරයාගේ නියමයකට එරෙහිව අභියාචන ඉදිරිපත් කිරීමේ පරිපාටිය නියම කරමින්:
(ඈ) සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩයක් ප්‍රවාහනය කිරීම විධිමත් කරමින්:

(ඉ) පහත දැක්වෙන දෑ ඇතුළුව, සුරා බදු අය කළ හැකි යම් භාණ්ඩයක් බෝතල්වල ඇසිරීම, සැපයීම හෝ ගබඩා කිරීම විධිමත් කරමින් -

(I) එවැනි භාණ්ඩයක් බෝතල්වල අසුරන, සපයන හෝ ගබඩා කරන යම් ස්ථානයක් සහ එහි භාවිත කැරෙන උපකරණ හා මෙවලම් පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.

(II) රා නිපදවන ගස් මැදීම සහ එවැනි ගස්වලින් රා ලබා ගැනීම.

(ඊ) සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩයක් ගුදමක තැන්පත් කිරීම සහ ඒ භාණ්ඩ එතැනින් ඉවත් කිරීම විධිමත් කරමින්:

(උ) සුරාබදු අයකළ හැකි යම් භාණ්ඩයක් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ඒවා අදාළ වන කාලපරිච්ඡේද සහ ප්‍රදේශ නියම කරමින්:

(ඌ) යම් ප්‍රදේශයක එවැනි භාණ්ඩ විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ නිශ්චය කොට සොයා දැනගත යුතු කරුණු කවරේදැයි නියම කරමින්:

(එ) සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩයක් මත පැනවිය යුතු බලපත්‍ර බද්ද නියම කරමින්:

(ඒ) සුරාබදු අය කළ හැකි යම් භාණ්ඩයක් ගබඩා කිරීම සම්බන්ධයෙන් වූ යම් වරප්‍රසාදයක්, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තු පරිමාණය හෝ ගාස්තු නියම කළ යුතු ආකාරය නියම කරමින්:

(ඔ) යම් ගාස්තුවක් හෝ බද්දක් ගෙවිය යුතු කාලය, ස්ථානය සහ ආකාරය විධිමත් කරමින්:

VI වන කොටස

මෝටර් වාහන බලපත්‍ර සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම.

ආදායම් බලපත්‍රයක් නොමැතිව මෝටර් වාහනයක් සන්තකයේ තබා නොගත යුතු බව

31. (1) පළාත තුළ සාමාන්‍යයෙන් පදිංචි යම් තැනැත්තකු විසින් මෝටර් වාහනයක් තමන් සන්තකයේ තබා ගැනීමේදී හෝ පාවිච්චි කිරීමේදී, පළාතේ මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ වාහනය ලියාපදිංචි කර ඇත්නම් සහ ඒ වාහනයේ සන්තකය දරන තැනැත්තා ලියාපදිංචි කර ඇත්නම් ද ඒ වාහනය සඳහා වලංගුව බල පවත්නා ආදායම් බලපත්‍රයක් ලබා ගෙන ඇත්නම් මිස, එවැනි කිසිදු තැනැත්තෙකු විසින් එවැනි වාහනයක සන්තකය දැරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

(2) ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, යම් මෝටර් රථයක තත් කාලයේ අයිතිකරු ලෙස ලියාපදිංචි කර ඇති තැනැත්තා මෝටර් වාහනයේ සන්තකය දරන තැනැත්තා හැටියට සලකනු ලැබේ.

(3) සාමාන්‍යයෙන් පළාත තුළ පදිංචිය නොදරන කිසිදු තැනැත්තකු විසින්, තමා පදිංචි වී සිටින පළාතේ නිසි බලධරයා විසින් ලියාපදිංචි කරනු ලැබූ ද, බලපත්‍ර නිකුත් කරනු ලැබූ ද, මෝටර් වාහනයක් නොවන මෝටර් වාහනයක සන්තකය පළාත තුළදී දැරීම හෝ එවැනි මෝටර් වාහනයක් පළාත තුළ පාවිච්චි කිරීම නොකළ යුතුය.

(4) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි වූ දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේය.

32. (1) මෝටර් වාහන ලියාපදිංචි කිරීමට සහ මෝටර් වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් වෙනත් දේ අතර, පහත දැක්වෙන කරුණු සඳහා විධි විධාන සලස්වනු ලැබිය හැකිය.:-

(අ) යම් පන්තියකට හෝ වර්ගයකට අයත් මෝටර් වාහන වල ගෙන යා හැකි තැනැත්තන් සංඛ්‍යාව විධිමත් කිරීම සහ එවැනි මෝටර් වාහන වල තත්ත්වය කලින් කල පරීක්ෂා කර බැලීම.

(ආ) වාහනයක ගෙන යා හැකි බඩුවල බර ප්‍රමාණය, ඒ බඩු පැටවිය යුත්තේ කොපමණ උසකට සහ කොපමණ පළලට සිටින සේ ද යන්න සහ වාහනයේ සම්පූර්ණ දිග ප්‍රමාණය කෙතෙක් විය යුතු ද යන්න පිළිබඳ සීමා නියම කිරීම.

(ඇ) වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර නිකුත් කරනු ලැබූ වාහන යෙදවිය යුතු කාර්ය කවරේද යන්න ලියා පදිංචි කිරීම.

(ඈ) ලියාපදිංචි කරන ලද වාහනවලින් ප්‍රවාහනය කරනු ලබන මගීන්ගේ සහ මහජනයාගේ ආරක්ෂාව සහ සැප පහසුවද එවැනි වාහනවලින් ප්‍රවාහනය කරනු ලබන බඩුවලද ආරක්ෂාව සැලසීම පිණිස වෙනත් කවර වුවද කාර්යයක් සඳහා:

(ඉ) බලපත්‍ර අවලංගු කරනු ලැබිය හැක්කේ කවර තත්ත්වයක් යටතේ ද යන්න:

(3) සාදනු ලැබූ, වෙනස් කරනු ලැබූ හෝ සංශෝධනය කරනු ලැබූ නියෝග ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු අතර, ඒවා ඉන් පසු මෙහිලා ඒකාබද්ධ කරනු ලැබූ පරිද්දෙන් නීත්‍යානුකූල සහ බල සහිත වන්නේය. තවද ඉන්පසු ඒ නියෝග පිළිබඳව අධිකරණමය සැලකිල්ල දක්වනු ලැබිය යුතුය.

(4) එවැනි සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළතදී පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, කෙසේ වුවද එකී ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු මාස 03ක් ඉකුත් වීමට පෙර අනුමැතිය

සඳහා එය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සභාව වෙත නියෝග ඉදිරිපත් කිරීමෙන් පසු පැවැත්වෙන පළමුවන රැස්වීමේදීම සභාව විසින් යම් නියෝගයක් අනුමත කරනු නොලැබුවහොත් එය අනුමත කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර සියළු කාර්ය සඳහා එය වලංගු සහ බල සහිත නියෝගයක් වන්නේය.

අධිකරණය විසින් පනවනු ලබන දඩ

අධිකරණය විසින් පනවනු ලබන දඩ

33. (1) පළාත තුළ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් යම් ප්‍රඥප්තියක් යටතේ හෝ පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියක් යටතේ පනවනු ලැබූ යම් දඩයක්, ඒ අධිකරණයේ විධිවිධානවලට යටත්ව, පළාතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(2) පළාත් පාලන ආයතනයක් පිහිටුවමින් පාර්ලිමේන්තුව විසින් සාදනු ලැබූ නීතියක් වන්නා වූද, ඒ නීතියේ විධිවිධාන හෝ ඒ නීතිය යටතේ සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා හෝ කඩ කිරීම් සම්බන්ධයෙන් පනවනු ලබන දඩයක් ඒ නීතිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු බවට විශේෂ විධිවිධානයක් ඒ නීතියේ අඩංගු වී ඇත්තා වූ ද, යම් නීතියක් යටතේ අධිකරණයක් විසින් පනවනු ලබන දඩයකට (1) වන උප වගන්තියේ විධි විධාන අදාළ නොවන්නේය.

ඉඩම් ගොඩනැගිලි සම්බන්ධ බදු.

ඉඩම් සහ ගොඩනැගිලි බදු

34. (1) රජයේ දේපළ ද ඇතුළුව, පළාත තුළ පිහිටි ඉඩම්වල සහ ගොඩනැගිලිවල වටිනාකම මත, පළාත් සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණය කරනු ලබන අනුප්‍රමාණය අනුව වූ බද්දක් එවැනි යෝජනාවක් මගින් පළාත් සභාව විසින් පනවනු ලැබිය හැකිය.

(2) එකී බද්දෙන් නිදහස් කෙරෙන ඉඩම් ද ගොඩනැගිලි සහ දේපළ කිසිවක් ඇත්නම් ඒවා කවරේදැයි එකී යෝජනා සම්මුතියේම නිශ්චිතව දැක්විය යුතුය.

රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාදනය කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාදනය කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

35. (1) රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාදනය කරනු ලැබූ ද, පළාත තුළ පිහිටියා වූ ද, ඉඩම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

මුද්දර ගාස්තු සහ අධිකරණ ගාස්තු

36. (1) පළාත තුළ පිහිටි ඉඩම් ඇතුළු දේපළ පැවරීම මත ගෙවිය යුතු මුද්දර ගාස්තු පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය. මුද්දර ගාස්තු සහ අධිකරණ ගාස්තු

(2) පළාත තුළ යම් මෝටර් වාහනයක් අයිතිය පවරා දීම මත ගෙවිය යුතු මුද්දර ගාස්තු පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(3) පළාත තුළ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ද ඇතුළුව ගෙවිය යුතු අධිකරණ ගාස්තු, ඒවා අය කර ගන්නා අධිකරණය විසින් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

වන සත්ත්ව වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත යටතේ ගෙවනු ලබන ගාස්තු

37. (1) වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් ජාතික රක්ෂිත ප්‍රදේශයක ජාතික වනෝද්‍යානයක, අන්තර් කලාපයක සම්පූර්ණයෙන්ම හෝ එවැන්නක යම් කොටසක් හෝ පළාත තුළ පිහිටුවා ඇති අවස්ථාවකදී, නියමිත ගාස්තු ගෙවා නියමිත නිලධරයන්ගෙන් අදාළ පරිදි ලබා ගන්නා ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක බලය යටතේ මිස, පළාත තුළ පිහිටි ඒ රක්ෂිත ප්‍රදේශය, වනෝද්‍යානය හෝ ආරක්ෂිත කලාපයට නැතහොත් ඉන් කොටසකට අයිති කිසිදු තැනැත්තෙකුට ඇතුළ්වීමට හෝ රැඳී සිටීම නොකරනු ලැබිය යුතුය. වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත යටතේ ගෙවනු ලබන ගාස්තු

(2) ඒ ආඥා පනතේ 4,5, 12, 13, 42 සහ 43 වන වගන්තිවල විධිවිධාන මේ ප්‍රඥප්තියේම කොටසක් වූ පරිද්දෙන් කියවා තේරුම් ගත යුතු අතර, යටකී බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී ඒ විධි විධාන අදාළ වන්නේය. තවද එකී විධි විධාන අවස්ථාවෝචිත පරිදි කිරීමේදී එහි සඳහන් නිලධරයන් යන්නෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ පළාතේ නියමිත නිලධරයන් අදහස් වන අතර, නියමිත ගාස්තුව යන්නෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ ගාස්තු ද අදහස් වේ.

වාර වාර්තා

38. (1) පළාතේ ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ යම් තක්සේරුකරුවකු විසින් ලිඛිත දැන්වීමක් යම් තැනැත්තකු වෙත යවමින්, ඒ තැනැත්තාගෙන් අය විය යුතු යම් බද්දක් තීරු බද්දක් හෝ ගාස්තුවක් සම්බන්ධයෙන් යම් වාර වාර්තාවක් තත් කාර්ය සඳහා නියමිත ආකෘතිය මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය තුළදී සපයන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය. වාර වාර්තා සහ තොරතුරු සැපයිය යුතු බව

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බදු, තීරු බදු හෝ ගාස්තු ගෙවිය යුතු යම් තැනැත්තකුට වාර වාර්තාවක් සපයන ලෙස 1 වන උප වගන්තිය යටතේ නියම කර නොමැති අවස්ථාවකදී ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දින සිට දින 14ක් ගත වූවාට පසු, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්ද, තීරු බද්ද හෝ ගාස්තුව සඳහන් කරමින් වාර වාර්තාවක් ඔහු විසින් සපයනු ලැබිය යුතුය.

(3) එවැනි වාර වාර්තාවකට අදාළ වැඩිදුරටත් වූ විස්තර සපයන ලෙස නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තක්සේරුකරුවකු විසින් දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තාගේ ව්‍යාපාරයට අදාළ පොත්, වාර්තා සහ ලදුපත් ඉදිරිපත් කරන ලෙස තදනන්තර දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

39. මේ වගන්තිය යටතේ යවන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දහසකට නොවැඩි දඩයකට ඒ තැනැත්තා යටත් වන්නේය.

<u>V වන පරිච්ඡේදය</u>

<u>බදු ගාස්තු</u>

40. යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු බද්ද ඒ කාර්තුව අවසාන වී එළඹෙන මාසයේ 15 වන දිනට පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ නොගෙවනු ලැබූ යම් බද්දක් පැහැර හරින ලද බද්දක් සේ සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවිය යුතු තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු වන අවස්ථාවක ඒ එක් එක් තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බදු ගෙවීම පැහැර හැරිය තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතුය. බදු ගාස්තු

එසේ වුවද යම් ව්‍යාපාරයක යම් පූර්ව කාර්තුවක පිරිවැටුම් බද්ද රුපියල් පනස් ලක්ෂය ඉක්මවන අවස්ථාවකදී ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු බද්ද පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) පෙරාතුවම වූ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන්, තුනෙන් එක් පංගුවක් ඊළඟට එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය.

(ආ) පෙරාතුවම වූ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එක් පංගුවක් ඊළඟට එළඹෙන කාර්තුවේ තුන්වන මාසයේ 15 වන දින දී හෝ ඊට පෙර ගෙවිය යුතුය.

(ඇ) ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන්, ඉහත (අ) වන සහ (ආ) වන ඡේද යටතේ ගෙවන ලද මුදල් ප්‍රමාණ අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ඒ කාර්තුවේ අවසානයට පසු එළඹෙන මාසයේ පහළොස්වන දින පසු වීමට පෙර ගෙවිය යුතුය.

එසේ නොගෙවනු ලැබූ යම් බද්දක් ගෙවීම පැහැර හැරි බද්දක් සේ සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එක් තැනැත්තකු විසින් ගෙවිය යුතු අවස්ථාවකදී ඒ තැනැත්තා හෝ එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවනු ලැබිය යුතු අවස්ථාවකදී ඒ එක් එක් තැනැත්තා සහ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බදු ගෙවීම පැහැර හැරි තැනැත්තෙක් ලෙස සලකනු ලැබේ.

41. (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති විටක, එසේ පැහැර හැර ඇති තැනැත්තා විසින් පැහැර හැරි බද්දට අමතරව දඩ වශයෙන් පහත දැක්වෙන ගෙවීම කළ යුතුය. පැහැර හැර ඇති බදු

(අ) පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් :

සහ

(ආ) යම් බද්දක් ගෙවීමට පැහැර හැරීම ආරම්භ වී ඇත්තේ කවර මාසයකදී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර එසේ පැහැර හැර ඇති මුදල නොගෙවනු ලබන අවස්ථාවකදී ඒ පැහැර හැරීම පැවතියදී ඊට පසු එළඹෙන එක් එක් මාසයේ පහළොස්වන දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය හෝ ඒ කාලපරිච්ඡේදයෙන් කොටසක් සඳහා පැහැර හැර ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිදුරටත් වූ මුදලක්.

VI වන පරිච්ඡේදය

තක්සේරු කිරීම

42. (1) තක්සේරුකරුවකුගේ මතය අනුව, බදු අය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු, 38 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සැපයිය යුතු වාර වාර්තාවක් සැපයීම පැහැර හැරියහොත්, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණේ යයි තක්සේරුකරු නිගමනය කරන බද්දක ප්‍රමාණය තක්සේරුකරු නිගමනය කරන බද්දක ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය යුතු අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ලිඛිත දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කළ යුතුය. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු තක්සේරු කිරීම

සම්බන්ධයෙන් එසේ තක්සේරු කරනු ලැබූ බදු මුදල, 46 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු ප්‍රමාණය වශයෙන් සලකනු ලැබිය යුතුය.

එසේ වුවද, යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ, ආදායම ආරක්ෂා කිරීම සඳහා, (7) වන වගන්තියෙන් නියමිත කාලයට කලින් කොමසාරිස්වරයා වෙත බදු ගෙවන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම ප්‍රඥාගෝචර බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවකදී යම් කාර්තුවක් අවසාන වීමෙන් පසු එළඹෙන පසලොස්වක දිනයට පෙර කවර වේලාවකදී වුවද ඒ කාර්තු සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කිරීම තක්සේරුකරු විසින් කරනු ලැබිය හැකිය. එසේ ගෙවනු නොලබන යම් බද්දක් ඒ කාර්තුව සඳහා පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ තක්සේරුවත්, ඒ තැනැත්තාගෙන් ඒ කාර්තුව සඳහා අය විය යුතු බදු ප්‍රමාණය පරිද්දෙන්, 8 වන වගන්තිය යටතේ වූ දඩයක් ගෙවීමට ඒ තැනැත්තා යටත්ව ඇති බැඳීමක් කෙරෙහි බල නොපාන්නේය.

(3) යම් කාර්තුවක් සඳහා වූ වාර වාර්තාවක් 38 වන වගන්තිය යටතේ සැපයීම පැහැර හැරියාවූ යම් තැනැත්තකු විසින් ඒ කාර්තුව සඳහා බදු වශයෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතුව තිබුණු සැබෑ බදු ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවකදී, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු මුදල් ප්‍රමාණය, තක්සේරුකරුගේ නිගමනයට අනුව, තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් යවමින්, එසේ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය අතර ඇති වෙනස ඒ දැන්වීමෙහි සඳහන් දිනදී හෝ ඊට පෙර ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතුය.

(4) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා (3) වන උප වගන්තිය යටතේ ඇස්තමේන්තුවක් කර ඇති අවස්ථාවකදී, එසේ ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රමාණය සහ පිරිවැටුම් බදු වශයෙන් ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවා ඇති මුදල් ප්‍රමාණයද අතර ඇති වෙනස, ඒ කාර්තුව සඳහා ගෙවීම පැහැර හැර ඇති බදු ප්‍රමාණය වශයෙන් සැලකිය යුතු අතර, ඒ අනුව, 41 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේවූ දඩයට ඒ තැනැත්තා යටත් වන්නේය.

43. (1) බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින් යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු නියමිත බද්දට හෝ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු බද්දට හෝ වඩා අඩු මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවා ඇති අවස්ථාවකදී, තක්සේරුකරුගේ නිගමනයට අනුව, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු අමතර මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් කවර වේලාවක වුවද තක්සේරුකරු විසින් ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකිය. තවද තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට තක්සේරු දැන්වීමක් බාර දිය යුතුය.

අය විය යුතු මුදලට වඩා අඩු ස්වයං තක්සේරු

(2) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, (1) වන උප වගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක එසේ තක්සේරු කරන ලද මුදල ඒ කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 40 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක දී එදින සිට ඒ තැනැත්තා 41 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

44. යම් තැනැත්තකු විසින් 38 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් වාර්තාව පිළිනොගැනීමට හේතු නැතහොත් තැපෑලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැක්විය යුතුය.

<u>VII වන පරිච්ඡේදය</u>

45. (1) මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් කරන ලද යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩනයක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තා අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම බාර දීමේ දිනයට පසු දින තිහක් ඇතුළත ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට විරුද්ධව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකිය. අභියාචනය කරනු ලැබුවද මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතුය. ඒ අභියාචනය තීරණය කරනු ලබන තෙක් පිරිවැටුම් බද්ද හෝ එහි යම් කොටසක්, හෝ ගෙවීම කල් තබනු ලැබිය යුතු බවට කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින්

කොමසාරිස් වෙත කරනු ලබන අභියාචනා

හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතුය. ඒ නියමය කරනු ලැබූ විට කල් තබනු ලැබූ පිරිවැටුම් බද්දෙහි මුදල හෝ එකී කොටස් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතුය.

එසේ වුවද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා අභියාචකට ඒ කාල සීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස්වරයා සෑහීමකට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට විරුද්ධවද, ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද විටෙක නිසියාකාරව පිළියෙල කරන ලද වාර්තාවක් සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතුය.

(4) (2) වන සහ (3) වන උප වගන්තිවල විධිවිධාන වලට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක්ම වලංගු නොවිය යුතුය.

(5) වලංගු අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස්වරයා විසින් තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේදී එකඟවීමකට එළඹුණහොත් තක්සේරුව අවශ්‍ය පරිදි සකස් කර ගත යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචන සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස්වරයා විසින් නියම කළ යුතුය.

(7) සෑම අභියාචකයෙකුම, අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. පුද්ගලික හෝ බලය ලත් නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන විභාගයට පෙනී සිටිය හැකිය. අභියාචනයක විභාගය අඩාලව කල් තැබීම සුදුසුයයි කොමසාරිස්වරයා කල්පනා කරන්නේ නම්, තමා විසින් නියම කරනු ලබන වේලාවකදී සහ ස්ථානයකදී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය කලින් කල අඩාලව කල් තැබිය හැකිය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයෙකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස්වරයා විසින් අඩාලව කල් තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන්නේ නම්, අඩාලව කල්තැබූ විභාගයක් සඳහා

හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත්, නැතහොත් පුද්ගලිකව පැමිණ සිටීමට කොමසාරිස්වරයා විසින් අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකිය.

එසේ වුවද, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචනයේ විභාගයේදී හෝ අඩාලව කල් තැබූ යම් අභියාචනයක විභාගයකදී ඔහු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වලක්වනු ලැබූ හෝ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුරභාවය හෝ වෙනත් නොවැලැක්විය හැකි හේතුවක් නිසා බවට කොමසාරිස්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස්වරයා විසින් යටකී නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට, අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකිය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමෙහි බලය කොමසාරිස්වරයාට ඇති අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන්ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකිය.

(9) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස්වරයා විසින් එසේ කිරීම අවශ්‍ය යයි සලකතහොත්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූද, එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූද, යම් ඔප්පු, පිඹුරු සාධන පත්‍ර පොත්, ගිණුම් වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු ලේඛන, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස්වරයා වෙත එවන ලෙස හෝ එම තැනැත්තාට නියම කළ හැකිය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස්වරයා විසින් කළ යුතුය.

(11) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේදී, අභියාචනා කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධවද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීම අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකිය.

(12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කරනු ලැබීම මත හෝ කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ නියමයන් මත (1) වන උප වගන්තිය යටතේ කල් තබනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක හෝ, මුල් තක්සේරුවෙන් අය කරනු ලැබූ පිරිවැටුම් බද්ද වැඩි කරනු ලැබූ අවස්ථාවක, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දෙහි ශේෂය ගෙවිය යුත්තේ යම් දිනයකදී නැතහොත් ඊට පෙරද, ඒ දිනය නියම කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් අභියාචකට දෙනු ලැබිය යුතුය. එසේ ගෙවනු නොලැබූ යම් පිරිවැටුම් බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(13) යම් තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කර ඇත්තා වූ අවස්ථාවක සහ තක්සේරුව පිළිබඳ දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් ගෙවීම (1) වන උප වගන්තිය යටතේ කල්තබා ඇත්තාවූ අවස්ථාවක, ඒ අභියාචනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් අතරතුර හෝ ඒ අභියාචනය විභාග කිරීමේදී ඒ තක්සේරුව සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් යම් මුදලක් ගෙවිය යුතු බවට හෝ ගෙවිය යුතු විය හැකි බවට අභියාචක එකඟ වෙතොත්, කොමසාරිස්වරයා විසින් අභියාචකට දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් දින හෝ ඊට පෙර ඒ මුදල ගෙවීමට විධාන කරනු ලැබිය හැකිය. එසේ ගෙවනු නොලැබුවාවූ යම් මුදලක් පැහැර හරිනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය.

46. 45 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවනු ලැබූ සමාලෝචන මණ්ඩලය වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය වෙත කරනු ලැබුණ අභියාචනයට අදාළ ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වන අභියාචනයකට අදාළ විය යුතුය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කිරීම

47. (1) සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය. එසේ වුවද, අභියාචනාධිකරණයේ මතය සඳහා නීති ප්‍රශ්නයක් ගැන කරුණු සැල කිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක හෝ කොමසාරිස්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

(2) අභියාචනාධිකරණය වෙත හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අදාළ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වූ අභියාචනයකට අදාළ විය යුතුය.

I/III වන පරිච්ඡේදය

තක්සේරුවල නිශ්චිතභාවය සහ වැරදි වාර්තා සඳහා දඬුවම්.

48. පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ ප්‍රඥප්තියේ නියමිත කාල සීමාව තුළම වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 45 (5) වන වගන්තිය යටතේ එකඟ වී ඇති අවස්ථාවක, හෝ අභියාචනයේදී නිශ්චය කරනු ලැබ, ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ එකඟවන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියළු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

එකඟ වී ඇති තක්සේරුව හෝ අභියාචනයේ තීරණය අවසානාත්මක බව

එසේ වුවද, යම් කාර්තුවක් සඳහා අභියාචනයේදී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම්, ඒ කාර්තුව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙහිලා තක්සේරුකරු - වෙකු මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් නිසා නොවැලැක්වෙන්නේය.

49. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකදී, පිරිවැටුම් බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම මත අයවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස ඔහු විසින් එවකටත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූද, තක්සේරුව 48 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නාවූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේදී හෝ ඒ පිරිවැටුම සම්බන්ධ පිරිවැටුම් බදු අනුප්‍රමාණය අදාළ කිරීමේදී හෝ වංචාවක් හෝ ඕනෑකමින්ම පැහැර හැරීමක් සිදුකර නොමැති බව කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙළ කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුම සාවද්‍ය පිරිවැටුම් බදු අනුප්‍රමාණයක් අදාළ කිරීම සඳහා දන්ඩණය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් පෙන්නුම් කරන මුළු පිරිවැටුම් බද්ද සහ වාර්තාව මත ගෙවනු ලැබූ පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක්ද ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකිය.

ගෙවන ලද මුදලට වඩා බද්ද වැඩිවන අවස්ථාවකදී, වංචාවක් නොමැති විටක, කොමසාරිස්වරයා විසින් දණ්ඩනයක් නියම කළ හැකි බව

IX වන පරිච්ඡේදය.

විශේෂ අවස්ථා.

50. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නිශ්චිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අගත්‍යතාවයට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍යතාවයට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

අගත්‍යතාවට පත් තැනැත්තකුගේ භාරකරු

51. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු වගකිව යුතු බව

එසේ වුවද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැනුම් දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ කොටස්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතුය.

52. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියළු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

සමාගමක් සම්බන්ධයෙන් වනවිට, ලේකම්, අධ්‍යක්ෂ යනාදීන් වගකිව යුතු බව

එසේ වුවද, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ ප්‍රඥප්තිය යටතේ දැන්වීමක් හෝ දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ සිටින අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතුය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකුම ඒ වරද කර ඇත්තේ තමාගේ අනු දැනුම නොමැති බව සහ එම තනතුරේ තම කර්තව්‍ය වල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියළු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැලැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියළු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

53. පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු යම් ව්‍යාපාරයක් යම් තැනැත්කු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජක වශයෙන් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙහි පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකළ යුතුව තිබුණු ආකාරයටම සහ ප්‍රමාණයටම වූ පිරිවැටුම් බද්දක් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන් අය කර ගත යුතුය

අනුයෝජිතයා සහ ප්‍රධානියා සතු වගකීම

54. තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙන් හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ ප්‍රඥප්තිය යටතේ ඔවුන්ගෙන් අය කළ හැකි වන පිරිවැටුම් බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකි වන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට ඔවුහු යටත් වෙති.

භාරයක භාරකරුවන් හෝ මිය ගිය තැනැත්තකුගේ පොල්මෑකරුවන් ඒකාබද්ධව යටත්වන බව

55. (1) සමාගම් ආඥා පනතේ කුමක් සඳහන් වුවද, සමාගමක් ඇවර කර වසා දමන අවස්ථාවකදී, ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අය කර ගත නොහැකි වූවිටක, බද්ද අයකර ගනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන්ද, ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකුව සිටි සෑම තැනැත්තකුම, බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක් ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අය කර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

සමාගමක් ඇවර කිරීමේදී අධ්‍යක්ෂවරුන් වගකිව යුතු බව

(2) පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලබන අවස්ථාවකදී ඒ පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අය කර ගත නොහැකි වූ විටක බද්ද අයකරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන්ද ඒ කාලසීමාව තුළ ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකු වූ සෑම තැනැත්තකුම බද්ද ගෙවීම පැහැර හැරීම ඒ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක් ව්‍යතිරේඛ ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතුවන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අය කර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

56. (1) පිරිවැටුම් බද්ද අය කරගනු ලැබිය හැකිවූ තැනැත්තකු, ඒ බද්ද අය කළ හැකි වනුයේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්ද ඒ ව්‍යාපාරය යම් කාර්තුවක් සඳහා පැවතී යන අතර අවසන් කරන අවස්ථාවක, ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණද, ඒ කාර්තුව තුළදී ඔහු ඒ ව්‍යාපාරය පවත්වාගෙන ගිය කාල සීමාව සඳහා මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටින්නේය.

ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේදී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම

(2) යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ අවස්ථාවක ඒ පැවරුමට පෙරාතුව වූ කාලසීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ පිරිවැටුම් බද්ද පැවරුම්කරුගෙන් අයකර ගත නොහැකිනම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණද පැවරුම්ලාභීන්ගෙන් එය අයකර ගත හැකි වන අතර, පිරිවැටුම් බද්ද එකතු කිරීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

තැනැත්තකු මිය ගිය විට පිරිවැටුම් බද්ද ගෙවීමට පොල්මඃකරුවන් යටත් බව

57. පිරිවැටුම් බද්ද අය කළ හැකි වූ යම් තැනැත්තකු මිය ගිය අවස්ථාවක ඒ තැනැත්තාගේ මරණය සිදු වීමට පෙරාතුව වූ සියළුම කාලසීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් අයකළ හැකිවූ පිරිවැටුම් බද්ද ඒ තැනැත්තාගේ පොල්මඃකරුගෙන් අයකරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් මේ ප්‍රඥප්තිය යටතේ වගකිව යුතු වූ සියළු ක්‍රියා, කාරණා හා දේවල් සම්බන්ධයෙන් ඒ පොල්මඃකරු වගකිව යුතුය.

එසේ වුවද, -

(අ) මිය ගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මඃකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතුය.

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදුවී දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් මරණය සිදු වූ කාර්තුවේ අවසානයේ සිට තුන් අවුරුද්දකට පසුව කරනු නොලැබිය යුතුය; තවද,

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මඃකරුගේ වගකීම -

(I) මේ වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට පොල්මඃකරුට දැන්වීම දෙනු ලබන දිනය වනවිට ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවති මියගිය තැනැත්තාගේ බූදලයේ ප්‍රමාණයට; සහ

(II) අර්ථලාභියෙකු අතට පත්ව තිබිය හැකි ඒ බූදලයේ යම් කොටසකට ප්‍රමාණයට සීමා විය යුතුය.

(2) පොල්මඃකරුවෙකු විසින් මිය ගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් ඒ බූදලයේ කොටසක් වන යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් අයකර ගත හැකිව තිබුණු පිරිවැටුම් බද්ද, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ පොල්මඃකරුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

58. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙහි ප්‍රමාණය අඩු කරන්නා වූ හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් කෘතිමබව හෝ ව්‍යාජබව සහ යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන්ම, ක්‍රියාත්මක කරනු නොලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඔහු විසින් නොසලකා හැරිය හැකි අතර, ඒ අනුව ඒ ගනුදෙනුවට හෝ බැහැර කිරීමට අදාළ පාර්ශවයන් තක්සේරු කළ හැකිය.

ඇතැම් අවස්ථාවලදී තක්සේරුකරු විසින් තම අභිමතය පාවිච්චි කළ හැකි බව

මේ වගන්තියෙහි "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක් හෝ සැකැස්මක් ඇතුළත් වේ.

X වන පරිච්ඡේදය.

බදු අයකර ගැනීම.

59. (1) 29 වන වගන්තියේ, 30 වන වගන්තියේ, 31 වන වගන්තියේ, 32 වන වගන්තියේ, 33 වන වගන්තියේ, 34 වන වගන්තියේ, 35 වන වගන්තියේ සහ 36 වන වගන්තියේ කාර්යය සඳහා "පිරිවැටුම් බද්ද" යන්නට මේ පනත යටතේ පනවන ලද හෝ දරන ලද යම් දණ්ඩනයක් ඇතුළත් වේ.

(2) 31 වන වගන්තිය හෝ 32 වන වගන්තිය යටතේ සහතිකයක් හෝ 34 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන කවර හෝ අවස්ථාවක, පැහැර හැරිය තැනැත්තා වෙත ඒ වේලාවෙහිම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව බාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හැරිය තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවන්නේය.

60. ගෙවීම් පැහැර හරිනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් එය පැහැර හරින්නාගේ සියළු වත්කම් විෂයයෙහි ප්‍රථම වැය බරක් විය යුතුය.

පිරිවැටුම් බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව.

එසේ වුවද -

(I) 34 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හරින්නා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිළදී ගන්නකුට විකුණන ලද යම් වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතුය. නැතහොත් බල නොපෑ යුතුය.

(II) නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ විට, දේපල තහනම් කරනු ලැබූ දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව, ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් පිරිවැටුම් බද්දට නොලැබිය යුතුය; තවද,

(III) වංචල දේපල සම්බන්ධයෙන් වූ විට, කාර්තු හතරක කාලයක් සඳහා පිරිවැටුම් බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක කොමසාරිස්වරයා විසින් තෝරාගත යුතු කාර්තු හතරක් පමණක් සඳහා වූ බදුවලට පැහැර හැරීමේ දිනයට පෙර වට්නාකම සඳහා සද්භාවයෙන් ඇතිකර ගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතුය.

පැහැර හරින්නා වෙත කරනු ලබන දැන්වීම

61. (1) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාව කොමසාරිස්වරයා විසින් ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට පෙර

(අ) ඒ බද්දේ විස්තර; සහ

(ආ) ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතුය.

(2) පැහැර හරිනු ලැබ ඇති පිරිවැටුම් බද්ද වූ කලී පැහැර හරින්නා මත කරන ලද තක්සේරුවක් සම්බන්ධයෙන් වූවක් නම්, සහ පැහැර හරින්නා විසින් ඒ තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැතිනම්, හෝ පැහැර හරින්නා විසින් සපයන ලද වාර්තාවකට අනුකූලව ගෙවිය යුතුයම් මුදලක් සම්බන්ධයෙන් වූවක් නම්, පැහැර හරින්නා විසින් ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අය කරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. තවද, 48 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක වන්නේය.

තහනම් කොට විකිණීමෙන් පිරිවැටුම් බද්ද අය කර ගැනීම

62. (1) කොමසාරිස්වරයා විසින්, මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තාගේ නම ද ඇතුළත් සහතියක් උප දිසාපතිවරයෙකු වෙත හෝ පිස්කල්වරයෙකු වෙත හෝ නියෝජ්‍ය පිස්කල්වරයෙකු වෙත හෝ බදු එකතු කරන්නෙකු වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැරහැරි තැනැත්තාගේ වංචල දේපොළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ලැබිය යුතුවක් හැර, එසේ අය කරන ලෙස ඒ නිලධාරියාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා කල්පනා කරන ආකාරයට එකී තහනම සිදු කළ යුතු අතර, එලෙස තහනමට ගත් දේපල පැහැර

හැරිය තැනැත්තා විසින් වියදම් හා ගාස්තු ගෙවනු ලැබීමට යටත්ව, දින පහක කාලයක් තබා ගත යුතුය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින පහ ඇතුළත ගාස්තු සහ වියදම් ද සමග නොගෙවුවහොත්, උපදිසාපතිවරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතුය.

(ඇ) එම විකිණීමෙන් ලැබෙන මුදල් -

(I) පළමුව දේපල තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා වියදම් පියවීම සඳහා ද,

(II) දෙවනුව, නොගෙවා ශේෂයන් වෙතොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතුය.

(3) තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබුවද, මේ වගන්තිය යටතේ පැහැර හරින්නෙකුට විරුද්ධව ක්‍රියා කිරීමේදී බදු එකතු කරන්නකු විසින් දරන ලද යුක්ති සහගත වියදම්, ඔහු විසින් යම් පැහැර හරින්නකුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය. මුදල් තහනමට ගනු ලැබූ අවස්ථාවක, එවැනි යුක්ති සහගත වියදම් එසේ තහනමට ගනු ලැබූ මුදලින් පළමුව හිලව් කරගනු ලැබිය යුතුය.

(4) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තාවූද, (2) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අය කර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන්නා වූද, අවස්ථාවක ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරි තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපලක් හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින්ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම නැතහොත් නම් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කළ හැකිය. එවිට ඒ අධිකරණය විසින්, ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යයි පිස්කල් සලකන ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියම කරන රීට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතුය. තවද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක්වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතුය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපල"යන්නට පිරියත සහ යන්ත්‍ර ඇතුළත් වන්නේය.

63. නොගෙවා පැහැර හැරිය බද්ද තහනම් කොට විකිණීමෙන් අය කර ගැනීම කළ නොහැකි බව හෝ ප්‍රඥාගෝචර නොවන බව හෝ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අය කරගනු නොලැබූ අවස්ථාවක ඒ බද්දේ විස්තරද පැහැර හැරිය හැකි තැනැත්තාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානයද දැක්වෙන සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කළ හැකිය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතුය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළයුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සම්බන්ධයෙන් ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දණ්ඩනයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන (එහි (අ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතුය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ විධානයන් ඔහු විසින් කළ හැකිය.

අය කර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය

64. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස්වරයාගේ මතය වූ අවස්ථාවක එකී බද්දේ විස්තරයද ඒ තැනැත්තාගේ නමද අඩංගු සහතිකයක් කොමසාරිස්වරයා විසින් මහේස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කරනු ලැබිය හැකිය. ඒ මහේස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස්වරයා සෑහීමකට පත්වන ආකාරයට ඇප තැබුම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැරයාම වැලැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහේස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

ශ්‍රී ලංකාවෙන් බැහැරයන තැනැත්තන්ගෙන් පිරිවැටුම් බදු අය කර ගැනීම

65. යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්ද නොගෙවා පැහැර හැර ඇත්තා වූද -

(අ) යම් තැනැත්තකු පැහැර හරින්නට හෝ ඔහුගේ අනුයෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවයක් ඇති බව; හෝ,

(ආ) යම් තැනැත්තකු පැහැර හරින්නා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ

ණය ආදියෙන් පිරිවැටුම් බද්ද අය කර ගැනීම

සසඳා නැතහොත් ඔහු වෙනුවෙන් මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවයක් ඇති බව; හෝ

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙනයම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවක් ඇතිබව; හෝ

(ඈ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන්කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව.

කොමසාරිස්වරයාට පෙනී යන්නා වූද, අවස්ථාවක නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වඩා වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑපෙලන් යැවිය යුතුය) ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස්වරයා විසින් දිය හැකිය. ඒ දැන්වීම ලැබූ දිනයෙහිදී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අය විය යුතු හෝ මුදල්වලටද දැන්වූ දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද ඒ දැන්වීම අදාළ විය යුතුය.

බදු අය කර ගැනීමේ මාර්ග එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම

66. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු සම්පූර්ණ පිරිවැටුම් බද්ද මේ ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධාන යටතේ අය කර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස්වරයාගේ මතය වූ අවස්ථාවක ඒ තැනැත්තා සම්බන්ධයෙන් 63 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණද, ඒ නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අයකර ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

පිරිවැටුම් බදු අය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳ කොමසාරිස්වරයා සතු බලතල

67. යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ අයවිය යුතු පිරිවැටුම් බද්ද අයකර ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

කොමසාරිස්, කොමසාරිස්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම

68. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස්වරයා වෙත පිරිනැමුණු හෝ පැවරුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමසාරිස්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවෙකු වෙත පවරනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවෙකු විසින්ම ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොමසාරිස්වරයාගේ සාමාන්‍ය මහා විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතුය.

දැන්වීම් අත්සන් කිරීම සහ බාර දීම

69. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස් විසින් නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් හෝ තක්සේරුකරුවෙකු විසින් දිය යුතු සෑම දැන්වීමකම අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ හෝ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක්ම කොමසාරිස්වරයාගේ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර තිබුණහොත් වලංගු විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක්ම, පුද්ගලිකව භාර දීමෙන් හෝ, යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළවන අවුරුද්ද ඇතුළත ඔහු ව්‍යාපාරයේ නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාර දීමෙන් නැතහොත් තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත බාර දිය හැකිය.

එසේ වුවද, 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ වූ තක්සේරු කිරීමේ දැන්වීමක් පුද්ගලිකව හෝ ඉහත සඳහන් කරනු ලැබූ යම් ස්ථානයකට ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවීමෙන් බාර දිය යුතුය.

(3) තැපෑලෙන් යවනු ලැබූ දැන්වීමක් තැපෑලට ගතවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි බාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපෑලෙන් බාර දීම ඔප්පු කිරීමේදී, දැන්වීම ඇතුළත් ලිපිය යථා පරිදි ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් හෝ දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ අත්සන් කර තිබේද, නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේද, ඒ සෑම නමක්ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතුද?

70. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම්, හෝ ගැලපේ නම් සහ එමගින් තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ බලපෑමක් ඇතිවී තිබෙන්නා වූ හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව එහි නම් කර තිබේනම්, එහි ආකෘතියේ ඌණතාවක් හේතුවෙන් නිශ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර, එහි ඇති යම් වරදකින්,දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතුය.

(2) යම් තක්සේරුවක් පිළිබඳව දැන්වීම ආදායම් බදු අය කර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි බාර දී ඇත්නම් සහ මේ උප වගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමේ ඇත්නම්, (1) වන උප වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක - .

(අ) බදු අය කරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත්නාමය පිළිබඳව හෝ පිරිවැටුම් ප්‍රමාණය පිළිබඳව හෝ අයකරනු ලැබූ පිරිවැටුම් බදු ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් කිරීම ; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳව දැන්වීම අතර යම් වෙනසක් තිබීම ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර, එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතුය.

71. කොමසාරිස්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු විසින් සාම නිලධරයෙකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකිය.

(අ) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ කටයුත්ත්කට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන,වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති නම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ ඒවා සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම ;

(ආ) එබඳු ගිණුම් පොත්, ලේඛන වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම.

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේදී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන, වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද, 1970 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම් වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම් වලට අදාළවිය හැකිතාක් දුරට අදාළ විය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයෙකුට බලය දීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වූයේ කුමක් නිසා දැයි කොමසාරිස්වරයා විසින් සටහන් කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකු විසින් යම් ගිණුම් පොත්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුගෙන් තහනමට ගනු ලබන අවස්ථාවක එම නිලධරයා විසින් තහනමට ගනු ලබන අවස්ථාවක ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

(4) යම් නිලධරයෙකු විසින් (1) වන උප වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු, පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකිතාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල ඒ නිලධරයා සන්තකයෙහි රඳවා ගනු ලැබිය හැකිය.

72. කොමසාරිස්වරයා විසින් හෝ, කොමසාරිස්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයෙකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක්

ඉටු කළ හැකිය. :-

(අ) මෙම පනතේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේදැයි තීරණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළු වීම සහ පිරික්සීම;

(ආ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් සොයාගනු ලැබිය හැකි යම් භාජනයක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහිදී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම :

පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින්ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව

73. පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී තමා එළඹුණු 47 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් ගනුදෙනුවක් නොවන එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් ;

(අ) ඒ ගනුදෙනුව එළඹුණු දිනය;

(ආ) ඒ ගනුදෙනුවේ ස්වභාවය;

(ඇ) ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය සහ

(ඈ) ඒ ගනුදෙනුව ඇතුළත් වූයේ යම් තැනැත්තකු සමග ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය

දක්වමින් වවුචරයක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කළ යුතුය. ඒ ගනුදෙනුවට එළඹුනේ යම්කිසි තැනැත්තකු සමගද, ඒ තැනැත්තාට ඒ වවුචරයේ මුල් පිටපත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ වවුචරය පිළියෙල කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින්ද, නැතහොත් යම් කිසි තැනැත්තකු වෙනුවෙන්ද, ඒ තැනැත්තා විසින් ඒ වවුචරය පිළියෙල කරනු ලැබූ කාර්තුව

ඉකුත් වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ වවුචරයේ පිටපත රඳවා තබා ගැනීම හා ආරක්ෂාව කිරීම කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ කුමක් සඳහන් වුවද, විවිධ වර්ගවල හෝ විස්තරවල ව්‍යාපාර සම්බන්ධයෙන් ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය හැක්කේ යම් ආකෘතියක් හා ආකාරයක් අනුවද, ඒ ආකෘතිය හා ආකාරය එම වර්ගයේ හෝ විස්තරයේ යම් ව්‍යාපාරයක ස්වභාවය සැලකිල්ලට ගනිමින්, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකිය. ව්‍යාපාරයක ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය යුතු ආකෘතිය හා ආකාරය කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, පිරිවැටුම් බද්ද අයකරනු ලැබිය යුතු වූද, ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නා වූද, සෑම තැනැත්තකු විසින්ම ඒ ව්‍යාපාරය කරගෙන යාමේදී තමා ඇතුළත් වූ එක් එක් හා සෑම ගනුදෙනුවක්ම නියමිත ආකෘතියෙහි සහ ආකාරයට වාර්තාගත කිරීම හෝ වාර්තාගත කිරීමට සැලැස්වීම කරනු ලැබිය යුතුය. එම වාර්තාව පිළියෙල කරන ලද්දේ යම් තැනැත්තකු විසින්ද, නැතහොත් යම් තැනැත්තකු වෙනුවෙන්ද ඒ තැනැත්තා විසින් එම වාර්තාව පිළියෙල කරන ලද්දේ යම් කාර්තුවක් සම්බන්ධයෙන්ද එම කාර්තුව ඉකුත් වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය.

XI වන පරිච්ඡේදය.

පරිපාලනය

74. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වන්නාවූ නියෝජ්‍ය ආදායම් කොමසාරිස්වරුන් හා ආදායම් තක්සේරුකරුවන් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හැකිය. පරිපාලනය

(2) මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කරන කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට බලය දෙනු ලැබූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය

(3) මේ ප්‍රඥප්තිය මගින් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ යම් බලයක් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(4) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී ආදායම් කොමසාරිස්වරයා වශයෙන් හෝ නියෝජ්‍ය ආදායම් කොමසාරිස්වරයකු වශයෙන් හෝ ආදායම් තක්සේරුකරුවකු වශයෙන් ධූරය දරන සෑම තැනැත්තකුම, සියළු කාර්ය සඳහා (1) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූවකු සේ සලකනු ලැබිය යුතුය.

75. (1) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහිලා හැර, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන සෑම තැනැත්තකුම, මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේදී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැක ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීමෙහි ලා සහය වීම කළ යුතුය. තවද, ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තාට එවැනි යම් කාරණයක් නොදැක්විය යුතු අතර, කොමසාරිස්වරයාගේ සන්තකයෙහි භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරනු ලැබූ හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන සෑම තැනැත්තකුම විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරිපිටදී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යභාවය පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයා ඉදිරිපිටදී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකිය.

(3) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරනු ලැබූ හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන කිසිම තැනැත්තකුට, මේ පනතෙහි හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේදී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයකදී ඉදිරිපත් කිරීමට හෝ යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරවු කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතුය.

නිල රහස්‍යතාව

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත්ද, මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකුට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, ඔහු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතිය යටතේ යම් යම් කාර්යයන් ඉටු කිරීම සඳහා ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධරයෙකුට ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය නම් ඒ එවැනි යම් නිලධරයෙකුට දැනුම් දීම කළ හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇත ද මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ කොමසාරිස්වරයා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරණයකින් ඔහු සන්තකයෙහි ඇති යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක් ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය. එවැනි අවස්ථාවකදී , ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ ලේඛනය සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

එසේ වුවද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය වන හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටකදී කොමසාරිස්වරයාට බල කරනු නොලැබිය යුතුය.

(5) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද -

(I) 1989 අංක 07 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවක් විසින් යම් තැනැත්තකුගේ, ඔහුගේ කලත්‍රයාගේ, ඔහුගේ පුත්‍රයෙකුගේ හෝ දියණියකගේ නැතහොත් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ චර්යාව පිළිබඳ පරීක්ෂා කිරීමක දී ඒ තැනැත්තාගේ කටයුතු සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට ලබා ගත හැකි සියළු තොරතුරු සපයන ලෙස කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ දැන්වීමෙහි සඳහන් තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුත්‍රයාට දියණියට හෝ ඒ වෙනත් යම් තැනැත්තාට අදාළව කොමසාරිස්වරයාගේ සන්තකයෙහි නැතහොත් පාලනය යටතේ ඇති සියළු තොරතුරු සැපයීම

සහ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ සැපයීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(II) යම් තැනැත්තකුට එරෙහිව නගා ඇති අල්ලස් චෝදනාවක් විමර්ශනය කිරීමේදී හෝ අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පැවරීමෙන් පසුව හෝ ඒ තැනැත්තා විනිශ්චයන් සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව හෝ නීතිපතිවරයා විසින් දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත් ඒ තැනැත්තාගේ, ඔහුගේ කලත්‍රයාගේ, පුත්‍රයෙකුගේ හෝ දියණියකගේ කටයුතුවලට අදාළව කොමසාරිස්වරයා වෙත ඇත්තා වූ ද එකී දැන්වීමෙහි සඳහන් කොට ඇත්තා වූ ද සියලු තොරතුරු සහ ඒ තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුතකුට හෝ දියණියකට අදාළව තමා සන්තකයේ ඇති හෝ තම පාලනයේ ඇති යම් ලේඛනයක් නැතහොත් යළි ලේඛනයක සහතික කළ පිටපතක් ද කොමසාරිස්වරයා විසින් නීතිපතිවරයා වෙත සැපයිය යුතුය.

(III) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවක් දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත්, ඒ කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුගේ, ඔහුගේ කලත්‍රයාගේ, පුත්‍රයෙකුගේ හෝ දියණියකගේ චර්යාව සම්බන්ධයෙන් පරීක්ෂා කර ගෙන යනු ලැබේද ඒ තැනැත්තාගේ කටයුතු පිළිබඳව කොමසාරිස්වරයා වෙත ඇති සියළු තොරතුරු ද එකී දැන්වීමේ සඳහන් පරිදි ඒ තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුත්‍රයකුට හෝ දියණියකට අදාළ වූද කොමසාරිස්වරයාගේ සන්තකයේ නැතහොත් ඔහුගේ පාලනය යටතේ ඇත්තා වූ ද යම් ලේඛනයක් හෝ ලේඛනයක සහතික කළ පිටපතක් ද කොමසාරිස්වරයා විසින් ඒ පරීක්ෂණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් සැපයිය යුතුය.

(IV) කොමසාරිස්වරයාට ලැබී ඇති තොරතුරු අනුව යම් තැනැත්තකු අල්ලස් ගැනීමේ වරදක් කර ඇති බව කොමසාරිස්වරයා සැක කරන අවස්ථාවකදී එවැනි කරුණක් ගැන විමර්ශනය කිරීම සඳහා එය නීතිපතිවරයා වෙත වාර්තා කළ යුතුය.

(6) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත්ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ, පිහිටුවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, ඒ පනත යටතේ ඒ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු කටයුතු සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන්නා වූ ද මේ ප්‍රඥප්තිය යටතේ තම කාර්ය ඉටු කිරීමේදී කොමසාරිස්වරයාට දැනගන්නට ලැබී ඇත්තා වූද විස්තර, කොමසාරිස්වරයා විසින් ඒ කොමිෂන් සභාව වෙත අනාවරණය කළ යුතුය.

(7) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, විගණකාධිපතිවරයාගේ නිල කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පොත්, වාර්තා, වාර වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධරයෙකුට අවසර දීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකිය. විගණකාධිපතිවරයා හෝ මේ වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකුට, (2) වන වගන්තියේ කාර්ය සඳහා, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස සේවයේ යොදවනු ලැබූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතුය.

(8) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමසාරිස්වරයා විසින් හෝ, තත් කාර්ය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, උචිත යයි සලකනු ලැබූ අවස්ථාවකදී -

(අ) සියලුම බදු ගෙවන්නන්ගේ නම් හා ලිපිනයන් සහ යම් තක්සේරු වර්ෂයක් සඳහා එම බදු ගෙවන්නන් විසින් සපයනු ලැබූ වාර්තාවල ප්‍රකාශ කොට ඇති මුළු ආදායම සහ අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකනු ලබන විට ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග කවරේදැයි යන්න ද අඩංගු ලැයිස්තුවක්; සහ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ යම් වරදකට යම් අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ හෝ මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් දණ්ඩනයක් පනවනු ලැබූ යම් තැනැත්තකුට අදාළ තොරතුරු කොමසාරිස්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට කලින් කල ප්‍රසිද්ධ කිරීමට කටයුතු සලස්වනු ලැබිය හැකිය.

(9) යම් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අර්ථලාභයට අහිතකර ආකාරයට ක්‍රියා කොට ඇති ඒ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයෙකුට, කළමනාකරුවකුට හෝ වෙනත් නිලධරයෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්යය සඳහා ඒ අධ්‍යක්ෂකවරයාගේ, කළමනාකරුගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ වත්කම් වලට අදාළව කොමසාරිස්වරයාගේ සන්තකයෙහි ඇති තොරතුරු කිසිවක් සපයන ලෙස නීතිපතිවරයා විසින් කොමසාරිස්වරයාට ලිඛිත නිවේදනයක් මගින් නියම කරනු ලැබූ විටක, කොමසාරිස්වරයා විසින් ඒ තොරතුරු නීතිපතිවරයා වෙත සැපයිය යුතුය.

(10) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, යම් තැනැත්තකු විසින් විනිමය පාලන පනත හෝ රේගු ආඥා පනත හෝ යටතේ යම් වරදක් සිදු කොට ඇති බව, මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයාගේ කාර්ය ඉටු කිරීමේදී ඔහුට දැනගන්නට ලැබෙන යම් කරුණකින් ඔහුට පෙනී යන අවස්ථාවකදී, ඒ වරද සිදු කිරීම හා සම්බන්ධ යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කළ බව ඔප්පු කිරීමේදී අවශ්‍ය වන නැතහොත් ප්‍රයෝජනවත් වන ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලක වෙත හෝ ප්‍රධාන රේගු අයකැමි වෙත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ යුතුය.

(11) විනිමය පාලක පනත යටතේ හෝ රේගු ආඥා පනත යටතේයම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් අදාළ වන යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කොට ඇති බව ඔප්පු කිරීමට අවශ්‍ය වන නැතහොත් ප්‍රයෝජනවත් වන යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන, කොමසාරිස්වරයා විසින් (10) වන උප වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලක හෝ ප්‍රධාන රේගු අයකැමි වෙත සපයන ලද හෝ බාර දෙන ලද අවස්ථාවකදී, මේ වගන්තියේ ඉහතින් විධිවිධානවලට ප්‍රතිවිරුද්ධව කුමක් සඳහන්ව ඇත ද, ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව පවත්වනු ලබන යම් නඩු විභාගයකදී කොමසාරිස්වරයා විසින් හෝ ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයෙකු විසින් ඒ නඩුවේදී එකී තොරතුරුවලට, භාණ්ඩ වලට, ගිණුම් පොත්වලට හෝ වෙනත් ලේඛනවලට අදාළව සාක්ෂි දිය හැකි අතර, ඉදිරිපත් කිරීමට තමාට නියම කරනු ලබන වාර වාර්තා, ගිණුම් පොත්, වෙනත් ලේඛන හෝ භාණ්ඩ ඉදිරිපත් කිරීම නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය. එවැනි නඩුවක කටයුතු සඳහා, යම් වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛනයක අඩංගු විස්තරවල පිටපතක් කොමසාරිස්වරයා විසින් හෝ ඒ වෙනත් නිලධරයා විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇතද, ඒ පිටපත සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

(අ) ඒ වාර්තාව, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු නැතහොත් අත්සන ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන විටෙක සහ එවැනි ඔප්පු කිරීමක් සඳහාම පමණක් එකී වාර්තාවල, ගිණුම් පොත්වල හෝ වෙනත් ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම කොමසාරිස්වරයා විසින් හෝ වෙනත් නිලධාරියා විසින් කරනු ලැබිය හැකිය;

(ආ) එවැනි යම් වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛනයක මුල් පිටපත නැතහොත් එවැනි වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛනයක අඩංගු විස්තරවල පිටපතක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කවර අවස්ථාවකදී වුවද, කොමසාරිස්වරයාට හෝ ඒ වෙනත් නිලධරයාට බලකරනු නොලැබිය යුතුය.

76. (1) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, ආදායම් පෙළඹවීම් අරමුදල නමැති අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) අරමුදලේ කාර්ය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව අය කරනු ලබන මුදල් ප්‍රමාණයක් එක් එක් වර්ෂය සඳහා ඒ වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට හෝ පසුව ගෙවනු ලැබිය යුතුය.

(3) එකී අරමුදලෙන් පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතුය ;-

(අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුබ සාධනය සඳහා අවශ්‍ය වන සියළු මුදල් ප්‍රමාණ;

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව, ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයන් පන්තියකට හෝ වර්ගයකට සාමූහික පෙළඹවීම් දීමනා.

(4) කොමසාරිස්වරයා විසින් හෝ, තත් කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු විසින් නියමිත පරිපාටියට අනුකූලව, ඒ අරමුදල පරිපාලනය කළ යුතුය.

XII වන පරිච්ඡේදය
සාමාන්‍ය කරුණු.

77. මේ ප්‍රඥප්තියේ මූල ධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම, තොග හෝ සිල්ලර වෙළෙඳාම මත පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් වන විට වෙළෙඳාම පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

78. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකුගෙන් නියමිත පරිදි අයකර ගනු ලැබිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවා ඇති බව ඒ කාර්තුව අවසාන වීමෙන් පසු වර්ෂ තුනක් ඇතුළතදී ලිඛිතව ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑමක් මගින් ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත්තේය.

එසේ වුවද, අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය දීර්ඝ කිරීම හෝ අඩු කිරීම හෝ, අන්‍යාකාරයෙන් අවලංගු වන්නා වූ යම් විරෝධතාවක් හෝ අභියාචනයෙන් වලංගු භාවයට පත් කිසිම හෝ අවසානාත්මකව තීරණය කරන ලද යම් තක්සේරුවක් හෝ කාරණයක් ප්‍රතිශෝධනය කිරීමට බලය දීම හෝ මේ වගන්තියේ අඩංගු කිරීමක් මගින් සිදු නොකෙරේ.

XIII වන පරිච්ඡේදය.
වැරදි සහ දණ්ඩන

රහස්‍යතාව කඩ කිරීම හා වෙනත් කාරණා වැරදි වන බව

79. පහත දැක්වෙන දේවල්, එනම් -

(අ) 75 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටියදී එම දිවුරුම නොදී මේ ප්‍රඥප්තිය යටතේ කටයුතු කරන්නාවූ ; හෝ

(ආ) 76 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කටයුතු කරන්නාවූ : හෝ

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලින් කිසිවක් කඩ කරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ අනුබල දෙන්නාවූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ; හෝ

සෑම තැනැත්තකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන

80. පහත දැක්වෙන දේනම්, එනම් -

(අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට හෝ වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් හෝ යම් අසත්‍ය පිළිතුරක් දෙන්නාවූ; හෝ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ ;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ යම් අසත්‍ය වාර්තාවක් කරන්නා වූ හෝ මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ ;

සහ එමගින් පිරිවැටුම් බද්ද ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ ඒ බද්ද ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට වෙනත් තැනැත්තකුට ආධාර කරන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට -

(I) වරද කරනු ලැබුවේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද ඒ කාර්තුව සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ ගෙවීමට යටත්ව සිටින්නාවූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත් කළා වූ ද බදු මුදල් ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලකින් ; සහ

(II) රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එක් තැනැත්තා යටත් විය යුතුය.

81. (අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන

(ආ) 38 වන වගන්තිය හෝ 45 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ;

(ඇ) 38 වන වගන්තිය හෝ 45 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සෑහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ; හෝ

(ඈ) පිරිවැටුම් බද්දට තමා යටත් වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ ; හෝ

(ඉ) 71 වන වගන්තිය හෝ 72 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී කොමසාරිස්වරයාට හෝ වෙනත් යම් නිලධරයෙකුට ඕනෑකමින්ම බාධා කරන්නා වූ හෝ කොමසාරිස්වරයා හෝ වෙනත් යම් නිලධරයකු ප්‍රමාද කරන්නා වූ ; හෝ

(ඊ) මේ පනතේ විධිවිධානවලට විරුද්ධව කටයුතු කිරීමට වෙනයම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හැරීමේ වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දහයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීමට යන දඬුවම් දෙකටම සහ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතුය.

වැරදි සමථයකට පත් කිරීම.

82. 79 වන වගන්තිය 80 වන වගන්තිය හෝ 81 වන වගන්තිය යටතේවූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයකට පත් කළ හැකිය. තවද, ඒ යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයකට පත් කිරීම ඔහු විසින් කළ හැකිය.

මේ ප්‍රඥප්තියේ විධි විධාන බලපැවැත්විය යුතු බව

මේ ප්‍රඥප්තියේ සහ වෙනත් යම් නීතිගත විධිවිධාන අතර අනනුකූලතාවක් ඇති වුවහොත් එය අනෙක් නීතියේ විධිවිධාන අභිබවා ඒ ප්‍රඥප්තියේ විධිවිධාන බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

84. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ "අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය ඇතිව සිටින තැනැත්තකු අදහස් වේ.

"භාණ්ඩය" යන්නට යම් බඩු, ද්‍රව්‍ය හෝ යම් කෘෂිකාර්මික හෝ උද්‍යාන නිෂ්පාදන ඇතුළත් වේ.

"තක්සේරුකරු" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද ආදායම් තක්සේරුකරුවකු අදහස් කරන අතර, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ.

"බලයලත් නියෝජිතයා" යන්නෙන් -

(අ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූද
(අ) කවර අවස්ථාවකදී වුව ද -

(I) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන්නා වූ ද,

(II) කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරීවරයෙකු වන්නා වූ,

(III) නීතිපතිවරයෙකු වන්නා වූ හෝ

(IV) අදාළ තැනැත්තා විසින් නිතිපතා සේවයේ නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයෙකු වන්නා වූ,

(ආ) පුද්ගලයෙක් සම්බන්ධයෙන් වන විට ඔහුගේ ඥාතියෙකු වන්නාවූද,

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු හෝ ලේකම්වරයෙකු වන්නා වූ ද,

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වන්නා වූ ද

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකු වන්නා වූ ද, නැතහොත්,

(2) බලය දීමට අදාළ යම් කාරණා සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූද මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූද,

යම් පුද්ගලයෙක් අදහස් වේ.

"පුද්ගල මණ්ඩලය" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක්, යම් හවුල් ව්‍යාපාරයක් යන මේ ඒකාබද්ධ තීන්දු පවුලක් අදහස් වන අතර, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් ඊට ඇතුළත් වේ.

"ව්‍යාපාරය" යන්නට යම් කර්මාන්තයක්, වෘත්තියක්, රැකියාවක්, කෘෂිකාර්මික ව්‍යාපාරයක් තුරඟ තරග පැවැත්වීම හෝ සමාගමක් විසින් වාණිජ ස්ථාන කුලියට දීම හෝ සාදන්නකුගේ ව්‍යාපාරයක් හෝ යම් ගනුදෙනුවක් හෝ කරන ලද සේවාවක් වෙනුවෙන් කොමිස් හෝ ගාස්තුවක් අය කරගන්නා වූ යම් තැනැත්තකුගේ ව්‍යාපාරයක් හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරයක් හෝ වෙළෙඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් සහ ආයතනයක් ද ඇතුළත් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූ ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර, කොමසාරිස්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයන් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු ඊට ඇතුළත් වේ.

"සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවේ හෝ අන් කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබ යම් සමාගමක් අදහස් වන අතර, රාජ්‍ය සංස්ථාවන් ද ඊට ඇතුළත් වේ.

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරනු ලැබූ ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු අදහස් වේ.

"බැහැර කරන ලද භාණ්ඩය" යන්නෙන් 08 වන වගන්තිය යටතේ බැහැර කරන ලද භාණ්ඩයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද යම් භාණ්ඩයක් අදහස් වේ.

"පොල්මඃකරු" යන්නෙන් මියගිය තැනැත්තකුගේ පොල්මඃකරු හෝ අද්මිනිස්ත්‍රාත් අදහස් වන අතර,

(අ) මියගිය තැනැත්තකුගේ දේපලවල සන්තකය ලබා ගන්නා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත් වන යම් තැනැත්තකු ; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයට ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ.

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ඊට ඇතුළත් වේ.

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රිය හවුල්කරුවන් අතුරෙන් -

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති ; හෝ

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනිත් හවුල්කරුවන්ට ප්‍රමුඛව තමන් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති ;

හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශයෙහි පළමුවෙන් නම් කොට ඇති හවුල්කරු අදහස් වේ;

"කාර්තුව" යන්නෙන් සෑම අවුරුද්දකම ජනවාරි මාසයේ පළමුවන දිනයෙන්, අප්‍රේල් මාසයේ පළමුවන දිනයෙන්, ජූලි මාසයේ පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලය අදහස් වේ.

"භාරකරු" යන්නට යම් භාරකරුවෙකු, ආරක්ෂකයෙකු, දේපළ ආරක්ෂකයෙකු, කළමනාකරුවෙකු, අනුයෝජිතයෙකු හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතුව ඇති වෙනත් තැනැත්තකු ඇතුළත් වන නමුත් පොල්මඃකරුවෙකු ඊට ඇතුළත් නොවේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව

85. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(8) 1990 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ඒ පළාතේ ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කර ගනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මේ ප්‍රඥප්තිය 1990 අංක 04 දරන පළාත් සභා (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පැවරීම) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

කාර්යක්ෂමතාව මත පළාත් පාලන ආයතන විසුරුවා හැරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල

02. (1) පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා, කවර වුවද අවස්ථාවකදී පහත සඳහන් කරුණු ගැන, එනම් යම් මහ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක පිළිවෙලින් නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ යම් සභිකයෙකුගේ ,

(අ) අකාර්යක්ෂමතාවය හෝ නොමනා පාලනය, හෝ දූෂණ ක්‍රියා හෝ

(ආ) අදාළ නීතිය මගින් හෝ වෙනත් ලිඛිත නීති මගින් නියම කොට ඇති කාර්ය කිරීම ඔහු විසින් දිගටම පැහැර ඇති බවට; හෝ

(ඇ) නීතියේ විධි විධාන කිසිවෙකට අනුකූලව ක්‍රියා කිරීම ඔහු විසින් දිගටම ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැර ඇති බවට; හෝ

(ඈ) අදාළ නීතිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පනවා ඇති බලතල ඔවුන් විසින් අනිසි ලෙස පාවිච්චි කළ බවට; හෝ

(ඉ) රැස්වීම පැවැත්වීම නැතහොත් රැස්වීම්වල පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමක ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයෙකු විසින් නිරතුරුවම ප්‍රතික්ෂේප කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි තමාට ඇති විට, අමාත්‍යවරයා විසින් ඒ එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් ,

(I) එකී මහ නගර සභාවේ නගරාධිපතිවරයා නැතහොත් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ධූරයෙන් පහ කරනු ලැබිය හැකිය . එසේ නැතහොත්,

(II) සභිකවරුන් සියළු දෙනාම හෝ ඔවුනතුරෙන් කිසිවකු ධූරයෙන් පහ කරනු ලැබිය හැකිය . එසේ ද නැතහොත්,

(III) පළාත් පාලන ආයතන විසුරුවා හරිනු ලැබිය හැකිය.තවද එසේ කිරීමෙන් පසු එවැනි යම් නියමයක් හැකි තාක් ඉක්මනින් පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උප වගන්තිය යටතේ නියමයන් කිරීමට පෙර, එකී උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තමන් සෑහීමකට පත්වීම සඳහා, ඒ කරුණු ගැන පරීක්ෂා කර බලා මාස තුනක් ඇතුළතදී වාර්තා කිරීම පිණිස, විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු පත් කළ යුතුය. එසේ පත් කරන ලද විනිශවයකාරවරයාට ඒ පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂමක බලතල ඇත්තේය.

03. (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු 2 (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ විට, එක් එක් අවස්ථාවට අනුකූලව අවශ්‍ය වන පරිදි, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන ආඥාවක් මගින්

(i) අවස්ථාවෝචිත පරිදි එකී මහ නගර සභාවේ නගරාධිපතිවරයෙකු නැතහොත් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ධූරය අත්හිටවනු ලැබිය හැකි අතර, ඒ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය ඉටු කිරීමට අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ උප නගරාධිපතිවරයාට විධාන කළ හැකිය.

(ii) තවද, ඒ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ ධූරය හිස් වී තිබේ නම් නැතහොත් අත්හිටුවා තිබේ නම් නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ සහ සභාවේ බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය කිරීමට අවස්ථාවෝචිත පරිදි, නාගරික කොමසාරිස්වරයාට හෝ තත් ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට නියම කළ හැකිය. මෙවැනි අවස්ථාවකදී අදාළ සභාව තාවකාලිකව අත්හිටවූ සේ සැලකිය යුතුය. එසේම,

(iii) යම් සභිකවරයෙකුගේ ධූරය හෝ සභිකවරු කිහිපදෙනෙකුගේ ධූර අත් හිටුවිය හැකිය; එසේ නැතහොත්,

(iv) සභාව අත්හිටුවා, සභාවේ සහ මහ නගර සභාවක් සම්බන්ධයෙන් එකී නගරාධිපතිවරයාගේද, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් එහි සභාපතිවරයාගේද, බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය කිරීමට අවස්ථාවෝචිත පරිදි ,නාගරික කොමසාරිස්වරයාට හෝ තත් ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට නියම කළ හැකිය.

04.(1) ඉහත කී 2 (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධීක්ෂණ නිලධාරියාගේ වාර්තාව ලැබුණු විට, අමාත්‍යවරයා විසින්,

(2) (1) වන උප වගන්තිය යටතේ නියමයන් කරන ලද හෝ 3 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ආඥාව ප්‍රත්‍යාදිෂ්ය කිරීම කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් යම් මහ නගර සභාවක් සම්බන්ධයෙන් නම් එහි නගරාධිපතිවරයා හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් නම් එහි සභාපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවකදී ඒ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයාගේ සභික ධූරය අවසන් වන අතර, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන එවිට අදාළ වන්නේය.

5. විසුරුවා හරිනු ලැබූ මහ නගර සභාව වෙනුවට අලුත් මහ නගර සභාවක් මහ නගර සභා ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව සංස්ථාපනය කළ යුතු යයි හෝ අනෙක් අවස්ථාවලදී නම විසුරුවා හරිනු ලැබූ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව වෙනුවට අළුත් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් එයට අදාළ නීතියේ විධිවිධානවලට අනුකූලව සංස්ථාපනය කළ යුතු යයි, ඉහත සඳහන් ආකාරයටම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

6. මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම, ඒ නියමය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විධාන අඩංගු විය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට නීතියේ බලය ඊට ලැබෙන්නේය.

7. මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසුරුවා හැරීමෙන් පසු ඒ මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව වෙනුවට අලුත් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරනු ලැබූ අවස්ථාවකදී ඒ අලුත් මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමට පෙරාතුවම අදාළ නීතිය නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව හෝ වෙත පවරා තිබුණු හෝ පනවා

තිබුණු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාර්ය සහ කර්තව්‍ය පාවිච්චි කළ, ඉටු කළ හෝ සිදු කළ තැනැත්තාගේ හෝ තැනැත්තියගේ අනුප්‍රාප්තිකයා බවට එසේ අලුතින් සංස්ථාපිත මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව එක් වන්නේය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

අර්ථ නිරූපණය

"පළාත් පාලන සහකාර කොමසාරිස්" යන්න යම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් යෙදෙන විට එම පළාත් පාලන ආයතනය පිහිටි දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලැබ ඇති පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා ඉන් අදහස් වේ.

"අදාළ නීතිය" යන්නෙන් පිළිවෙලින් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් මහ නගර සභා ආඥා පනත (252 වන අධිකාරිය) නගර සභා ආඥා පනත (255 වන අධිකාරිය) හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වේ.

(09) දකුණු පළාතේ 1990 අංක 06 දරන පළාත් පාලන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයින් පළාත් පාලන ආයතනවලට ලබා දීමට හැකියාව සඳහාත්, ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහාත් විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මේ ප්‍රඥප්තිය 1980 අංක 36, 1985 අංක 10 සහ 1987 අංක 16 දරන පනත් වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන පනතට අනුකූල වේ.

01. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1990 අංක 06 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය

02. 1. (අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයක පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ එවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය. පළාත් පාලන සේවයේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීම

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත් කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ (20) (අ) වන වගන්තියේ (2) සහ (3) වන උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එකී සාමාජිකයන්ට අදාළ විය යුතුය.

2. (අ) පළාත් පාලන සේවයේ සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවකදී කලින් කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ (20) (අ) වන වගන්තියේ (4) උප වගන්තියේ විධිවිධාන අදාළ වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාළ විය යුතුය.

(ආ) එවැනි සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ දින සිට පළාත් පාලන සේවය අතහැර ගිය තැනැත්තෙකු ලෙස සලකනු ලැබිය යුතු

අතර, ඒ අනුව ඔහු එසේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකු වූයේ නම් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල නියමයන් ප්‍රකාර ප්‍රදානයන් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය.

එසේ වුවද, එකී ප්‍රදානය ඔහුට ගෙවනු ලැබිය යුත්තේ පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවා නියුක්තිය අවසන් වීමෙන් පසුව පමණකි.

(ඇ) ඉහත (2) 1 (අ) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු එසේ පත් කරන ලද අවසථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකුව සිටියේ නම්, පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවය, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයෙකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

03. පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් මුදා හැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධූරයෙන් අස් කිරීම සහ ඔහු පිළිබඳ විනය පාලනය ඒ සාමාජිකයා පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

එසේ වුවද, එවැන්නෙකු පිළිබඳ විනය පාලන කටයුතු ඉහත සඳහන් පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූල විය යුතුය.

04. (1). පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ නිලධරයෙකුගේ සේවය පළාත තුළ පිහිටි යම් පළාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන කාලපරිච්ඡේදයකට එවැනි පළාත් පාලන ආයතනයකට ලබා දිය හැකිය යන්න එසේ පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලබන සෑම නිලධරයෙකු සම්බන්ධයෙන්ම නියමයන් සහ කොන්දේසියක් වන්නේය.

(2). ඉහත 1 වන උප වගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකුගේ සේවය පළාත් පාලන ආයතනයට ලබා දුන් අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයෙකුට අදාළ වන විනය පාලනයටම ඔහු යටත් වන්නේය.

(10) 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය.

බදු සහ ගාස්තු පැනවීම සහ අය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මේ ප්‍රඥප්තිය සංශෝධිත පරිදි වූ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ සහ සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරන ගාස්තු පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. (1) මේ ප්‍රඥප්තිය 1990 අංක 07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

02. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයෙකු සහ නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්, පළාත් තක්සේරුකරුවන් සමග වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකිය.

i වන කොටස

i වන පරිච්ඡේදය

<u>පිරිවැටුම් බද්ද පැනවීම.</u>

03. (1) පළාත තුළ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ සෑම තැනැත්තෙකුගෙන්ම 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා ම (මෙහි මින් මතු "පිරිවැටුම් බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලැබූ බද්දක, පාර්ලිමේන්තුව විසින් සාදනු ලබන නීතිවලින් සහ මේ පනතේ වෙනත් විධිවිධානවලින් නියම කර ඇති සීමා වලට සහ නිදහස් කිරීම්වලට යටත්ව අය කරනු ලැබිය යුතුය. පිරිවැටුම් බදු පැනවීම

(2) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "ව්‍යාපාරය" යන්නෙන්, යම් පාරිභෝගික ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් තොග වශයෙන් නැතහොත් සිල්ලරට විකිණීම අදහස් වන නමුත් නිෂ්පාදකයකු විසින් කරනු ලබන විකිණීමක් ඊට අයත් නොවේ.

04. (1) පළාත තුළ යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එක් එක් කාර්තුව සඳහා පිරිවැටුම් බද්ද ඔහුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

යම් තැනැත්තෙකු පිරිවැටුම් බද්ද ගෙවිය යුත්තේ කවර අවස්ථාවලදී ද යන්න

(2) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාගෙන් පිරිවැටුම් බද්ද අයකර ගනු ලැබිය යුතු විටක ඒ ව්‍යාපාරයේ අයිතිය මාරුවීමක් සිදුවී ඇති විටක, (1) වන උප වගන්තියේ සලස්වා ඇති විධිවිධාන නොතකා ඒ ව්‍යාපාරයේ නව අයිතිකරු ඒ ව්‍යාපාරයේ අයිතිය වෙනස්වීමට පෙරාතුවම ඒ ව්‍යාපාරයේ අයිතිකරුව සිටියාක් මෙන් සලකා ඒ ව්‍යාපාරයේ නව අයිතිකරුගෙන් පිරිවැටුම් බදු අයකර ගනු ලැබිය යුතුය.

II වන පරිච්ඡේදය

නිදහස් කිරීම.

05. (1) අමාත්‍යවරයා විසින්. පළාතේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය බව තමාගේ මතය වේ නම්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් හෝ නිශ්චිත වශයෙන් දක්වනු ලබන ව්‍යාපාරයක් හෝ පිරිවැටුම් බද්දෙන් නිදහස් කළ හැකිය.

පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම

(2) (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි සිට හෝ ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු අතර, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට, මාස තුනක කාලසීමාවක් ඇතුළත හෝ, ඒ කාලසීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත්, ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසුව පවත්වනු ලබන පළාත් සභාවේ ප්‍රථම රැස්වීමේ දී හෝ ඒ නියමය අනුමත කරන ලෙසට වූ යෝජනාවක් මගින් ඒ නියමය පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබිය යුතුය.

(3) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් නියමයක්, ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින තෙක් ඒ නියමයේ වලංගු භාවයට හානියක් නොමැතිව ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලදැයි

සලකනු ලැබිය යුතු අතර, ඒ නියමය යම් දිනයක දී ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලදැයි සැලකෙන්නේ ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

iii වන පරිච්ඡේදය

පිරිවැටුම

06. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් “පිරිවැටුම“ යන්නෙන් ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹුණු ගණුදෙනු වලින් ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ. පිරිවැටුම

(2) ඉහත (1) වන උප වගන්තියේ කාර්ය සඳහා "පිරිවැටුම" යන්නට මූලධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති යම් මුදල් ප්‍රමාණයක් ඇතුළත් නොවේ.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් ඒ කාර්තුව ඇතුළත ලබා ගත හැකි යම් මුදල් ප්‍රමාණයක් සඳහා පිරිවැටුම් බද්ද ගෙවන ලද අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය නියම වශයෙන් ලබාගන්නා ලද්දේ යම් කාර්තුවක් ඇතුළත ද ඒ කාර්තුව සම්බන්ධයන් ඒ මුදල් ප්‍රමාණය සඳහා කිසිම බද්දක් ගෙවනු ලැබීම අවශ්‍ය නොවේ.

(4) යම් කාර්තුවක් සඳහා ව්‍යාපාරයක පිරිවැටුම් නිශ්චය කිරීමේදී, කලින් කාර්තුවක් සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද ඒ සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ගෙවනු ලැබ ඇත්තා වූ ද ඒ ව්‍යාපාරය විසින් දරන ලද බොල් ණයක් වන්නා වූ ද මුදලක් වන ඒ කාර්තුව තුළ බොල් ණයක් වී ඇත්තා වූ යම් බොල් ණයකට සමාන මුදලක් අඩු කරනු ලැබිය යුතුය.

එසේ වුවද බොල් ණයක් සම්බන්ධයෙන් උප වගන්තිය යටතේ කලින් අඩු කරනු ලැබූ මුදලක් වෙනුවෙන් යම් කාර්තුවක දී යම් මුදලක් ලැබුණහොත් ඒ මුදල් භාර ගනු ලැබුවේ යම් කාර්තුවකදී ද ඒ කාර්තුව සඳහා වූ ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි ඒ මුදල ඇතුළත් කරනු ලැබිය යුතුය.

IV වන පරිච්ඡේදය

බදු අනුප්‍රමාණ

07. (1) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බදු අනුප්‍රමාණ ඒ ව්‍යාපාරයේ ස්වභාවය අනුව තීරණය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, අමාත්‍යවරයා විසින් ඒ ඒ වෙනස් පන්තිවල හෝ වර්ගවල ව්‍යාපාර සඳහා වෙනස් වෙනස් බදු අනුප්‍රමාණ තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය හැකිය.

පිරිවැටුම් බදු අනුප්‍රමාණ

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු අනුප්‍රමාණය කලින් කල වෙනස් කිරීම කරනු ලැබිය හැකිය.

(3) (1) වන උප වගන්තිය යටතේ සෑම තීරණයක්ම හා (2) වන උප වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ තීරණය කිරීමෙහි හෝ නියමයෙහි සඳහන් කරනු ලැබූ පසු දිනයක හෝ සිට බලාත්මක විය යුතු අතර, ඒ තීරණය කිරීම හෝ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයේ සිට තුන් මසක කාලසීමාවක් ඇතුළත හෝ ඒ කාලසීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත් ඒ කාලසීමාව ඉකුත් වූ පසු පවත්වනු ලබන ප්‍රථම පළාත් සභා රැස්වීමේදී ඒ තීරණය කිරීම හෝ නියමය අනුමත කරනු ලැබීමට යෝජනාවක් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි සෑම යෝජනාවකම උපලේඛනයක ඒ යෝජනාවේ සඳහන් කරනු ලබන්නේ යම් තීරණය කිරීමක් හෝ නියමයක් ද, ඒ තීරණය කිරීමෙහි හෝ නියමයෙහි පෙළ දක්වනු ලැබිය යුතුය.

(4) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ (1) වන උප වගන්තිය යටතේ වූ යම් තීරණය කිරීමක් හෝ (2) වන උප වගන්තිය යටතේ වූ යම් නියමයක්, ඒ යටතේ කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොවන පරිදි, ඒ ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය. එවැනි යම් තීරණය කිරීමක් හෝ නියමයක් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ සේ සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

08. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ නියමයෙහි නියමිත යම් භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බැහැර කරන ලද භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කළ හැකිය. වෙනස් වෙනස් පංති හෝ වර්ගවල ව්‍යාපාර සම්බන්ධයෙන් වෙනස් වෙනස් භාණ්ඩ බැහැර කරන ලද භාණ්ඩ ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

බැහැර කරනු ලැබූ භාණ්ඩ

09. 8 වන වගන්තිය යටතේ යම් භාණ්ඩයක් යම් ව්‍යාපාර පංතියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් බැහැර කරන ලද භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක ඒ භාණ්ඩය විකිණීමෙන් ලබා ගන්නා මුදල් වෙනුවෙන් කිසිම පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු නොවන්නේය.

V වන පරිච්ඡේදය

වාර්තා

10.(1) පළාත තුළ යම් ව්‍යාපාරයක් කරගෙන යන සෑම තැනැත්තෙකුම විසින්, එක් එක් කාර්තුවේ දී ඒ ව්‍යාපාරයේ පිරිවැටුම් දැක්වෙන වාර්තාවක් ඒ එක් එක් කාර්තුව අවසාන වීමෙන් පසු දින පහළොවක් ගතවීමට පෙර පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි සෑම වාර්තාවක්ම නියමිත ආකෘතිය මගින් විය යුතු අතර ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතු යයි නියමිත සියලු තොරතුරු ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතුය. වාර්තා සහ තොරතුරු

(2) තක්සේරුකරුවකු විසින්, ඔහුගේ විනිශ්චය පරිදි පිරිවැටුම් බදු අයකරනු ලැබිය හැකි යම් තැනැත්තකු වෙත යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත තක්සේරුකරුට අවශ්‍ය වන විස්තර ඇතුළත් වාර්තාවක් සපයන ලෙස විධාන කළ හැකිය.

(3) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා වෙත යවනු ලබන ලිඛිත දැන්වීමකින් -

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත එහි සඳහන් යම් පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු ලේඛන වවුචර, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් යම් ලේඛන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ තක්සේරුකරු වෙත යවන ලෙස,

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පිරිවැටුම පිළිබඳ පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා ඒ දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයෙකු මගින් හෝ පැමිණෙන ලෙස

නියම කරනු ලැබිය හැකිය.

(4) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමකින් -

(අ) ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත එහි සඳහන් යම් පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත් ගෙවිලි තුංඩු, විගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ ඒ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත යවන ලෙස;

(ආ) ඒ දැන්වීමේ සඳහන් යම් කරුණක් හෝ කරුණු පිළිබඳ ඔහු පරීක්ෂා කරනු ලැබීම සඳහා දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමා ම හෝ බලයලත් නියෝජිතයෙකු මගින් හෝ පැමිණෙන ලෙස

නියම කරනු ලැබිය හැකිය.

(5) (4) වන උප වගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් ප්‍රකාර පැමිණෙන යම් තැනැත්තෙකුට එසේ පැමිණීමෙන් ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් කොමසාරිස් විසින් අනුමත කරනු ලැබිය හැකිය.

(3) වන උප වගන්තිය යටතේ හෝ (4) වන උප වගන්තිය යටතේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමතය ඇතිව තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ ඉදිරිපත් කර තිබුණ වූ හෝ ප්‍රේෂණය කරනු ලැබ හෝ ප්‍රේෂණය කොට තිබුණ වූ හෝ වෙනත් ආකාරයකින් තම සන්තකයට පත්වන හෝ පත්ව තිබෙන යම් පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු. තොග ලැයිස්තු, ලේඛන වවුචර, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලියකියවිලි මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තම භාරයෙහි යම් කාලයක් සඳහා රඳවා ගැනීමට අවශ්‍ය වන්නේ ද ඒ කාලය සඳහා තම භාරයෙහි රඳවා ගනු ලැබිය හැකිය.

(6) තක්සේරුකරුවකු විසින් අවශ්‍ය යයි තමා අදහස් කරන කවර විටක සහ විටින් විට යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් -

(අ) වඩා පරිපූර්ණ හෝ වැඩිමනත් වාර්තා; හෝ

(ආ) තක්සේරුකරුගේ අදහස පරිදි ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු පිරිවැටුම් බද්ද තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ අදාළ වන්නා වූ යම් කාරණයක් පිළිබඳව වඩා පරිපූර්ණ හෝ වැඩිමනත් තොරතුරු

ඒ නිවේදනයෙහි සඳහන් නියමිත කාලය තුළ සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(7) යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලැබිය යුතු යැයි සලකනු ලබන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සපයන ලද බවට සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර ඊට පටහැනිව කරුණු ඔප්පු කරන්නේ නම් මිස, එවැනි යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක් අත්සන් කරන යම් තැනැත්තකුට ඒ වාර්තාවේ ප්‍රකාශයේ හෝ ආකෘතියේ සියලු කරුණු පිළිබඳ දැනීම ඇති බවට සලකනු ලැබිය යුතුය.

(8) (2) වන උප වගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දෙන ලද දැන්වීමක් නියමයන් අනුව කටයුතු කිරීමට ඔහු පැහැර හරින අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් -

(අ) ඒ තැනැත්තා මත රුපියල් දස දහසක් නොඉක්මවන දණ්ඩනයක් පැනවිය හැකිය. තවද,

(ආ) (i) ඒ දඩ ගෙවීමට සහ

(ii) තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට දෙන ලද දැන්වීමෙහි සඳහන් වන වාර්තාව කොමසාරිස්වරයාගේ දැන්වීමෙහි ඒ තැනැත්තාට නියම කළ හැකිය.

(9) යම් තැනැත්තකු විසින් වාර්තාවක් සැපයීම පැහැර හැරීමට හේතුව තම පාලනයෙන් බාහිර වූ අවස්ථානුගත කරුණු නිසා බවට සහ දණ්ඩනය නියම කිරීමෙන් පසුව තමා විසින් ඒ වාර්තාව සපයා ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් කොමසාරිස්වරයා විසින් අඩු කරනු ලැබිය හැකිය; නැතහොත් අත්හරිනු ලැබිය හැකිය.

(10) (8) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක ඒ දැන්වීමට අදාළව 35 වන වගන්තිය යටතේ වරදක් සඳහා වූ අපරාධ චෝදනාවකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.

VI වන පරිච්ඡේදය

<u>බදු ගෙවීම.</u>

පිරිවැටුම් බද්ද ගෙවීම

11. යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ කාර්තුව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් බද්දක් එක් තැනැතකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම පැහැර හැරියකු ලෙස සලකනු ලැබිය යුතුය.

ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය

12. (i) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන් -

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති යම් මුදලක් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක ගෙවීම පැහැර හැර තිබෙන කාලසීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි පහළොස්වන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන්, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක් ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් කවර අවස්ථාවක දී හෝ නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදුවී ඇති යම් විශේෂ කාරණා හේතු කොටගෙන ඒ මුදල අත් හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩුකිරීම කළ හැකිය.

(2) 79 වන වගන්තිය යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීම මත (1) වන උප වගන්තිය යටතේ එකතු කරනු ලැබූ යම් මුදලක් හෝ මුදල් ද සමග යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක, ඒ මුදල හෝ මුදල්, එසේ අඩු කරන ලද බද්ද මත ගණන් බැලිය යුතුය.

VII වන පරිච්ඡේදය

තක්සේරු කිරීම.

13. (1) යම් තැනැත්තකු

තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය

(අ) තක්සේරුකරුවකුගේ මතය පරිදි පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන්නේ ද, ඒ තැනැත්තා යම් කාර්තුවක් සඳහා 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම සහ ඒ කාර්තුව සඳහා බදු ගෙවීම පැහැර හැරිය හොත්,

(ආ) පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන්නේ ද ඒ තැනැත්තා යම් කාර්තුවක් සඳහා 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයූ නමුත් ඒ කාර්තුව සඳහා බදු ගෙවීම පැහැර හැරිය හොත්

තක්සේරුකරුගේ මතය අනුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණය පළාත් තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතුය. යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා එසේ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවකින්, ඒ තක්සේරු කරන ලද මුදල එම කාර්තුව සඳහා ඔහුගෙන් අයවිය යුතු පිරිවැටුම් බදු මුදල වූවාක් සේ සලකා 12 වන වගන්තිය යටතේ දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් විය යුතු වීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතුය.

(3) යම් කාර්තුවක් සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම පැහැර හරින ලද තැනැත්තෙකු විසින් ඒ කාර්තුව සඳහා ගෙවන ලද පිරිවැටුම් බදු මුදල පළාත් තක්සේරුකරුගේ මතය අනුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු නියම මුදලට වඩා අඩු වූ විටක පළාත් තක්සේරුකරුගේ විනිශ්චය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල පළාත් තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන දිනයකට පෙර, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(4) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උප වගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා පිරිවැටුම් බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ඒ කාර්තුව සඳහා ගෙවීම පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 11 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුනේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා 12 වන වගන්තියෙහි (i) වන උප වගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

අතිරේක තක්සේරු

14. පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය යුතු යම් තැනැත්තකු විසින්, යම් කාර්තුවක් සඳහා බද්ද වශයෙන්, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු හෝ ඒ කාර්තුව සඳහා අයකර ගත යුතු නියම මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක්, ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ තක්සේරුකරු විසින් කවර විටක වුවද තම විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතුව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකටද ඒ අතිරේක මුදල් ප්‍රමාණය අනුව ඒ තැතැත්තාගෙන් පිරිවැටුම් බද්ද අයවිය යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකිය. තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලැබිය යුතුය.

15. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් 14 වන වගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක එසේ තක්සේරු කරන ලද මුදල ඒ කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 11 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා 12 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

වාර්තාවක් පිළි නොගැනීම පිළිබඳව තක්සේරුකරු හේතු දැක්විය යුතු බව

16. යම් තැනැත්තකු විසින් 10 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 13 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ඒ වාර්තාව පිළි නොගැනීමට හේතු තැපෑලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැන්විය යුතුය.

VIII වන පරිච්ඡේදය

තක්සේරුවල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සඳහා දණ්ඩනය.

17. පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ ප්‍රඥප්තියේ නියමිත කාලීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 79 (5) වන වගන්තිය යටතේ එකඟ වී ඇති අවස්ථාවක හෝ අභියාචනයේදී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ එකඟ වන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ සියළු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව

එසේ වුවද, යම් කාර්තුවක් සඳහා අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සළකා බැලීම ඇතුළත් නොවන්නේ නම් ඒ කාර්තුව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙහිලා තක්සේකරුවකු මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් නිසා නොවැළැක්වෙන්නේය.

18. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකදී, පිරිවැටුම් බද්දේ ප්‍රමාණය, ස්වකීය ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම් මත අයවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස ඔහු විසින් එවකටත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ ද, තක්සේරුව 11 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේදී හෝ ඒ පිරිවැටුම සම්බන්ධ පිරිවැටුම් බදු අනු ප්‍රමාණය අදාළ කිරීමේදී හෝ වංචාවක් හෝ ඕනෑකමින් ම පැහැර හැරීමක් සිදු වී නොමැති බව පළාත් කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුමට සාවද්‍ය පිරිවැටුම් බදු අනුප්‍රමාණයක් අදාළ කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා, තක්සේරුවෙන් පෙන්නුම් කරන මුළු පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ද ගෙවන ලෙස පළාත් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකිය.

පිරිවැටුම් බද්ද අඩුවෙන් ගෙවීම සඳහා දඩුවම්

ix වන පරිච්ඡේදය

විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි

අශක්‍යතාවයට පත් තැනැත්තකු වෙනුවෙන් කවරකු ක්‍රියාකළ හැකිද යන බව

19. යම් තැනැත්තෙකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්‍යතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍යතාවට පත් තැනැත්තා ගේ භාරකරු විසින් කරනු ලැබිය යුතුය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළයුතු බව

20. යම් තැනැත්තෙකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වනවිට ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුවද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැනුම් දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැතතකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතුය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් ප්‍රධාන නිලධරයා ක්‍රියා කළයුතු බව

21. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනත යටතේ කළ යුතු යයි නියමිත සියලු ක්‍රියා, කාරණා හෝ දේවල් සම්බන්ධයෙන්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු වගකිව යුතුය.

එසේ වුවද යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමන්ගේ කිසිදු සම්බන්ධතාවයක් නැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසිත වෙනත් යම් තැනැත්තකු ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා බව ඔප්පු කළහොත් මිස ඒ තැනැත්තා ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතුය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථා ගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකුම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනු දැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

22. (1) පිරිවැටුම් බද්ද අයකරනු ලැබිය හැකි වූ තැනැත්තකු, ඒ බද්ද අයකළ හැකි වනුයේ යම් ව්‍යාපාරයක් සම්බන්ධ ඒ ව්‍යාපාරය යම් කාර්තුවක් අවසන් කරන අවස්ථාවක, ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණද, ඒ කාර්තුව තුළ දී ඔහු ඒ ව්‍යාපාරය පවත්වාගෙන ගිය කාලසීමාව සඳහා මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටින්නේය.

ව්‍යාපාරය අවසන් වන අවස්ථාවේ දී පිරිවැටුම් බද්ද ගෙවීමේ වගකීම

(2) යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරුමට පෙරාතුව වූ කාලසීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවිය යුතුවූ පිරිවැටුම් බද්ද පැවරුම්කරුගෙන් අයකර ගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පැවරුම්ලාභීගෙන් එය අයකරගත හැකි වන අතර, පිරිවැටුම් බද්ද එකතු කිරීම හෝ අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

23. (1) පිරිවැටුම් බද්ද අයකළ හැකි වූ යම් තැනැත්තකු මියගිය අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව වූ සියලුම කාලසීමාවන් සම්බන්ධයෙන්, ඒ තැනැත්තා ජීවත්ව සිටින්නේ නම්, ඔහුගෙන් අයකළ හැකි වූ පිරිවැටුම් බද්ද ඒ තැනැත්තාගේ පොල්මඃකරුගෙන් අයකරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් මේ ප්‍රඥප්තිය යටතේ වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේවල් සම්බන්ධයෙන් ඒ පොල්මඃකරු වගකිව යුතුය.

පිරිවැටුම් බද්ද ගෙවීමට පොල්මඃකරුවන් යටත් බව

එසේ වුවද,

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මඃකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතුය.

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදුවූ දිනයට පෙරාතුව වූ කාලපරිච්ඡේදයන් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් මරණය සිදුවූ කාර්තුවේ අවසානයේ සිට තුන් අවුරුද්දකට පසුව කරනු නොලැබිය යුතුය.

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මඃකරුගේ වගකීම -

(i) මේ වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට පොල්මඃකරුට දැන්වීම දෙනු ලබන දිනය වනවිට ඔහු සන්තකයෙහි

හෝ ඔහුගේ පාලනයෙහි පැවති මියගිය තැනැත්තාගේ බූදලේ ප්‍රමාණයට; සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ බූදලයේ යම් කොටසක ප්‍රමාණයට සීමා විය යුතුය.

(2) පොල්මෑකරුවකු විසින් මියගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් ඒ බූදලයේ කොටසක් වන යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකර ගත හැකිව තිබුණු පිරිවැටුම් බද්ද, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන්, ඒ පොල්මෑකරුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

24. පිරිවැටුම්බද්දක් ගෙවිය යුතු යම් ව්‍යාපාරයක් යම් තැනැතකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජක වශයෙන් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙහි පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අය කළ යුතුව තිබුණු ආකාරයටම සහ ප්‍රමාණයට ම වූ පිරිවැටුම් බද්දක් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකර ගත යුතුය.

තමන්ට අයත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම්

25. තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මියගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙන් හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ ප්‍රඥප්තිය යටතේ ඔවුන්ගෙන් අයකළ හැකි වන පිරිවැටුම් බද්ද ඒකාබද්ධව හා වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකිවන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට ඔවුහු යටත් වෙති.

ඒකාබද්ධ අනුයෝජිතයන් භාරකරුවන් හා පොල්මෑකරුවන්

26. (1) සමාගම් ආඥාපනතේ කුමක් සඳහන් වුවද, සමාගමක් ඈවර කර වසා දමනු ලබන අවස්ථාවකදී ඒ සමාගම විසින් ගෙවිය යුතුවූ යම් පිරිවැටුම් බද්දක් අයකර ගත නොහැකි වූ විටක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකුම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක්, ව්‍යාජ්ති ක්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාල විය යුතුය.

සමාගමක් ඈවර කිරීමේදී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේ දී පිරිවැටුම් බද්ද ගෙවිය යුතු වන තැනැත්තන්

(2) පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලබන අවස්ථාවකදී ඒ පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතු වූ යම් පිරිවැටුම් බද්දක් අය කරගත නොහැකි

වූ විටක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකු වූ සෑම තැනැත්තකුම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, ඒ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක් ව්‍යාතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතුවන අතර, පිරිවැටුම් බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතුය.

(3) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙහි ප්‍රමාණය අඩු කරන්නා වූ හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනු දෙනුවක් හෝ බැහැර කිරීමක් කෘතිම බව හෝ ව්‍යාජ බව සහ යම් ගනු දෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන්ම, ක්‍රියාත්මක කරනු නොලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඔහු විසින් නොසලකා හැරිය හැකිය.

මේ වගන්තියෙහි "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක්, ප්‍රතිඥාවක්, ගිවිසුමක් හෝ සැකැස්මක් ඇතුළත් වේ.

තක්සේරුවල වලංගු භාවය

27. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ ප්‍රඥප්තියේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ එමගින් තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ එය බලපාන්නා වූ හෝ තැනැත්තා කවුරුන්දැයි පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව, එහි නම්කර තිබේ නම්, එහි ආකෘතියේ ඌණතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභා කරනු ලැබීම හෝ ශුන්‍ය ලෙස හෝ ශුන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර, එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදු විය යුතුය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම පිරිවැටුම් බදු අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි භාරදී ඇත්නම් සහ මේ උප වගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම් ඒ දැන්වීමේ ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක -

(අ) බදු අයකරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ පිරිවැටුම් ප්‍රමාණය පිළිබඳව හෝ

අයකරනු ලැබූ පිරිවැටුම් බදු ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් තිබීම; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතුය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය

28. (1) කොමසාරිස්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ පළාත් රාජ්‍ය සේවයේ බදු අයකිරීමේ කටයුතු කරන යම් නිලධරයකු විසින් සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කළ හැකිය:-

(අ) මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ ඊට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලිය කියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ ඒවා සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එබඳු ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම් හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම;

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ ප්‍රඥප්තිය යටතෙහි වූ යම් නඩු කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන, වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද, 1970 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම්වලට අදාළ විය හැකිතාක් දුරට අදාළ විය යුතුය.

මේ උප වගන්තියේ "සාම නිලධරයා" යන්නෙහි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

(2) (1) වන උප වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍යවීමට තුඩු දුන් කරුණු පළාත් කොමසාරිස්වරයා විසින් සටහන් ගතකළ යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ පළාත් කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුගෙන් තහනමට ගනු ලබන අවස්ථාවක, එසේ තහනමට ගනු ලැබ ඇති ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ නිලධරයා විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල ඒ නිලධරයා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකිය.

29. (1) පළාත් කොමසාරිස්වරයා විසින් ම හෝ තත් කාර්යය සඳහා පළාත් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ පළාත් රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකිය :-

ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය

(අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේදැයි තීරණය කිරීමේ කාර්යය සඳහා, යම් තැනැත්තකු විසින් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම;

(ආ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් සොයා ගනු ලැබිය හැකි යම් භාජනයක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහිදී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපල ලැයිස්තුවක් සෑදීම;

(ඇ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම හා පිටපත් හෝ උධෘත ගැනීම;

(ඈ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් සන්තකයට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම;

(ඉ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන් කොට ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම;

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ වූ කරුණු සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් සැපයීමට හැකි යම් තැනැත්තකු ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ සිට සොයා ගනු ලැබූ විට, ඒ තොරතුරු සපයන ලෙස එවැනි සෑම තැනැත්තකුටම නියම කිරීම;

(2) (1) වන උප වගන්තිය යටතේ පළාත් කොමසාරිස්වරයා විසින් බල දෙනු ලැබූ නිලධාරියෙකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක එම නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතුය.

(3) යම් නිලධාරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය වාර්තාව හෝ ලියවිල්ල ඒ නිලධාරියා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකිය.

පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින්ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව

30. පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු විසින්ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තමා එළඹුනු එක් එක් ගණුදෙනුව සම්බන්ධයෙන්-

(අ) ඒ ගනුදෙනුවට එළඹුනු දිනය;

(ආ) ඒ ගනුදෙනුවේ ස්වභාවය;

(ඇ) ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ලැබුණ හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණය; සහ

(ඈ) ඒ ගනුදෙනුවට ඇතුළත් වූයේ යම් තැනැත්තකු සමගද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය;

දක්වමින් වවුචරයක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කළ යුතුය. ඒ ගනුදෙනුවට එළඹුණේ යම්කිසි තැනැත්තකු සමගද ඒ තැනැත්තා ට ඒ වවුචරයේ මුල් පිටපත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ වවුචරය පිළියෙල කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින්ද, නැතහොත් යම්කිසි තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින් ඒ වුචරය පිළියෙල කරනු ලැබූ කාර්තාව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ වවුචරයේ පිටපත රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය. තවද මේ වගන්තියේ කුමක් සඳහන් වුවද වෙනස් වෙනස් ව්‍යාපාරවලදී ගනුදෙනු වාර්තා කළයුතු ආකාරය සහ ඒ සඳහා භාජන කළ

යුතු ආකෘතියේ ආකාරය පළාත් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

31. (1) පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු විසින්ම, තම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තමා එළඹුණු ගනුදෙනු සම්බන්ධයෙන් එක් එක් කාර්තුව වෙනුවෙන් වූ ගනුදෙනු පිළිබඳ ලේඛනයක් තබා ගැනීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

ගනුදෙනු පිළිබඳ ලේඛනය

(2) යම් කාර්තුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් තබාගනු ලැබූ ගනුදෙනු පිළිබඳ ලේඛනය, ඔහු විසින් එම කාර්තුව ඉකුත් වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය.

32. (අ) 102 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එම දිවුරුම නොදී මේ කොටස යටතේ කටයුතු කරන්නා වූ; හෝ

රහස්‍යතාව කඩ කිරීම හා වෙනත් කාරණා වැරදි වන බව

(ආ) 102 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කටයුතු කරන්නා වූ; හෝ

(ඇ) මේ කොටසේ විධිවිධාන වලින් කිසිවක් කඩ කරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තෙකුට ආධාර දෙන්නා වූ අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ; හෝ

සෑම තැනැත්තෙකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙ ආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

33. (අ) මේ කොටසේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට, වාචිකව හෝ ලිඛිතව යම් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ; හෝ

වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන

(ආ) මේ කොටස යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ ;

(ඈ) මේ කොටස යටතේ යම් අසත්‍ය වාර්තාවක් කරන්නා වූ හෝ මේ කොටස යටතේ සපයනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ සහ එමගින් පිරිවැටුම් බද්ද ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ ඒ බද්ද ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර කරන්නා වූයම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට

(i) වරද කරනු ලැබුවේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද ඒ කාර්තුව සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ ප්‍රඥප්තිය යටතේ ගෙවීමට යටත් ව සිටින්නා වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත් කළා වූ ද බදු මුදල් ප්‍රමාණය මෙන් දෙ ගුණයකට සමාන මුදලකින් සහ

(ii) රුපියල් පන් දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙයකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

34. (අ) 10 වගන්තියේ හෝ 30 වන වගන්තියේ හෝ 31 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ හෝ

වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන

(ආ) 10 වන වගන්තිය හෝ 73 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඇ) 10 වන වගන්තිය හෝ 73 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සෑහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ; හෝ

(ඈ) පිරිවැටුම් බද්දට තමා යටත්වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ; හෝ

(ඉ) 28 වන වගන්තිය හෝ 29 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයාට හෝ වෙනත් යම් නිලධරයෙකුට ඕනෑකමින් ම බාධා කරන්නා වූ හෝ කොමසාරිස්වරයා හෝ වෙනත් යම් නිලධරයකු ප්‍රමාද කරන්නා වූ; හෝ

(ඊ) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට විරුද්ධව කටයුතු කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹ වන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත්විය යුතුය.

වැරදි සමථයට පත් කිරීම

35. 32 වන වගන්තිය, 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයට පත් කළ හැකිය. තවද ඒ යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයට පත් කිරීම ඔහු විසින් කළ හැකිය.

නඩු පැවරීම කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව

36. 32 වන වගන්තිය, 33 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතුය.

2 වන කොටස

X වන පරිච්ඡේදය

<u>මුද්දර ගාස්තු පැනවීම</u>

37. පහත දැක්වෙන පරිදි, එනම්,

(අ) දකුණු පළාතේ පිහිටි නිශ්චල දේපල විකිණීමකට අදාළ සෑම සාධන පත්‍රයක් සඳහා;

(ආ) ශ්‍රී ලංකාවේ දකුණු පළාත තුළ නීතියෙන් පිහිටුවන ලද යම් අධිකරණයක පවරනු ලබන නඩු කටයුතුවලදී ඉදිරිපත් කරනු ලබන හෝ ගොනුගත කරනු ලබන සෑම ලේඛනයක් සඳහා;

(ඇ) දකුණු පළාත තුළදී මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා;

නියමිත අනුප්‍රමාණවලට අනුකූලව මුද්දර ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය. විවිධ පන්තිවල හෝ වර්ගවල සාධන පත්‍ර සඳහා වෙනස් වෙනස් ගාස්තු අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකිය.

38. එකිනෙකට වෙනස් කරුණු කීපයකින් සමන්විත වන සේ එවැනි කරුණු කීපයකට අදාළ යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වනවිට, ඒ එක් එක් කරුණ සඳහා වෙන වෙනම සාධන පත්‍රය බැගින් සකස් කරන ලද්දේ නම් ඒ එක් එක් සාධන පත්‍රය සඳහා අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවේ එකතුවට සමාන මුද්දර ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.

වෙනත් කරුණු කීපයකට අදාළ සාධන පත්‍ර

XI වන පරිච්ඡේදය

නිදහස් කිරීම්

39. පහත දැක්වෙන සාධන පත්‍රය සහ ලේඛන මුද්දර ගාස්තුවෙන් නිදහස් කරනු ලැබිය යුතුය:-

නිදහස් කිරීම

(1) අපරාධ නඩුවල ඇප ඔප්පු;

(2) ආණ්ඩුව විසින් හෝ යම් තැනැත්තකු විසින් ආණ්ඩුව සඳහා නැතහොත් ආණ්ඩුව වෙනුවෙන් යම් නිශ්චල දේපලක් හෝ මෝටර් රථයක් පැවරීමේ හෝ විකිණීමේ;

(3) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුව, මෙයින් කරනු ලබන නිදහස් කිරීම නිසා නොවන්නට ආණ්ඩුව විසින් ගෙවිය යුතු වේද, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ නමට හෝ ලියා අත්සන් කරනු ලබන එවැනි සාධන පත්‍රයක්;

(4) 76 (2) වන වගන්තිය යටතේ වූ නියමයන් බලපාන යම් රටක ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ නමට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක්;

(5) නඩු කටයුතුවලදී ඉදිරිපත් කරනු ලබන පහත දැක්වෙන ලේඛන:-

(අ) මහේස්ත්‍රාත් අධිකරණවලදී සහ ප්‍රාථමික අධිකරණවලට ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන සහ අපරාධ නඩු කටයුතුවල කාර්ය සඳහා වෙනත් යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන;

(ආ) යම් අධිකරණයකදී තම නිල බලයෙන් රජයේ නිලධරයන් විසින් නඩු පැවරීමේදී, ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබීමේදී හෝ මැදිහත්වීමේදී ඒ අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඇ) යම් අධිකරණයක නඩු කටයුතුවදී දිළින්දකු වශයෙන් නඩු පැවරීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට හෝ මැදිහත්වීමට යථා පරිදි ඉඩ දෙන ලද තැනැත්තකු විසින් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඇ) වස්තු භංගත්වයට පත්වූවකු ලෙස ප්‍රකාශ කරවා ගැනීම සඳහා යම් අධිකරණයකින් ඉල්ලුම් කරන තැනැත්තකු විසින් ඒ අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන

(ඉ) හබයාස්කෝපුස් රීට් ආඥාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක කාර්ය පිණිස යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරණ නීති ආධාර පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි නඩු පැවරීම, උත්තරවාද බැඳීම හෝ මැදිහත්වීම කරන තැනැත්තකු ලෙස, නියමිත නිලධරයකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන;

(උ) මෝටර් වාහනයකින් සිදු වූ මරණයක් හෝ අලාභයක් නිසා උද්ගත වන අලාභ ඉල්ලා සිටින යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන;

(ඌ) යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන මෝසම්;

(එ) ඉල්ලීමක් මත හෝ අධිකරණයේ අභිමතය මත හෝ නිකුත් කරනු ලබන වරෙන්තු;

(6) නොතාරිස්වරයකු සහතික කළ හෝ අන්‍යාකාරයක අන්තිම කැමති පත්‍ර තෙස්තමේන්තු හෝ කොඩිසිල් පත්‍ර.

XII වන පරිච්ඡේදය

<u>මුද්දර ගැසිය යුතු වේලාව හා ආකාරය.</u>

මුද්දර ගාස්තු ගෙවිය යුතු වේලාව සහ ආකාරය

40. (1) යම් සාධන පත්‍රයක් සඳහා අය කළයුතු මුද්දර ගාස්තු ඒ සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන වේලාවේදීම හෝ ගෙවනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තියෙන් අන්‍යාකාරයකට අවසර දී ඇතහොත් ඒ පරිදි හැර, ඒ ගෙවීම කර ඇති බව අලවන මුද්දර හෝ ලාංඡිත මුද්දර හෝ මෙහි (2) වන උප වගන්තියේ සඳහන් ගෙවීම් සහතිකයක් මගින් ඒ සාධන පත්‍රයෙහි දැක්විය යුතුය.

(2) නිශ්චල දේපල විකිණීමකට අදාළ යම් සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු නියමිත බැංකුවකට ගෙවිය හැකි අතර, ගෙවන ලද මුද්දර ගාස්තු ප්‍රමාණය සහ ඒ මුද්දර ගාස්තුව ගෙවන ලද දිනය දැක්වෙන සහතිකයක් ඒ බැංකුව විසින් නියමිත ආකෘතිය මගින් නිකුත් කළ යුතුය. තවද බැංකුව විසින් එසේ නිකුත් කරකන ලද සහතිකය ඒ සාධන පත්‍රයෙහි අලවා තිබිය යුතුය. යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට පෙර හෝ ලියා අත්සන් කරන අවස්ථාවේදීම හෝ යම් බැංකුවකට ඒ ගෙවීම කිරීම,

ඒ මුද්දර ගාස්තු ගෙවිය යුතු තැනැත්තාගේ පාලනයෙන් පරිබාහිර යම් හේතුවක් කරණකොටගෙන ඒ තැනැත්තාට නොහැකි වන අවස්ථාවකදී, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද ඒ නොතකා ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන ලද දින සිට දින 7 ක් ඉකුත්වීමට පෙර ඒ ගාස්තුව ගෙවනු ලැබිය යුතුය. එහෙත් එවැනි සෑම අවස්ථාවකදීම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයෙහි සහතික කළ යුතුය. මුද්දර ගාස්තු ගෙවීම සඳහා වූ සහතිකය අලවා ඇති යම් සාධන පත්‍රයක් යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(3) යම් සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුව ගෙවූ බව දැක්වෙන සේ අලවන මුද්දර හෝ ලාංඡිත මුද්දර භාවිතා කිරීම නැතහොත් ඉහත සඳහන් පරිදි බැංකුවක් වෙත ගෙවීම ප්‍රායෝගික වශයෙන් අපහසු වන අවස්ථාවකදී ඒ සාධන පත්‍රය සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුදලක් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබූ විට, එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ ගෙවීම කළ දිනය ඒ සාධන පත්‍රය මත කොමසාරිස්වරයා විසින් පිටසන් කරනු ලැබිය හැකිය. එසේ පිටසන් කරනු ලැබූ සාධන පත්‍රයක් යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

අලවන මුද්දර අවලංගු කිරීම

41. (1) යම් සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුව ගෙවූ බව අලවන මුද්දර මගින් පෙන්නුම් කොට ඇති අවස්ථාවකදී, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා හෝ තැනැත්තන් අතුරින් කවරකු හෝ විසින් ඒ මුද්දරය නැවත පාවිච්චි කිරීම වැලැක්වීම සඳහා ඒ මුද්දර හරහා තම නම තීන්තෙන් ලියා කෙටි අත්සන යෙදීමෙන් ඒ මුද්දර අවලංගු කරනු ලැබිය යුතුය.

(2) රුපියල් පනහක හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු අලවන මුද්දරයක් යම් සාධන පත්‍රයකට ගසා තිබේ නම්, (1) වන උප වගන්තියේ සඳහන් පරිදි එය හරහා ලිවීමට අමතරව කුරකින් පිද්‍රිකයකින් කපනයකින් තෙරපුම් උපකරණයක් මගින් කැපීමෙන් ද ඒ මුද්දර අවලංගු කරනු ලැබිය යුතුය.

(3) (1) වන සහ (2) වන උපවගන්ති වලින් දක්වා ඇති ආකාරයට අවලංගු කොට නොමැති අලවන මුද්දරයක් ගසන ලද යම් සාධන පත්‍රයක් ඒ මුද්දරයේ වටිනාකමේ ප්‍රමාණයට මුද්දර නොගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

XIII වන පරිච්ඡේදය

ඇතැම් සාධන පත්‍රවල මුද්දර ගැසිය යුතු අන්දම.

42. ගාස්තු අයකළ යුතු සාධන පත්‍රයක් ලිවීමට එවකටත් භාවිතා කොටගෙන තිබෙන, මුද්දර ගැසූ කඩදාසියක් මත මුද්දර ගාස්තු අයකළ යුතු තවත් කිසිම සාධන පත්‍රයක් ලිවීම නොකළ යුතුය.

එකම මුද්දර ගාස්තුවක් සඳහා එක සාධන පත්‍රයක් විය යුතු බව

එසේ වුවද, යම් සාධන පත්‍රයකින් යම් අයිතියක් ඇති කරන ලද හෝ ඒ සාධන පත්‍රය ඒ අයිතිවාසිකමට සාක්ෂි දරන විටක, ඒ අයිතිවාසිකම පැවරීමේ කාර්යය සඳහා ඒ සාධන පත්‍රය මත හෝ යම් සාධන පත්‍රයකින් ගෙවීම ආරක්ෂා කොට ඇති මුදලක් හෝ භාරදීම ආරක්ෂා කොට ඇති බඩු ලැබුණු බව දැන්වීමේ කාර්යය සඳහා ඒ සාධන පත්‍රය මත හෝ යම් විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් ගෙවීම සඳහා වූ කාලය දීර්ඝ කිරීමේ කාර්යය සඳහා යම් සාධන පත්‍රයක් මත හෝ නිසි පරිදි මුද්දර ගැසූ හෝ මුද්දර ගාස්තු අය නොකළ යුතු යම් පිටසනක් යෙදීම මේ වගන්තියේ ඇති කිසිවකින් නොවැලැක්විය යුතුය.

43. දේපල හුවමාරු කිරීමකදී ඒ දේපළ හිමිකර දීමට හෝ පැවරීමේ සාධන පත්‍ර කීපයක් ඇති අවස්ථාවක, ඒ හුවමාරු කිරීම සඳහා අයකළ යුතු යම් මුද්දර ගාස්තුවක් තිබේ නම්, ඒ මුද්දර ගාස්තුවට සමාන මුද්දර පළමුව ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයේ ගැසිය යුතු අතර සෙසු සියලු සාධන පත්‍රවල රුපියල් පහක් වූ මුද්දර ගාස්තුවට සමාන මුද්දර ගැසිය යුතුය.

හුවමාරු කිරීම්වලට බලපාන සාධන පත්‍රවල මුද්දර ගැසිය යුත්තේ කෙසේද යන වග

එසේ වුවද, පළමු සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ දින සිට මාස තුනක කාලයකින් පසුව ලියා අත්සන් කරන ලද එවැනි යම් තදනත්තර සාධන පත්‍රයකට මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන අදාළ නොවිය යුතුය.

44. යම් නඩු කටයුත්තකදී ඉදිරිපත් කරනු ලැබූ සහ මුද්දර ගාස්තු අයකළ යුතු සෑම ලේඛනයක්ම සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ, ලේඛන ලැයිස්තුවට ගසා අවලංගු කර තිබේ නම්, ඒ ලේඛන නිසි පරිදි මුද්දර ගසනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

නඩු කටයුතුවල ලේඛන

45. මුද්දර ගාස්තු අයකළ යුතු යම් සාධන පත්‍රයක් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ තමාගේ තනතුරේ කාර්ය ඉටු කිරීමේදී පිස්කල්වරයකු ඉදිරියේදී ලියා අත්සන් කරන ලද හෝ පිළිගන්නා ලද හෝ අවස්ථාවක දී, ඒ සාධන පත්‍රය සඳහා අය කළයුතු මුද්දර ගාස්තු මුල් සාධන පත්‍රය මත වෙනුවට, එහි අනුපිටපත හෝ ප්‍රතිරූපය මත අයකළ යුතු අතර, මුල් සාධන පත්‍රයෙහි රුපියල් එකක මුද්දරයක් ඇරිය යුතුය.

ඇතැම් සාධන පත්‍රවල අනු පිටපත්වල මුද්දර ගැසීම

XIV වන පරිච්ඡේදය

මුද්දර ගාස්තු සමථයට පත් කිරීම.

ගෙවිය යුතු මුද්දර ගාස්තු සමථයකට පත් කිරීම

46. (1) නීතියෙන් ඇතිකරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ අධිකරණයකට ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු ද පහත දැක්වෙන කොන්දේසි මත සමථයකට පත් කිරීමට ඒ අධිකරණයක යම් නිලධරයකුට කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබිය හැකිය.

(i) අධිකරණයකට පවරනු ලැබූ නඩු කටයුතුවලදී ඉදිරිපත් කරන ලද ගොනුගත කරන ලද ලේඛනවල වාර්තාවක් ඒ නිලධරයා විසින් පවත්වාගෙන යා යුතුවීම.

(ii) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් අවසානයේදී

(අ) ඒ නිලධරයා පත්කරනු ලැබ තිබෙන අධිකරණයේ පවරා තිබෙන සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතුවලදී ඉදිරිපත් කරනු ලැබූ හෝ ගොනුගත කරනු ලැබූ ලේඛන සඳහා හෝ

(ආ) ඒ කාලපරිච්ඡේදය තුලදී යම් තැනැත්තකු විසින් කරන ලද සාධන සඳහා

ගෙවිය යුතු මුද්දර ගාස්තුවල එකතුව ඒ නිලධරයා විසින් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතුවීම.

(2) නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකරණයක පවරනු ලැබූ සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතුවලදී ඉදිරිපත් කරනු ලැබූහෝ ගොනුගත කරනු ලැබූ ලේඛනයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ද මේ වගන්තිය යටතේ සමථයට පත්කරනු ලැබූ අවස්ථාවකදී ඒ ලේඛන මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය කවරේද යන්නත් මේ වගන්තිය යටතේ ඒ මුද්දර ගාස්තු ගෙවීම සමථයට පත්කර ඇති බවත් 1 වන උප වගන්තිය යටතේ බලය දෙනු ලැබූ ඒ අධිකරණයේ නිලධරයා විසින් ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතුය.

XV වන පරිච්ඡේදය
නඩු කටයුතුවල ගොනු කරනු ලබන ලේඛන වලට අදාළ විශේෂ විධිවිධාන

47. (1) (අ) නීතියෙන් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් අධිකරණයක පවරනු ලැබූ නඩු කටයුතු වලදී හෝ

(ආ) මහාධිකරණයේ පවරනු ලැබූ යම්, අද්මිරාල්ති නඩු කටයුතු වලදී,

සිවිල් නඩුවල වටිනාකම

ඉදිරිපත් කරනු ලබන හෝ ගොනු කරනු ලබන ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු තීරණය කිරීමේ කාර්ය සඳහා මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම් හැර, ඒ නඩු කටයුතුවල වටිනාකම -

- (i) ඒ නඩු කටයුතුවල දී ඉල්ලා ඇති ණය මුදලේ ඉල්ලීම්වල හෝ අලාභවල ප්‍රමාණය විය යුතුය;
- (ii) ඉඩම් සම්බන්ධ අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතා පිළිබඳ නඩු කටයුතුවලදී, ඒ ඉඩමේ වටිනාකම විය යුතුය;
- (iii) මියගිය තැනැත්තකුගේ බූදලයට අදාළ හෝ ප්‍රොබෙට් බලපත්‍රය අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, ඒ බූදලයේ ශුද්ධ වටිනාකම විය යුතුය.
- (iv) වෙනත් යම්අවස්ථාවකදී නම්, රුපියල් පන් දහසක් විය යුතුය.

(2) යම් අධිකරණයක නඩු කටයුත්තකදී ගොනු කරනු ලබන ලේඛන සඳහා අයකළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව, නඩු කටයුත්තේ එක් එක් පාර්ශවය විසින් ගොනු කරනු ලබන පළමු ලේඛන දහය සඳහා අයකළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව නොඉක්මවිය යුතුය.

XVI වන පරිච්ඡේදය
මුද්දර ගාස්තු සඳහා වටිනාකම තක්සේරු කිරීම.

48. (1) සාධන පත්‍රයක් මගින් යම් දේපලක් හිමිකර දෙනු ලබන අවස්ථාවක, හිමි කරදෙනු ලබන දේපලෙහි වටිනාකම අනුව, ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකළ යුතු මුද්දර ගාස්තුව ගණන් බැලිය යුතුය.

මුද්දර ගාස්තුව සඳහා වටිනාකම තක්සේරු කිරීම.

(2) ප්‍රතිඡ්ඨාවක් මත පවරනු ලබන යම් දේපලක් යම් උකසකට බැඳීමකට හෝ සම්බන්ධතා වෙන්කර තැබීමකට යටත්වන අවස්ථාවක, පැවරුම් සාධන පත්‍රය සම්බන්ධයෙන් අය කළයුතු මුද්දර ගාස්තුව, ඒ උකස බැඳීම හෝ වෙන්කර තැබීම පිළිබඳව යම් අඩු කිරීමක් නොකර, විකුණනු ලබන දේපලෙහි වටිනාකම අනුව ගණන් බැලිය යුතුය.

(3) ත්‍යාගදායකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වාසියට කරනු ලබන යම් රඳවා ගැනීමකට යටත්ව, යම් දේපලක් ත්‍යාග කරනු ලබන අවස්ථාවක, ත්‍යාග සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකළ යුතු මුද්දර ගාස්තුව, ඒ දේපල ඒ රඳවා ගැනීම නොමැතිව ත්‍යාගලාභියා වෙත ත්‍යාග කරන ලද විටක මෙන්, ඒ දේපලෙහි වටිනාකම මත ගණන් බැලිය යුතුය.

49. ශ්‍රී ලංකාවේ මුදල් නොවන වෙනත් යම් මුදල් වර්ගයකින් ප්‍රකාශිත මුදලක් සම්බන්ධයෙන් වූ සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තු අයකළ යුතුව ඇති අවස්ථාවකදී ඒ සාධන පත්‍රයෙහි සඳහන් දිනයේදී ඇති විනිමය අනුපාත ප්‍රමාණයට අනුකූලව ඒ මුදලට සමානව ගණන් බලනු ලබන ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රමාණය අනුව මුද්දර ගාස්තු ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකරනු ලැබිය යුතුය.

50. යම් නිශ්චල දේපලක් හෝ ඉන් යම් කොටසක් සාධන පත්‍ර කිහිපයක් මගින් කැබලි වශයෙන් එකම තැනැත්තා වෙත හිමිකර දෙනු ලැබූ හෝ පවරනු ලැබුවා වූ ද, ඒ සාධන පත්‍ර කිහිපය මගින් හිමිකර දෙනු ලැබූ හෝ පවරනු ලැබූ සම්පූර්ණ දේපල එකම සාධන පත්‍රයක් මගින් නම්කර දෙනු ලැබුවේ නම් හෝ පවරනු ලැබුවේ නම් අයකළ හැකිව තිබූ මුද්දර ගාස්තුව ගෙවීම වලක්වාලීමේ චේතනාව ඇතිව එසේ සාධන පත්‍ර කිහිපයක් ලියා අත්සන් කරනු ලැබ ඇති බව තක්සේරුකරුට පෙනී යන්නා වූද අවස්ථාවක, ඒ සාධන පත්‍ර එවැනි චේතනාවක් ඇතිව ලියා අත්සන් නොකරන ලද බව තමා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලෙස ඔහු විසින් ඒ සාධන පත්‍රවල පාර්ශවකරුවන්ට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි සාධන ඉදිරිපත් කරනු නොලැබුවේ නම් හෝ ඉදිරිපත් කරන ලද සාධන ප්‍රමාණවත් නොවේ නම් එකී සියළුම සාධන පත්‍ර සම්බන්ධයෙන් අය කළ යුතු මුද්දර ගාස්තුවල මුළු ප්‍රමාණය ඒ සාධන පත්‍ර මගින් හිමිකර දෙන සහ පවරන ලද මුළු ඉඩම් ප්‍රමාණය එසේ හිමි කිරීම සඳහා සහ පැවරීම සඳහා එක සාධන පත්‍රයක් පමණක් ලියා අත්සන් කරන ලද නම් අයකළ යුතුව තිබුණ මුද්දර ගාස්තුව මෙන් එකහමාරකට සමාන වන ලෙස ගණන් බලා ඒ එක් එක් සාධන පත්‍රයෙහි හිමි කරදෙන ලද සහ පවරන ලද දේපල කොටසේ සමානුපාතික වටිනාකම අනුව ඒ එක් එක් සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අයකළ යුතුය.

ගාස්තු ගෙවීම වලක්වාලීම සඳහා සාධන පත්‍ර කිහිපයක් සකස් කිරීම.

XVII වන පරිච්ඡේදය

<u>මුද්දර ගාස්තු ගෙවීමට බැඳී සිටින තැනැත්තෝ</u>

51. මීට පටහැනිව යම් ගිවිසුමක් ඇති අවස්ථාවක දී හැර, පහත සඳහන් තැනැත්තන් විසින් මුද්දර ගාස්තු ගෙවිය යුතුය. –

ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යන වග

(අ) හිමිකර දීමක් හෝ හිමිකර දීම සඳහා වූ ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට, ප්‍රදානලාභී හෝ අපේක්ෂිත ප්‍රදානලාභී විසින්,

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වනවිට, ඒ සාධන පත්‍රය සකස් කරන, සාධන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්,

52. (1) මුද්දර ගාස්තු අයකළ යුතු යම් සාධන පත්‍රයක් පළාත තුළ ලියා අත්සන් කරනු ලැබ හෝ පළාත තුළ පිහිටි යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් ලියා අත්සන් කරනු ලැබ ඇත්තා වූ ද ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර අලවා නොමැත්තා වූ ද, අවස්ථාවකදී ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන සෑම තැනැත්තකුම, ඒ ගාස්තු ප්‍රමාණයද, ඒ ගාස්තුව නොගෙවීම නිසා ගෙවිය යුතු වන යම් දණ්ඩනයක් ද කොමසාරිස්වරයා වෙත ගෙවීමට බැඳී සිටින්නේය.

මුද්දර ගාස්තු සම්බන්ධයෙන් වෙනත් පාර්ශවකරුවන්ගේ බැඳීම

(2) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව සහ දණ්ඩනයක් වෙතොත්, එයද ගිවිසුමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ 51 වන වගන්තිය යටතේ ඒ සාධන පත්‍රය වෙනුවෙන් මුද්දර ගාස්තුව ගෙවීමට බැඳී සිටින තැනැත්තා නොවන යම් තැනැත්තකුගෙන් කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද විට, එසේ ලබාගනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය සහ දණ්ඩනයක් වෙතොත්, එයද පළමුව සඳහන්කරන ලද තැනැත්තාගෙන් ලබා ගැනීමට දෙවනුව සඳහන් කරන ලද තැනැත්තාට අයිතිවාසිකම් ඇත්තේය.

(3) 51 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ වගන්තියේ (1) වන සහ (2) වන උප වගන්තිවල විධිවිධාන බලාත්මක විය යුතුය.

(4) යම් මියගිය තැනැත්තකු ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් මුද්දර ගාස්තු අයකර ගැනීමට යටත් වන සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමට, ඒ මියගිය තැනැත්තාගේ බූදලයේ පොල්මඃකරුවකු බැඳී සිටින අතර, ඒ මියගිය තැනැත්තා පාර්ශ්වකරුවකු වූ සියලු සාධන පත්‍ර සම්බන්ධයෙන්, ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකළ යුතුව තිබුණු මුද්දර ගාස්තු ඒ පොල්මඃකරුගෙන් අයකළ යුතුය.

එසේ වුවද,

(i) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මඃකරුට විරුද්ධව කිසිම නඩුවක් නොපැවරිය යුතුය.

(ii) මේ උප වගන්තිය යටතේ පොල්මඃකරුවකුගේ බැඳීම-

(අ) මේ උප වගන්තිය යටතේ මුද්දර ගාස්තුව පිළිබඳ බැඳීමක් ඇතිවන බවට තමා වෙත දැනුම් දුන් දිනයෙහිදී, තමාගේ සන්තකයේ හෝ පාලනයේ පවත්නා මියගිය තැනැත්තාගේ බූදලයට; සහ

(ආ) අර්ථලාභියකු වෙත ලැබී ඇති බූදලයේ යම් කොටසකට සීමාවිය යුතුය.

53. (1) 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන් වී තිබුණ ද, යම් පෞද්ගලික සමාගමක් වසා දමනු ලැබුවා වූ ද මුද්දර ගාස්තු වශයෙන් යම් මුදලක් ගෙවීමට ඒ සමාගමේ ඇති බැඳීම, ඒ සමාගම ඈවර කිරීමට පෙර, ඈවර කරනු ලබන අතරතුර හෝ ඈවර කිරීමෙන් පසුව වුවද ඒ මුදල අයකර ගත නොහැකි වන්නා වූ ද අවස්ථාවක, ඒ ගාස්තුව ගෙවීම සඳහා සමාගමේ බැඳීම ඇති වූ කාලසීමාව තුළ කවර හෝ විටක දී සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකුම විසින් සමාගමේ කටයුතුවලට අදාළව ස්වකීය කාර්‍ය ඉටු කිරීමේදී ඇති වූ දැඩි නොසැලකිල්ල හෝ බලය අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ කාර්‍යයි නොකර හැරීම හෝ හේතු කොටගෙන ඒ මුදල ගෙවීම පැහැර හැරීම සිදු නොවූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ මුදල ගෙවීම සම්බන්ධයෙන් ඒ තැනැත්තා තනි තනිව හා වෙන් වෙන්ව බැඳී සිටිය යුතුය. සමාගම ගණන් බේරා වසා දැමූවිට ඇතිවන බැඳීම.

(2) මේ වගන්තියේ "පෞද්ගලික සමාගම" යන යෙදුමට 1982 අංක 17 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම ඇත්තේය.

XVIII වන පරිච්ඡේදය

සාධන පත්‍ර තහනමට ගැනීම.

54. (1) සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශ්වකරුවන් ගේ කැමැත්ත ප්‍රකාර හෝ බලය ඇති සෑම තැනැත්තකුම විසින් සහ (පොලිස් නිලධරයකු නොවන) රජයේ කාර්‍යාලයක යම් නිලධරයකු වෙත සහ රාජ්‍ය සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු විසින්, ස්වකීය කාර්ය ඉටු කිරීමේදී මුද්දර ගාස්තු අයකළ යුතු යයි ඔහු අදහස් කරන සාධන පත්‍රයක් ඔහු ඉදිරියට පමුණුවනු ලැබූ විටක හෝ ඔහුට ලැබුණු විටක ඒ සාධන පත්‍රයෙහි විධිමත් ලෙස මුද්දර අලවා නොමැති බව ඔහුට පෙනී ගියහොත් ඔහු විසින් ඒ සාධන පත්‍රය තහනමට ගත යුතුය. සාධන පත්‍ර තහනමට ගෙන පරීක්ෂා කිරීම සඳහා ඇතැම් නිලධරයන් සතු බලය

එසේ වුවද යම් මහේස්ත්‍රාත්වරයෙකු වෙත හෝ අපරාධ අධිකරණයක විනිශ්චයකාරවරයකු වෙත ඒ අධිකරණයේ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කරනු ලබන යම් සාධන පත්‍රයක් තහනමට ගැනීම හෝ පරීක්ෂා කිරීම හෝ සුදුසු නොවන බව ඔහු සලකන්නේ නම්, ඔහු විසින් එසේ තහනමට ගනු ලැබීම හෝ පරීක්ෂා කරනු ලැබීම මේ වගන්තියේ ඇති කිසිවකුත් අවශ්‍ය කරන ලෙස නොසැලකිය යුතුය.

(2) මුද්දර ගාස්තු අය කළයුතු සාධන පත්‍රයක්, තම කර්තව්‍ය ඉටු කිරීමේදී, රජයේ කාර්යාලයක හෝ සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ පමුණුවනු ලැබූ විටක -

(අ) ඒ සාධන පත්‍රයේ නිසි පරිදි මුද්දර අලවා තිබේදැයි නිශ්චය කිරීම සඳහා එය පරීක්ෂා කිරීමට;

(ආ) ඒ සාධන පත්‍රය තහනමට ගැනීමට කොමසාරිස්වරයා විසින් ඒ නිලධරයාට නියම කරනු ලැබිය හැකිය.

(3) යම් සාධන පත්‍රයක් පරීක්ෂා කිරීමට හෝ තහනමට ගැනිමට (2) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සාධන පත්‍රය, අවස්ථාවෝචිත පරිදි තහනමට ගැනීම හෝ පරීක්ෂා කිරීම සහ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන යම් වැඩිදුර පියවර ගැනීම ඒ තැනැත්තාගේ කාර්යය වන්නේය.

(4) කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, යම් රජයේ කාර්යාලයක, සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක ඇති යම් සාධන පත්‍රයක නිසි පරිදි මුද්දර අලවා තිබේදැයි නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ රජයේ කාර්යාලය, සංස්ථාව හෝ බැංකුව හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනය භාර යම් තැනැත්තකු වෙත නිසි පරිදි දැනුම් දීමකින් පසුව, ඒ සාධන පත්‍රය ඒ කාර්යාලයේදී සංස්ථාවේදී හෝ ණය දෙන නියෝජ්‍යායතනයේදී පරීක්ෂා කර බැලිය හැකි අතර සාධන පත්‍රයේ මුද්දර අලවා නොමැති නම් එය තහනමට ගනු ලැබිය හැකිය.

තහනමට ගන්නා ලද සාධන පත්‍ර සම්බන්ධයෙන්

55. (1) සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශවකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්ජනරාල්වරයා විසින් හෝ 62 වන වගන්තියේ අතුරු වගන්තියේ විධිවිධානවලට අනුකූලව, යම් සාධන ප්‍රතයක් සාක්ෂිවලදී පිළිගනු ලබන හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ සාධන පත්‍රය දෙනු ලබන තැනැත්තාගේ වියදමින් සපයනු ලබන, ඒ සාධන පත්‍රයේ

සත්‍යායතනය කරන ලද පිටපතක්ද, ඒ සම්බන්ධයෙන් අය කරනු ලැබූ මුද්දර ගාස්තුවේ සහ දණ්ඩනයේ මුදල් ප්‍රමාණය දැක්වෙන ලිඛිත සහතිකයක් ද කොමසාරිස්වරයා වෙත යැවිය යුතු අතර ඒ මුදල් ප්‍රමාණයද කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

(2) වෙනත් සෑම අවස්ථාවකදීම, සාධන පත්‍රයක් එසේ තහනමට ගන්නා තැනැත්තා විසින් එහි මුල් පිටපත කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

අහම්බෙන් නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කිරීම

56. රුපියල් දෙකකට නොවැඩි මුද්දර ගාස්තුවක් අයකළ යුතු සාධන පත්‍රයක් නොවන, මුද්දර ගාස්තු අයකළ යුතු වූද නිසි පරිදි මුද්දර ගසනු නො ලැබූවා වූ ද යම් සාධන පත්‍රයක් එය ලියා අත්සන් කරන ලද දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත, යම් තැනැත්තකු විසින් සිය මෙහෙයීමෙන්ම තක්සේරු කරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් සහ ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර නොගසා ඇති බව ඒ තැනැත්තා විසින් ඒ තක්සේරුකරුට දැනුම් දෙනු ලැබුවහොත් සහ නිසි ගාස්තු ප්‍රමාණය හෝ ගාස්තු ප්‍රමාණය සම්පූර්ණ වීමට අවශ්‍ය මුදල තක්සේරුකට ගෙවීමට ඉදිරිපත් වුවහොත් සහ ඒ සාධන පත්‍රයෙහි මුද්දර ගැසීම නොකර හැර ඇත්තේ අහම්බෙන්, වැරදීමකින් හෝ හදිසි හේතුවක් නිසා බවට තක්සේරුකරු සෑහීමට පත් වුවහොත්, ඔහු විසින්, සාධන පත්‍රය තහනමට ගැනීම වෙනුවට, ඒ මුදල භාරගත හැකි අතර ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකළ යුතු නියම මුද්දර ගාස්තු ප්‍රමාණය ගෙවූ බව එහි කරනු ලබන පිටසනක් මගින් දැක්විය යුතුය.

තහනමට ගන්නා ලද සාධන පත්‍ර සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් ක්‍රියා කළයුතු බව

57. (1) රුපියල් දෙකක ගාස්තුවක් අයකළ යුතු සාධන පත්‍රයක් නොවන යම් සාධන පත්‍රයක්, කොමසාරිස්වරයා විසින් 54 වන වගන්තිය යටතේ තහනමට ගන් ලබන හෝ 55 (2) වන වගන්තිය යටතේ භාර ගනු ලබන අවස්ථාවක, ඔහු විසින් එය තක්සේරුකරුවකු වෙත යොමු කළයුතු අතර, ඒ තක්සේරුකරු විසින් ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතුය.

(අ) ඒ සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර ගසා තිබෙන බව හෝ ඒ සඳහා මුද්දර ගාස්තු අය කළයුතු නොවන බව ඔහුගේ මතය වුවහොත්, ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, එය නිසි පරිදි මුද්දර ගසා ඇති බවට හෝ ඒ සඳහා එසේ ගාස්තුවක් අය කළයුතු නොවන බවට එහි කරනු ලබන පිටසනක් මගින් සහතික කළ යුතුය.

(ආ) ඒ සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අයකළ යුතුව තිබුණ බවත්, නිසි පරිදි එහි මුද්දර නොගසා ඇති බවත් ඔහුගේ මතය වුවහොත් ඔහු විසින් නියම මුද්දර ගාස්තුවේ මුදල මෙන් තෙගුණයක් නොඉක්මවන දණ්ඩනයක් ද සමග නියම මුද්දර ගාස්තුව හෝ ගාස්තුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රමාණය හෝ ගෙවන ලෙස මුද්දර ගාස්තුව ගෙවීමට බැඳී සිටින තැනැත්තාට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතුය.

(2) එවැනි යම් සාධන පත්‍රයක් සඳහා නියම මුද්දර ගාස්තු ප්‍රමාණය ගෙවනු ලැබ ඇත්තා වූ ද එහෙත් ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ ක්‍රමයෙහි යම් අක්‍රමිකතාවක් නිසා හෝ නීතියෙන් නියමිත වේලාවේ දී එහි මුද්දර ගසා නොතිබූ නිසා එය තහනමට ගනු ලැබුවා වූ ද අවස්ථාවක, ඒ අක්‍රමිකතාව අහම්බෙන්, වැරදීමක් හෝ හදිසි හේතුවක් නිසා සිදු වූවක් බවට තක්සේරුකරු සෑහීමට පත්වුවහොත්, රුපියල් පන්සියයකට නොවැඩි දඩයක් ගෙවනු ලැබූ කල්හි සාධන පත්‍රයෙහි නිසි පරිදි මුද්දර ගසා ඇති බවට ඔහු විසින් එහි කරනු ලබන පිටසනක් මගින් සහතික කරනු ලැබිය හැකි අතර, එසේ පිටසන් කරනු ලැබූ සෑම සාධන පත්‍රයක්ම, එය ලියා අත්සන් කරනු ලැබූ දින පටන් නිසි පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ගාස්තු ගෙවනු ලැබූ සාධන පත්‍රයක් පිටසන් කිරීම

58. (1) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් 56 වන වගන්තිය යටතේ ගෙවිය යුතු හෝ 57 (1) (ආ) වගන්තිය යටතේ වූ දැන්වීමක් ප්‍රකාර ගෙවිය යුතු හෝ 60 වන වගන්තිය යටතේ ගෙවිය යුතු මුද්දර ගාස්තු ද දණ්ඩනයක් වෙතොත් එය ද ගෙවනු ලැබූ හෝ ලබා ගනු ලැබූ අවස්ථාවක, තක්සේරුකරු හෝ සාක්ෂියේ දී ඒ සාධන පත්‍රය පිළිගනු ලබන හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරන හෝ තැනැත්තා විසින් -

(i) ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් නියම මුද්දර ගාස්තුව සහ දණ්ඩනය;
(ii) ඒවා ගෙවන තැනැත්තාගේ නම සහ ලිපිනය; සහ
(iii) ගෙවූ දිනය

එහි කරනු ලබන පිටසනක් මගින් සහතික කළ යුතුය.

එම සහතිකය මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, එහි දක්වන ලද කරුණු පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව පිටසන් කරනු ලැබූ සෑම සාධන පත්‍රයක් ම නිසි පරිදි මුද්දර ගසා ඇති සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සාක්ෂිවලදී පිළිගනු ලැබිය යුතුය. තවද එහි එසේ මුද්දර ගසා ඇති වටක මෙන්, එය ලියාපදිංචි කිරීම ද, ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කිරීමද එය සත්‍යායනය කිරීම ද කළයුතු අතර, එය තහනමට ගත් නිලධරයාට එය ලැබුනේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබිය දී ද, ඒ තැනැත්තාගේ ඉල්ලීම පිට, ඔහු වෙත ආපසු යැවිය යුතුය.

59. (1) 55 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත යවන ලද යම් සාධන පත්‍රයක් සම්ප්‍රේෂණයේදී නැති වුවහොත්, විනාශ වුවහොත් හෝ පලුදු වුවහොත් එය යවන තැනැත්තා ඒ නැතිවීම, විනාශවීම හෝ පලුදුවීම සම්බන්ධයෙන් වගකීමට නොබැඳෙන්නේය.

(2) යම් සාධන පත්‍රයක් එසේ යැවීම සඳහා සූදානම් කොට තිබෙන විට, එය තහනමට ගත් තැනැත්තාට එය ලැබුණේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබිය දී ද තම වියදමින් ඒ සාධන පත්‍රයේ පිටපතක් සකස් කරන ලෙස එය තහනම් කළ තැනැත්තා විසින් අනෙක් තැනැත්තාට නියම කළ හැකි අතර, ඉන්පසු පිටසන සත්‍යායනය කරනු ලැබිය හැකිය.

යවන ලද සාධන පත්‍ර සම්බන්ධයෙන් වගකීමක් නැති බව

XIX වන පරිච්ඡේදය
<u>සාධන පත්‍ර පිළිගැනීම.</u>

සාධන පත්‍ර පිළි ගැනීම

60. මුද්දර ගාස්තු අයකළ යුතු කිසිම සාධන පත්‍රයක නිසි පරිදි මුද්දර ගසනු ලැබ තිබේ නම් මිස, ඒ සාධන පත්‍රය සාක්ෂි භාර ගැනීමට නීතියෙන් හෝ පාර්ශවකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් සාක්ෂියේදී භාර ගැනීම හෝ පිළිගැනීම හෝ එවැනි යම් තැනැතකු විසින් හෝ රජයේ කාර්යාලයක හෝ සංස්ථාවක හෝ බැංකුවක හෝ අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක යම් නිලධරයකු විසින් හෝ ලියාපදිංචිකිරීම හෝ සත්‍යායනය කිරීම හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කිරීම හෝ නොකළ යුතුය.

එසේ වුවද, එවැනි සාධන පත්‍රයක් සඳහා අයකළ යුතු නියම මුද්දර ගාස්තුව හෝ එම ගාස්තුව සම්පූර්ණ වීම සඳහා අවශ්‍ය මුදල සහ එම ගාස්තුවෙහි තුන් ගුණයක් නොඉක්මවන දඩ මුදලක් ද ගෙවනු ලැබූ විට -

(අ) සාක්ෂි පිළිගැනීමට නීතියෙන් හෝ පාර්ශවකරුවන්ගේ කැමැත්ත ප්‍රකාර බලය ඇති යම් තැනැත්තකු විසින් සාක්ෂියේ දී ඒ සාධන පත්‍රය පිළිගනු ලැබීම; හෝ

(ආ) ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව රුපියල් පන් දහසක් හෝ ඊට අඩු ගණනක් නම්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ යම් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු විසින් ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරනු ලැබීම කළ හැකිය.

61. මුද්දර ගසන ලද කුවිතාන්සියක් දීමට නියම වී ඇති යම් තැනැත්තකු විසින් මුද්දර ගසා නැති කුවිතාන්සියක් දී ඇති අවස්ථාවක, ඒ කුවිතාන්සියේ මුද්දර ගසා තිබේ නම්, එය ඔහුට විරුද්ධව සාක්ෂි ලෙස පිළිගැනීමට හැකි නම් 60 වන වගන්තියේ කුමක් සඳහන් වී තිබුණ ද ඒ කුවිතාන්සිය ඉදිරිපත් කරන තැනැත්තා විසින් රුපියල් පහක් වූ දණ්ඩන මුදලක් ගෙවූ විට ඒ කුවිතාන්සිය මුලින් සඳහන් තැනැත්තාට විරුද්ධව සාක්ෂි ලෙස පිළිගත යුතුය.

ඇතැම් අවස්ථාවලදී කුවිතාන්සි පිළිගැනීම

XX වන පරිච්ඡේදය

<u>මුද්දර ගාස්තු නිශ්චය කිරීම.</u>

නිසි මුද්දර ගාස්තුව නිශ්චය කිරීම

62. ලියා අත්සන් කරනු ලැබූ හෝ නොලැබූ සහ කලින් මුද්දර ගසන ලද හෝ එසේ නොගසන ලද යම් සාධන පත්‍රයක්. එහි පිටපතක්ද සමඟ තක්සේරුකරුවකු වෙත ගෙන එනු ලැබූ අවස්ථාවක සහ ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවක් වේ නම්, ඒ පිළිබඳව තක්සේරුකරුගේ මතය අනුව ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු යම් මුද්දර ගාස්තුවක් වේ නම් එය ඔහු විසින් තීරණය කළයුතු අතර, තම තීරණය ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

63. තම මතය ප්‍රකාශ කිරීමේ කාර්යය සඳහා, සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අය කළ යුතු වීම හෝ එය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවේ ප්‍රමාණය හෝ සම්බන්ධයෙන් අදාළ කරුණු ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස තක්සේරුකරු විසින් සාධන පත්‍රය රැගෙන එන තැනැත්තාට නියම කළ හැකිය;

එසේ වුවද, එවැනි සාක්ෂි සපයන සෑම තැනැත්තකුම විසින්, ඒ සාක්ෂි අදාළ වන සාධන පත්‍රය සඳහා අයකළ යුතු සම්පූර්ණ මුද්දර ගාස්තුව ගෙවූ විට ඉත සඳහන් සිද්ධි හෝ අවස්ථානුගත කරුණු ඒ සාධන පත්‍රයේ සත්‍ය ලෙස ප්‍රකාශ කිරීම ඔහු විසින් පැහැර හැරීමේ හේතුව නොවන වෙනත් හේතුවක් නිසා මේ පනත යටතේ ඔහු යටත්ව ඇති යම් දණ්ඩනයකින් ඔහු මුදා හරිනු ලැබිය යුතුය.

තක්සේරුකරුගේ පිටසන

64. (1) 62 වන වගන්තිය යටතේ තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව ගෙවනු ලැබූ ඇති බවට හෝ ඒ සාධන පත්‍රය සඳහා මුද්දර ගාස්තු අය කළ යුතු නොවන බවට තක්සේරුකරු විසින් ඒ සාධන පත්‍රය මත පිටසනකින් සහතික කළ යුතුය.

(2) මේ වගන්තිය යටතේ පිටසනක් කරනු ලැබූ යම් සාධන පත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි, නිසි පරිදි මුද්දර ගසන ලද හෝ මුද්දර ගාස්තු අය කළ යුතු නොවන හෝ සාධන පත්‍රයක් ලෙස සැලකිය යුතු අතර, ඒ සඳහා මුද්දර ගාස්තු අය කළ යුතු නම්, එය සාක්ෂි වල දී හෝ වෙනත් අවස්ථාවලදී පිළිගත යුතුය. තවද එහි මුලින් නිසි පරිදි මුද්දර ගසනු ලැබූ විටක මෙන්, ඒ පිළිබඳව ක්‍රියා කරනු ලැබීම සහ එය ලියාපදිංචි කිරීම කරනු ලැබිය හැකිය.

එසේ වුවද,

(අ) ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද හෝ පළමුවෙන් ලියා අත්සන් කරන ලදුව, අවස්ථාවෝචිත පරිදි, එසේ ලියා අත්සන් කිරීමේ හෝ පළමුවෙන් ලියා අත්සන් කිරීමේ දින සිට එක් මාසයක් ඉකුත්වීමෙන් පසු, තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටතදී ලියා අත්සන් කරන ලද හෝ පළමුවෙන් ලියා අත්සන් කරන ලදුව, එය ශ්‍රී ලංකාවට පළමුවෙන්ම ලැබී එක් මාසයක් ඉකුත් වීමෙන් පසු, තමා වෙත ගෙන එනු ලැබූ යම් සාධන පත්‍රයක හෝ

පිටසනක් කිරීමට මේ වගන්තියේ ඇති කිසිවකින් තක්සේරුකරුට බලය නොපැවරෙන්නේය.

XXI වන පරිච්ඡේදය
මුද්දර සඳහා දීමනා.

පාවිච්චි නොකරන ලද හා නරක් වූ මුද්දර සඳහා දීමනා

65. (1) කොමසාරිස්වරයා වෙත (2) වන උප වගන්තියේ සඳහන් කාලය ඇතුළත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ ඔහු ඒ කරුණු පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු, පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර සඳහා ඔහු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී දීමනාවක් දිය හැකිය:-

(අ) මුද්දරයක්, අනවධානයෙන් හෝ අනභිප්‍රායෙන් නරක් වී, එය පාවිච්චි කිරීමට අපේක්ෂිත කාර්යය සඳහා නුසුදුසු අවස්ථාවක; හෝ

(ආ) මුද්දරයක් යම් අසම්පූර්ණ සාධන පත්‍රයක හෝ ලියා අත්සන් නොකරන ලද සාධන පත්‍රයක හෝ ශුන්‍යසාධන පත්‍රයක ගසා ඇති අවස්ථාවක හෝ යම් වැරැද්දක් නිසා මුද්දරයක් අපේක්ෂිත කාර්යය සඳහා නුසුදුසුවූ බව පෙනී ගිය අවස්ථාවක; හෝ

(ඇ) පසුව නිසි පරිදි මුද්දර ගසන ලද සාධන පත්‍රයකින් ප්‍රතියෝජනය කරන ලද යම් සාධන පත්‍රයක වැරදි වර්ගයකට අයත් හෝ වැරදි වටිනාකමකින් යුක්ත මුද්දරයක් අනවධානයෙන් හෝ අනභිප්‍රායෙන් ගසන ලද අවස්ථාවක හෝ

(2) (1) වන උප වගන්තිය යටතේ දීමනා ලබාගැනීම සඳහා වූ ඉල්ලීමක්, පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර මිල දී ගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ දීමනා ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට, කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුට ඒ වර්ගයේම හා ඒ වටිනාකමින්ම යුත් මුද්දර දීම හෝ ඒ මුද්දරවල වටිනාකම මුදලින් ගෙවීම හෝ කරනු ලැබිය හැකි අතර, ඔහු විසින් ඒ මුද්දරවල වටිනාකම මුදලින් ගෙවනු ලබන විටක, සෑම රුපියලක්ම සඳහා හෝ ඉන් යම් කොටසක් සඳහා ශත පහක් අඩුකර ගත යුතුය.

XXII වන පරිච්ඡේදය
<u>වැරදි හා දණ්ඩන.</u>

66. (1) යම් තැනැත්තකු -

නිසි පරිදි මුද්දර නොගැසූ සාධන පත්‍ර ලියා අත්සන් කිරීම ආදිය සඳහා දණ්ඩනය

(අ) මුද්දර ගාස්තු අය කළ යුතු යම් සාධන පත්‍රයක් නිසි පරිදි මුද්දර නොගසා, සාක්ෂිකරුවකු වශයෙන් හැර අත්සන් කළහොත්; හෝ
(ආ) 41 වන වගන්තියේ නියම කර ඇති පරිදි අලවන මුද්දර අවලංගු කිරීම පැහැර හැරියහොත්

ඔහු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

(2) නීත්‍යානුකූල බලයක් නොමැතිව, යම් මුද්දරයක් හෝ අච්චුවක් සාදන හෝ නිෂ්පාදනය කරන හෝ සෑදීමට නැතහොත් නිෂ්පාදනය කිරීමට කවර ආකාරයකින් වුවද ආධාර කරන හෝ එසේ සාදනු ලැබූ නැතහොත් නිෂ්පාදනය කරනු ලැබූ යම් මුද්දරයක් හෝ අච්චුවක් තම සන්තකයේ තබාගෙන සිටින කවර වුවද තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක

බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

67. 78 වගන්තියෙන් මහජන නොතාරිස්වරයකු වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම දැන දැනම පැහැර හරින යම් මහජන නොතාරිස්වරයකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නකු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ වරද කරන ලද්දේ යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන්ද ඒ සාධන පත්‍රය සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව සහ රුපියල් පන්දහසක් යන මුදලට නොවැඩි දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකින්ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතුය.

මහජන නොතාරිස්වරුන් විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම

68. යම් තැනැත්තකු විසින් -

සභාවට වංචා කිරීම සඳහා දණ්ඩනය

(අ) 78 වන වගන්තිය ප්‍රකාර සඳහන් කිරීමට නියමිත සිද්ධි කරුණු හා අවස්ථානුගත කරුණු සියල්ල සම්පූර්ණයෙන් සඳහන් කර නොමැති යම් සාධන පත්‍රයක් පළාත් සභාවට වංචා කිරීමේ චේතනාවෙන් සකස් කිරීම, සහතික කිරීම හෝ ලියා අත්සන් කිරීම කරනු ලැබුවහොත්; හෝ

(ආ) තමා ලියා අත්සන් කළ, සත්‍යායනය කළ හෝ සහතික කළ යම් සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තුව ගෙවීම පිණිස යම් මුදල් ප්‍රමාණයක් භාර ගැනීමෙන් පසු, ඒ මුද්දර ගාස්තුව ගෙවීමට ඒ මුදල නොයොදවනු ලැබුවහොත් හෝ ඒ මුදල හෝ ඉන් යම් කොටසක් අනිසි ලෙස තමා ළඟ තබා ගනු ලැබුවහොත් හෝ රඳවා ගනු ලැබුවහොත්; හෝ

(ඇ) යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමේදී හෝ සත්‍යායනය කිරීමේදී හෝ සහතික කිරීමේදී නිර්ව්‍යාජ නොවන හෝ කලින් පාවිච්චි කරන ලද මුද්දරයක් ඒ සාධන පත්‍රයට ගැසුවහොත්, හෝ ඒ සාධන පත්‍රයෙහි යොදා අවලංගු කිරීමට සැලැස්වුවහොත්; හෝ

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ යම් ගාස්තුවක් හෝ දණ්ඩනයක් පළාත් සභාවට අහිමි කිරීමට සැලසුම් කැරෙන වෙනත් යම් ක්‍රියාවක් කළ හොත් හෝ

(ඉ) කොමසාරිස්වරයා විසින් 54(2) වන වගන්තිය යටතේ ඔහු වෙත පනවනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ඊ) 54 (4) වන වගන්තියෙන් කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී කොමසාරිස්වරයාට ප්‍රතිරෝධය පෑම හෝ බාධා කිරීම කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට -

(i) ඉහත (ආ) අනුඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන්

වනවිට, ඒ තැනැත්තා විසින් තමා ළඟ තබා ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද මුද්දර ගාස්තුවට සමාන මුදලකින් සහ රුපියල් පන්දහසකට නොවැඩි මුදලකින් සමන්විත වන දඩයකට

(ii) ඉහත (ඇ) අනුඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වනවිට, ඒ තැනැත්තා විසින් ගසන ලද හෝ අවලංගු කරන ලද මුද්දරවල වටිනාකම මෙන් දස ගුණයකට සමාන මුදලකින් සහ රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත වන දඩයකට

(iii) (අ) හෝ (ඇ) හෝ (ඉ) හෝ (ඊ) අනුඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වනවිට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට, හෝ ඒ සෑම අවස්ථාවකදීම මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතුය.

69. 73(8) වන වගන්තිය යටතේ තමාට දෙන ලද දැන්වීමක අඩංගු නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

70. මේ කොටස යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පවරා තිබීම නිසා හෝ එවැනි යම් වරදක් සඳහා දණ්ඩනයක් දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමක් යම් තැනැත්කුට නියම කර තිබීම නිසා, මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තා විසින් සිදු කරන ලද හෝ සිදු කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවක් ගෙවීමේ වගකීමෙන් ඒ තැනැත්තා නිදහස් නොවන්නේය.

දණ්ඩන ආදිය සඳහා යම් නඩු කටයුත්තක් තිබුණද, මුද්දර ගාස්තු ප්‍රමාණය හෝ දඩය ගෙවිය යුතු බව

71.මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සඳහා නඩුවක් පැවරීම කොමසාරිස්වරයාගේ අනුමතය නොමැතිව නොකළ යුතුය. නඩු පැවරීම

72. සිදුකරන ලද වරදට අදාළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයට පත් කරනු ලැබිය හැකි අතර, නඩු තීන්දුවට පෙර, යම් නඩු කටයුතු නතර කිරීම හෝ සමථයට පත්කිරීම ඔහු විසින් කරනු ලැබිය හැකිය. නඩු පැවරීම

XXIII වන පරිච්ඡේදය
සාමාන්‍ය කරුණු.

73. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ තක්සේරුකරුවකු විසින් දෙනු ලැබිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම සඳහන් විය යුතු අතර, කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම යථා පරිදි එවැනි දැන්වීමක මුද්‍රණය කොට හෝ අත්සන් කොට තිබේ නම් ඒ දැන්වීම වලංගු එකක් වන්නේය. දැන්වීමක් අත්සන් කිරීම භාර දීම සහ එහි වලංගු භාවය, සහ තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙන ලද සෑම දැන්වීමක්ම, යම් තැනැත්තකු වෙත පෞද්ගලිකවම භාර දීමෙන් හෝ ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටියේයයි දැන ගැනීමට ඇති ස්ථානයට හෝ ඔහු තම ව්‍යාපාරය පවත්වාගෙන යන හෝ පවත්වාගෙන ගිය ස්ථානයට භාරදීමෙන් හෝ තැපැල් මගින් යැවීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකිය.

(3) තැපෑලෙන් යවනු ලබන යම් දැන්වීමක්, එය තැපෑලෙන් සාමාන්‍යයෙන් ලැබිය හැකි දිනයට පසු දිනයේදී භාරදෙන ලද ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපැල් මගින් භාරදෙන ලද බව ඔප්පු කිරීමේදී දැන්වීම අඩංගු ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කරන ලද බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වේ.

(5) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා දෙන ලද හෝ නිකුත් කරන ලද යම් දැන්වීමක මුද්‍රණය කරනු ලැබූ හෝ අත්සන් කරනු ලැබූ සෑම නමක්ම හෝ එසේ දෙන ලද හෝ නිකුත් කරන ලද සහතිකයක කරනු ලැබූ සෑම අත්සනක්ම, එය දීමට හෝ නිකුත් කිරීමට බලය දෙන ලද තැනැත්තාගේ යයි සලකනු ලබන්නේ නම් ඒ නම සඳහා අධිකරණ සැලකිල්ල ලැබිය යුතුය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල යයි සලකනු ලබන දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කෘත්‍යයක්, එහි සාරය සහ ඵලය අනුව මේ ප්‍රඥප්තියේ අරමුණුවලට සහ අර්ථයට අනුකූල වන්නේ නම් හෝ සැලකෙන්නේ නම් සහ ඒ දැන්වීම හෝ සහතිකය දෙනු ලබන හෝ දෙනු ලැබීමට අදහස් කරනු ලබන හෝ එය බලපාන තැනැත්තා කවරේදැයි පොදු අධ්‍යාසයට හා අවබෝධයට අනුව එහි සඳහන් කොට තිබේ නම්, ආකෘතියේ අඩුපාඩුවක් හේතුකොටගෙන, එය නිෂ්ප්‍රභාවේ යයි හෝ අවලංගු යයි හෝ අවලංගු කරනු ලැබිය හැකි යයි හෝ, එහි අඩංගු යම් වරදක්, දෝෂයක් හෝ අත හැරීමක් හේතු කොටගෙන ඊට බලපෑමක් ඇති වේ යයි නොසැලකිය යුතුය.

(7) මෙහි 5 වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, ගාස්තු අය කරනු ලැබූ තැනැත්තා වෙත යම් දැන්වීමක් යථා පරිදි භාර දෙනු ලැබ තිබේ නම්, ගාස්තු අය කළ යුතු තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව යම් වරදක් ඒ දැන්වීමේ හෝ තක්සේරුවේ තිබීමේ හේතුව නිසා ඒ දැන්වීම හෝ තක්සේරුව දෝෂාභිරෝපනයට පත් කිරීමක් හෝ ඒ කෙරෙහි බලපෑමක් හෝ නොවිය යුතුය.

(8) (අ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන පරිදි යම් තැනැත්තකු වෙත ලිඛිතව දැනුම් දෙන දැන්වීමක් කොමසාරිස්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ තක්සේරුකරුවකු විසින් දෙනු ලැබිය හැකිය. –

(i) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය තුළදී, එය තමන් වෙත ඉදිරිපත් කරන ලෙස හෝ ප්‍රේෂණය කරන ලෙස;

(ii) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් තොරතුරක් සපයන ලෙස;

(iii) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දිනයකදී සහ වේලාවකදී එසේ සඳහන් ස්ථානයට තමාම පැමිණ සිටින ලෙස හෝ තමන් වෙනුවෙන් බලය දෙනුලැබූ නියෝජිතයෙකු එවන ලෙස;

(2) යම් තොරතුරක් සපයන ලෙස නියම කරමින් (1) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත දැන්වීමක් බාර දෙනු ලැබූ අවස්ථාවකදී, එවැනි තොරතුරු සැපයීම තහනම් කරන වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද ඒ නොතකා, ඒ තැනැත්තා විසින් යටකී නියමයට අනුකූලව ක්‍රියාකළ යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමකට අනුකූලව පැමිණෙන යම් තැනැත්තකු විසින් එසේ පැමිණීම සඳහා යුක්ති සහගත ලෙස දරනු ලැබූ වියදම් කොමසාරිස්වරයා විසින් ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(4) මේ වගන්තියේ "තැනැත්තා" යන්නට බැංකුකරුවකු ද ඇතුළත් වේ.

දණ්ඩන සම්බන්ධයෙන් අභිමතය පාවිච්චි කිරීම

74. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු විෂයෙහි පනවනු ලැබිය යුතු යම් දණ්ඩනයක මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් අභිමතය පාවිච්චි කිරීම කොමසාරිස්වරයා හෝ තක්සේරුකරු වෙත පවරා ඇති අවස්ථාවකදී, ඒ දණ්ඩනය නියම කරනු ලැබීමට හේතු වූ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයා හෝ තක්සේරුකරු විසින් ඒ අභිමතය පාවිච්චි කළ යුතුය.

මුද්දර ගාස්තු හෝ දණ්ඩන ගෙවන තැනැත්තන් විසින් ඇතැම් අවස්ථාවලදී ඒ ගාස්තු හෝ දණ්ඩන ආපසු ලබාගත හැකි බව

75. (1) යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැතකු විසින් යම් මුද්දර ගාස්තුවක් හෝ දණ්ඩනයක් ගෙවනු ලැබ ඇත්තා වූ සහ එකඟත්වයක් නිසා හෝ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ හෝ වෙනත් යම් තැනැත්තකු ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ගාස්තුව ගෙවීමට යටත් වන අවස්ථාවක, එසේ ගෙවන ලද මුද්දර ගාස්තුව හෝ දණ්ඩන මුදල ඒ වෙනත් තැතැත්තාගෙන ලබාගැනීමට පළමුවෙන් සඳහන් කරන ලද තැනැත්තාට හිමිකම ඇත්තේය.

(2) එසේ ලබාගැනීමේ කාර්ය සඳහා, සහතිකයෙහි සඳහන් තැනැත්තා විසින් සාධන පත්‍රය සම්බන්ධයෙන් වූ මුද්දර ගාස්තුව ගෙවා ඇති බවට කොමසාරිස්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතුය.

නියමයන්

76. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ නියමයේ සඳහන් වන සාධන පත්‍රවලට මුද්දර ගැසීම සඳහා ඒ නියමයේ විස්තර කොට ඇති මුද්දර පාවිච්චි කළ යුතු බව නියම කරනු ලැබිය හැකි අතර, එවැනි සාධන පත්‍ර සඳහා මුද්දර ගාස්තු ගෙවීම පිණිස එසේ විස්තර කොට ඇති මුද්දර නොවන වෙනත් මුද්දර යම් තැනැත්තකු විසින් පාවිච්චි කිරීම නිත්‍යානුකූල නොවන්නේය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට හෝ යම් රටකදී ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ඒ රටේ දී කිසිම මුද්දර ගාස්තුවක් අය නොකරන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ විට, ඒ රටේ ආණ්ඩුව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක් සම්බන්ධයෙන් 39 වන වගන්තියේ 3 වන ඡේදයෙන් ප්‍රදානය කරන ලද නිදහස් කිරීම, අදාළ විය යුතු බව, ශ්‍රී ලංකාණ්ඩුව විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකිය.

77. (1) අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(අ) නියම කළ යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ බලය දී ඇති යම් කරුණක්;

(ආ) ලාංඡිත මුද්දර මගින් මුද්දර ගාස්තුව ගෙවනු ලැබිය හැකිවන යම් සාධන පත්‍ර;

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

78. (1) මුද්දර ගාස්තුව අය කළ යුතු යම් සාධන පත්‍රයක් ලියන සාදන, ලියා අත්සන් කරන හෝ සහතික කරන සෑම තැනැත්තෙකුම, එම සාධන පත්‍රයේ පාර්ශවකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන්, ප්‍රතිෂ්ඨාව, ගෙවීමේ දිනය හා ක්‍රමය සහ ඒ සාධන පත්‍රයට මුද්දර ගාස්තුව ගෙවීම කෙරෙහි බලපාන වෙනත් සියලු කරුණු සහ අවස්ථානුගත කරුණු ද, ඒ සම්බන්ධයෙන් අයකළයුතු මුද්දර ගාස්තුවේ ප්‍රමාණය ද එහි දැක්විය යුතුය. පැවරීමේ පත්‍රවලට බලපාන කරුණු

(2) පැවරුම් සාධන පත්‍රයක් සහතික කරන සෑම මහජන නොතාරිස්වරයකුම විසින්, එසේ කිරීමට පෙර, මුද්දර ගාස්තුව ගෙවනු ලබන්නේ යම් වටිනාකමක් මතද ඒ වටිනාකම පවරනු ලබන දේපලෙහි වටිනාකම වන බවට සෑහීමට පත්වීම සඳහා සියලු යුක්ති සහගත පියවර ගත යුතුය.

(3) ඇලෙන මුද්දර භාවිතා කරනු ලබන යම් සාධන පත්‍රයක් සහතික කරන සෑම මහජන නොතාරිස්වරයකුම විසින් ඒ සාධන පත්‍රයට නියමිත විස්තරයෙන් සහ වටිනාකමින් යුක්ත මුද්දර ඇලවිය යුතු අතර, මේ ප්‍රඥප්තියෙහි විධාන කරනු ලැබ ඇති ආකාරයට ඒවා අවලංගු කොට ඒ සාධන පත්‍රයෙහි ඇලවූ මුද්දර ගණන සහ ඒවායේ වටිනාකම ඔහුගේ සහතික කිරීමෙහි සඳහන් කළ යුතුය.

(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 (2) සහ (3) වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවකදී, බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීමේ සහතිකය යථා පරිදි ඒ සාධන පත්‍රයට අලවා ඇති බවත් සාධන පත්‍රය ලියා අත්සන් කරන අවස්ථාවේදී හෝ ඊට පෙර මුද්දර ගාස්තු ගෙවා නොමැති විටක ඊට හේතුද ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් ඒ සාධන පත්‍රයෙහි සහතික කළ යුතුය.

3 වන කොටස

XXIV වන පරිච්ඡේදය

<u>අභියාචන</u>

79. (1) පළාත් තක්සේරු කරුවෙකු විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරනු ලැබූ තක්සේරුවකින් හෝ අතිරේක තක්සේරුවකින් හෝ මේ ප්‍රඥප්තියේ 1 වන කොටස යටතේ පනවනු ලැබූ යම් දණ්ඩනයකින් හෝ 62 වන වගන්තිය යටතේ දෙනු ලැබූ මත ප්‍රකාශයකින් හෝ 2 වන කොටසේ 57 (1) (ආ) වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ තක්සේරුවට අතිරේක තක්සේරුවට, දණ්ඩනයට, මතයට හෝ නියමයට විරුද්ධව අභියාචනයක්, ඒ තක්සේරුව, අතිරේක තක්සේරුව, දණ්ඩනය, මතය හෝ නියමය පිළිබඳ දැන්වීම තමාට ලැබී දින තිහක් ඇතුළතදී කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය. ඒ අභියාචනය තීරණය කිරීම පොරොත්තුවෙන් පිරිවැටුම් බද්ද හෝ මුද්දර ගාස්තුව හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවීම නතර කළ යුතු බවට කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, ඒ තැනැත්තා විසින්, ඔහුගේ

පළාත් කොමසාරිස්වරයා වෙත අභියාචන ඉදිරිපත් කිරීම

අභියාචනය ගැන නොතකා, ඒ තක්සේරුවෙන්, අතිරේක තක්සේරුවෙන් හෝ මතය මගින් හෝ නියම කරනු ලැබූ නැතහොත් පනවනු ලැබූපිරිවැටුම් බද්ද හෝ මුද්දර ගාස්තුව, මේ ප්‍රඥප්තියෙන් ඒ මත පනවනු ලැබූ යම් දණ්ඩනයක්ද සමග ගෙවිය යුතුය. කොමසාරිස්වරයා විසින් ඉහත සඳහන් පරිදි වූ නියමයක් කරනු ලැබූ විට, නවත්වනු ලැබූ පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තුව, හෝ එහි යම් කොටසක්, හිඟ තබා ඇති සේ නොසළකනු ලැබිය යුතුය.

එසේ වුවද, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, රෝගාතුරවීම, හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා, නියමිත කාලපරිච්ඡේදය තුල දී අභියාචනය කිරීමට අභියාවකට නොහැකි වී තිබුණු බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය කොමසාරිස්වරයා විසින් දීර්ඝ කරනු ලැබිය හැකිය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස්වරයා අමතා ලියවිල්කින් වූ පෙත්සමක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, ඒ අභියවනයට හේතු අඩුලුහුඩුවක් නොමැතිව එහි සඳහන් කර තිබිය යුතුය.

(3) තක්සේරුව හෝ අතිරේක තක්සේරුව කර ඇත්තේ වාර්තාවක් නොසැපයීමේ හේතුවෙන් වන අවස්ථාවකදී යථා පරිදි සකස් කරන ලද වාර්තාවක් ද සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) (1), (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක්ම වලංගු එකක් නොවන්නේය.

(5) වලංගු අභියාචන පෙත්සමක් ලැබුණු විට, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩි දුරටත් විමර්ශනයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් කටයුතු යෙදිය යුතු අතර, ඒ විමර්ශනය කෙරීගෙන යන අතරතුරදී ඒ අභියාචන පෙත්සමේ සඳහන් කාරණා සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණියහොත්, තක්සේරුව පිළිබඳ අවශ්‍ය ගැලපීම් කිරීම හෝ මතයේ නැතහොත් දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය ඒ අනුව සංශෝධනය කිරීම කරනු ලැබිය යුතුය.

(6) 5 වන උප වගන්තියේ සලස්වා ඇති විධිවිධානවල ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අභියාචනය විභාග කිරීමට වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතුය.

(7) සෑම අභියාචකයකුම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. අභියාචකට පෞද්ගලිකව හෝ බලය ලත් නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ අභියාචනය පිළිබඳ විභාගයට පෙනී සිටිය හැකිය. අභියාචනයක් පිළිබඳ විභාගය සඳහා සුදුසු යයි කොමසාරිස්වරයා අදහස් කරන වේලාවකදී සහ ස්ථානයකදී පැවැත්වීම පිණිස ඒ විභාගය ඔහු විසින් කලින් කල අඩාලව කල් තැබිය හැකිය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයෙකු පැමිණ සිටින යම් අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අභියාචනය පිළිබඳ විභාගය අඩාලව කල් තැබිය හැකි අතර, අභියාචනය ගැන තීරණයක් කිරීම සඳහා අභියාචක පෞද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි ඔහු සලකන්නේ නම්, අඩාලව කල් තැබූ අභියාචනය පිළිබඳ විභාගය සඳහා නියම කර ඇති වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පෞද්ගලිකව පැමිණ සිටිය යුතු යයිද ඔහු විසින් නියම කරනු ලැබිය හැකිය. අභියාචනය පිළිබඳ විභාගය සඳහා හෝ අඩාලව කල් තැබූ විභාගය සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ පෞද්ගලිකව පැමිණ සිටින ලෙස කොමසාරිස්වරයා විසින් අභියාචකට නියම කරනු ලැබූ විට, එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකිය;

එසේ වුවද, ඒ අභියාචනය පිළිබඳ විභාගයේදී හෝ අඩාලව කල් තැබූ විභාගයකදී තමාට හෝ තමාගේ බලය ලත් නියෝජිතයාට නිසි පරිදි පැමිණ සිටීමට නොහැකි වූයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බව අභියාචක විසින් ඒ අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත කොමසාරිස්වරයාට ඒත්තු ගැන්වුවහොත් ඔහු විසින් නිෂ්ප්‍රභා කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකිය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියට කැඳවීමේ බලය කොමසාරිස්වරයාට ඇති අතර කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණ සිටීමේදී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන්ම දරණ ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් ඔහුට ඉඩදිය හැකිය.

(9) යම් අභියාචනයක් පිළිබඳව තම තීරණය කිරීමට පෙර, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූද ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන්නා වූද යම් ඔප්පු, පිඹුරු, නාම ලේඛන, සාධන පත්‍ර, පොත්, ගිණුම්, තොග, ලැයිස්තු, චෙක්පත්, විගණක වාර්තා හෝ තක්සේරු වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කිරීමට අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකිය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකයාගේ හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ සාක්ෂි කොමසාරිස්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනිමට සැලැස්වීම හෝ කොමසාරිස්වරයා විසින් කළ යුතුය.

(11) මේ වගන්තිය යටතේ අභියාචනයක් තීරණය කිරීමේදී අභියාචනය කරනු ලැබ ඇත්තේ යම් මතයකට විරුද්ධව ද ඒ මතය කොමසාරිස්වරයා විසින් ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම හෝ කළ හැකිය; නැතහොත් අභියාචනය කරනු ලැබ ඇත්තේ දැන්වීමේ සඳහන් යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන්ද ඒ මුදල කොමසාරිස්වරයා විසින් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය. අනතුරුව කොමසාරිස්වරයා විසින් අභියාචනය පිළිබඳ තම තීරණය අභියාචකට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කළ විට හෝ 1 වන උප වගන්තිය යටතේ රඳවා ගනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු යයි හෝ මුල් තක්සේරුව මගින් පිරිවැටුම්බද්ද නැතහොත් මුද්දර ගාස්තුව වැඩි යයි කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබූ විට, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දක ශේෂයක් හෝ මුද්දර ගාස්තුවක් හෝ මුද්දර ගාස්තුවක ශේෂයක් ගෙවිය යුතු කවර දිනයකදී ද නැතහොත් කවර දිනයකට පෙරද යන්න කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්විමක් මගින් අභියාචක වෙත දැනුම් දිය යුතුය. එසේ නොගෙවනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් පැහැර හැර ඇති පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් ලෙස සලකනු ලැබිය යුතුය.

(13) යම් තක්සේරුවකට හෝ මතයකට හෝ නියමයකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් හෝ මුද්දර ගාස්තුවක් ගෙවීම 1 උපවගන්තිය යටතේ රඳවාගෙන ඇති විටක, ඒ අභියාචනය පිළිබඳ පරීක්ෂණය පවත්වන අතරතුරේදී හෝ ඒ අභියාචනය විභාග කරන අතරතුරේදී, ඒ තක්සේරුව පිළිබඳ අභියාචක වෙත දෙනු ලැබූ ලිඛිත නිවේදනයෙහි සඳහන් නියමය සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද වශයෙන් හෝ මුද්දර ගාස්තුව වශයෙන් එක්තරා මුදල් ප්‍රමාණයක් තමන් විසින් ගෙවිය යුතු බව නැතහොත් ගෙවන්නට සිදුවිය හැකි බවට අභියාචක එකඟ වුවහොත්, දැන්වීමෙහි සඳහන් දිනයේදී හෝ ඊට පෙර ඒ මුදල ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ඔහුට නියම කරනු ලැබිය හැකිය. එසේ නොගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් හිඟ හිට ඇති මුදලක් සේ සලකනු ලැබිය යුතුය.

XXV වන පරිච්ඡේදය

<u>සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම.</u>

සමාලෝචන මණ්ඩලයේ සංයුතිය

80. (1) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ආකාරයෙන් අභියාචනා විභාග කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලයක් විය යුතුය. එසේ පත් කරන ලද මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා ධූරය දැරිය යුතුය. එහෙත් ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේය. අමාත්‍යවරයා විසින් සාමාජිකයකු සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(2) මණ්ඩලයේ ලේකම්වරයකු විය යුතු අතර, ඔහු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.
(3) සභාපතිවරයා විසින් නම් කරනු ලැබූ කවර හෝ සාමාජිකයන් තිදෙනෙකු විසින් යම් අභියාචනයක් විභාග කළ හැකිය.

(4) පළාත් කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට, මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ රැස්වීමක් කැඳවිය යුතුය.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ ලේකම්වරයාගේ පාරිශ්‍රමිකය අමාත්‍යවරයා විසින් නියම කළ යුතුය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කිරීම

81. (1) කොමසාරිස්වරයා වෙත 79 යන වගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක් පිළිබඳව ඔහු විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් වූ යම් තැනැත්තකු විසින් ඒ තීරණය සම්බන්ධයෙන් තමා අතෘප්තියට පත්වූ බව කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දන්වනු ලැබිය හැකිය. එවැනි සෑම දැන්වීමක්ම තීරණයේ දින සිට එක් සතියක් ඇතුළත කරනු ලැබිය යුතුය.

(2) කොමසාරිස්වරයාගේ තීරණය පිළිබඳව තමා අතෘප්තියට පත්වූ බව අභියාචක විසින් (1) වන උපවගන්තියට අනුකූලව දන්වනු ලැබ ඇති අවස්ථාවක, ඒ තීරණයේ දින සිට එක් මාසයක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම තීරණය සඳහා වූ තම හේතු අභියාචක වෙත ලියවිල්ලකින් ප්‍රේෂණය කළ යුතුය.

(3) කොමසාරිස්වරයා විසින් තීරණය සඳහා වූ හේතු (2) වන උපවගන්තිය යටතේ ප්‍රේෂණය කිරීමේ දින සිට එක් මාසයක් ඇතුළත, අභියාචක විසින් මණ්ඩලය අමතන ලද ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඒ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකිය. එවැනි සෑම පෙත්සමක්ම -

(අ) අභියාචනය කරනු ලබන්නේ කොමසාරිස්වරයාගේ යම් තීරණයකට විරුද්ධවද ඒ තීරණයේ පිටපතක් සමග විය යුතුය;

(ආ) ඊට විරුද්ධව අභියාචනය කරනු ලබන්නේ යම් හේතු සම්බන්ධයෙන්ද එම හේතු සංක්ෂිප්ත වශයෙන් දැක්විය යුතුය; තවද

(ඇ) මණ්ඩලයේ ලේකම්වරයාට භාරදෙනු ලැබිය යුතුය.

පළාත් කොමසාරිස්වරයා විසින් අභියාචනා සමාලෝචක මණ්ඩලයට යොමුකළ හැකිය

82. කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් වලංගු අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලයට යොමු කළ හැකි අතර, මණ්ඩලය විසින් ඒ අභියාචනය විභාග කොට තීරණය කළ යුතුය. තවද ඒ අනුව එසේ යොමු කරන ලද යම් අභියාචනයක් විභාග කොට තීරණය කිරීම සම්බන්ධයෙන් 83 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

සමාලෝචන මණ්ඩලය විසින් අභියාචනා විභාග කිරීම

83. (1) අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසුව හැකි ඉක්මණින් මණ්ඩලයේ ලේකම්වරයා විසින් අභියාචනය විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතුය. තවද අභියාචක සහ කොමසාරිස්වරයා යන දෙදෙනාටම ඒ පිළිබඳව දින දහ හතරක දැන්වීමක් දෙනු ලැබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණ විට 79 (10) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණ විට යනු ලබන සාක්ෂි වාර්තාවේ පිටපතක් කොමසාරිස්වරයා විසින් මණ්ඩලයට ප්‍රේෂණය කළ යුතුය.

(3) අභියාචනයක් විභාග කිරීමේදී සෑම අභියාචකයකු විසින්ම පෞද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණ සිටිය යුතුය. අභියාචක පෞද්ගලිකව පැමිණ සිටීම හැකි කිරීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් කල්පනා කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලය විසින් විභාගය කල් තබනු ලැබිය හැකිය.

(4) යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ තක්සේරුවකට, මතයකට නැතහොත් නියමයකට විරුද්ධවද, ඒ තක්සේරුව කරනු ලැබූ හෝ මතය දෙනු ලැබූ හෝ නියමය පනවනු ලැබූ තක්සේරුකරු හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඒ අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව සනාථ කිරීමෙහි ලා පැමිණ සිටිය යුතුය.

(5) අවස්ථාවෝචිත පරිදි අභියාචනයේදී හෝ නැතහොත් 82 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යොමු කරනු ලැබූ විට කොමසාරිස්වරයා විසින් ස්ථිර කරනු ලැබූ තක්සේරුව මතය හෝ නියමය අධික බව හෝ වැරදි සහගත බව ඔප්පු කිරීමේ බලය අභියාචක වෙත පැවරෙන්නේය.

(6) සියලු අභියාචනා රහසිගතව විභාග කළ යුතුය.

(7) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දීමට හැකි යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් තැනැත්තකුට විභාගයේදී පැමිණ සිටීමට සිතාසි නිකුත් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේය. තවද සාක්ෂිකරුවකු වශයෙන් දිවුරුම් මත හෝ අන්‍යාකාරයකින් ඔහු විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණ සිටින යම් තැනැත්තකුට එසේ පැමිණ සිටීමේදී ඔහු විසින් අවශ්‍යයෙන්ම දරන ලද යුක්ති සහගත වියදම් කිසිවකට මණ්ඩලය විසින් ඉඩ දෙනු ලැබිය හැකිය.

(8) මණ්ඩලයේ කැමැත්ත ඇතිව සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් නියමයන් මත හැර කොමසාරිස්වරයා ඉදිරියේ ඉදිරිපත් කරනු නොලැබුවා වූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස්වරයා ඉදිරියේ සාක්ෂි දෙනු නොලැබුවා වූ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි හෝ කොමසාරිස්වරයා ඉදිරියේ වූ විභාගයේදී එවකටත් වර්තා ගත කරනු ලැබුවා වූ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට මණ්ඩලය විසින් විභාගයේදී අභියාචකට ඉඩ නොදිය යුතුය.

(9) අභියාචනා විභාගයේදී මණ්ඩලය විසින් (8) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව වාචික වුවද නැතහොත් ලේඛනගත වුවද ගෙනහැර දක්වන ලද සාක්ෂි කිසිවක් ආවේශ්‍යා කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම මණ්ඩලය විසින් කළ හැකි අතර, සාක්ෂි ආවේශ්‍යා කිරීමට අදාළ සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(10) අභියාචනා විභාග කිරීමෙන් පසුව අවස්ථාවෝචිත පරිදි අභියාචනය මත හෝ 82 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යොමු කරනු

ලැබූ පරිදි කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව මණ්ඩලය විසින් ස්ථිර කිරීම අඩු කිරීම වැඩි කිරීම හෝ නිශ්ප්‍රභ කිරීම කළ හැකිය. නැතහොත් එම විෂය ඒ පිළිබඳ මණ්ඩලයේ මතය සමඟ කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ හැකිය. මණ්ඩලය විසින් විෂයයන් එසේ ප්‍රේෂණය කරනු ලැබ ඇති අවස්ථාවක මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය පරිදි කොමසාරිස්වරයා විසින් තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතුය. මණ්ඩලයේ තීරණය අභියාචකට සහ කොමසාරිස්වරයාට ලියවිල්ලකින් දැන්විය යුතුය.

(11) (10) වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් ඒ තක්සේරුව සම්බන්ධයෙන් අඩු කිරීමක් හෝ නිෂ්ප්‍රභ කිරීමක් කරනු නොලබන අස්ථාවක රුපියල් පන්සියයක් නොඉක්මවන මුදලක් මණ්ඩලයේ ගාස්තු ගෙවීමට මණ්ඩලය විසින් අභියාචකට නියම කළ හැකි අතර එය තක්සේරුවෙන් අය කරනු ලැබූ බද්දට එකතු කොට ඒ සමග අයකර ගනු ලැබිය යුතුය.

XXVI වන පරිච්ඡේදය

අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචන.

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කිරීම

84. (1) මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය.

එස් වුවද නීති ප්‍රශ්නයක් පිළිබඳව අභියාචනාධිකරණයේ මතය ලබා ගැනීම සඳහා එකී තීරණයට අදාළ කරුණු සැලකිරීමක් කරන ලෙස අභියාචක විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. ඒ ඉල්ලීම මණ්ඩලයේ තීරණය අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයා වෙත හෝ අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලද දින සිට එක් මාසයක් ඇතුළත රුපියල් පනහක ගාස්තුවක් ද සමග ලියවිල්ලකින් මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් මිස එය භාර නොගත යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණයට අදාළ කරුණු සැලකිරීමකදී එහි සිද්ධි ද මණ්ඩලයේ තීරණය ද බදු මුදල් රුපියල් පන් දහසක් ඉක්මවන අවස්ථාවක ප්‍රස්තුත බදු මුදලද සඳහන්ව තිබිය යුතු අතර, ඒ තීරණයට අදාළ කරුණු සැලකිරීම කරන ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින් ඒ තීරණයට අදාළ කරුණු සැල කරන ලද සහ අත්සන් කරන ලද විට, එය තමා වෙත ලැබීමෙන් දින දහ හතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යවනු ලැබිය යුතුය.

(3) මුද්දර ආඥා පනතේ විධිවිධාන අදාල කිරීමේ කාර්ය සඳහා -

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද එකී තීරණයට අදාළ කරුණු සැලකිරීමක් පිළිබඳව අභියාචනාධිකරණය ඉදිරියේ පැවැත්වුණු හෝ එවැනි කරුණු සැලකිරීමක් පිළිබඳව කරන ලද විභාගයක තීරණයක් පිළිබඳ හෝ ඒ පිළිබඳව අවසානයක් කිරීම පිළිබඳ පවත්වනු ලැබූ සියලු නඩු කටයුතු රුපියල් පන් දහසක වටිනාකමින් යුක්ත හෝ කරන ලද තීරණය පිළිබඳ කරුණු සැලකිරීමේදී මණ්ඩලය විසින් ප්‍රස්තුත බදු මුදල වශයෙන් සඳහන් කරනු ලැබූ වැඩි මුදලක වටිනාකමින් යුක්ත අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුතු ලෙස සැලකිය යුතුය.

(ආ) එසේ කරන ලද තීරණය පිළිබඳ සෑම කරුණු සැලකිරීමක්ම මණ්ඩලය විසින් ඊට අමුණනු ලැබූ පොත්, ලේඛන සහ ලියවිලි ද සමග අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුතුවල තනි ඒකකයක් ලෙස සැලකිය යුතුය.

(ඇ) කොමසාරිස්වරයා අභියාචක වන්නේ නම්, ඔහු නිල බලය අනුව නඩුවක් පවරන රජයේ නිලධරයකු වශයෙන්ද නැතහොත් ඔහු අභියාචනයක වගඋත්තකරුවන්නේ නම් ඔහු නිල බලයෙන් නඩුවක් පවරනු ලැබූ රජයේ නිලධරයකු වශයෙන් ද සලකනු ලැබිය යුතුය.

(4) අභියාචනාධිකරණය වෙත තීරණයට අදාළ කරුණු සැල කරන ලෙස ඉල්ලා සිටින පර්ශ්වකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ කරන වෙලාවෙහි හෝ ඊට පෙර ස්වකීය ඉල්ලීමෙන් කරුණු සැලකිරීමක් කරනු ලැබූ බව දන්වමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් අනෙක් පාර්ශවකරු වෙත යැවිය යුතු අතර, එකී කරුණු සැලකිරීමෙහි පිටපතක් ද ඒ පාර්ශවකරු වෙත සැපයිය යුතුය.

(5) යම් කරුණු සැලකිරීමක් සංශෝධනය කිරීම පිණිස අභියාචනාධිකරණයෙහි යම් විනිශ්වයකාරවරයකු විසින් මණ්ඩලය වෙත එය ආපසු යවනු ලැබිය හැකි අතර, ඒ අනුව කරුණු සැලකිරීම මණ්ඩලය විසින් සංශෝධනය කළ යුතුය.

(6) අභියාචනාධිකරණයෙහි එක් විනිශ්වයකාරවරයකු හෝ ඊට වැඩි ගණනක් විසින් එකී කරුණු සැලකිරීමෙන් උද්ගතවන යම් නීති ප්‍රශ්නයක් විභාග කොට තීරණය කළ හැකි අතර, ඒ ප්‍රශ්නය පිළිබඳව අධිකරණය එළඹි තීරණය සම්බන්ධයෙන් අභියාචනය කරනු ලැබුවේ යම් මතයකට විරුද්ධවද ඒ මතය ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම ඒ අනුව කළ හැකි අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ තක්සේරුව හෝ දැන්වීම සම්බන්ධයෙන් ස්ථිර කිරීමක්, අඩු කිරීමක්, වැඩි කිරීමක් හෝ නිෂ්ප්‍රභ කිරීමක් කළ හැකිය. නැතහොත් ඒ පිළිබඳව අධිකරණයේ මතය සමග සැලකරනු ලැබූ කාරණය මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලැබිය හැකිය.

(7) අභියාචනාධිකරණය ඉදිරියේ වූ යම් නඩු කටයුත්තකදී අභියාචනාධිකරණයෙහි ගාස්තු සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ ගෙවනු ලැබූ මුදල සම්බන්ධයෙන් ද සුදුසු යයි අධිකරණය සලකන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකිය.

(8) (6) වන උප වගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවකට විරුද්ධව කොමසාරිස්වරයා විසින් හෝ වෙනත් යම් පාර්ශ්වකරුවක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට හැකි කිරීමේ කාර්යය සඳහා සහ අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමට අදාල යම් ලිඛිත නීතියක විධිවිධාන අදාල කිරීමේ කාර්ය සඳහා -

(අ) (6) වන උප වගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවක් සහ ඒ සමග (7) වන උප වගන්තිය යටතේ ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් පළාත් කොමසාරිස්වරයා සහ ඒ වෙනත් පාර්ශ්වකරු අතර වූ සිවිල් නඩුවක දී අභියාචනාධිකරණය විසින් කරන ලද අවසාන නඩු තීන්දුවක් ලෙස සැලකිය යුතුය;

(ආ) ඒ සිවිල් නඩුවේ ප්‍රස්තුත කාරණයෙහි වටිනාකම රුපියල් පන් දහසක් ලෙස සැලකිය යුතුය;

එසේ වුව ද මණ්ඩලය විසින් ප්‍රස්තුත බදු මුදල් ප්‍රමාණය වශයෙන් රුපියල් පන් දහසකට වැඩි ප්‍රමාණයක්, කරන ලද කරුණු සැලකිරීමෙහි දක්වා ඇති අවස්ථාවක, ඒ සිවිල් නඩුවෙහි ප්‍රස්තුත කාරණයෙහි වටිනාකම එසේ දක්වා ඇති වැඩි ප්‍රමාණය ලෙස සැලකිය යුතුය;

තවද,

(ඇ) එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් එවැනි යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස කොමසාරිස්වරයාට නියම කරනු නොලැබිය යුතුය.

XXVII වන පරිච්ඡේදය

බද්ද අයකර ගැනීම.

85. (1) මේ පරිච්ඡේදයේ "බද්ද" යන්නෙහි "පිරිවැටුම් බද්දක්" සහ මුද්දර ගාස්තුවක් සහ ඒ "පිරිවැටුම් බද්දට" හෝ "මුද්දර ගාස්තුවට" එකතු කරන ලද යම් මුදලක් සහ මේ ප්‍රඥප්තිය යටතේ දරන ලද කවර වූ යම් දඬ, දණ්ඩන, මුදල්, ගාස්තු හෝ වියදම් ඇතුළත් වේ.

(2) 4 වන වගන්තියෙ සහ 57 (1) (ආ) වගන්තිය යටතේ වූ යම් දැන්වීමක් මගින් ගෙවීමට නියමිත බදු මුදල ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර ගෙවිය යුතු අතර එසේ නොගෙවන ලද බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) 11 වන සහ 12 වන වගන්ති යටතේ සහ 57 (1) (ආ) වගන්තිය යටතේ සෑම කාර්තුවක් තුල ගෙවිය යුතු බද්ද, එහි සඳහන් දින හෝ ඉන් පෙර ගෙවනු නොලැබූ අවස්ථාවක ඒ බද්ද සහ බද්දෙන් සියයට 10 ක් සහ ගෙවීම නොකළ සෑම මාසයක් සඳහා පැහැර හැර ඇති බද්දෙන් සියයට 2 ක දණ්ඩන මුදලක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, බද්ද ගෙවීමට යටත් තැනැත්තා ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සැලකිය යුතුය.

එසේ වුවද, දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතු මුළු මුදල ගෙවීම පැහැර හරින ලද ගාස්තුවෙන් සියයට පනහක් නොඉක්මවිය යුතුය.

(4) යම් අභියාචනයක් ඉදිරිපත් කර ඇති විටක, ඒ අභියාචනයේ තීරණය ලැබෙන තෙක් යම් බද්දක් හෝ එහි යම් කොටසක් ගෙවීම අත් හිටුවා තබන ලෙස කොමසාරිස්වරයා නියම කළහොත් මිස, ඒ අභියාචනය නොතකා එය ගෙවිය යුතුය. එවැනි නියමයක් කරන ලද විටක එසේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්ද පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතුය.

(5) (3) වන උප වගන්තිය යටතේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්ද හෝ එහි යම් කොටසක් ලබා ගැනීමට නොහැකි වීමට ඉඩ ඇති බව හෝ අභියාචක තම අභියාචනයේ කටයුතු අයුක්ති සහගත ලෙස ප්‍රමාද කරන බව හෝ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් ඒ උපවගන්තිය යටතේ කළ නියමය ප්‍රත්‍යාදිෂ්ට කොට අවස්ථානුකූලව අවශ්‍ය යයි ඔහුට පෙනී යන යම් අලුත් නියමයක් කරනු ලැබිය හැකිය. ඒ අලුත් නියමයෙහි සඳහන් කරනු ලබන දින හෝ ඊට පෙර නොගෙවන ලද යම් බද්දක් පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතුය.

(6) මේ කොටස යටතේ අභියාචනයක් පිළිබඳව අවසාන තීරණයක් කරනු ලැබූ විට හෝ කොමසාරිස්වරයා විසින් යම් නියමයක් කරනු ලැබූ විට, (4) වන උප වගන්තිය යටතේ ගෙවීම අත්හිටුවන ලද යම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක හෝ දැන්වීමක් යටතේ ගෙවනු ලැබිය යුතු බද්ද හෝ බද්දක ශේෂයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද ඒ දිනය නියම කරමින් කොමසාරිස්වරයා විසින් අභියාචක වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් යැවිය යුතුය. ඒ දිනයට පෙර ගෙවනු නොලැබූ යම් බද්දක් පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතුය.

86. ගෙවීම පැහැර හරිනු ලැබූ යම් බද්දක්, පැහැර හැර ඇති තැනැත්තාගේ සියලු වත්කම් විෂයෙහි ප්‍රථම වැය බරක් විය යුතුය;

එසේ වුවද -

(i) 88 වන වගන්තියෙහි විධිවිධානවලට අනුව තහනමට ගනු ලැබීමට පෙර පැහැර හැරි තැනැත්තා විසින් වටිනාකම දී සද්භාවයෙන් මිළදී ගන්නකුට විකුණන ලද වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතුය; නැතහොත් ඒ වැය ඒ වත්කම්වලට බල නොපෑ යුතුය.

තවද,

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, දේපළ තහනම් කරනු ලැබූ දිනට පෙර, වටිනාකම දී සද්භාවයෙන් ඇති කරනු ලැබ ලියාපදිංචි කරන ලද බදු දීමකට හෝ බැඳීමකට ඉහළින් ප්‍රමුඛත්වයක් පැහැර ඇති මුදලට නොලැබිය යුතුය.

87. (1) යම් බද්දක් පැහැර හැර ඇති අවස්ථාවක, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති කවර හෝ ආකාරයකින් ඒ බද්ද ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට පෙර කොමසාරිස්වරයා විසින් -

(අ) ඒ බද්දෙහි විස්තර; සහ
(ආ) ඒ බද්ද අය කිරීම සඳහා කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින්, පැහැර හැර ඇති තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතුය.

(2) පැහැර හැර ඇති තැනැත්තා විසින් 57 (1) (ආ) වගන්තිය යටතේ වූ යම් තක්සේරුවකට හෝ දැන්වීමකට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත අභියාචනයක් කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී, එසේ නියම කරනු ලැබූ බද්ද පිළිබඳව යම් විරෝධතාවයක් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව තම තීරණය දිය යුතුය. එවිට ඒ තීරණය අවසානාත්මක වන්නේය.

(3) මේ වගන්තියේ කුමක් සඳහන් ව ඇත්ද, 57 (1) (ආ) වගන්තිය යටතේ වූ දැන්වීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, ඒ දැන්වීමේ සඳහන් යම් බද්දක් ගෙවීම කොමසාරිස්වරයාගේ නියමයක් අනුව අත්හිටුවා ඇත්තා වූද, ඒ අභියාචනය විභාග කරනු ලබන අතර තුර, ඒ දැන්වීම සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් යම් මුදලක් අයවිය යුතු බවට හෝ අයවීමට ඉඩ ඇති බවට අභියාචක එකඟ වන්නා වූද අවස්ථාවක, කොමසාරිස්වරයාවිසින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර දිනයක ඒ මුදල ගෙවන ලෙස අභියාචකට නියම කරනු ලැබිය හැකිය. ඒ දිනයට පෙර නොගෙවන ලද යම් මුදලක් පැහැර හරින ලද මුදලක් ලෙස සැලකිය යුතුය.

(4) යම් අභියාචනයක් මේ කොටස යටතේ අවසානාත්මක ලෙස තීරණය කරනු ලැබූ විටක, පැහැර හැර තිබෙන යම් බද්දක් අඩු කරනු ලබන අවස්ථාවක, ඒ බද්ද සම්බන්ධයෙන් ගෙවිය යුතු දණ්ඩන මුදල ද සමානුපාතිකව අඩු කරනු ලැබිය යුතුය.

88. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් බදු එකතු කරන්නන් පත් කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් බද්දක් ගෙවීම පැහැර හරින අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තරද පැහැර හැර ඇති තැනැත්තාගේ නම ද ඇතුළත් සහතිකයක් දිසාපතිවරයකුට, පිස්කල්වරයකුට, නියෝජ්‍ය පිස්කල්වරයකු හෝ බදු එකතු කරන්නකු වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. ඒ සහතිකයේ නම් කරනු ලැබූ පැහැර හැර ඇති තැනැත්තාගේ චංචල දේපල තහනමට ගෙන විකිණීමෙන් ඔහුගෙන් ගාස්තු අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට මෙයින් බලය දෙනු ලබන අතර එසේ කරන ලෙස ද ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) චංචල දේපල තහනමට ගැනීම ඉතාමත් යෝග්‍ය යයි ඒ නිලධරයා සලකන ආකාරයට කළ යුතු අතර, ඒ නිලධරයා විසින් යම් චංචල දේපලක් තහනමට ගනු ලැබූ විගස, ඒ දේපළවල ලැයිස්තුවක් වහාම පිළියෙල කොට, ඔහු විසින් එය අත්සන් කොට පැහැර හැර ඇති තැනැත්තාට දී එහි පිටපතක් කොමසාරිස්වරයාට යැවිය යුතුය.

(ඇ) එසේ තහනමට ගනු ලැබූ දේපළ -

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක පැහැර හැර ඇති ගාස්තුව පියවීම සඳහා ඒ මුදල් ගෙවිය යුතුය;

(ii) විදේශීය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කළ යුතු අතර , එයින් ලැබෙන මුදල් පැහැර හැර ඇති ගාස්තුව පියවීම සඳහා ගෙවිය යුතුය;

(iii) මුදල් නොවන වෙනත් දේපලක් වන අවස්ථාවක පැහැර හැර ඇති තැනැත්තා විසින් වියදම් සහ වෙනත් අය කිරීම් ගෙවීමේ වගකීම පිට ඒ දේපල දින පහක කාලයක් තබාගත යුතුය. පැහැර හැර ඇති තැනැත්තා විසින්, එකී දින පහ ඇතුළත පැහැර හැර ඇති ගාස්තුව සහ එකී වියදම් සහ වෙනත් අයකිරීම් ගෙවනු නොලැබුවහොත් දිසාපතිවරයා, සහකාර දිසාපතිවරයා, පිස්කල්වරයා, නියෝජ්‍ය පිස්කල්වරයා හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්වීමට හෝ ඒ දේපළ ගණුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක හෝ පොදු සමාගමක කොටසක් හෝ වන අවස්ථාවක, තැරැව්කරුවකු මගින් එදින පවතින වෙළෙඳ අගය අනුව ඒ දේපළ විකිණීමට සැලැස්වීම හෝ කළ යුතුය.

(ඇ) (iii) වන අනුඡේදයේ සඳහන් විකිණීමෙන් උපලබ්ධිවන මුදල් ප්‍රමාණය පහත දැක්වෙන පරිදි යෙදවිය යුතුය.

(i) පළමුව දේපළ තහනමට ගැනීමේ, තබා ගැනීමේ සහ විකිණීමේ වියදම් සහ ගාස්තු පියවීම සඳහා සහ

(ii) දෙවනුව, පැහැර හැර ඇති බද්ද පියවා ගැනීම සඳහා ඉන්පසු ශේෂ වන යම් මුදලක් වේ නම් එය තහනමට ගනු ලැබූ දේපලෙහි අයිතිකරුට ගෙවිය යුතුය.

(3) තහනමට ගැනීම ක්‍රියාත්මක නොකරන ලද්දේ වුවද, යම් පැහැර හැරි තැනැත්තෙකුට විරුද්ධව මේ වගන්තිය යටතේ නීති කෘත්‍යය කරගෙන යාමේදී බදු අයකරන්නකු විසින් දරනු ලැබූ යුක්ති සහගත වියදම් ඔහු විසින් ඒ පැහැර හැරි තැනැත්තාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය. මුදල් තහනමට ගෙන ඇති අවස්ථාවක දී යට කී අන්දමේ යුක්ති සහගත වියදම් පළමුකොට ඒ මුදල්වලින් අඩු කරගනු ලැබිය යුතුය.

(4) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී සහ (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ බද්ද අයකර ගැනීම ප්‍රායෝගික හෝ යෝග්‍ය නොවන්නේ යයි කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, ඒ බද්ද පිළිබඳ විස්තර , ඒ බද්ද ගෙවිය යුතු තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ඇතුලත් සහතිකයක්, එකී පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඔහුට අයත් චංචල හෝ නිශ්චල යම් දේපළක් පිහිටා ඇති ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එවිට ඒ බද්ද අයකර ගැනීම සඳහා අවශ්‍ය යයි ඒ දිසා අධිකරණය එයින් සලකනු ලබන පරිදි පැහැර හරින්නාගේ චංචල හෝ නිශ්චල දේපල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ තහනමට ගෙන විකුණන ලෙස ඒ පිස්කල් නිලධරයාට බලය දෙමින් ඇස්කිසි රිට් ආඥාවක් නිකුත් කරන ඒ අධිකරණය විසින් විධාන කළ යුතුය. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි තහනමට ගැනීමකට සහ විකිණීමකට අදාළ වන්නේය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපල" යන්නට පිරියත් සහ යන්ත්‍රෝපකරණ ඇතුළත් වේ.

(5) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන කවර වුවද අවස්ථාවකදී, ඒ පිළිතුරු නිවේදනයක් නොපමාවම පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමෙන් හෝ විදුලි පුවතක් මගින් හෝ පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හරින්නා වෙත ඒ නිවේදනය නොලැබීම නිසා මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවන්නේය.

89. (1) එසේ තහනමට ගෙන විකිණීමෙන් පැහැර හැර ඇති බද්ද අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, හෝ තහනමට ගෙන විකිණීමෙන්, සම්පූර්ණ බද්ද අයකර ගනු නොලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, ඒ බද්දේ විස්තර ද පැහැර හැර ඇති තැනැත්තා ගේ නම සහ ඔහුගේ අන්තිමට දැන සිටි පදිංචි ස්ථානයද දැක්වෙන සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ හැකිය.

එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, බද්ද අයකර ගැනීම සඳහා ඒ පැහැර හැර ඇති තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්වීමට තරම් කරුණු තිබේ නම්, ඒ කරුණු ඔහු විසින් දැක්වීම පිණිස තමා වෙත කැඳවිය යුතුය. ඔහු ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත්, පැහැර හැර ඇති බද්ද දඩයකින් පමණක් දඩුවම් කළ හැකි හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඩුවම් නොකළ හැකි වරදක් සඳහා

ඒ පැහැර හැර ඇති තැනැත්තාට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දණ්ඩන නියමයකින් නියම කරනු ලැබූ දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට, ඒ වරද සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන (එහි (අ), (ආ) සහ (එ) ඡේද හැර) අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර කොමසාරිස්වරයා විසින් කළ හැකිව තිබූ විධානයක් ද ඔහු විසින් කරනු ලැබිය හැකිය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උප වගන්තියේ කාර්ය සඳහා නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන, මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තකදී මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කරනු ලැබීම හෝ විභාග කරනු ලැබීම නොකළ යුතු අතර, ඒ අනුව, ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන සලකා බැලීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය පවරන්නක් ලෙස ඒ උප වගන්තියෙහි වූ කිසිවක් තේරුම් නොගත යුතුය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උප වගන්තිවල විධිවිධාන කිසිවක් මේ වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් යම් අවස්ථාවකට අදාළ නොවිය යුතුය.

(4) (1) වන උප වගන්තියේ සඳහන් වන්නා වූ ද, පැහැර හැර ඇති තැනැත්තාට නියම කරනු ලැබූ ලෙස ඒ උප වගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා, පැහැර හැර ඇති තැනැත්තා බන්ධනාගාරගත කිරීමට නියම කරනු ලැබුවා වූ ද යම් අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ දඩ මුදල ගෙවීමට කල් දීම හෝ ඒ මුදල කොටස් වශයෙන් ගෙවන ලෙස විධාන කිරීම හෝ කළ හැකිය.

(5) (1) වන උප වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උප වගන්තිය යටතේ කල් දීම සඳහා හෝ (4) වන උප වගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා හෝ පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තබන ලෙස අධිකරණය විසින් නියම කළ හැකිය. තවද එසේ ඇප තබන ලෙස පැහැර හැර ඇති තැනැත්තාට නියම කළ විටක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ xxxiv වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

(6) කොටස් වශයෙන් යම් මුදලක් ගෙවිය හැකි බවට මහේස්ත්‍රාත්වරයෙකු විසින් (4) වන උප වගන්තිය යටතේ විධාන කරනු ලැබ තිබියදී, ඉන් යම් කොටසක් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියළුම කොටස් ගෙවීම පැහැර හැර ඇති විටක මෙන් නඩු කටයුතු ඇරඹිය හැකිය.

(7) (1) වන උප වගන්තිය යටතේ යම් නඩු කටයුත්තකදී කොමසාරිස්වරයාගේ සහතිකය බද්ද ගෙවන ලෙස යථා පරිදි නියම කරනු ලැබූ බවට හා එය පැහැර හැර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, ගාස්තු ප්‍රමාණය අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනා කොට ඇති බවට ඉදිරිපත් කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතුය.

90. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද පැහැර හැර ඇත්තා වූ ද -

(අ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට යම් තැනැත්තකුගෙන් යම් මුදලක් ලැබිය යුතු බව හෝ යම් තැනැත්තකු මුදල් ගෙවීමට සූදානම්ව සිටින බව; හෝ

(ආ) පැහැර හැර ඇති තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා නැතහොත් වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබා ගෙන සිටින බව; හෝ

(ඇ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙනත් යම් තැනැත්තකු මුදල තබාගෙන සිටින බව; හෝ

(ඈ) පැහැර හැර ඇති තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට වෙනත් යම් තැනැත්තකුගෙන් යම් තැනැත්තකු බලය ලබා සිටින බව

කොමසාරිස්වරයාට පෙනී යන්නා වූද අවස්ථාවක, පැහැර හැර ඇති බදු ප්‍රමාණය නොඉක්මවන මුදලක් දැන්වීමේ සඳහන් කරනු ලබන නිලධරයා වෙත ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කෙරෙන (පැහැර හැර ඇති තැනැත්තා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතුය.) ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට දිය හැකිය. දැන්වීම ලැබුණු දිනයෙහි ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් ලැබිය යුතු සියලුම මුදල්වලටද, දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක, ඔහු අතට පත්වන හො ඔහුගෙන් ලැබිය යුතු වන හෝ ඔහු විසින් ගෙවීමට ඉඩ ඇති සියලුම මුදල් වලටද ඒ දැන්වීම අදාළ විය යුතුය.

(2) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු, පැහැර හැර ඇති තැනැත්තාගේ සහ සම්බන්ධතාවයක් ඇති වෙනත් සියලු තැනැත්තන්ගේ බලය යටතේ ක්‍රියාකළ ලෙස සැළකිය යුතු අතර, යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කුමක් සඳහන්ව තිබුණද, ඒ ගෙවීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලින් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(3) (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ඒ උප වගන්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත ඒ උප වගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ මුදල් ඔහුගෙන් ලැබිය යුතු නොවීමේ හේතුව නිසා ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසු දින දහ හතරක් ඇතුළත ඒ කරුණු සඳහන් කරමින් කොමසාරිස්වරයාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතුය.

(4) මෙහි (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වී ඇත්තා වූද, (3) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස්වරයාට දැනුම්දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ අවස්ථාවක හෝ දැන්වීම අදාළ වන ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ හෝ ගෙවනු ලැබිය හැකිව තිබූ සහ කොමසාරිස්වරයා විසින් දෙන ලද දැන්වීමෙන් නියම කරනු ලැබූ පරිදි ඒ ගාස්තුව හෝ එහි කොටස (1) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත්වීමෙන් දින දහ හතරක් ඇතුළත ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම්, ඒ තැනැත්තා ද, ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම් කළමනාකරු හෝ එහි ප්‍රධාන නිලධරයාද, එකී තැනැත්තා විසින් ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබූ සම්පූර්ණ ගාස්තුව ගෙවීම සඳහා පෞද්ගලිකව වගකිව යුතුය. තවද ඒ මුදල මේ පනතේ විධිවිධාන මගින් සලස්වනු ලැබූ සෑම මාර්ගයකින්ම අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ ප්‍රධාන නිලධරයාගෙන් ලබාගත හැකිය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමට පැහැර හැරි තැනැතකුගේ අනුයෝජිතයකු ද ඇතුළත් වන ලෙස සැළකිය යුතු අතර යම් තැනැත්තකු ජීවත්ව සිටී නම් ඔහු විසින් ගෙවිය යුතුව තිබෙන බද්ද පැහැර හැර ඇති අවස්ථාවලට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය. තවද එවැනි අවස්ථාවකට මෙම විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා (1 වන උප වගන්තියේ "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමෙන් -

(අ) මියගිය තැනැත්තකුගේ පොල්මඃකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ දේපලවල සන්තකය භාර ගන්නා වූ හෝ දේපල පරිශීලනය කරන්නා වූ යම් තැනැත්තෙක්; හෝ

(ඇ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබෙට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැතැත්තෙක්

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් අය කර ගැනීම

91. (1) යම් තැනැත්තකු විසින් ගෙවීමට නියමිත බදු මුදල නොගෙවා, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ කඩ ඇති බව හෝ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ මුදල පිළිබඳ විස්තර ද ඒ තැනැත්තාගේ නමද අඩංගු සහතියක් කොමසාරිස්වරයා විසින් මහේස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ මහේස්ත්‍රාත්වරයා වෙත එය ලැබුණු විට, මුදල නොගෙවා හෝ එය ගෙවීම සඳහා කොමසාරිස්වරයා සෑහීමට පත්වන ආකාරයට ඇප නොතබා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැලැක්වීමට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයාට විධානයක් නිකුත් කළ යුතුය.

(2) මහේස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරනු ලබන වේලාවෙහි, කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කරනු ලැබූ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතුය. එහෙත් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු එවැනි නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් බල රහිත නොවිය යුතුය.

(3) මුදල ගෙවූ බවට හෝ මුදල ගෙවීම සඳහා ඇප තැබූ බවට හෝ පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ මුදල ගෙවූ බවට කොමසාරිස්වරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතුය. යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස්වරයා වෙත නොපමාව ගෙවිය යුතුය.

92. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකළ යුතු සම්පූර්ණ ගාස්තුව මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් අදාළ කිරීමෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති බව හෝ නොහැකිවීමට ඉඩ ඇති බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක 89 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර, එය ක්‍රියාත්මක කර තිබුණද, නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් ලබා ගැනීම සඳහා මේ පරිච්ඡේදයෙන් විධිවිධාන සලස්වනු ලැබූ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

අයකර ගැනීම සඳහා එකකට වැඩි මාර්ග ගණනක් උපයෝගී කර ගැනීම.

93. කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තෙකු වෙත දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ තැනැත්තාගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ ලැබිය යුතු යම් ගාස්තුවක් ලබා ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයාට අවශ්‍ය වන යම් තෙරතුරක්, ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය

ගාස්තුව අය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමට ඇති බලය

4 වන කොටස
XXVIII වන පරිච්ඡේදය
<u>සුරාබදු ආදායම.</u>

94. රේන්ද, ගස් මැදීමේ ගාස්තු සහ (සංශෝධිත පරිදි වූ) 1912 අංක 8 දරණ සුරාබදු ආඥාපනත යටතේ, මත් බව ඇති කරන මත්පැන් සන්තකයේ තබා ගැනීම ප්‍රවාහනය, මිලදී ගැනීම හා විකිණීම පිළිබඳව වූ මත්පැන් බලපත්‍ර සම්බන්ධයෙන් නියම කරනු හෝ අය කරනු ලබන්නා වූ ද පළාත තුළදී ගෙවනු හෝ අයකර ගනු ලබන්නා වූ ද, සියලු ගාස්තු (සංශෝධිත පරිදි වූ) ඉහත කී ආඥාපනතට අනුකූලව අයකරගත යුතු අතර, ඒවා පළාතේ පළාත් අරමුදලේ බැරට ප්‍රේෂණය කළ යුතුය.

සුරාබදු බලපත්‍ර ගාස්තු සහ තැබෑරුම් කුලී

95. පළාතේ ආදායම් කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තක්සේරුකරුවකුගේ නිලයට අඩු නොවන නිලයක නිලධරයකු විසින් බලපත්‍ර ගාස්තු හෝ රේන්ද අයකර ගැනීමට අදාළ යම් කාරණයක් සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලේඛන ඒ නිලධරයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස මත්පැන් ප්‍රවාහනය කිරීමේ, සන්තකව සිටීමේ, මිලදී ගැනීමේ හෝ සිල්ලරට විකිණීමේ යෙදී සිටින යම් තැබෑරුම් රේන්දකරුවකුට හෝ මත්පැන් බලපත්‍රලාභියකුට ලිඛිත නියමයක් මගින් නියම කළ හැකිය.

5 වන කොටස
XXIX වන පරිච්ඡේදය
ලොතරැයි.

ලොතරැයි බද්ද

96. (1) ජාතික ලොතරැයිය හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ලොතරැයියක් හැර, යම් නීතියකට අනුකූලව දකුණු පළාතේ පවත්වනු ලබන යම් ලොතරැයි සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුප්‍රමාණයක වූ බද්දක් සෑම ලොතරැයියකම දළ ලැබුම් මත පැනවිය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක්ම එම නියමයේ නිශ්චිතව සඳහන් දිනයේදී ක්‍රියාත්මක විය යුතු අතර එම නියමය, එය පළ කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත හෝ එම කාල සීමාව ඇතුළත සභාවේ රැස්වීමක් නොපැවැත්වුවහොත් එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන 1 වන රැස්වීමේදී හෝ සභාවේ අනුමත සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) අනුමත කිරීමට සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියමයක්, එම ප්‍රතික්ෂේප කිරීමේ දී සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කරන ලද කිසිම දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(4) මේ වගන්තියේ ලොතරැයියක් යන්නට ලොතරැයියක ස්වභාවයේ වූ යම් ව්‍යවසායයක් ඇතුළත් වේ.

බද්ද ගෙවීම

97. (1) ii වගන්තිය යටතේ පනවන ලද යම් බද්දක් ලොතරැයියේ සංවිධායක හෝ සංවිධායකයන් විසින් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය. එම බද්ද නොගෙවනු ලැබුවහොත් එය පළාත් සභාවට අය විය යුතු ණයක් සේ සංවිධායකගෙන් හෝ සංවිධායකයන්ගෙන් අය කර ගනු ලැබිය හැකිය.

(2) සංවිධායක හෝ සංවිධායකයන් බද්ද නොගෙවන අවස්ථාවක ඔහු හෝ ඔවුන් ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරදකට වරදකරු හෝ වරදකරුවන් විය යුතුය.

(3) මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රු. 5000/=කට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් හෝ එක් ආකාරයකින් බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

6 වන කොටස
XXX වන පරිච්ඡේදය
මෝටර් වාහන.

98. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද (සංශෝධිත පරිදි වූ ලංකා නීති ප්‍රඥප්තියේ 203 වන අධිකාරය වන) මෝටර් ප්‍රවාහන පනත යටතේ පනවනු හෝ නියම කරනු ලැබූ යම් ගාස්තු හෝ දණ්ඩන සමග බලපත්‍ර ගාස්තු ඇතුළු සියළු ගාස්තු වූ ද පනත යටතේ ඒවා ලැබීමට හිමිකම ඇති බලධරයාට ගෙවනු ලැබූ හෝ පළාත ඇතුළත එම බලධරයා විසින් හෝ පළාත් සභාව විසින් පත් කරන ලද වෙනත් යම් බලධරයෙකු විසින් එකතු කර ගෙන එම බලධරයා විසින් පළාතේ පළාත් අරමුදලේ බැරට ප්‍රේෂණය කළ යුතුය. මෝටර් වාහන ගාස්තු

7 වන කොටස
XXXI වන පරිච්ඡේදය
අධිකරණ දඩ.

99. පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින්, පළාත් සභාව විසින් සම්මත කරන ලද ප්‍රඥප්තියක් යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නියම කරනු ලැබ, අධිකරණය වෙත ගෙවනු ලබන සියළුම දඩ, යම් ලිඛිත නීතියක් අනුව එම දඩයෙන් කළ යතු යම් යම් ගෙවීමක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් කරනු ලබන යම් විධානයකට යටත්ව, ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය. අධිකරණ දඩ

8 වන කොටස
XXXII වන පරිච්ඡේදය
සාමාන්‍ය කරුණු.

100. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් හෝ තක්සේරුකරුවෙකු විසින් හෝ දෙනු ලැබිය යුතු සෑම දැන්වීමකම , අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ ඒ තක්සේරුකරුගේ නම සඳහන් විය යුතු අතර, පළාත් කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය පළාත් කොමසාරිස්වරයාගේ හෝ පළාත් තක්සේරුකරුගේ නම යථා පරිදි එවැනි සෑම දැන්වීමකම මුද්‍රණය කොට හෝ ඒ මත අත්සන් කරනු ලැබ හෝ තිබේ නම්, එය වලංගු විය යතුය. දැන්වීමක් අත්සන් කිරීම, එය බාර දීම

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙන ලද සෑම දැන්වීමක්ම, යම් තැනැත්තකු වෙත පෞද්ගලිකව බාර දීමෙන් හෝ ඔහු අවසන් වරට පදිංචිව සිටි ස්ථානයට හෝ ඔහු තම ව්‍යාපාරය පවත්වා ගෙන යන හෝ පවත්වා ගෙන ගිය ස්ථානයට තැපැල් මගින් යැවීමෙන් හෝ බාර දෙනු ලැබිය හැකිය.

එසේ වුවද 13 වන හෝ 14 වන වගන්තිය යටතේ වූ තක්සේරු දැන්වීමක් පෞද්ගලිකව හෝ ඉහත කී පරිදි එවැනි යම් ස්ථානයකට ලියාපදිංචි ලිපියක් මගින් තැපෑලෙන් යැවීමෙන් බාර දෙනු ලැබිය යුතුය.

(3) තැපැල් මගින් යවන ලද යම් දැන්වීමක්, සාමාන්‍ය තැපෑලේ ලැබිය හැකි දින බාර දුන් දින ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපැල් මගින් බාර දුන් බව ඔප්පු කිරීමේදී , දැන්වීම ඇතුළත් ලිපියෙහි නිසි ලෙස ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේය.

(5) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා දෙන ලද හෝ නිකුත් කරන ලද යම් දැන්වීමක් මත මුද්‍රණය කරන ලද හෝ අත්සන් කරන ලද හෝ යම් සහතිකයක් මත අත්සන් කරන ලද සහ එය දීමට හෝ නිකුත් කිරීමට බලය ලද තැනැත්තාගේ නම ලෙස සැලකෙන සෑම නමකටම අධිකරණ සැලකිල්ල ලැබිය යුතුය.

අනවධානයෙන් ගෙවන ලද මුද්දර ගාස්තුව හෝ දණ්ඩන මුදල්

101. (1) යම් තැනැත්තකු විසින් එකතු කර ගැනීමක් මගින් හෝ වෙනත් ආකාරයකින්, ගෙවන ලද යම් මුද්දර ගාස්තුවක් හෝ දඩයක් ඔහු විසින් නිසි පරිදි ගෙවිය යුතු ප්‍රමාණයට වඩා වැඩි බවට කොමසාරිස්වරයා සෑහීමකට පත් වන ආකාරයට ඒ ගෙවීම කරන ලද දින සිට තුන් වර්ෂයක් ඇතුළත ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මගින් ඔප්පු කරනු ලැබුවහොත්, එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

වැඩියෙන් ගෙවූ පිරිවැටුම් බදු ආපසු ගෙවිය යුතු බව

(2) යම් තැනැත්තකුගෙන් යම් කාර්තුවක් සඳහා අය කළ යුතු නිසි ගණනට වැඩියෙන් ඔහු විසින් පිරිවැටුම් බදු ගෙවා ඇති බව ඒ කාර්තුව අවසාන වීමෙන් පසු තුන් අවුරුද්දක් ඇතුළත ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මගින් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

(3) එසේ වුවද, මේ වගන්තියේ කිසිවක්, වෙනත් යම් වගන්තියක සඳහන්ව ඇති අභියාචනා කිරීමේ හෝ ආපසු ගෙවීමේ කාල සීමාව දීර්ඝ කිරීම හෝ අඩු කිරීම හෝ අන් ආකාරයකින් අවලංගුව ඇති යම් විරෝධය පෑමක් හෝ අභියාචනයක් වලංගු කිරීමට හෝ අවසානාත්මක වූ හා තීරණාත්මක වූ යම් දෙයක් ප්‍රතිශෝධනය කිරීමට අවසර දීම හෝ සිදුවන සේ ක්‍රියාත්මක නොවිය යුතුය.

(4) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් යම් මුදලක් යම් තැනැත්තකු විසින් ගෙවූ බවද, එම මුදල එම වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන වලට අනුකූලව එය ගණන් බැලුවේ නම් ඔහු විසින් ගෙවිය යුතුව තිබූ මුදලට වැඩි බවද යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් කරනු ලබන හිමිකම් පෑමක් මගින් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක එම හිමිකම් පෑම ඉහත කී (1) වන උප වගන්තියේ සඳහන් මුදල ගෙවූ කාර්තුවේ අවසානයෙන් තුන් අවුරුද්දක්ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවේ නම්, එසේ වැඩියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

102. (1) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහිලා හැර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකුම, ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියළු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතුය. තවද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුටද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර කොමසාරිස්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතුය.

නිල රහස්‍යතාව

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ සෑම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර, සමාදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරිපිටදී නියමිත ආකෘතියෙහි රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකිය.

(3) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ ප්‍රඥප්තියෙහි හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර යම් වාර්තාවක් ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයකදී ඉදිරිපත් කිරීමට හෝ මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේදී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළි දරවු කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතුය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ එකී වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ දැනුම් දීම අවශ්‍ය නම්, ඒ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයෙකුට දැනුම් දිය හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇතද කොමසාරිස්වරයා විසින්, මේ ප්‍රඥප්ති යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමාට ලැබුණු හෝ තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටයුත්තකදී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේ වුවද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ පිටපත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටකදී කොමසාරිස්වරයාට බල කරනු නොලැබිය යුතුය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන් වුවද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයෙකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි යම් පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් අවසර දිය හැකිය. විගණකාධිපතිවරයා හෝ මේ උප වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකු, මේ පනතේ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන් (2) වන උප වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

103. මේ ප්‍රඥප්තියේ කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා භාවිතා කළ යුතු ආකෘති සහ ගනුදෙනු ලේඛනය කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කළ හැකිය. එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ගනුදෙනු ලේඛනය කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ගනුදෙනු ලේඛනය වෙනුවට වෙනත් යම් ආකෘති හෝ ගනුදෙනු ලේඛනයක් ආදේශ කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකිය.

ආකෘති හා ගනුදෙනු ලේඛන

XXXIII වන පරිච්ඡේදය
ක්‍රියාත්මක කිරීම.

104. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම කොමසාරිස්වරයා වෙත බාර විය යුතුය. නිලධරයන්

(2) මේ ප්‍රඥප්තියෙන් කොමසාරිස්වරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් තක්සේරුකරුවෙකුට බලය දෙනු ලැබිය හැකිය.

(3) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස්වරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන යම් තක්සේරුකරුවෙකුට ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට බලය දෙනු ලැබූ බවට එසේ නොවන බව ඔප්පු කරනු ලබන තෙක්, සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(4) මේ ප්‍රඥප්තියෙන් යම් තක්සේරුකරුවකු වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමසාරිස්වරයෙකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

105. 78 (8) වන වගන්තිය යටතේ තමා වෙත දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

XXXIV වන පරිච්ඡේදය
අර්ථ නිරූපණය.

106. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි - අර්ථ නිරූපණය
"ඇලෙන මුද්දරය" යන්නෙන් අලවනු ලැබිය හැකි වන්නාවූ ද, 67 (1) වන වගන්තිය යටතේ නියමයක් බලාත්මකව ඇත්තාවූ ද මුද්දරයක් අදහස් වේ.
"අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය බාරව සිටින යම් තැනැත්තකු අදහස් වේ.
"තක්සේරුකරු" යන්නෙන් ඒ පනතේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් තක්සේරුකරුවකු අදහස් වන අතර, ඒ පනතේ කාර්ය සඳහා පත් කරන ලද ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ.

"බලයලත් නියෝජිතයා" යන්නෙන්

(1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ සහ -

(අ) සෑම අවස්ථාවකදීම -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයෙක්;

(ii) කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරීවරයෙක්;

(iii) නීතිඥවරයෙක්; හෝ

(iv) ඒ තැනැත්තා විසින් ස්ථිර ලෙස සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තකයෙක්

වන්නා වූ; හෝ

(ආ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයාගේ ඥාතියෙක්;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයෙක් හෝ ලේකම්වරයා;

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙක්;

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ

සාමාජිකයෙක් වන්නා වූ; හෝ

(2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, බලය දෙන ලියවිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන්, යම් තැනැත්තකු විසින් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද සමාගම් (විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයෙකු වශයෙන් ලියාපදිංචි පුද්ගලයෙකු වන්නා වූ ද කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද

යම් පුද්ගලයෙක් අදහස් වේ;

"බැංකුව" යන්නට බැංකු ආයතනයක් ද ඇතුළත් වේ;

"බැංකු ආයතනය" යන්නෙහි, මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය;

"පුද්ගල මණ්ඩලය" යන්නෙන්, යම් සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් හෝ යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක් අදහස් වේ;

"ව්‍යාපාරය" යන්නෙන්, යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම අදහස් වන නමුත් නිෂ්පාදකයෙකු විසින් විකිණීමක් ඊට ඇතුළත් නොවිය යුතුය.

"අය කළ යුතු" යන්නෙන්, ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් හෝ මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනට පසු ප්‍රථමවරට ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් හෝ සම්බන්ධයෙන් වන විට, මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තුවක් අය කළ යුතු බව අදහස් වේ;

"චෙක්පත" යන්නෙන් යම් නිශ්චිත බැංකුවක් වෙත අණ කරන ලද, එහෙත් ඉල්ලූ විට හැර, වෙනත් අවස්ථාවක, නොගෙවිය යුතු ලෙස ප්‍රකාශිත විනිමය පත්‍රයක් අදහස් වේ;

"කොමසාරිස්වරයා හෝ පළාත් කොමසාරිස්වරයා" යන්නෙන්, පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරනු ලැබ, තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට කොමසාරිස්වරයා විසින්, සාමාන්‍ය වශයෙන් හෝ යම් නිශ්චිත කාර්යයක් සඳහා බලය දෙන ලද නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරයෙකු ද ඊට ඇතුළත් වේ.

"සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක බල පවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් සමාගමක් අදහස් වන අතර රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ;

"සමර්පණය කිරීම" යන්නට, විකිණීමක් මත සමර්පණය කිරීම සහ යම් දේපළ හෝ යම් දේපළක් පිළිබඳ යම් සම්බන්ධතාවක් පවරනු ලබන සෑම සාධන පත්‍රයක්ම ඇතුළත් වේ;

"මුද්‍රාංකනය" යන්නට, සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යම් මුද්දර ගාස්තුවක් හෝ දණ්ඩනයක් ගෙවා ඇති බව හෝ සාධන පත්‍රයක විධිමත් ලෙස මුද්දර ගසා ඇති බව හෝ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ මුද්දර ගාස්තුවක් අය කළ යුතු බව ප්‍රකාශ කිරීම හෝ ඒ බව දැක්වීම සඳහා කොමසාරිස්වරයාගේ විධානය යටතේ භාවිතා කරන ලද යම් තහඩු මුද්‍රණයක්, අතුරු ආයුධයක් හෝ උපකරණයක් හෝ එහි කොටසක් ඇතුළත් වේ;

"ලේඛනය" යන්න යම් අධිකරණයක නඩු කටයුතු සම්බන්ධයෙන් යෙදෙන විට, ඊට නීතිඥවරයෙකු පත් කිරීම, පැමිණිල්ල, උත්තරය, ප්‍රති උත්තරය හෝ වෙනත් උත්තරවාදයක්, පෙත්සමක්, ඉල්ලීමක්, දිවුරුම්

පත්‍රයක්, පත් කිරීමක්, සිතාසියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, යම් ආකාරයක ආඥාවක්, ප්‍රදානයක්, රිට් ආඥාවක්, වරෙන්තුවක්, ඉන්වෙන්ටරියක්, ගිණුමක්, අධිකරණ විධානයක්, බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්, කැඳවීමක්, මෝසමක් නොවන ඉල්ලුම්

පත්‍රයක්, පත් කිරීමක්, සිතාසියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, යම් ආකාරයක ආඥාවක්, ප්‍රදානයක්, රිට් ආඥාවක්, වරෙන්තුවක්, ඉන්වෙන්ටරියක්, ගිණුමක්, අධිකරණ විධානයක්, බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්, කැඳවීමක්, මෝසමක් නොවන ඉල්ලුම්පත්‍රයක්, ප්‍රශ්න මාලාවක්, ප්‍රශ්න මාලාවට පිළිතුරු, අභියාචන දැන්වීමක්, ගාස්තු බිල් පත්‍රයක්, අධිකාර පත්‍රයක්, ඉන්ජන්ෂන් තහනමක්, හෝ දැන්වීමක් ඇතුළත් වේ;

"නිසි පරිදි මුද්දර ගසන ලද" යන්න යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් නිසි වටිනාකමට අඩු නොවන ඇලෙන මුද්දරයක් හෝ ලාංඡිත මුද්දරයක් හෝ පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බවද ඒ මුද්දරය ඇලෙන මුද්දරයක් වන අවස්ථාවක මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඒ මුද්දර ගසා, අවලංගු කොට ඇති බවද අදහස් වේ.

"ලියා අත්සන් කරන ලද" සහ "ලියා අත්සන් කිරීම" යන්න, සාධන පත්‍රයක් සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන විට, පිළිවෙලින් "අත්සන් කරන ලද" සහ "අත්සන" යන්න ඉන් අදහස් වේ;

"පොල්මඃකරු" යන්නෙන්, මියගිය තැනැත්තකුගේ පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු අදහස් වන අතර, ඊට පහත දැක්වෙන අය ඇතුළත් වේ-

(අ) මිය ගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය බාර ගන්නා වූ හෝ දේපළ පරිශීලනය කරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති තැනැත්තෙක්; හෝ

(ඇ) භාරයේ කර්තෘගේ අන්තිම කැමති පත්‍රය යටතේ ඇති කරන ලද භාරයක් යටතේ ක්‍රියා කරන භාරකරුවෙක් අදහස් වේ;

"ත්‍යාගය" යන්නෙන්, ස්වේච්ඡාවෙන් සහ මුදලින් වූ ප්‍රතිෂ්ඨාවක්, හෝ මුදල් වටිනාකම ඇති ප්‍රතිෂ්ඨාවක් නොමැතිව යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකුට පවරා දීමක් අදහස් වේ;

"අබලතාවයට පත් තැනැත්තා" යන්නෙන්, යම් බාලවයස්කරුවෙක්, උන්මත්තකයෙක්, මුග්ධයෙක් හෝ සිහි විකල තැනැත්තෙක් අදහස් වේ;

"ලාංඡිත මුද්දරය" යන්නෙන්, මුද්‍රාංකනයක මාර්ගයෙන් සහ රුපියල් දහයක් නොඉක්මවන මුද්දර ගාස්තුවක් අය කළ යුතු යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වූ ලාංඡනය කරන ලද මුද්දර අදහස් වන අතර, සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ පාවිච්චි කරනු ලබන, තැපැල් නිල මුද්‍රා යන්ත්‍රයක මාර්ගයෙන් ලාංඡනය කරන ලද මුද්දර ද ඇතුළත් වේ;

"සාධන පත්‍රය" යන්නට යම් අයිතියක් හෝ බැඳීමක් ඇති කළ, පැවරූ, සීමා කළ, දීර්ඝ කළ, අහෝසි කළ හෝ සටහන් කළ හෝ එලෙස කළ ලෙස හැඟෙන සෑම ලේඛනයක්ම ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂය භාර කරනු ලැබ ඇති පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා අදහස් වේ.

"මුදල්" යන්නට ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කරනු ලැබූ හෝ විදේශයක ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කරනු ලැබූ සියලු මුදල් අතුළත් වේ;

"මෝටර් වාහනය"යන්නෙන්, මෝටර් ප්‍රවාහන පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතුය;

"ඇටෝර්නි බලය" යන්නට යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තා වෙනුවෙන් ඒ තැනැත්තාගේ නාමයෙන් ක්‍රියා කිරීමට යම් නිශ්චිත තැනැත්තකුට බලය දෙන්නා වූ ඒ සාධන පත්‍රය ඇතුළත් වේ;

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දකුණු පළාත අදහස් වේ;

"පළාත් තක්සේරුකරු" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද ආදායම් තක්සේරුකරුවෙක් අදහස් වේ;

"පළාත් කොමසාරිස්වරයා" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ;

"නියෝජ්‍ය පළාත් කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, පළාතක පළාත් සභාව අදහස් වේ;

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රීය හවුල්කරුවන් අතුරින් -

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති; හෝ

(ආ) ගිවිසුමක් නොමැති නම් හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනික් හවුල්කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති; හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයෙහි පළමුවෙන් නම් කොට ඇති,

හවුල්කරු අදහස් වේ;

"කාර්තුව" යන්නෙන්, එක් එක් වර්ෂයේ ජනවාරි මස 01 වන දින, අප්‍රේල් මස 01 වන දින, ජූලි මස 01 වන දින සහ ඔක්තෝබර් මස 01 වෙනි දින ආරම්භ වන මාස තුනක කාලපරිච්ඡේදය අදහස් වේ.

"භාරකරු" යන්නට යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක්, අනුයෝජිතයෙක් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාරණය සතුව ඇති වෙනත් තැනැත්තෙක් ඇතුළත් වන නමුත්, පොල්මඃකරුවෙක් ඊට ඇතුළත් නොවේ.

107. 1990 අංක 03 දරන මුදල් ප්‍රඥප්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීමේ ප්‍රතිපාදන

දකුණු පළාතේ, පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය77 (1) (අ) වගන්තිය යටතේ පනවනු ලබන නියෝග.

දකුණු පළාතේ පළාත් සභාවේ, 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 77(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් අමාත්‍ය ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම, එම ප්‍රඥප්තියේ 45වෙනි වගන්තිය සමග කියවෙන 37(අ), (ආ) සහ (ඇ) දරන වගන්තිවල සහ 1992 අංක 02 දරන දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් (සංශෝධිත) ප්‍රඥප්තියේ සඳහන් ලේඛන සහ ලියවිලි පිළිබඳ මුද්දර ගාස්තු ගෙවීම සඳහා පහත සඳහන් නියෝගයන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ගුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා

දකුණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් අමාත්‍ය

2011 වර්ෂයේ දෙසැම්බර් මස 05 වැනි දින,

ගාල්ල දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

නියෝග

01. මෙම නියෝග දකුණු පළාත් සභාවේ, 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 40 වන වගන්තිය යටතේ වූ මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය සම්බන්ධයෙන් වූ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2012 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කළ යුතුය.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991 ජනවාරි මස 12 වැනි දින අංක 644/29, 1991 පෙබරවාරි මස 05 වැනි දින අංක 648/5, 1991 ජූලි මස 09 වැනි දින අංක 670/4 සහ 2007 ජනවාරි මස 04 වැනි දින අංක 1478/16 දරන අති විශේෂ ගැසට් නිවේදන මගින් නියම කරන ලද සියළුම වටිනාකම්වලින් යුත් අලවන මුද්දර භාවිත කිරීම අවලංගු කළ යුතුය.

03. අදාළ කාර්යය සඳහා අලවන මුද්දර භාවිතා කිරීම වෙනුවට, දකුණු පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 40(2) වගන්තිය ප්‍රකාර බැංකුවට මුදල් ගෙවා ලබා ගත් සහතිකය භාවිතා කළ යුතුය.

04. අදාළ කාර්යය සඳහා මුද්දර ගාස්තු වෙනුවෙන් ගෙවිය යුතු මුදල්, ශ්‍රී ලංකාව තුළ ඕනෑම ලංකා බැංකු හෝ මහජන බැංකු ශාඛාවක් වෙත පහත දක්වා ඇති ආකෘතිය අනුව පහත දැක්වෙන ගිණුම් අංක වෙත ගෙවීම් කළ යුතුය.

ලංකා බැංකුව - ගාල්ල කඩ වීදිය, දකුණු පළාත් ආදායම් කොමසාරිස්ගේ මුද්දර ගාස්තු රැස් කිරීමේ ගිණුම් අංක - 402478

මහජන බැංකුව - ගාල්ල කොටුව, දකුණු පළාත් ආදායම් කොමසාරිස්ගේ මුද්දර ගාස්තු රැස් කිරීමේ ගිණුම් අංක - 013-1001-00021541

11 1991 අංක 01 ප්‍රඥප්තිය

දකුණු පළාතේ පළාත් සභාව - ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය

දකුණු පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීමට විධිවිධාන යෙදීම පිණිසත්, එසේ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම පිණිසත්, ඒ හා සම්බන්ධ වූ වෙනත් කටයුතු පිණිසත් පනවන ලද ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය (149 වන අධිකාරිය වූ) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතට අනුකූල වූවකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය 1991 අංක 01 දරන දකුණු පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991.07.01 දින සිට එය ක්‍රියාත්මක වන්නේය. — ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

02. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා (මෙහි මින්මතු "පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්"යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කරනු ලැබිය හැකිය. මේ ප්‍රඥප්තිය යටතේ සාමාන්‍ය පරිපාලනය ඔහුට බාර වන අතර, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන, පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් හා වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. — ප්‍රඥාප්තිය යටතේ පරිපාලනය

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල කාර්යය හෝ කර්තව්‍යය යම් පමණක් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් හෝ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයෙකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය. ඉටු කරනු ලැබිය හැකිය. සිදු කරනු ලැබිය හැකිය

03. (1) මෙහි (2) වන උප වගන්තියට යටත්වද මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද සහතිකය බලය යටතේ ද හැර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනයේදී හෝ ඉන්පසු දකුණු පළාත තුළ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතුය. — ව්‍යාපාර නාම ලියාපදිංචිය

(2) (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනත යටතේ දකුණු පළාත තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සඳහා දැනටමත් නිකුත් කරන ලද්දා වූ සහතික පත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතික පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස 06ක කාලයක් සඳහා පමණක් එම සහතික පත්‍රය වලංගු වන්නේය.

(3) ඉහත (1) උප වගන්තියේ සඳහන් ලියාපදිංචි කිරීමේ සහතිකය මෙම ප්‍රඥප්තියේ දින සිට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව නියමිත ගාස්තු ගෙවා ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කරවාගෙන අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකපත් ලබා ගත යුතුය.

(4) දකුණු පළාතේ ව්‍යාපාරික ස්ථානයන් පිහිටා ඇත්තා වූ ද මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද වලංගු සහතිකයක් නොමැතිව ව්‍යාපාරික නාමයක් යටතේ ව්‍යාපාරය කරගෙන යන්නා වූද, යම් ව්‍යාපාරක ආයතනයක් හෝ තැනැත්තෙකු, මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මගින් ඒකාබද්ධ කරන ලද (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥා පනතේ විධිවිධාන සලස්වා ඇති දණ්ඩනවලට යටත් විය යුතුය.

ඒකාබද්ධ කිරීමේ වගන්තිය

04. (1) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද (149වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ 2 සිට 16 දක්වා වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව) සහ 18 සිට 20 දක්වා (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල විධිවිධාන එකී වගන්තිවල "ආඥා පනත" යන වචනය යෙදී ඇති කවර වුවද තැනක ඒ වෙනුවට "ප්‍රඥප්තිය" යන වචනය ආදේශ කිරීමට යටත්ව සහ එකී ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ 8 වන ඡේදයේ "රුපියල් සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට යන වචන ආදේශ කිරීමට යටත්ව සහ එම ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ 10 වන ඡේදයේ "රුපියල් තුන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමට යටත්ව මේ ප්‍රඥප්තියෙහි ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා මේ ප්‍රඥප්තියෙහි කොටසක් වන්නේය. තවද එකී වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව දකුණු පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා අදාළ වන්නේය.

(2) මෙහි 1වන තීරයෙහි දැක්වෙන යම් නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙයකට අදාළව (1) වන උප වගන්තියේ සඳහන් විධිවිධාන වලට ඇතුළත් වන යම් සඳහනක් මෙහි 2 වන තීරයේ තදානුරූපව දන්වා ඇති නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දෙයකට කරනු ලැබූ සඳහනක් සේ සලකනු ලැබිය යුතුය.

1 වන තීරය	**2 වන තීරය**
අමාත්‍යවරයා	.. දකුණු පළාතේ වෙළෙඳ විෂය භාර
	.. පළාත් අමාත්‍යවරයා
රෙජිස්ට්‍රාර්	.. පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්
මේ ආඥා පනත	.. මේ ප්‍රඥප්තිය

05. (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ විධි විධාන අදාළ වන බවට මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇත්තේ යයි සලකනු ලබන තාක් දුරට හැර, එකී ආඥා පනතේ විධිවිධාන, ව්‍යාපාරික නාම යටතේ දකුණු පළාත තුළ ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාර ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සහ ඊට සම්බන්ධ කාර්යය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම නතර විය යුතුය.

(149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥා පනත දකුණු පළාත තුළ අදාළ නොවන බව

06. (1) පහත දැක්වෙන කවර කරුණක් සඳහා වුවද ව්‍යවස්ථා හෝ නියෝග දකුණු පළාතේ වෙළෙඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් සම්පාදනය කළ හැකිය.

නියෝග සම්පාදනය කිරීමේ බලය

(අ) පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාල පිහිටුවීම.

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රුපියල් පන්සියයකට වැඩි නොවන පරිද්දෙන් පළාත් සමාගම් රෙජිස්ට්‍රාර්ට හෝ පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවිය යුතු ගාස්තු.

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ පාවිච්චි කළ යුතු ආකෘති.

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් හා පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් ඉටු කළ යුතු යුතුකම්.

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් කළ යුතු බවට නියම වූ කාර්යභාරය පළාත් සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් හා සෙසු නිලධාරීන් විසින් ඉටු කිරීම.

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ තබනු ලබන ලේඛන හෝ ඒවායේ අන්තර්ගත විස්තර පිළිබඳ වාර්තාවන්හි විස්තර ගැසට් පත්‍රයෙන් හෝ වෙනත් ක්‍රමයකින් කලින් කල ප්‍රසිද්ධියට පත් කිරීම

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පරිපාටිය හා පාලනය සහ ඊට ආගන්තුක වූ සෙසු කරුණු ද වේ.

(2) එබඳු කිසියම් ව්‍යවස්ථා හෝ ආඥා සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ගාස්තු දකුණු පළාතේ වෙළෙඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් විධාන කරන පරිද්දෙන් ගෙවිය යුතුය.

1991 මැයි මස 14 වන දින පවත්න ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

සභාපති,
දකුණු පළාත් සභාව

1991 මැයි මස 29 වන දින,
ගාල්ලේ,
පළාත් සභා කාර්යාලයේදීය.

12. 1992 අංක 01 දරන දකුණු පළාත් සභාවේ බස් රථ මගීන් ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය.

දකුණු පළාත ඇතුළත ආරම්භ වන බස් රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම විධිමත් කිරීම සඳහා සහ ඒ සේවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා පළාත් සභාවට හැකි කරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ:-

01. මේ ප්‍රඥප්තිය මගීන් ගෙන යාමේ සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන දිනයක සිට බලාත්මක වන්නේය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

02. (1) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා (මෙහි මින් මතු "අධ්‍යක්ෂකවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් බස් රථ ප්‍රවාහන අධ්‍යක්ෂකවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තිය සාමාන්‍යයෙන් පරිපාලනය කිරීම ඔහුට භාර වන්නේය. තවද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පළාත් බස් රථ ප්‍රවාහන නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාවක් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතුය ප්‍රඥප්තිය පරිපාලනය කිරීම

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂකවරයාගේ යම් බලයක්, කාර්යයන් හෝ කර්තව්‍යයන්, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂකවරයාගේ අත්සන සහිත ලියවිල්ලකින් බලය පවරනු ලැබූ, යම් පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු විසින් හෝ වෙනත් නිලධරයෙකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

03. (1) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂකවරයා විසින් දෙන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ හැර, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව, කිසිම තැනැත්තෙකු විසින්, මෙකී (2) වන උප වගන්තියට යටත්ව, වෙන් වෙන් ගාස්තු ම, මගීන් ගෙන යාම සඳහා පළාත ඇතුළත ආරම්භ වන නිතිපතා සේවය සඳහා බස් රථ පළාත ඇතුළත යොදා නොගත යුතුය. නිතිපතා සේවා සඳහා මගී වාහන අවසර පත්‍ර

(2) පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයක් සම්බන්ධයෙන්, 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධන) පනතින් සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර සහ බස් රථ ධාවකයින් විසින් දැනට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාලසීමාවකටද, ඒ කාල සීමාව සහ මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට හය මාසයක් වූ කාලසීමාව යන දෙකෙන් අඩු කාලසීමාවක් සඳහා ඒ අවසර පත්‍ර වලංගු වන්නේය.

(3) කිසිම තැනැත්තෙකු විසින්, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව, වෙන් වෙන් ගාස්තු මත, පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ නිතිපතා සේවය සඳහා, බස් රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) අධ්‍යක්ෂකවරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තෙකු විසින් හෝ කරනු ලබන පැමිණිල්ලක් මත, යම් පොලිස් නිලධාරියෙකු විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් තහනම් කොට තම බාරයට ගත හැකි අතර, ඔහු ඒ වාහනය එසේ තහනම් කොට තම භාරයට ගනු ලැබුවේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව තුළ ද, ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, ඒ වාහනය ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(5) යම් වාහනයක් (4) වන උප වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසාන වනතුරු, ඒ වාහනය රඳවා තබන ආඥාවක් හෝ නඩුවේ කරුණු අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ වාහනය නිදහස් කරන ආඥාවක් කළ හැකිය.

04. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින් ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ගෙන යාම සඳහා සේවයක් පවත්වා ගෙන යාම පිණිස, ඒ අවසර පත්‍රය දරන්නා ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක් යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නාට අයිතිවාසිකම ලැබෙන්නේය.

අවසරික බස්රථ මගීන් ගෙන යාම

05. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියක් අනුව විය යුතු අතර, එය බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

මගී වාහන අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙකු විසින් (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග, පහත දැක්වෙන විස්තර අඩංගු නියමිත ආකෘතිය අනුව සකසනු ලැබිය යුතුය.

(අ) වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා ඒ බස් රථය යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර,

(ආ) 6 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂකවරයා ඉල්ලා සිටින වෙනත් විස්තර.

06. මගී සේවා අවසර පත්‍රයක් දීම සම්බන්ධයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් සහ අවසර පත්‍ර දෙනු ලැබිය හැක්කේ යම් මාර්ගයක් හෝ මාර්ග සඳහා ද, ඒ මාර්ග සම්බන්ධයෙන් තම අභිමතය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂකවරයා විසින්, වෙන් වෙන් ගාස්තු මත, මගීන් ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් අවශ්‍ය කරන තැනැත්තන් සහ ඒ පහසුකම් සලසන තැනැත්තන්ද ඇතුළුව, පොදු මහජනතාවගේ යහපත ගැනත්, විශේෂයෙන්ම, ඒ අභිමතය ක්‍රියාත්මක කිරීමේදී පහත දැක්වෙන කරුණු ගැනත් සැලකිල්ල දැක්විය යුතුය.

අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම.

(අ) පොදු යහපත පිණිස කොතෙක් දුරට යෝජිත පරිදි මගීන් ගෙන යාම අවශ්‍යද, යෝග්‍යද යන වග;

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාව;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ ඉන් යම් මාර්ගයක දැනටමත් කොතෙක් දුරට ප්‍රමාණවත් ලෙස, මගීන් ගෙන යාමේ සේවයක් සලසා තිබේද යනවග;

(ඈ) (ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවන් සැපයීමද ඇතුළුව) රථවාහන වලට අදාළව, සමස්තයක් වශයෙන් ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් ප්‍රවාහනය කිරීම ඇතුළුව, සියළුම ආකාරයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධීකරණය කිරීම;

මගී සේවා අවසර පත්‍ර වලංගු කාල සීමාව

07. (1) යම් තැනැත්තෙකු විසින් නියමිත ගාස්තුව හෝ ගාස්තු අධ්‍යක්ෂකවරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර අධ්‍යක්ෂකවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(2) සෑම වාහන අවසර පත්‍රයක්ම -

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය ; තවද,

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් හැර, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහේ සිට මාස තිස් හයක් වූ කාලසීමාවක් වලංගුව පවතින්නේය.

අවසර පත්‍රයේ අනුයුක්ත කළ යුතු කොන්දේසි

08. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව සහ පහසුව සැලසීම පිණිස අධ්‍යක්ෂකවරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසි අනුයුක්ත කරනු ලැබිය යුතුය. ඒ කොන්දේසිවලට -

(අ) අය කරනු ලබන ගමන් ගාස්තු මගී සේවා අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් වන ගාස්තු විය යුතු බවට;

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය අවසර පත්‍රයේ සඳහන් වන මාර්ගයෙහි හෝ මාර්ගවල ධාවනය කළ යුතු බවට;

(ඇ) (නියම කර ඇති විට) කාල සටහනෙහි සහ ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත්, අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රැගෙන යා යුතු බවට සහ එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට;

(ඈ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය සියළු අවස්ථාවන්හිදී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු බවට;

(ඉ) බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව කාර්යයෙහි නිරත වන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන සහ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රියදුරු සහ කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපදිනු ලැබිය යුතු බවට නියම කෙරෙන කොන්දේසි ද ඇතුළත් කළ හැකිය.

09. අධ්‍යක්ෂකවරයා විසින්, මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් දෙනු ලබන අවස්ථාවේදී, යොදා ගැනීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන බස් රථය, එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි බලය ලත් තැනැත්තා සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන්, නිශ්චිත වශයෙන් ඒ අවසර පත්‍රයේ දක්වනු ලැබිය යුතුය.

නිශ්චිත වශයෙන් දැක්වීම

10. මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ ඕනෑම තැනැත්තෙකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන පිළිපදින බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි අධ්‍යක්ෂකවරයා අදහස් කරන විධාන ඒ තැනැත්තාට නිකුත් කර ඇති අතර, ඒ විධාන නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ඒ විධානවල සඳහන් වන කාලය ඇතුළත, ඒ විධාන පිළිපැදිය යුතුය.

විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂකවරයාට ඇති බලය

11. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේය.

අවසර පත්‍ර පැවරිය නොහැකි බව

12. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍රය දරන්නා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදු වූ දින සිට දින තිහක් ඇතුළත, ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ පිළිබඳව ලියවිල්ලකින් අධ්‍යක්ෂකවරයාට දැනුම් දී, ඔහුගේ එකඟත්වය ලියවිල්ලකින් ලබා ගත යුතුය.

අවසර පත්‍ර දරන්නන් විසින් විස්තරවල යම් වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂකවරයාට දැන්විය යුතු බව

13. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින් අධ්‍යක්ෂකවරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට -

අවසර පත්‍රය අළුත් කිරීම

(අ) ඒ මගී සේවා අවසර පත්‍රය දරන්නා මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව, ක්‍රියා කර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් කර නොමැති බවට; සහ

(ආ) මගී සේවා අවසර පත්‍රය දරන්නා අවසර පත්‍රය අළුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන බවට අධ්‍යක්ෂකවරයා සෑහීමකට පත් වුවහොත් ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අළුත් කළ හැකිය.

14. (1) එකී ඕනෑම අවසර පත්‍රයක් දරන්නා -

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් හෝ උල්ලංඝනය කර ඇති බවට;

(ආ) 10 වන වගන්තිය යටතේ ඔහුට නිකුත් කර ඇති යම් විධානයක් පිළිපැද නොමැති බවට; හෝ

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක ඔහු දැනුවත් ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට;

අධ්‍යක්ෂකවරයා සෑහීමකට පත් වුවහොත් අධ්‍යක්ෂකවරයා විසින් ඒ මගී වාහන අවසර පත්‍රය අවලංගු කළ හැකිය.

අවසර පත්‍රය අවලංගු කිරීම

(2) අධ්‍යක්ෂකවරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීමේ කාලය ඉකුත් වන තුරු හෝ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ අභියාචනය පිළිබඳව සුදුස්සක් කරනු ලබන තුරු, (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවන්නේය.

15. අධ්‍යක්ෂකවරයා විසින් මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ අළුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂකවරයා විසින් තම තීරණය සහ එයට හේතු, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතුය.

අධ්‍යක්ෂකවරයා විසින් තම තීරණය සහ එයට හේතු ඉල්ලුම්කරුට හෝ වෙනත් අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතු බව

16. (1) (අ) මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ එය අළුත් කිරීම ප්‍රතික්ෂේප කරමින්; හෝ

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින් අධ්‍යක්ෂකවරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ ඉල්ලුම්කරු හෝ මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්, තමාට ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින දහ හතරක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ජාතික ගමනා ගමන කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකිය.

අභියාචනය

(2) මෙහි (1) වන උප වගන්තිය යටතේ යම් අභියාචනයක් ඉදිරිපත් කරන ලද විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් -

(අ) අභියාචනයට ඉඩ දී, අවසර පත්‍රය දෙන ලෙස හෝ අලුත් කරන ලෙස අධ්‍යක්ෂකවරයාට විධාන කිරීම; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම

කරනු ලැබිය හැකිය.

(3) මෙහි (2) වන උප වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ ඕනෑම විධානයක් අධ්‍යක්ෂවරයා විසින් පිළිපැදිය යුතුය.

සහතිකය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව

17. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මගී සේවා සහතිකයක්ම, ඒ සහතිකය නිකුත් කරනු ලැබුවේ යම් බස් රථයක් සම්බන්ධයෙන්ද, ඒ බස් රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතුය.

18. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා, අධ්‍යක්ෂකවරයාට අවශ්‍ය වන යම් වාර වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීම් දැන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුළත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකුට අධ්‍යක්ෂකවරයා විසින් ලියවිල්ලකින් දැන්වීමක් දිය හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේය.

බස් රථ සඳහා පොදු බස් නැවතුම්පලවල්

19. බස් රථ නැවැත්වීම සඳහා පළාත් පාලන ආයතන විසින් ප්‍රදේශය තුළ පොදු බස් නැවතුම්පලවල් සහ බස් නවත්වන ස්ථාන එකක් හෝ වැඩි ගණනක් සැපයිය හැකිය.

නියෝග

20. (1) නියමිත කරුණු ලෙස මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) විශේෂයෙන්ම සහ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සියළු කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකිය.

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රැගෙන යා යුතු පුවරු සහ සලකුණු;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රියදුරු හෝ කොන්දොස්තර විසින් රැගෙන යායුතු ලේඛන සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක්, එසේ යොදා ගන්නා යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්, සහ ඒ සම්මතයන් උල්ලංඝනය වන ක්‍රියා සහ අකෘතයන් තහනම් කිරීම.

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල ගමන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා;

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍ර දරන්නන් විසින්, ඒ අවසර පත්‍රවල නියමයන් යටතේ යොදා ගනු ලබන බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන සහ අවසාන කරන වේලාවන් සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබා ගත යුතු වාර්තා;

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ තබා ගනු ලබන වාර්තා සුරැකිව තබා ගැනීම, නියෝගවල සඳහන් යම් බලධරයෙකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධරයා විසින් ඉල්ලා සිටින ලද විට, ඒ වාර්තා එසේ පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කිරීම.

(උ) දිස්ත්‍රික් සංගම් වල සහ ඒකාබද්ධ මහා සංගම්වල සහ වෙනත් යම් සංගම්වල කටයුතු පවත්වාගෙන යාමේ ක්‍රියා පටිපාටිය සහ ඒවායේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ ක්‍රියා පටිපාටිය.

(ඌ) විශේෂයෙන්ම බස් ධාවන වේලාවන් සංවිධානය කිරීම, වේලාවල් තැබීම, සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස යෙදවීම සඳහා බස් නැවතුම්පලවල්, බස් නවත්වන ස්ථාන සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම.

(එ) කොන්දොස්තරවරුන්ට බලපත්‍ර දීම.

(3) මෙහි (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පල කරනු ලැබිය යුතු අතර, එසේ පල කරනු ලබන දිනයෙහි හා නියෝගයේ සඳහන් වන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේය.

(4) මෙහි (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පල කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව; එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබිය යුතුය.

වරදවල්

21. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ තමා දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර ඇතුළත් යම් වාර වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නේය.

දණ්ඩන

22. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක්ම, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව

23. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරන වේලාවේදී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂකවරයෙකුට, සාමාන්‍යාධිකාරිවරයෙකුට, ලේකම්වරයෙකුට හෝ ඊට සමාන වෙනත් නිලධරයෙකුව සිටි සෑම තැනැත්තෙකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේදී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තෙකුම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියළු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැලැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ සියළු

උද්‍යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

24. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඊට එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල , කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කොට, පිහිටුවනු ලැබූ යම් අධිකාරයක්ද ඇතුළත් වේ.

"බස් රථය" යන්නෙහි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම දී ඇත්තේය;

"මගී" යන්නෙහි, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

"නියමිත" යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, පළාත් සභාවේ ගමනාගමනය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"වෙන් වෙන් ගාස්තු" යන්නෙහි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

13. 1992 අංක 02 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය 1992 අංක 02 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

02. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

දකුණු පළාතේ 1990 අංක 7 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුවද, යම් ව්‍යාපාරයක යම් පූර්ව කාර්තුවක් සඳහා වූ පිරිවැටුම රුපියල් දස ලක්ෂය ඉක්මවන අවස්ථාවකදී, තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද පහත දැක්වෙන ආකාරයෙන් ගෙවනු ලැබිය හැකිය.

(අ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක්, මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දිනට පෙර ගෙවිය යුතුය.;

(ආ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තවත් තුනෙන් එකක්, මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ තුන්වන මාසයේ පහළොස්වන දිනදී හෝ ඊට පෙර ගෙවිය යුතුය;

(ඇ) ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දේ ඉතිරි කොටස, මෙය ඒ කාර්තුව අවසාන වීමෙන් පසු එළඹෙන ප්‍රථම මාසයේ පහළොස්වන දිනට පෙර ගෙවිය යුතුය."

එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය.

03. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (ඇ) ඡේදයේ, "මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා" යන වචනය වෙනුවට, "මෝටර් රථයක අයිතිය පැවරීමේ සෑම සාධන පත්‍රයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

04. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තියේ (5) වන ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සපයනු ලබන නීති ආධාර මත නඩු පවරන, විත්ති වාචක ඉදිරිපත් කරන හෝ මැදිහත් වන තැනැත්තකු වීම පිණිස එකී නීති ආධාරපනත. යටතේ අනුමත කර ඇති නීති ආධාර යෝජනා ක්‍රමයේ පාලකවරයා විසින් හෝ තත් කාර්ය සඳහා යථා පරිදි ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු විසින් නැතහොත් ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියළු ලේඛන."

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ, "එහෙත් එවැනි සෑම අවස්ථාවකදීම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයේ සහතික කළ යුතු" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම

06. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (3) වන උප වගන්තියේ, "අවලංගු කොට නොමැති අලවන මුද්දරයක්" යන වචනය වෙනුවට "අවලංගු නොකරන ලද්දාවූ අලවන මුද්දරයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

07. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉනික්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 43 (අ) වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වන වගන්තිය ඇතුලත් කිරීම

43 (අ) යම් සාධන පත්‍රයක්, -

(අ) පළාතේ සීමා තුළ එක් කොටසක් ද වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ අනෙක් කොටසද පිහිටා ඇති යම් නිශ්චල දේපලක් පැවරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර, විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම් හෝ, ඒ දේපලෙහි අනෙක් කොටස පිහිටා ඇත්තේ යම් වෙනත් පළාතක හෝ පළාත් වල සීමා තුළද අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තියේ විධි විධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය; නැතහොත්, එක් පළාතකට වඩා වැඩි පළාත් ගණනක පිහිටි දේපල සම්බන්ධයෙන් මුද්දර ගාස්තු

(ආ) එක් නිශ්චල දේපළක් හෝ එකකට වැඩි සංඛ්‍යාවක් පළාතේ සීමා තුළ පිහිටා ඇත්තාවූ ද අනෙක් දේපළ එකක් හෝ ඊට වැඩි ගණනක් සීමා තුළ පිහිටා ඇත්තා වූ ද විටක ඒ දේපළ පැවරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම් හෝ, ඒ අනෙක් දේපල පිහිටියේ යම් පළාතක හෝ පළාත්වල සීමා තුළද, ඒ අනෙක් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම්, ඒ දේපල සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

08. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ "රුපියල් එකක මුද්ද්රයක් දැරිය යුතුය" යන වචන වෙනුවට, "රුපියල් එකක මුද්දර ගැසීම හෝ එකී රුපියලක මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට නියමිත බැංකුවකට ගෙවනු ලැබිය යුතුය." යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "අධිකරණයකට ඉදිරිපත්කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවද පහත දැක්වෙන කොන්දේසි මත" යන වචන වෙනුවට "අධිකරණයක පවරන ලද යම් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් සහ,

(ආ) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ "ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතුය" යන වචන වෙනුවට "ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතු අතර, ඉන්පසු ඒ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උප වගන්තියේ, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම්" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා තිබේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "අය කළ යුතුව තිබුණු" යන වචනය වෙනුවට "අය කළ තිබුණාවූ" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

ගාස්තුව ගෙවිය යුත්තේ කවුරුන් විසින් ද යන වග

51. මීට පටහැනිව යම් ගිවිසුමක් තිබුණහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් විසින් මුද්දර ගාස්තුව ගෙවිය යුතුය:-
(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, පැවරුම්කරු විසින් ; සහ
(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සාධන පත්‍රය පිළියෙල කරන, ලියන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (4) වන උප වගන්තියේ, "ඔහුගෙන් මුද්දර ගාස්තු අය කර ගැනීමට යටත් වන සියළු ක්‍රියා" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත්ව සිටියා වූ සියළු ක්‍රියා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "මේ පනත යටතේ ඔහු යටත්ව ඇති වචන වෙනුවට, "මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත් විය යුතුය" යන වචන ආදේශ කිරීමේ ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (2) වන උප වගනත්යේ "මුද්දර ගාස්තු අය කළ යුතු නම් එය සාක්ෂි වලදී" යන වචන වෙනුවට, "මුද්දර ගාස්තු අය කළ යුතු වන්නේ නම් වුවද ඒ සාධන පත්‍රය සාක්ෂිවලදී" යන වචන ආදේශ කිරීමේ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (3) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා "මුද්දර" යන යෙදුමට, අලවන මුද්දරයක් හෝ ලාංඡිත මුද්දරයක් හෝ 40(2) වන වගන්තිය යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූ මුද්දර ගාස්තු ගෙවූ බවට වූ සහතිකයක් ඇතුළත් වේ."

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි අළුත් උප වගන්තියක් ඇතුළත් කිරීම

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක් යන යෙදුමට යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එකී 68 වන වගන්තිය ඒ වගන්තියේ 68(1) වන උප වගන්තිය ලෙස යළි අංක කිරීමෙන් ;

(ආ) එසේ යළි අංක කරන ලද උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන්;-

"(2) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක්" යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (7) වන උප වගන්තියේ දැක්වෙන, "මෙහි 5 වන උප වගන්තියේ" යන යෙදුම වෙනුවට, "මෙහි 6 වන උප වගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.;

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එහි (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන හෝ (3) වන උප වගන්තිවල දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවකදී, 40 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් සහතිකය ඒ සාධන පත්‍රයේ පිටපතට යථා පරිදි අලවා ඇති බව හෝ 40 වන වගන්තියේ (3) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රය කොමසාරිස්වරයා විසින් පිටසන් කර ඇති බව, ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් තම සහතිකය මගින් සහතික කළ යුතුය;

(ආ) එකී (4) වන උප වගන්තියට ඉක්බිතිවම ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ මෙන් බලපාන පරිදි පහත දැක්වෙන උප වගන්තිය එහි ඇතුළත් කිරීමෙන් ;-

" (5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට, 1991 ජනවාරි 1 වන දින සිට 1991 ජුනි මස 30 වැනි දිනය දක්වා වූ කාලය තුළදී 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන වලට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි මුද්දර ගසා තිබේ නම්, ඒ සාදන පත්‍රය හෝ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXXI වන පරිච්ඡේදය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ XXXI වන පරිච්ඡේදයේ ශීර්ෂ පාඨයේ "අධිකරණ දඩ" යන වචන වෙනුවට "අධිකරණ දඩ සහ ගාස්තු" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ.

"අධිකරණ දඩ සහ ගාස්තු 99. (1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ බදු, ගාස්තු හෝ වෙනත් අය කිරීම් අය කර ගැනීම සඳහා පනවනු ලබන දඩ හැර, වැරදි සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් පනවනු ලබන්නා වූ සහ ඒ අධිකරණය වෙත ගෙවනු ලබන්නා වූ දඩ මුදල් අතුරෙන්, යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩ මුදල්වලින් ගෙවිය යුතු යයි අධිකරණය විසින් කරනු ලබන යම් විධානයකට යටත්ව, ඒ සියළු දඩ මුදල් පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

99 (2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණය විසින් රැස් කරන ලද සියළුම ගාස්තු පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ "ඉන් කිසිවක් සඳහා භාවිත කළ යුතු ආකෘති සහ ගනුදෙනු ලේඛනය" වන වචන වෙනුවට, "ඉන් කිසිවක් සම්බන්ධයෙන් වූ ගනුදෙනු සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර සහ ලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104"අ" වන වගන්තිය ඇතුළත් කිරීම

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් අදහස් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 104 "අ" වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය.

පළාත් දිරි ගැන්වීමේ අරමුදල

104. "අ" (1) මෙහි මින් මතු "අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් දිරි ගැන්වීමේ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි 1 වන දිනෙන් ආරම්භ වන වර්ෂය සම්බන්ධයෙන් පරිපූරක ආධාර මුදලක් වශයෙන් පළාත් සභාව ඉදිරියේ තබනු ලැබීමට සලස්වනු ලබන මුදල් ප්‍රමාණ සහ ඉන්පසු අරමුදලේ කාර්යය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් ප්‍රමාණ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(3) අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතුය.

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුබ සිද්ධිය සඳහා අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව අවශ්‍ය වන සියළු මුදල් ; සහ

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම සහතික කිරීම අරහයා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට ගෙවනු ලබන දිරි දීමනා;

(4) කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු විසින්, නියමිත කාර්යය පරිපාටියට අනුකූලව, අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතුය.

25. මුදල් ප්‍රඥප්තිය නමින් හැඳින්වෙන මුදල් ප්‍රඥප්තියේ සිංහල පාඨයෙහි "විකිණීම" යන වචනය සඳහන් වන කවර තැනක වුවද ඒ වෙනුවට "පැවරීම" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කෙරේ. ප්‍රඥප්තියේ සිංහල පාඨය සංශෝධනය කිරීම

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) "මේ ප්‍රඥප්තියෙහි" යන වචන වෙනුවට,
"මේ ප්‍රඥප්තියෙහි" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) "ඇලෙන මුද්දරය" යන්නෙහි අර්ථ නිරූපණයේ,
"67 (1) වන වගන්තිය" යන යෙදුම වෙනුවට
"76 (1) වන වගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන්;

(ඇ) "තක්සේරුකරු" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "පනතේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තියේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(ඈ) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ නිරූපණයෙහි,

(I) වන ඡේදයේ "ප්‍රඥප්තියේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තියේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(II) එහි (2) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්;

" (2) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා තමා විසින් දෙනු ලබන බලය පැවරීමේ ලිපියෙහි නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් කලින් කල ලිඛිතව බලය පවරනු ලැබුවා වූද සමාගම් (විගණකවරුන්) නියෝග යටතේ විගණකවරයෙකු වශයෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලයෙකු වන්නා වූ සහ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ හෝ දේශීය ආදායම් පනතේ කාර්යය සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ ද යම් පුද්ගලයෙක් අදහස් වේ"

(ඉ) "අය කළ යුතු" යන්නෙහි අර්ථ නිරූපණයෙහි, "ලියා අත්සන් කරන ලද" යන වචන වෙනුවට "ලියා අත්සන් කළ" යන වචන ආදේශ කිරීමෙන්

(ඊ) "මුද්‍රාංකනය යන්නෙහි අර්ථ නිරූපණයේ "යම් තහඩු මුද්‍රණයක්, අතුරු ආයුධයක් හෝ උපකරණයක්," යන වචන වෙනුවට "යම් තහඩුවක්, ප්‍රරූපයක්, මෙවලමක් හෝ උපකරණයක්" යන වචනය ආදේශ කිරීමෙන් ;

(උ) "ලේඛනය" යන්නෙහි අර්ථ නිරූපණයේ, "බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියළු වචන ඉවත් කොට ඒ වෙනුවට, "බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇතුළත් වේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඌ) "නිසි පරිදි මුද්දර ගසන ලද"යන්නෙහි අර්ථ නිරූපණයේ, "පිටසන් කිරීම සහතිකයක් හෝ ඒ සාධන පත්‍ර යේ ඇති බවද," යන වචන වෙනුවට, "පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව හෝ මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සහතිකයක් ඒ සාධන පත්‍රයට අමුණා ඇති බව ද" යන වචන ආදේශ කිරීමෙන්;

(එ) "සාධන පත්‍රය" යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

"සාධන පත්‍රය" යන්නට පළාත තුළ යම් නිශ්චල දේපලක් පැවරීමට හෝ පළාත තුළදී කරනු ලබන යම් මෝටර් වාහනයක් පැවරීමට අදාළ සෑම ලේඛනයක්ම ඇතුළත් වේ;

(ඒ) "තැනැත්තා" යන්නෙහි අර්ථ නිරූපණයේ "පුද්ගල මණ්ඩලයක්" යන වදන වෙනුවට "පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඔ) "ඇටෝර්නි බලය" යන්නෙහි අර්ථ නිරූපණයේ "තැනැත්තා වෙනුවෙන්" යන වචන වෙනුවට "තැනැත්තා වෙනුවෙන් සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඕ) "කාර්තුව" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"පැවරුම"යන්නෙන් විකිණීමක් හෝ හුවමාරු කිරීමක් හෝ තෑගි දීමක් අදහස් වන අතර, මිය ගිය තැනැත්තකුගේ බූදලයේ යම් දේපලක් ඊට ප්‍රතිලාභී හිමිකම් ඇති යම් තැනැත්තකු වෙත හෝ මිය ගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ එක් කොට ඇති භාරකරුවකු වෙත, එකී මියගිය තැනැත්තාගේ බූදලයේ පොල්මඃකරුවකු නැතහොත් අද්මිනිස්ත්‍රාත්කරුවකු විසින් ප්‍රතිෂ්ඨාවකින් තොරව තෑගි කිරීමක්, හුවමාරු කිරීමක් හෝ පැවරීමක් හෝ එවැනි භාරකරුවකු විසින් ප්‍රතිලාභියෙකු වෙත කරනු ලබන තෑගි කිරීමක් හෝ පැවරීමක් හෝ මිය ගිය භාරකරුවකු විසින් උත්තර ජීවී භාරකරුවකු හෝ අලුත් භාරකරුවකු වෙත හෝ ප්‍රතිෂ්ඨාවකින් තොරව කරනු ලැබූ පැවරීමක් ඇතුළත් වන අතර, පොදුවේ දරන යම් ඉඩමක් බෙදා වෙන් කර ගැනීමේ ඔප්පුවක් හෝ පැවරීම සඳහා වූ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ.

(ක) "භාරකරු" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපණයට ඇතුළත් කිරීමෙන් :-
"වටිනාකම" යන්න,

(අ) තෑගි කරනු ලැබූ නිශ්චල දේපලක් නොවන යම් දේපලක් සහ යම් දේපලක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, තක්සේරුකරුගේ මතය අනුව එදිනට විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපලට ලැබිය හැකි මිල ගණන අදහස් වේ.;

(ආ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වන දිනදී හෝ ඊට පෙර අත්කර ගන්නා ලද්දා වූ ද පසුව තෑගි කරනු ලැබුවා වූද යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් යෙදී ඇති විට,

(I) ඒ දේපල 1977 මාර්තු 31 වන දින දී විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය අනුව ඒ දේපල සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, 1977 මාර්තු 31 වන දිනෙන් පසු ඒ දේපල එසේ තෑගි කළ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපලට යම් වැඩි දියුණු කිරීමක්, වෙනස් කිරීමක් හෝ අමුතුවෙන් එකතු කිරීමක් කර තිබුණේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල; හෝ

(II) ඒ දේපල තෑගි කරන්නට යෙදුණු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළෙඳපොළේදී ඒ දේපල විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය

අනුව, ඒ දේපල සඳහා ලැබිය හැකිව තිබුණු මිල, යන දෙකින් අඩු මුදල අදහස් වේ;

(ඇ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වන දිනෙන් පසු අත්කර ගන්නා ලදුව පසුව තෑගි කළ යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් යෙදී ඇති විට,

(I) ඒ දේපල ඒ පැවරුම්කරු විසින් අත්කර ගන්නා ලද දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපල විකුණන ලද නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපල සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, ඒ දේපල එකී පැවරුම්කරු විසින් අත්කර ගැනීමෙන් පසු සහ ඒ දේපල තෑගි කිරීමේ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපලට කරන ලද යම් වැඩි දියුණු කිරීමක, වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් වේ නම් ඒ සඳහා ගිය වියදම් එකතු කිරීමෙන් ලැබෙන මුදල; හෝ

(II) ඒ දේපල තෑගි කරන්නට යෙදුණු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපල විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපල සඳහා ලැබිය යුතුව තිබුණු මිල, යන දෙකින් අඩු මුදල අදහස් වේ;

14. දකුණු පළාත් සභාවේ, 1992 අංක 04 දරන පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් 1992.12.31 වැනි දින සම්මත කරන ලදුව 1992.12.31 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම පිණිස මෙසේ පහත පල කරමි.

පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය

දකුණු පළාත

පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ අධිකාරිය තුළ කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කොට දැක්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම ද පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරී පනතට අනුකූල වූවකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය 1992 අංක 04 දරන දකුණු පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු කාර්ය හා ක්‍රියාත්මක වීම් දිනය

1 වන කොටස

දකුණු පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය.

02. (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන දකුණු පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන පළාත්බද අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතුය.

පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියක් පිහිටුවීම

(2) පළාත්බද අධිකාරිය, (1) වන උප වගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා හොඳ මුද්‍රාවක් තිබිය යුතුය. තවද, ඒ නාමයෙන් එය විසින් නඩු පවරනු ලැබිය හැකි

අතර, එයට විරුද්ධව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය.

(3) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ශාඛා කාර්යාල අවශ්‍ය විය හැකි සංඛ්‍යාවක් පිහිටුවා පවත්වා ගෙන යා හැකිය

03. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

අධිකාරියේ සාමාජිකයෝ

(අ) සිවිල් ඉංජිනේරු විද්‍යාව, මහා මාර්ග ඉංජිනේරු විද්‍යාව, වාණිජ්‍යය, මූල්‍ය හෝ පරිපාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් හා නිපුණත්වයක් දක්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් ඒ අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයින්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන්දෙනෙක් සහ

(ආ) (I) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්.

(II) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්.

(III) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක්.

(IV) රජයේ නගර නිර්මාණ ශිල්පී හෝ ඔහු විසින් නම් කරන ලද, නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු.

යනුවෙන් මෙහි මින් මතු "නම් කළ සාමාජිකයින්"යනුවෙන් හැඳින්වෙන වෙනත් සාමාජිකයින් හතර දෙනෙක්.

(2) පත් කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ.

(3) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කර ගෙන යෑමට හෝ සුදුස්සෙක් නොවන්නේය.

(4) යම් තැනැත්තකු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට පෙර, අධිකාරියේ සාමාජිකයෙකු වශයෙන් ඒ තැනැත්තා විසින් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේදී හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතුය. තවද අධිකාරියේ කිසිම සමාජිකයෙකුට එවැනි කිසිම සම්බන්ධතාවක් නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත් විය යුතුය. මේ උප වගන්තිය යටතේ සිය කාර්ය තමා විසින් ඉටු කරනු ලැබීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන තොරතුරු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් තැනැත්තකු විසින් හෝ ඒ අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට ඒ අමාත්‍යවරයා අදහස් කර සිටින යම් තැනැත්තකු විසින් හෝ ඒ අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතුය.

(5) අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව, කෙලින්ම හෝ අන් අයුරකින් කිසියම් සම්බන්ධතාවයක් ඇති අධිකාරියේ යම් සාමාජිකයෙකු විසින්, ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමකදී හෙළිදරව් කරනු ලැබිය යුතු අතර, ඒ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතුය. තවද, අධිකාරිය විසින් ඒ ගිවිසුම් සලකා බැලීමේදී හෝ ඒ පිළිබඳව තීරණයකට එළඹීමේදී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතුය.

(6) අධිකාරියේ පත් කළ සෑම සාමාජිකයෙකුම, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට ගණන් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, (8) වන හා (9) වන උප වගන්තිවල විධි විධානවලට යටත්ව, ධූරය දැරිය යුතු අතර, (8) වන උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය. තවද, පත්කළ සාමාජිකයෙකුගේ ඇබෑර්තුවක් පිරවීම සඳහා පත් කරනු ලබන වෙනත් පත්කළ සාමාජිකයෙකු කලින් සිය තනතුර ඇබෑර්තු වුවහොත් මිස, ඔහුට කලින් එම තනතුර දැරූ සාමාජිකයාගේ ධූර කාලයේ ඉතිරිව ඇති කාලය වෙනුවෙන් පමණක් ධූරය දැරිය යුතුය.

(7) (9) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාලසීමාව වන්නේය.

(8) කවර හෝ පත්කළ සාමාජිකයෙකු කිසිම හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(9) අධිකාරියේ සාමාජිකයෙකු සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් (8) වන උප වගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති විටක ඒ නියමය ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ දිනයේදී ඒ සාමාජිකයාගේ ධූරය හිස් විය යුතුය.

(10) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් අධිකාරියේ පත් කළ සාමාජිකයෙකුට සාමාජිකයෙකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධූරයෙන් ඕනෑම අවස්ථාවකදී, ඉල්ලා අස් විය හැකිය.

(11) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ අධිකාරියේ යම් සාමාජිකයෙකු ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක

(අ) ඔහු පත් කළ සාමාජිකයෙකු නම්, (1) (අ) උප වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු, ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා පත්කළ හැකිය, නැතහොත්,

(ආ) ඔහු නම් කළ සාමාජිකයෙකු වන්නේ නම් එම සාමාජිකයා නම් කළ අධිකාරිය විසින් වෙනත් පුද්ගලයෙකු එම සාමාජිකයා වෙනුවට නම් කළ හැකිය. ඔහු රජයේ නගර හා ග්‍රාම නිර්මාණ ශිල්පී වන්නේ නම් ඔහු වෙනුවට රජයේ නගර හා ග්‍රාම නිර්මාණ ශිල්පී වශයෙන් රාජකාරි කරන නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ නිලධාරියා එම කාලය තුළ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ හැකිය.

(13) අධිකාරියේ ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය මරණය, ඉවත් කිරීම, ඉල්ලා අස් වීම හෝ කාලය ඉකුත් වීම නිසා අවසන් වන්නේය.

04.අධිකාරියේ සියළුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවකුට අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික දීමනා සහ වෙනත් වියදම්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික දීමනා

05. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින, අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය, ඔහු විසින් දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය. අධිකාරියේ කාර්ය පරිපාටිය

(2) අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර වූ හෝ අවස්ථාවක එය රැස්විය යුතුය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

06. අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණ පූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතුය.

07. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබියදී වුව ද අධිකාරියට ක්‍රියා කළ හැකිය. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයෙකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවන අතර නිර්බල සේ සලකනු නොලැබිය යුතුය.

08.(1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය සඳහා ඒ අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) අධිකාරිය විසින් එසේ සාදනු ලබන රීති අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතුය.

09. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරව තිබිය යුතුය. අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) එක් අයෙකු අධිකාරියේ සභාපතිවරයා වන්නා වූ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු නොලැබිය යුතුය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

11 වන කොටස.

මාර්ග සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ පළාත්බද අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

10. (1) ප්‍රාදේශීක අවශ්‍යතා සහ ක්‍රම සම්පාදනයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නා විට පළාත ඇතුළත යම් ප්‍රදේශයක මාර්ග සංවර්ධනය විධිමත් කිරීම හා පාලනය කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඒ ප්‍රදේශය (මෙහි මින් මතු "සංවර්ධන ප්‍රදේශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග සංවර්ධන ප්‍රදේශයක් විය යුතු බවට හා එම ප්‍රදේශය ඇතුළත් යම් මාර්ගයක් පළාත් මහා මාර්ගයක් ලෙසට ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් ප්‍රකාශයට පත් කළ හැකිය.

අමාත්‍යවරයාගේ නියමයක් මගින් මාර්ග සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා ඒ නියම වල බලපෑම

(2) සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කෙරෙන (1) වන උප වගන්තිය යටතේ වූ නියමයක් මගින් ඒ ප්‍රදේශයේ සීමා හා මායිම් සලකුණු කොට ඒ ප්‍රදේශය වෙන් කර දැක්විය යුතුය.

(3) සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව හැර, ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක් මගින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ජාතික මහා මාර්ගවල නැතහොත් ජාතික මහා මාර්ගයන්හි ඇති පාලම් සහ තොටුපලවල සංවර්ධන වැඩ හෝ පළාත් පාලන ආයතනයක් මගින් කිසියම් නීතියක් යටතේ පාලනය කරනු ලබන හෝ නඩත්තු කරනු ලබන මාර්ගයක් ද නොවන කිසිදු මාර්ග සංවර්ධන වැඩක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

11. (1) ඉහත (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත් හෝ පළාත් මහා මාර්ග සම්බන්ධයෙන් -

පළාත්බද අධිකාරියේ බලතල කාර්ය හා කර්තව්‍ය

(අ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව ඒ ප්‍රදේශ ඇතුළත අනුකලනය කළ මාර්ග සැලසුම් කිරීම හා මාර්ග සංවර්ධනය කර ගෙන යාම.

(ආ) අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත දෙනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශවල අනුකලනය කල මාර්ග සැලසුම් කිරීම හා අනුකූල වූ ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන වැඩ, ක්‍රියාකාරකම් හා සේවාවන් හා සම්බන්ධිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) මෙම සංවර්ධන ප්‍රදේශ හෝ පළාත් මහා මාර්ග සම්බන්ධයෙන් මූලධන ආයෝජන සැලසුම් ඇතුළුව මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම හා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(ඈ) යම් ලිඛිත නීතියක සඳහන් කොන්දේසිවලට යටත්ව සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත හෝ පළාත් මහා මාර්ගවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ශ්‍රී ලංකාව තුළ නැතහොත් ඉන් පිටත යම් තැනැත්තකු සමග අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කෙළින්ම හෝ හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කරවා ගැනීම හා කර ගෙන යාම.

(ඉ) යම් සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක යම් අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් නිම කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු විසින් පැහැර හරින ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිම කිරීමට බාර ගැනීම.

(ඊ) යම් සංවර්ධිත ප්‍රදේශයක් හෝ යම් පළාත් මහා මාර්ගයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ මාර්ග සංවර්ධන සැලසුම් හා මූළධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

(උ) යම් සංවර්ධිත ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක මාර්ග සංවර්ධන වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම.

(ඌ) යම් සංවර්ධිත ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක මාර්ග සංවර්ධන කටයුතු සඳහා යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලදී ගැනීම හෝ 24 වන වගන්තියට යටත්ව යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම හෝ දැරීම නැතහොත් එය විසින් අත්කර ගනු ලැබූ හෝ යම් චංචල හෝ නිශ්චල දේපලක් බැහැර කිරීම.

(එ) ආණ්ඩුවේ යම් නියෝජිතායතනයක ඉල්ලීම අනුව, ඒ නියෝජිතායතනය වෙනුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම පිළියෙල කිරීම හා ඒ ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම හෝ ඊට සහාය වීම.

(ඒ) ආණ්ඩුවේ නියෝජිතායතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා සංවර්ධිත ප්‍රදේශවල හෝ පළාත් මහා මාර්ග සම්බන්ධව හෝ සැලසුම් සේවා සැපයීම.

(ඔ) අධිකාරිය විසින් ඒ සංවර්ධිත ප්‍රදේශයේ හෝ පළාත් මහා මාර්ග සම්බන්ධයෙන් සපයනු ලබන කවර වූ හෝ සේවාවක් සඳහා ගාස්තු අය කිරීම.

(ඕ) යම් සංවර්ධිත ප්‍රදේශයක් තුළ හෝ පළාත් මහා මාර්ග සම්බන්ධයෙන් ඉටු කරන කටයුතු සඳහා මුදලින් හෝ අන්‍යාකාරයෙන් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් බාර ගැනීම සහ පළාත්බද අධිකාරියේ අරමුණු අතරෙන් යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඒවා උපයෝගී කර ගැනීම.

(ක) මේ උප වගන්තිය යටතේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම හා කිරීම සම්බන්ධයෙන් ප්‍රසාංගික හෝ අනුශාංගික වන්නා වූ සියළු ක්‍රියා හෝ දේවල් කිරීම.

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය විය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ ස්වකීය බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි ඉටු කිරීමෙහි හා කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත හෝ පළාත් මහා මාර්ගයක් සම්බන්ධයෙන් මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට, යෝජිත වැඩ කටයුතුවලින් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අයිතිවාසිකම් සම්බන්ධතා හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේද අවස්ථාවෝචිත පරිදි, ඒ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථා විමසා ඒවා සකස් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම පළාත්බද අධිකාරියේ කාර්යයන් වන්නේය.

(3) අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පැවරුණු බලතල යම් පළාත් පාලන ආයතනයක් විසින් යම් නීතියක් යටතේ නඩත්තු කරනු ලබන හෝ පරිපාලනය කරනු ලබන යම් මාර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ එකී පළාත් පාලන ආයතනයේ ප්‍රකාශිත අනුමැතිය හෝ ඉල්ලීමක් ඇත්නම් පමණකි.

(4) (1) වන උප වගන්තිය යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත හෝ පළාත් මහා මාර්ගයක් සම්බන්ධයෙන් මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට යම් පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක් ඒ සංවර්ධන ප්‍රදේශයට ඇතුළත් වන්නේ නම් හෝ අතිව්‍යාප්ත වන්නේ නම්, අධිකාරියේ ඒ සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සහභාගි වන ලෙස, ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට හෝ සභාපතිවරයාට ආරාධනා කිරීම, අධිකාරියේ කාර්යය වන්නේය.

අමාත්‍යවරයාගේ විධාන

12. (1) අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන බලාත්මක කළ යතුය.

(2) අධිකාරියේ දේපල සහ කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කල ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කළ යුතුය.

අධිකාරිය විසින් බලතල ආදිය පැවරීම

13. (1) මේ ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය බලතල කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් පවරනු ලැබූ විට, එසේ පැවරීමේදී අධිකාරිය විසින් දෙන ලද කිසියම් විධාන වේ නම් එයට යටත්ව එම බලතල කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම අදාළ පරිදි සභාපතිවරයාගේ හෝ එම නිලධාරියාගේ කාර්ය වන්නේය.

(2) ඉහත (1) උප වගන්තිය අනුව අධිකාරියේ බලතල කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් පවරනු ලැබූ විට, එසේ පැවරීමේදී අධිකාරිය විසින් දෙන ලද කිසියම් විධාන වේ නම් එයට යටත්ව එම බලතල හෝ කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කිරීම හෝ කිරීම අදාළ පරිදි සභාපතිවරයාගේ හෝ එම නිලධාරියාගේ කාර්ය වන්නේය.

III වන කොටස
අධිකාරියේ කාර්ය මණ්ඩලය.

අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා

14. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයෙකු පත් කරනු ලැබිය යුතුය.

(2) ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව අධිකාරියේ පොදු මෙහෙයවීමට යටත්ව අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ද, 13 වන වගන්තියේ හා වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ සේවා නියුක්තිකයන් පිළිබඳ පරිපාලනය හා විනය පාලනය ද සාමාන්‍යාධිකාරිවරයාට බාර කරනු ලැබිය යුතුය.

(3) තමාගේ බලතල කර්තව්‍ය හෝ කාර්ය අතුරින් පළාත්බද අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයෙකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය පළාත්බද අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව, 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සාමාන්‍යාධිකාරිවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරිවරයා ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යතුය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත් වීම් ආදිය

15. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා ඔහුට සහාය වීම පිණිස අවශ්‍ය වේ යයි සැලකෙන සේවා නියුක්තකයන් සංඛ්‍යාවක් අධිකාරිය මගින් පත් කරනු ලැබිය හැකිය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ පත් කරනු ලබන කිසියම් සේවා නියුක්තයකු සාමාන්‍යාධිකාරිවරයා විසින් වරින් වර පනවනු ලබන හෝ භාර කරනු ලබන බලතල කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කරනු ලැබිය යුතුය.

(3) කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අධිකාරියේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධාරියෙකු එම නිලධරයාගේ ද, එම නිලධරයා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද, නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(4) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා අධිකාරියට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතුය.

යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව කරනු ලබන සේවයන් ලෙස සැලකිය යුතුය.

IV වන කොටස

මුදල්.

අධිකාරියේ පළාත් මාර්ග ගිණුම

16. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා මෙහි මින් මතු "මාර්ග ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන, පළාත් සභා අරමුදලින් නඩත්තු වන වෙනම පළාත් මාර්ග ගිණුමක් අධිකාරිය සඳහා තිබිය යුතුය.

(2) විස්තර කරනු ලබන ආකාරයට සාමාන්‍යාධිකාරිවරයා විසින් මාර්ග ගිණුම ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(3) මාර්ග ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂයක් විය යුතුය. එම මුදල් ප්‍රමාණය අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන වාරික වලින් පළාත් සභා අරමුදලින් මාර්ග ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

(4) මාර්ග ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 111 කොටසේ විධිවිධාන වලට යටත් විය යුතුය.

මාර්ග ගිණුමේ ලැබීම්

17. (1) මාර්ග ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය හැර පහත සඳහන් ලැබීම් පළමුව පළාත් සභා අරමුදලට ගෙවා ඉන් පසුව මාර්ග ගිණුමට මාරු කරනු ලැබිය යුතුය.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් වරින් වර සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්.

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා කිරීමේදී අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් හා

(ඇ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්.

මාර්ග ගිණුමෙන් කරන ගෙවීම්

18. මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේදී ඉටු කිරීමේදී හා කිරීමේදී දැරීමට සිදුවන සියලු වියදම් ද, අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම සඳහා ද, අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා හා අනිකුත් සියලු සේවා නියුක්තිකයන්ට වැටුප් හා දීමනා ගෙවීම සඳහා ද මෙම ප්‍රඥප්තිය යටතේ දැරීමට සිදුවන අනිකුත් සියළු වියදම් සඳහා ද වන සියලු ගෙවීම් කිරීම පිණිස සාමාන්‍යාධිකාරිවරයා විසින් සභාපතිවරයාගේ එකඟත්වය ඇතිව මාර්ග ගිණුම ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

අධිකාරියේ ණය ගැනීමේ බලතල

19. මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ කාර්ය ඉටු කිරීමේ දී සිය වගකීම් ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුවද, අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුළු මුදල කිසිම අවස්ථාවකදී අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය.

20. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

අධිකාරියේ මුදල් වර්ෂය

21. (1) එක් එක් මුදල් වර්ෂය සඳහා වන අධිකාරියේ ගිණුම් එම මුදල් වර්ෂය අවසන් වී මාස 06ක් ඉකුත් වීමට පෙර විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙම ගිණුමේ විගණනය සඳහා ඔහුට සහාය වීම පිණිස ඔහුගේ පාලනය හා විධානය යටතේ කටයුතු කරන සුදුසුකම් ලත් ගණන් පරීක්ෂකවරයෙකු හෝ ගණන් පරීක්ෂකවරුන් විගණකාධිපතිවරයා විසින් සේවයේ යොදවනු ලැබිය හැකිය.

(2) අධිකාරියේ ගිණුම් විගණනය සඳහා ඔහු විසින් දරනා ලද වියදම් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි යම් පාරිශ්‍රමිකයන් අධිකාරියේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය හැකිය. විගණකාධිපතිවරයාට අධිකාරියෙන් මෙසේ ලැබෙන යම් පාරිශ්‍රමිකයන්, එකී ගිණුම් විගණනය සඳහා ඔහු විසින් සේවයේ යොදවන ලද සුදුසුකම් ලත් විගණන පරීක්ෂකවරයෙකුට ගෙවන ලද මුදල් වෙනුවෙන් අඩු කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) විගණන කටයුතු සඳහා විගණකාධිපති විසින් අවශ්‍ය යයි සලකන අධිකාරියේ සියලුම පොත්පත්, ඔප්පු, කොන්ත්‍රාත්, ගිණුම්, වවුචර් හා වෙනත් ලියවිලි එම ගිණුම් විගණනය කරන විගණකාධිපතිවරයාට සහ ඔහුට සහාය වන වෙනත් ඕනෑම පුද්ගලයෙකුට ලබා ගත හැකි විය යුතුය. එසේම මෙම කටයුතු සඳහා අවශ්‍ය විය හැකි තමන් දන්නා සියලු තොරතුරු අධිකාරිය හෝ එහි නිලධාරීන් විසින් සපයා දිය යුතුය.

(4) මෙම කොටසේ පරමාර්ථ සඳහා සුදුසුකම් ලත් ගණන් පරීක්ෂකවරයා යන්නෙන් -

(අ) ගණකාධිකාරීවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් දරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකයෙක් වන පුද්ගලයෙකු හෝ,

(ආ) එක් එක් වාසික හවුල් කරුවාට, ගණකාධිකාරීවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් සමග ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකත්වය දරන හවුල් කරුවන්ගෙන් සමන්විත ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

22. (1) විගණකාධිපතිවරයා අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට -

(අ) ඔහුට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණු හෝ නොලැබුණු බව සඳහන් කරමින්,

(ආ) අධිකාරියේ කටයුතු සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මැනවින් පිළියෙල කර තිබේද යන්න සඳහන් කරමින්,

(ඇ) ඔහුගේ මතය අනුව පළාත් සභාව විසින් අධිකාරියේ ගිණුම් හා කටයුතු පිළිබඳව කිසියම් පරීක්ෂණයක් කිරීම සඳහා උනන්දුවක් දැක්විය යුතු යයි අදහස් කරන ගිණුම් වලට අදාළ කිසියම් කරුණක් වේ නම්, ඒ ගැන අවධානය යොමු කරමින්, වාර්තාවක් ඉදිරිපත් කළ හැකිය.

(2) විගණකාධිපතිවරයා සිය වාර්තාව විගණනය කරන ලද ගිණුම් සමග සභාපතිවරයාට යවනු ඇත.

23. එක් එක් වර්ෂයේ විගණන කරන ලද ගිණුම් හා විගණකාධිපතිවරයාගේ වාර්තාව ලද විට එම වාර්තාව සහ ගිණුම්, අධිකාරියේ කටයුතු පිළිබඳව වාර්තාවක් ද සමග සභාපතිවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයාට යවනු ලැබිය යුතුය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් එම වාර්තාවල පිටපත් අධිකාරියේ එම ගිණුම් අදාළ වන වර්ෂය අවසන් වී මාස 12ක් ඇතුළත පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ අධිකාරියේ වාර්ෂික කටයුතු පිළිබඳ වාර්තාව ප්‍රධාන අමාත්‍යවරයාට යැවිය යුතු බව

V වන කොටස

පොදු විධිවිධාන

24. (1) මෙම ප්‍රඥප්තියේ කිසියම් කටයුත්තක් සඳහා පළාත් තුළ පිහිටා ඇති කිසියම් ඉඩමක් අවශ්‍ය වේ යයි අමාත්‍යවරයාගේ මතය වන විට අමාත්‍යවරයාගේ නිර්දේශය මත පළාත් සභාව විසින් එකී රැස්වීමකදී සම්මත කරනු ලබන යෝජනාවක් මගින්-

ප්‍රඥප්තියේ කටයුතු සඳහා අවශ්‍ය වන ඉඩම්

(අ) එම ඉඩම රජයට අයත් ඉඩමක් වන්නේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයේ 1 වන ලැයිස්තුවේ II වන පරිච්ඡේදයේ 112 ඡේදය පරිදි එම ඉඩම අදාළ කටයුතු සඳහා පළාත් සභාවට ලබා දෙන ලෙස ජනරජයේ ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටීමට;

හා

(ආ) එම ඉඩම පුද්ගලික ඉඩමක් වන්නේ නම්, අදාළ කටයුතු සඳහා එය පළාත් සභාව වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන පරිදි අත්පත් කර ගන්නා ලෙස කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීමට -

යෝජනා සම්මත කරනු ලැබිය හැකිය.

(2) පළාත් සභාව විසින් ඉහත (1) උප වගන්තිය යටතේ යෝජනා සම්මතයෙන් කර ඇති විට, විස්තර කරනු ලබන ආකාරයේ ආකෘතියක් මගින්-

(අ) යෝජනා සම්මතය රජයේ ඉඩමක් සඳහා නම් ජනරජයේ ජනාධිපතිවරයා වෙත ද, හෝ

(ආ) යෝජනා සම්මතය පුද්ගලික ඉඩමක් සඳහා නම් කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා වෙත ද,

අදාළ ඉඩම සඳහන් කරන ලද කාරණාව සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

(3) ඉහත (2) වන උප වගන්තිය පරිදි වන ඉල්ලීමක් මත අවස්ථාවෝචිත පරිදි ජනරජයේ ජනාධිපතිවරයා හෝ කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් අදාළ ඉඩම් පළාත් සභාවට ලබා දෙනු ලැබුවහොත් පළාත් සභාව විසින් එම ඉඩම ලබා දෙන අවස්ථාවේදී අවස්ථාවෝචිත පරිදි ජනරජයේ ජනාධිපතිවරයා විසින් හෝ කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් වන්දි ගෙවීමද ඇතුළුව නියම කරනු ලබන යම් නීතිරීති හා කොන්දේසිවලට යටත්ව ඉල්ලා සිටින ලද කාරණය සඳහා පමණක් එම ඉඩම ප්‍රයෝජනයට ගත යුතු අතර, වෙනත් කිසිම කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

යම් ඉඩමක් හෝ ස්ථානයකට ඇතුළ් වීම සඳහා බලය

25. අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකු විසින් පළාත තුළ පිහිටි යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින 07ක දැනුම් දීමක් කිරීමෙන් පසුව ඒ ඉඩම හෝ ස්ථානයට ඇතුළ්වීම සහ එහිදී, ප්‍රඥප්තිය යටතේ මාර්ග සංවර්ධනයට සම්බන්ධ හෝ අධිකාරියේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා කිරීමට අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ අදාළ නිලධාරියාගේ මතය අනුව යුක්ති සහගතව අවශ්‍ය විය හැකි යම් ක්‍රියාවක් කිරීම නීත්‍යානුකූල වන්නේය.

26. (1) මෙම ප්‍රඥප්තිය හා එහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීම සඳහා ද, මෙම ප්‍රඥප්තිය යටතේ විග්‍රහ කළ යුතු සියලු කාරණා සඳහා ද, රෙගුලාසි පිළියෙල කළ යුතු කාරණා සඳහා ද, අමාත්‍යවරයා විසින් රෙගුලාසි සම්පාදනය කළ හැක.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කළ දින සිට හෝ එහි සඳහන් කාරණා පසුව එළඹෙන දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් පිළියෙල කරන ලද සෑම රෙගුලාසියක්ම ඒවා ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු, පහසු ඉක්මන් දිනයක අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(4) එසේ ඉදිරිපත් කරනු ලබන යම් රෙගුලාසියක් අනුමත කරනු නොලැබුවහොත් ඒවා ක්‍රියාත්මක වූ කාලයට හානියක් නොවන පරිදි එසේ අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු වන්නේය. අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි එසේ අවලංගු වූ දිනය ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය

27. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද මේ රෙගුලාසියක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය. වැරදි දණ්ඩ

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තිය "ආණ්ඩුවේ නියෝජිතායතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ මහා මාර්ග විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"ජාතික මහාමාර්ග" යන්නෙන්, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 1989 ජුනි මස 6 වන දින අංක 561/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ජාතික මහා මාර්ග අදහස් වේ.

"පළාත් අරමුදල" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියේ සඳහන් වන පළාත් අරමුදල අදහස් වේ.
"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ.
"දකුණු පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව අදහස් වේ.

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

"මාර්ගය" යන්නෙහි මහා මාර්ග ආඥා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

"මාර්ග සංවර්ධනය" යන්නට අලුතින් මාර්ගයක් ඉදි කිරීම, පවත්නා කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම, කිසියම් මාර්ගයක් පළල් කිරීම, කිසියම් මාර්ගයක් මට්ටම් කිරීම, පදිකයන්ගේ ප්‍රයෝජනය පිණිස පදික වේදිකා සැපයීම, දූවිලි වලින් ඇති වන හිරිහැරය අඩු කිරීම සඳහා මහා මාර්ගයට ප්‍රතිකර්ම යෙදීම, ගස් රෝපණය හා තණකොළ තීරු ඇති කිරීම හා පළාත තුළ පිහිටි මාර්ගයක සිදු කරන වෙනත් අන්දමේ අලුත්වැඩියාවන් ද ඇතුළත් වේ.

කිසියම් අනුකූලතාවයකදී සිංහල පිටපත වලංගු බව

29. ප්‍රඥප්තියේ සිංහල හා ඉංග්‍රීසි පිටපත් අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගු සේ සැලකිය යුතුය.

15. 1994 අංක 03 දරන දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.
සභාපති, දකුණු පළාත් සභාව
1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය

<u>සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.</u>

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය 1994 අංක 03 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

02. 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය එහි "මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධාන වලට අනුකූල වේ" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥා පනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥා පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූල වේ." යන වචන ආදේශ කිරීම මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

03. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වූ විටෙක සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල නාමය බලපැවැත්විය යුතු බව

දකුණු පළාත් සභාව මගින් සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන සංශෝධනයේ 154 එච් වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1994.12.02 දින අනුමත කර ඇත.

16. 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය.

1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

ලුහුඬු නාමය

01. මේ ප්‍රඥප්තිය 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුද්දර ගාස්තු හැරවීම

02. 1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 02 දරන දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත් සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතුකර, දකුණු පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන්ද, ඒ නිශ්චල දේපල පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා විසින්, ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02ක් වූ කාලසීමාවක් ඇතුළත දකුණු පළාතේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත, ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය

> "මෙම වගන්තියේ කාලසීමාව පිළිබඳව සඳහන් නියමයන්, මෙම ප්‍රඥප්තිය සම්මත වීමට පෙර, වර්ෂයන්ට බල නොපැවැත්විය යුතුය."

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය

03. 02 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් සහතික කරන ලද දකුණු පළාත් සභාව විසින් නියම කරන ආකාරයක, උප ලේඛනයක් ඒ හිමිකම සමග ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.

04. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය කළහොත් මිස "ප්‍රධාන පරිපාලන නිලධාරියා" යන්න -

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා; සහ
(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, දැන් එහි ලේකම්වරයා අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන බලතලවලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ
"සාධන පත්‍රය" යන්නෙහි 1990 අංක 07 දරන දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය;
"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

05. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්නේය

අනනුකූලතාවයක් ඇති වූ විට, සිංහල පාඨය බල පැවැත්විය යුතු බව

17. අධිකරණය විසින් නියම කරනු ලැබ දකුණු පළාතේ 1990 අංක 01 දරණ මුදල් ප්‍රඥප්තිය යටතේ අයකර ගත් දඩ සහ දන්ඩණ මුදල් දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට පැවරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

01. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1994 අංක: 05 දරණ අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

02. සංශෝධිත පරිදි වූ දකුණු පළාතේ 1990 අංක 07 දරණ මුදල් ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණය විසින් නියම කරන ලද දඩ හා දන්ඩණ මුදල් අයකර ගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දන්ඩණ මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විසින් ලිඛිතව පළාතේ මුදල් විෂයය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දන්ඩණ මුදල අදාළ පළාත් පාලන ආයතනයට පැවරිය හැකිය. — අධිකරණය දඩ හා දන්ඩණ මුදල් පැවරීම.

03. 2 වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දන්ඩණ මුදල් ගෙවූ දිනය, එම මුදල් අදාල අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දන්ඩණ මුදල නියම කළේ කවර ආඥාපනතක් හෝ පනතක් යටතේද යන වග, එහි උපලේඛනයට විශේෂ යොමු කිරීමක් සහිතවද එම දඩ හෝ දන්ඩණ මුදල් නියම කර අයකරගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා නම්කල වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නොවිය යුතුය. — අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ සහතිකය.

04. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මේ ප්‍රඥප්තියෙහි,"ප්‍රධාන පරිපාලන නිලධරයා" යන්නෙන් — අර්ථ නිරූපණය

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර සභා කොමසාරිස්වරයා ද,

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලේකම්වරයාද අදහස් වෙයි.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ.
"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ.
“පළාත් සභාව“ යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

05. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

18. 1995 අංක 01 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය.

දකුණු පළාතේ සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත, කෘෂිකර්මාන්ත, සහ සත්ත්ව පාලනය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාත්, ඊට සම්බන්ධ හෝ අනුශංගික වෙනත් කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ, 1995 අංක 01 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)

1 වැනි කොටස

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය, අරමුණු, බලතල හා කාර්ය ආදිය.

02. (මෙහි මින්මතු "අධිකාරි" ලෙස සඳහන් කරනු ලබන) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය නමින් හඳුන්වන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. (දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම)

03. අධිකාරිය 02 වැනි වගන්තියෙන් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් වන්නේය. තවද ඊට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු අතර, එකී නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීමද ඊට විරුද්ධව නඩු පැවරීමද කළ හැකිය. (අධිකාරිය සංස්ථාවක් වන බව)

04. අධිකාරියේ අරමුණු පහත සඳහන් වේ. (අධිකාරියේ අරමුණු)

(අ) දකුණු පළාත තුළ සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්තවලට, කෘෂි කර්මාන්තයට සහ සත්ත්ව පාලනයට සහ ඒ ආශ්‍රිත කර්මාන්තවලට අනුබල දීම සහ ඒවා පවත්වා ගෙන යාම හා ඒවා දියුණු කිරීම සඳහා අවස්ථා සැලසීම.

(ආ) දේශීය හා විදේශීය ආයෝජකයන් දකුණු පළාත තුළ ආයෝජනය සඳහා දිරි ගැන්වීමෙන් හා ඵලදායී ව්‍යාපෘති හඳුන්වා දීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් එවැනි ආයෝජකයන්ට සහාය වීම.

(ඇ) පෙළඹවීම් ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම්වලින් හෙබි හිතකර ආයෝජන වාතාවරණයක් දකුණු පළාත තුළ ඇති කිරීම.

(ඈ) දකුණු පළාත තුළ ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනීය කටයුතු කර ගෙන යාම, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම, දැනුම හා තොරතුරු පතුරුවාලීම සහ වෙනත් වැඩසටහන් ඇති කිරීම සහ පර්යේෂණ හා සංවර්ධනාත්මක කටයුතු මෙහෙයවීම.

(ඉ) දකුණු පළාත තුළ නිෂ්පාදිත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළෙඳපොලවල් ඇති කිරීම සහ දේශීය හා විදේශීය වෙළෙඳපොල පහසුකම් සලසා දීමට අවශ්‍ය අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) දකුණු පළාතේ අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන දේශීය නිෂ්පාදකයින්ගෙන් ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියා කිරීම හා දේශීය හා විදේශීය අලෙවි අවශ්‍යතා ඇති අංශවල නිෂ්පාදකයන් දිරි ගැන්වීම.

(උ) දකුණු පළාතේ සුළු මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂි කර්මාන්තය සහ සත්ත්ව පාලනය යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවනට ගැලපෙන ආකාරයේ ශිල්ප ඥානය ඇති කර ගැනීම, නවීකරණය පිළිබඳව උපදෙස්දීම හා මග පෙන්වීම සහ එවැනි ශිල්ප ඥානය සංවර්ධනය කිරීමට හා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මූලාධාර ලබා දීම හා දකුණු පළාතේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වීම සහ ඒවා භාර ගැනීම.

(ඌ) දකුණු පළාතේ ක්‍රියාත්මක සංවර්ධනය හා කාර්ය සාධකතාව වැඩි දියුණු කිරීම සහ කළමනාකරණය හා නිෂ්පාදනය හා බෙදා හැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබල දීම.

(එ) දකුණු පළාතේ ඉහත සඳහන් එක් එක් කර්මාන්ත අංශ උදෙසා නිශ්චිත කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියාත්මක සැලසුම් වර්ධනය කිරීම.

05. අධිකාරියට පහත සඳහන් බලතල සහ කාර්ය ඇත්තේය. අධිකාරියේ බලතල සහ කාර්යයන්

(අ) අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අවශ්‍ය වුවහොත් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව ඒ දේපල අත් කර ගැනීම;

(ආ) සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය දිරිගැන්වීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම හා ඒවා පවත්වා ගෙන යාම;

(ඇ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව දේශීය හා විදේශීය වශයෙන් ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම්වලට හෝ ඇතුළත්වීම;

(ඈ) සුළු, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය යන අංශ සංවර්ධන කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය වීම, සම්බන්ධීකරණය කිරීම හා අනුබල දීම;

(ඉ) ඉහත දැක්වෙන මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන පුහුණු වැඩසටහන්, ව්‍යාපෘති, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය සංවිධානය කිරීම හා මෙහෙයවීම;

(ඊ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලට ගැනීම, තබා ගැනීම, බද්දට, උගසට හෝ කුලියට ගැනීම හෝ දීම, ඇපයට තැබීම, උගස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(උ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ, අමුද්‍රව්‍ය හෝ වෙනත් දේශීය වශයෙන් මිලට ගැනීම හෝ ආනයනය කිරීම;

(ඌ) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන වියදම් ගෙවීම;

(එ) අධිකාරියේ අරමුණු ඉටු කරගැනීම සඳහා විවිධ දේශීය, විදේශීය හා අන්තර්ජාතික ආයතන මගින් සපයනු ලබන මූල්‍ය ආධාර, ද්‍රව්‍යමය ආධාර, උපදේශක සේවා හෝ වෙනත් යම් ආකාරයක ආධාර ලබා ගැනීම;

(ඒ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයතන හෝ පුද්ගලයන් සමග ඒකාබද්ධ හවුල් ව්‍යාපාර, ඒකාබද්ධ ව්‍යාපෘති ආදිය සැලසුම් කිරීම පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඔ) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කර ගැනීම සහ අවශ්‍ය වුවහොත් බැංකු, මූල්‍ය ආයතන හෝ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන වලින් ණය මුදල්, අයිරා පහසුකම් ආදිය ලබා ගැනීම;

(ඕ) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා විවිධ ව්‍යාපාර ආරම්භ කිරීම හා අධිකාරියේ මෙහෙයවීම යටතේ ආරම්භ කෙරෙන රැකියා උත්පාදන ව්‍යාපෘති, ස්වයං රැකියා ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීම ප්‍රාග්ධනය සඳහා දායක වීම, උපකරණ හා වෙනත් පහසුකම් ලබා දීම හා එබඳු මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී ඇපකරුවන් ලෙස කටයුතු කිරීම;

(ක) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යම් ගොඩනැගිලි ඉදි කිරීම, මිලයට ගැනීම හෝ අලුත්වැඩියා කිරීම හෝ පවත්වා ගෙන යාම සහ යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, රැස් කිරීම සහ අලෙවි කිරීම;

(ග) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන විවිධ වෘත්තිමය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන යම් සංඛ්‍යාවක් අධිකාරිය විසින් ස්ථාපනය කර පවත්වාගෙන යාම.

(ච) අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම;

(ඩ) අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම;

(ත) අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කරන නිලධාරීන්, සේවා නියුක්තිකයන් සහ සේවකයන් පත් කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම, ඔවුන් පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ නිවාඩු;

(න) අධිකාරියේ නිලධරයන් සේවා නියුක්තිකයන් හා සෙසු සේවකයන් සඳහා සේවක අර්ථ සාධක යෝජනා ක්‍රමයක් ඇති කිරීම;

06. තම අරමුණු සාර්ථකව ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය නියෝජිතායතන සහ අංශ දේශීය හා විදේශීය වශයෙන් පිහිටුවා පවත්වාගෙන යා හැකිය. අධිකාරියේ නියෝජිතායතන හා අංශය

II වන කොටස

අධිකාරියේ කළමනාකරණය සහ එහි සංයුතිය.

07. (1) අධිකාරිය සඳහා නිල බලයෙන් පත්වෙන සාමාජිකයන් අට දෙනෙකුගෙන් ද පත් කරනු ලබන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් ද සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් තිබිය යුතුය.

කළමනාකාර මණ්ඩලය

(2) මණ්ඩලයේ නිලබලයෙන් පත්වන සාමාජිකයන් පහත සඳහන් පරිදි වේ.

(අ) දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම ලේකම්;

(ආ) දකුණු පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්;

(ඇ) දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්);

(ඈ) කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකාරවරයා;

(ඉ) අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්;

(ඊ) ගාල්ලේ වෙළෙඳ මණ්ඩලයේ සභාපති;

(උ) මාතර වෙළෙඳ මණ්ඩලයේ සභාපති;

(ඌ) හම්බන්තොට වෙළෙඳ මණ්ඩලයේ සභාපති;

(3) (මෙහි මින්මතු "පත් කළ සාමාජිකයන්" ලෙස සඳහන් කරනු ලබන) අධිකාරියේ විෂයයන්ට අදාළ අංශයන්හි නිපුණත්වයක් හා ක්‍රියාශීලීව නියැලෙන තැනැත්තන් ලෙස අමාත්‍යවරයා සලකන සාමාජිකයන් 07 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(4) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති ලෙස ඉහත කී සාමාජිකයන් අතුරින් කෙනෙකු පත් කළ යුතුය.

08. පත් කළ සාමාජිකයකු ඉල්ලා අස් වීම නිසා හෝ මරණය නිසා හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ කලින් තම ධූරය හිස් කළහොත් හැර ඔහු පත් කළ දින සිට අවුරුදු තුනක් ධූරය දැරිය යුතුය.

පත්කළ සාමාජිකයන්ගේ ධූර කාලය

09. කාලය ඉකුත් වීම නිසා ධූරය හිස් කරන යම් පත් කළ සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

පත් කළ සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට ඇති සුදුසුකම්

10. අමාත්‍යවරයා අමතන ලිපියකින් ඕනෑම වේලාවක තනතුරෙන් ඉල්ලා අස් වීමට පත්කළ සාමාජිකයෙකුට හැකිය.

පත් කළ සාමාජිකයකු ඉල්ලා අස් වීම

11. කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කළ හැකිය.

පත් කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම

12. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ අපරාධ නීතිය යටතේ හෝ මුදල් වංචා සම්බන්ධයෙන් අධිකරණයේ වරදකරුවෙකුවූ (විශ්වාසය කඩ කිරීම හා බංකොලොත්භාවයට පත් වූ) අයද ඇතුළත්ව මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයෙකු ලෙස දිගටම වැඩ කිරීමට සුදුසුකම් නොලබන්නේය.

නුසුදුසුකම්

13. යම් සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධූරය කටයුතු ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් මෙහි වෙනත් විධිවිධානවලට යටත්ව එකී සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකිය.

වැඩ බලන සාමාජිකයෙකු පත් කිරීම

14. මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක්වත් හෝ රැස්විය යුතුය.

මණ්ඩලයේ රැස්වීම්

15. මණ්ඩලයේ රැස්වීම් සඳහා ගනපූර්ණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයින් පස් දෙනෙකු වන්නේය.

ගන පූරණය

16. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිණිස මණ්ඩලය විසින් සිය කාර්ය පරිපාටිය නියෝග මගින් සකස් කර ගත හැකිය.

මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පරිපාටිය

17. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයෙකු පත් කිරීම දෝෂ සහිත වීම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් හෝ බල රහිත යයි සලකනු නොලැබිය යුතුය

මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් නිසා එහි කටයුතු ආදිය බල රහිත නොවන බව

18. පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය හැකිය

මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික

19\. (1) අධිකාරියේ පොදු මුද්‍රාව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ තිබිය යුතුය. අධිකාරියේ පොදු මුද්‍රාව

(2) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට හැර අධිකාරියේ පොදු මුද්‍රාව යම් සාධන පත්‍රයක හෝ ලියවිල්ලක හෝ නොයෙදිය යුතු අතර, එම සාමාජිකයින් දෙදෙනා එම අවස්ථාවේ එහි සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි හෝ ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතුය.

(3) අධිකාරියේ පොදු මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් අමාත්‍ය මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතුය.

20. මණ්ඩලය තම බලතල ක්‍රියාත්මක කිරීමේදී කර්තව්‍ය ඉටු කිරීමේදී සහ කටයුතු කිරීමේදී අමාත්‍යවරයා විසින් කලින් කලට දෙනු ලැබිය හැකි පොදු හෝ නිශ්චිත විධිවිධානවලට මණ්ඩලය යටත්වන අතර, එම උපදෙස් අනුව ක්‍රියා කිරීමට මණ්ඩලය බැඳී ඇත්තේය. අමාත්‍යවරයා විසින් මණ්ඩලයට උපදෙස් දීම

21. (1) මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක් මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අධිකාරියේ යම් නිලධරයෙකුට මණ්ඩලය විසින් පැවරිය හැකිය. මණ්ඩලයේ බලතල කර්තව්‍ය හා කාර්ය පැවරීම

(2) එවැනි බලතල, කර්තව්‍ය හෝ කාර්ය පවරනු ලැබූ යම් සාමාජිකයෙකු හෝ නිලධරයෙකු විසින් ඒවා මණ්ඩලයේ සාමාන්‍ය හා විශේෂ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

III වන කොටස
අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා හා සෙසු කාර්ය මණ්ඩලය.

22. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් පැවරෙන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට උචිත සුදුසුකම් ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණකාලීන නිලධරයෙකු මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(2) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික අධ්‍යක්ෂ ජනරාල්වරයාට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කර්තව්‍ය හා කාර්ය ගෙවිය යුතු අතර මණ්ඩලයේ විධානවලට හා උපදෙස්වලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය

23. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම් වන අතර, මණ්ඩලයේ රැස්වීම්වලදී ඔහුට ඡන්දයක් හිමි නොවේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල , කර්තව්‍ය හා කාර්ය

(2) අධිකාරියේ එදිනෙදා සියලුම පරිපාලන කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයට වගකිව යුතුය. තවද, මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව,

(අ) අධිකාරිය විසින් සේවයේ යොදවා ගෙන ඇති නිලධාරීන්ගේ , සේවා නියුක්තිකයන්ගේ සහ සේවකයන්ගේ කුසලතා වර්ධනය කිරීම

(ආ) අධිකාරියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස කටයුතු කිරීම.

(ඇ) අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම.

(3) මණ්ඩල විසින් කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි වෙනත් බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ යුතුය.

24. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව,

අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලය

(අ) අධිකාරියේ නිලධරයන්, සේවා නියුක්තිකයන් සහ සේවා පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම.

(ආ) එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් කාර්ය පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම මණ්ඩලය විසින් කළ හැකිය.

IV වන කොටස
මුදල් හා ගිණුම්

25. (1) (මෙහි මින් මතු "ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) "දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ගිණුම" නමින් ගිණුමක් පළාත් සභා අරමුදලෙන් පවත්වාගෙන යා යුතුය.

අධිකාරියේ ගිණුම

(2) එකී ගිණුම සඳහා ලැබෙන පහත දැක්වෙන ලැබීම් ප්‍රථමයෙන් පළාත් සභා අරමුදලට ගෙවා ඉන් පසුව ගිණුමට හර කළ යුතුය.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් හා ත්‍යාග.

(ආ) අනෙකුත් ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(ඇ) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් නීත්‍යානුකූලව අධිකාරියට දෙනු ලබන සියලු මුදල්; සහ

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී අධිකාරියට ලැබෙන මුදල්.

ගිණුමේ මුදල් යෙදවීම

26. අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා, බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහිලා මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට සහ ගිණුමෙන් ගෙවිය යුතු ලෙස මේ ප්‍රඥප්තියේ සඳහන් වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල් ගිණුමෙන් ගෙවනු ලැබිය යුතුය.

පාලනය

27. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ විධිවිධානවලට යටත්ව ගිණුමේ ප්‍රධාන පරිපාලක නිලධරයා වන්නේය.

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 වන කොටසේ විධිවිධානවලට යටත්ව ගිණුම් පවත්වා ගෙන යා යුතුය.

අධිකාරියේ මුදල් වර්ෂය

28. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වේ.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගිණුමේ ලැබීම් සහ ගෙවීම් හා වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය.

29. (1) අධිකාරියේ මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඉකුත් වීමට පෙර අදාළ මුදල් වර්ෂය වෙනුවෙන් ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අභ්‍යන්තර විගණන අංශයට නිරන්තරයෙන් විගණන කටයුතු කර ගෙන යාමට බලය පැවරේ. එකී ගිණුම් විගණනය සඳහා ඔහුට සහාය වීම පිණිස විගණකාධිපතිවරයා විසින් ඔහුගේ මග පෙන්වීම හා පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් විගණකාධිපතිවරයෙකුගේ හෝ විගණනවරුන්ගේ හෝ සේවය ලබා ගත හැක.

(2) අධිකාරියේ ගිණුම් විගණන සඳහා ගෙවිය යුතු ගාස්තුවක් වෙතොත් එම ගාස්තුව අධිකාරියේ ගිණුමෙන් දැරිය යුතුය.

(3) විගණකාධිපතිවරයා විසින් හෝ අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහුට සහාය වන යම් තැනැත්තකු විසින් හෝ එම විගණනයේ කාර්ය සඳහා අවශ්‍ය වන සියළුම පොත් පත්, ඔප්පු හා වෙනත් සාධන පත්‍ර, ගිවිසුම් ලේඛන, වවුචර් හා වෙනත් ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි අතර, ඒවා සැපයීම හා විගණනය සඳහා අවශ්‍ය තමා දන්නා කවර හෝ තොරතුරක් සැපයීම මණ්ඩලයක් හෝ එහි සාමාජිකයෙකු සතු කාර්යය වන්නේය.

(4) මෙම වගන්තියේ "සුදුසුකම් ලත් විගණනවරයා" යනුවෙන්,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුවූ ද ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ). යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයා වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ.

30. විගණකාධිපතිවරයා විසින් ගිණුම පරීක්ෂා කොට පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. විගණන වාර්තාව

(අ) තමන්ට අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණේද නැද්ද යන වග.

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහසක් ලබා ගැනීමට හැකිවන පරිදි ගිණුම් නිසියාකාරව පවත්වාගෙන ගොස් තිබෙන්නේද යන වග,

(ඇ) තමන්ගේ හැඟීම් අනුව පළාත් සභාවට වැදගත් වන යම් කරුණු, ගිණුම් විගණනය කිරීමේදී හෙළිදරව් වූයේ නම් ඒ කරුණු,

31. විගණනය කරන ලද ගිණුම හා විගණකාධිපතිවරයාගේ වාර්තාව, එක් එක් වර්ෂයේදී ලැබුණු විට එම වාර්තාව හා ගිණුම අදාළ මුදල් වර්ෂය තුළදී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස්මසක් ඉකුත් වීමට පළමු ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය.

විගණන වාර්තාව හා අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව

V වන කොටස

පොදු කරුණු

32. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියමිත කරුණු සඳහාත්, නියෝග සෑදිය යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය පළ වූ දිනයේ සිට හෝ එම නියෝගයේ සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ඒවා ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු හැකි තාක් ඉක්මනින් අනුමතය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු වූවා සේ සැලකිය යුතු නමුත් එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියාවක් හෝ තීරණයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ අවලංගු වූවා සේ සැලකිය යුත්තේ කවර දිනක සිට ද යන්න පිළිබඳව දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය

33. (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ සාමාජිකයෙකු සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට විරුද්ධව හෝ,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට අධිකාරියේ යම් නිලධරයෙකු, සේවා නියුක්තකයෙකු හෝ සේවකයෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවා නියුකිත්කයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතුය.

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධාන පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ වියදමින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ අධිකාරිය විසින් අයකර ගනු ලබන යම් ගාස්තුවක් ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේදී ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඔහු විසින් දරන යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළ හොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී අය කර ගනු ලැබුවේ නම් මිස, ගිණුමින් ගෙවනු ලැබිය යුතුය.

අධිකාරියේ නිලධරයන් රජයේ නිලධරයන් ලෙස සැලකෙන බව

34. අධිකාරියේ සියළුම නිලධරයන්, සේවා නියුක්තකයන්, සේවකයන් හා මණ්ඩලයේ සියලු සාමාජිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල හා (1) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලබන්නීය.

අර්ථ නිරූපණය

35. මෙම ප්‍රඥප්තියේ අන්‍යාකාර විධිවිධාන සලස්වා තිබේ නම් හැර "අමාත්‍යවරයා"යන්නෙන් දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"පළාත් සභා අරමුදල" යන්නෙන් දකුණු පළාතේ, පළාත් සභා අරමුදල අදහස් වේ.

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පාඨය බලපැවැත්විය යුතු බව

36. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පාඨය බල පවත්වන්නේය

19. 1996 අංක 01 දරන දකුණු පළාත් ග්‍රාම සංවර්ධන කෙටුම්පත් ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම ද, ඊට සම්බන්ධ හෝ අනුශංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1 වෙනි කොටස

01. මෙම ප්‍රඥප්තිය "ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාවේ අංක........... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වේ. — ලුහුඬු නාමය

02. දකුණු පළාත් සභා බලප්‍රදේශයේ ජනතාවගේ සහභාගිත්වයෙන්, ඔවුන් දැනුවත් කරමින්, ඔවුන්ගේ කුසලතාවයන් හා ස්වශක්තිය වර්ධනය කරමින්, ඔවුන්ගේම සැලසුම් සහගත ක්‍රියාකාරකම් පාදක කර ගත් ආර්ථික, සමාජයීය හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම සඳහා මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව: — පරමාර්ථය හා කාර්යයන්

i. ග්‍රාම සංවර්ධන සමිති සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
ii. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
iii. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
iv. කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යෑම.
v. ග්‍රාමීය නායකත්වය හා ප්‍රජාසේවා ව්‍යාපෘති සඳහා පුහුණු වැඩ සටහන් සංවිධානය හා පවත්වාගෙන යෑම.

03. මෙම ප්‍රඥප්තිය අනුව පිහිටුවනු ලබන ග්‍රාම සංවර්ධන සමිතිවලටද, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවලටද, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලවලටද පිළිවෙලින් වෙන වෙනම ව්‍යවස්ථා තුනක් තිබිය යුතුය. එම ව්‍යවස්ථා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආදර්ශ ව්‍යවස්ථා අනුව සකස් කරන ලද ව්‍යවස්ථා විය යුතුය — ග්‍රාම සංවර්ධන සමිති හා බලමණ්ඩල ව්‍යවස්ථා

04. i. ග්‍රාම සංවර්ධන සමිතියක බලප්‍රදේශය, ග්‍රාම නිලධාරී වසමකට වඩා විශාල නොවිය යුතුය. එකම ග්‍රාම නිලධාරී වසමක් තුළ ආර්ථික, සමාජයීය හා භූගෝලීය වශයෙන් අනන්‍යතාවයක් ඇති ගම් ගොඩක්, යායක් හෝ වතු ඒකකයක් සඳහා වෙන වෙනම සමිති පිහිටුවිය හැකිය.

ග්‍රාම සංවර්ධන සමිතියක බලප්‍රදේශය

ii. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයක, බලප්‍රදේශය වන්නේ ප්‍රාදේශීය ලේකම්වරයෙකුගේ බලප්‍රදේශයයි. එසේ වුවත් ජනගහණය හා භූ විෂමතාවය වැනි සුවිශේෂ හේතුවක් ඇත්නම්, ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා, ප්‍රාදේශීය බල මණ්ඩල දෙකක් පිහිටුවා ඒ සඳහා බලප්‍රදේශ දෙකක් බෙදා වෙන් කළ හැකිය.

iii. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයක බල ප්‍රදේශය වන්නේ දිසා ලේකම්වරයෙකුගේ බල ප්‍රදේශය වන දිස්ත්‍රික්කය වේ.

ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය

ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය වන්නේ සමිතියේ පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග උපයෝගී කරගෙන කටයුතු කිරීමය.

(අ) ගමේ ඇති භෞතික හා මානව සම්පත් මැනවින් අධ්‍යයනය කිරීම.

(ආ) නිෂ්පාදනයේදී ද, අලෙවියේදී ද පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීමේදී ද, මතුවන ගැටළුවලට මුහුණදීමට අවශ්‍ය සංවිධාන ශක්තිය ගොඩනැගීම.

(ඇ) දැනට ගමේ ඇති ආදායම් මාර්ග වර්ධනය කරගැනීම හා නව ආදායම් මාර්ග මතුකර ගැනීම.

(ඈ) වත්මන් ආර්ථික අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ව්‍යවසායකත්ව දැනුම හා නව තාක්ෂණ දැනුම වර්ධනය කිරීම.

(ඉ) බාහිර සම්පත් හා සේවාවන් හඳුනාගෙන ඒවා ගමේ අවශ්‍යතාවලට උචිත ලෙස ගමට ගලපා ගැනීමට ක්‍රියා කිරීම.

(ඊ) සැලසුම්කරණය හා ක්‍රම සම්පාදනය මගින් සමිතියේ ප්‍රතිලාභ ලබන අයගේ ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම.

(උ) ප්‍රාග්ධන ශක්තිය වර්ධනය කර ගැනීමට අවශ්‍ය අරමුදල් ගොඩනැගීම.

06. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයක කාර්යභාරය වන්නේ, ග්‍රාම සංවර්ධන සමිතිවලට වර්ධනය සඳහා, පහත සඳහන් කටයුතු කිරීමය:- ප්‍රාදේශීය බලමණ්ඩලයක කාර්යභාරය

I. ග්‍රාම සංවර්ධන සමිති පවත්වාගෙන යෑම සඳහා, උපදෙස් දීම හා පුහුණු කටයුතු සකස් කිරීම

II. ග්‍රාම සංවර්ධන සමිතිවල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අරමුදල් ගොඩනැගීම.

III. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සැලසුම් සම්පාදන කාර්යයේදී, සමිති නියෝජනය කිරීම හා යෝජනා ඉදිරිපත් කිරීම.

IV. ග්‍රාම සංවර්ධන සමිතිවල පැවැත්ම සඳහා, අන්‍යෝන්‍යාධාර ක්‍රම හා ණය ආධාර ක්‍රම ඇති කිරීම.

V. ග්‍රාම සංවර්ධන සමිතිවල පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා, අදාළ වන්නා වූ හා අවශ්‍ය වන්නාවූ වෙනත් කටයුතු කිරීම.

VI. සමිති අතර සම්බන්ධීකරණය ඇති කිරීම.

07. ග්‍රාමසංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩලයක කාර්යභාරය වන්නේ, සිය බලප්‍රදේශය තුළ ඇති ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාමසංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවල අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය, සම්බන්ධීකරණය හා මාර්ගෝපදේශකත්වය දීම සඳහා, පහත සඳහන් කටයුතු කිරීමය:- ග්‍රාමසංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයක කාර්යභාරය

I. සංවර්ධනය සඳහා කටයුතු කරන, රජයේ දෙපාර්තමේන්තු හා රජයේ නොවන ස්වේච්ඡා සංවිධාන සමග ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවල සම්බන්ධතාවයක් ඇති කිරීමට කටයුතු කිරීම.

II. සංවර්ධන සැලසුම්කරණයේදී, ග්‍රාම සංවර්ධන සමිතිවල අත්දැකීම්, අදහස් හා යෝජනා, උපයෝගී කරගත හැකි ක්‍රම, උපායයන් සකස් කිරීම.

III. ප්‍රජා සංවර්ධන ප්‍රවේශය වෙනුවට, ඉලක්ක කණ්ඩායම් සමග දුප්පත්කම අවම කිරීම සඳහා වූ සහභාගිත්ව ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු ද, සමීක්ෂණ කටයුතු ද, පුහුණු කිරීමේ කටයුතු ද සැලසුම් කිරීම හා මෙහෙයවීම.

IV. ග්‍රාම සංවර්ධන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හා අදාළ වන්නාවූ වෙනත් කටයුතු කිරීම.

V. ග්‍රාම සංවර්ධන කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල කටයුතු සංවිධානය හා පවත්වාගෙන යාම.

2 වන කොටස

නිලධාරීන් අනුයුක්ත කිරීම

08. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, නවවන උපලේඛනයේ, 1 වන ලැයිස්තුවේ (පළාත්සභා - ලැයිස්තුවේ අංක 10 යටතේ විමධ්‍යගත කරන ලද) ග්‍රාම සංවර්ධන විෂය සඳහා, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පත්කරනු ලැබ දකුණු පළාතේ, ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සේවයේ යොදවා සිටි ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන්, ග්‍රාම සංවර්ධන නිලධාරීන් හා මැහුම් ප්‍රදර්ශිකාවන් හා මැහුම් පරිපාලිකාවන්ද, ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානවල කණිෂ්ඨ සේවකයන්ද, මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභාවේ, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබේ.

ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ පත්කිරීම

09. (i) දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලැබිය යුතුය.

ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් ඔහු වෙත මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ රාජකාරි යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

(ii) පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල හා කාර්යභාරය අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු අතර, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරුන් පත් කිරීම

10. (i) ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් අධ්‍යක්ෂවරයාට සහායවීම පිණිස ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා සහකාර අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුද, පුහුණු හා පර්යේෂණ කටයුතු සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙකු ද පත්කළ යුතුය.

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් හා රාජකාරි යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතුය.

11. මෙම ප්‍රඥප්තිය යටතේ, අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් ද පත්කරනු ලැබිය හැකිය.

12. මෙම ප්‍රඥප්තියේ 9, 10, 11 යන වගන්ති යටතේ පත් කරනු ලබන සියළුම නිලධාරීන්, දණ්ඩ නීති සංග්‍රහයේ, අර්ථානුකූලව රජයේ නිලධාරීන් ලෙස සලකනු ලැබිය හැකිය.

13. මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සත්භාවයෙන් කරන ලද හෝ නොකරන ලද හෝ යම් කාර්යයන් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

14. මෙම ප්‍රඥප්තියේ 9, 10, 11 යන වගන්ති යටතේ පත් කරන ලද සියළුම නිලධාරීන්, තම බලතල ක්‍රියාත්මක කිරීමේදී, අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන පොදුවූද, විශේෂ වූද නියෝගවලට හා විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

දකුණු පළාත් ග්‍රාම සංවර්ධන පොදු අරමුදල් ගිණුම

3 වෙනි කොටස

15. (i) දකුණු පළාත් ග්‍රාමසංවර්ධන කටයුතු කිරීමේදී, අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙහි සඳහන් පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම අරමුණු කර ගනිමින්, කළයුතු ආධාර හා වියදම් සඳහා මෙහි මින්මතු "අරමුදල් ගිණුම" යනුවෙන් සඳහන් කරන්නා වූ හා "දකුණු පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල් ගිණුම" යනුවෙන් හැඳින්වෙන්නා වූ ගිණුමක්, පළාත් සභා අරමුදලේම ගිණුමක් වශයෙන් පවත්වාගෙන යා හැකිය.

(ii) මෙම අරමුදල් ගිණුම, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 111 වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(iii) මෙම අරමුදල් ගිණුමට, පහත සඳහන් මුදල් බැරකළ යුතුය:-

(අ) රජය මගින් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලැබිය හැකි මුදල්.

(ආ) දකුණු පළාත් සභාව විසින්, අරමුදල් ගිණුමේ කාර්යයන් සඳහා සම්මත කරනු ලැබිය හැකි මුදල්.

(ඇ) යම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සංවිධානයක් මගින් කෙරෙන පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්.

(ඈ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්.

අවශ්‍ය වෙනත් නිලධාරීන් පත්කිරීම

(ඉ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රමවලින් ලබාගන්නා සියලුම මුදල්

(iv) එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසිය පිට II , III වගන්තියේ, ඇ, ඈ, ඉ යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක, එම මුදල අරමුදලේ ගිණුමේ බැරට බාර ගැනීම ඇමතිවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

අරමුදල් ගිණුමෙහි පාලනය,

16. (i) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි, පත් කරනු ලබන මණ්ඩලයක උපදේශකත්වය යටතේ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අරමුදල් ගිණුම පවත්වාගෙන යෑමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.

(ii) එක් එක් ලිත් වර්ෂය සඳහා, සම්පූර්ණ ලෙස හා උචිත ලෙස ගිණුම් පවත්වා ගෙන යෑමට ලේකම්වරයා විසින් විධිවිධාන සැලැස්විය යුතුය.

(iii) එක් එක් ලිත් වර්ෂය අවසන් වූ පසු, හැකිතාක් ඉක්මනින් අරමුදල් ගිණුමේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සකස් කළ යුතුය.

(iv) 1971 අංක 38 දරන මුදල් පනතේ, 11 කොටසේ විධිවිධාන අනුව අවශ්‍ය වෙනස්කම් සහිතව, අරමුදල් ගිණුමේ මුදල් පාලනය සහ ගණන් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(v) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතුය.

17. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින්, එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වූ වාර්තාවක්ද, එම අරමුදල් ගිණුමේ විගණනය කරන ලද, එම වර්ෂයේ ගිණුම්වල පිටපතක් ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය හා දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාව

18. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා කරනු ලබන වැඩ සටහන් වෙනුවෙන් අදාළ උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයාගේ අනුමැතියෙන් ගෙවීම් කටයුතු කළ හැකිය.

අරමුදල් ගිණුමින් කරනු ලබන ගෙවීම්

4 වෙනි කොටස

19. අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානයක් හෝ ප්‍රදානයන් පිහිටුවනු ලැබිය හැකිය.

ශිෂ්‍යත්ව ප්‍රදානයක් පිහිටුවීම

(අ) සංවර්ධන ක්ෂේත්‍රයේ නව ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමේදී, මතුවන ගැටලු හා පරිපාලන ක්ෂේත්‍රයේදී ඇතිවන අනුබද්ධ ගැටළු විසඳීමේ විධි ක්‍රම පිළිබඳ දැනුමක් ලබාදීම.

(ආ) කාන්තා අභිවෘද්ධි කටයුතු පිළිබඳ, ක්ෂේත්‍රයේ නියුතු පරිපාලිකාවන්ට හා ප්‍රදර්ශිකාවන්ට ඔවුන්ගේ කටයුතුවලට අදාළ නව තාක්ෂණ දැනුම ලබාදීම.

(ඇ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික්ක මට්ටමේදී, නිර්මාණශීලී දක්ෂතාවන් දක්වන සමිතිවල හා බලමණ්ඩලවල සාමාජිකයන්ට වැඩිපුර දැනුමක් ලබාදීම.

20. ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා දේශීය හා විදේශීය අරමුදල් උපයෝගී කරගත හැකිය.

21. මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් යෙදවීම හා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම, අමාත්‍යවරයාගේ අවසාන තීරණයන්ට යටතේ වේ.

5 වෙනි කොටස

22. ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාව අනුව, කටයුතු කිරීමට සියළු ග්‍රාම සංවර්ධන සමිතිවලද, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් බලමණ්ඩලවල ද නිලධාරීන් බැඳී සිටී.

අනුමත ව්‍යවස්ථාවලට පටහැනිව කටයුතු කිරීම

23. ලියාපදිංචි කරන ලද සියළුම ග්‍රාම සංවර්ධන සමිතිවල ලේඛනයක්ද, සියලුම ප්‍රාදේශීය බලමණ්ඩලවල හා දිස්ත්‍රික් බලමණ්ඩලවල ලේඛනයක්ද ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යා යුතුය.

24. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ලියාපදිංචි කරන ලද, ග්‍රාමසංවර්ධන සමිති ලේඛනයක් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වාගෙන යා යුතුය.

25. (i) මෙම ප්‍රඥප්තියේ ඇති පරමාර්ථයන්ට හා අනුමත ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන බවට චෝදනා ලැබ ඇති අමාත්‍යාංශයේලේකම්වරයාගේ නියමයෙන් පවත්වන ලද විධිමත් පරීක්ෂණයකින් වැරදිකරුවන් වන සමිතියේ හෝ බලමණ්ඩලයේ නිලධාරී මණ්ඩලය විසුරුවා හැරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

(ii) ඉහත සඳහන් ලෙස නිලධාරී මණ්ඩලය විසුරුවා හරින ලද සමිතිය හෝ බලමණ්ඩලය ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ නැවත ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

(iii) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියකට හෝ බලමණ්ඩලයකට අයත් සියලුම දේපල ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට එම දේපල භාරදී නිදහස් වනතුරු විසුරුවා හරින ලද නිලධාරී මණ්ඩලය වගකීමෙන් නිදහස් නොවේ.

26. (i) "අමාත්‍යවරයා" යන්නෙන් අදහස් වන්නේ දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාය . — අර්ථ නිරූපණය.

(ii) "අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් අදහස් වන්නේ දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

(iii) "දේපල" යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම සංවර්ධන සමිතිය හෝ ග්‍රාම සංවර්ධන බලමණ්ඩලය සතු පොත්පත්, ලේඛන අත ඉතිරි හා බැංකුගත මුදල්, ලීබඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් යන සියලුම දේපලය.

27. මෙම ප්‍රඥප්තියේ සිංහල පාඨය, දෙමළ පාඨය හා ඉංග්‍රීසි පාඨය අතර යම් නොපැහැදිලිකමක් ඇතිවූ අවස්ථාවක සිංහල පාඨය බලපවත්වන්නේය.

05-48